මෙහි විශේෂභාවය මෙසේයි සංසාරයෙහි සැරිසරන්නාවූ සියළුම සත්ත්වයෝ අඩානවාගීයව පිළිපන් පුරුෂතෙමේ ඉගණගිය මාගේඋපකරණය අනුභවකරමින් යන්නාක්මෙන් නොයෙක් ජාතියෙහි රැස්කරණලද්දාවූ අපරාපරිය මෙවද්‍ය කුශලා කුශල කර්මයෙන් මුසනවූ සත්ත්වයක්නම් නැත්තේමැයි යම් පුද්ගලයක්තෙමේ වනීම්නභවයෙහි බුඩධම් සංඝඛ්‍යාත රත්නත්‍රය හැඟිදැක්මි කර්මවිපාකයෙහිද ශ්‍රධ්ධාසංඛ්‍යාත ඇදහිමෙන් තොරව ප්‍රාණඝාත අදත්තා දානාදි දශඅකුශල කර්මපථයෙහිම දක්නාලැබ්ද නිරන්තරයෙන්ම වරදවූ පාපක්‍රියාවෙහිම ගැළිවාසයෙකේද

කථංධම්මං චරිත්වාන, පච්ඡාගච්ඡන්තගි සුගතිං
කථාමවෙතං අධම්මිඨා, පතන්තේ නිරයං අඝධා'' යි.....

එහි ගාථාය මෙසේයි එහි පින්වත්වූ කාශ්‍යපය මනුෂ්‍ය තෙමේ මව්පියන් කෙරෙහි කෙසේ හැසිරෙන්නේද ආචාර්යයන් කෙරෙහි කෙසේ හැසිරෙන්නේද පුත්‍රදාරාවන් කෙරෙහි කෙසේ හැසිරෙන්නේද මයාවෘඩ සැණවෘඩ තපොවෘඩියන්ගේ කෙරෙහි කෙසේ හැසිරෙන්නේද මහණ බමුණන් කෙරෙහි කෙසේ හැසිරෙන්නේද සෙනාවකෙරෙහි නොමහත් රාජපුරුෂයන්ට හටයන් කෙරෙහි කෙසේ හැසිරෙන්නේද ජනපදවාසීන් කෙරෙහි කෙසේ හැසිරෙන්නේද පින්වත් කාශ්‍යපයනි කෙබඳු ධර්මයක හැසිරීම මහතුෂ්කාවහෙණ පසුභාගයෙහි මරණින්මතු සුගතියට යන්නාහුද ඇතම් මනුෂ්‍යයෝ කවර ධර්මයක හැසිර මරණින්මතු අපායගත වේද්දැයි. මෙසේ අතීතම් රජ්ජුරුවෝ ආනිසයින් සියුම්වූ ගැඹුරුවූ බුඩ ප්‍රත්‍යක බුඩ ආර්‍යශ්‍රාවක බෝධිසත්වාදි මහාප්‍රඥයන්ට අගාවරවූ පුළුල් පඬිතයන් නැත්තාහුනම් පසු පසු පඬිතයන් විසින් ව්‍යසදියයුතු මහානුභාවසම්පන්නවූ ප්‍රඥයන් අඹබාලවූ අලානතෙරුන් සමනවියාගේ බසට රැවටී අවුත් සම්‍යති සම්ප්‍රජන්‍යයෙන් විරහිතවූ නිර්‍යන්තුව සිටිනහාවූ මිථ්‍යාඤාණයන් යුක්තවූ සිත්වූ අමවලකයා අතින් විවාළේසි එසින් කිහ ජාතකඅටුවාමයහි–

''සබ්බඤ්ඤු බුඩපටිච්ච බුඩසාවකා මහාබෝධිසත්තාසු පුරිම සා පුරිමස්ස අලාමහන පඨිමං පඨිමං පුච්ඡිතබ්බකං මඤ්ඤකා පණ්ඩිතා රාජා කිඤ්චි අජානන්තානං නග්ගභාවගං නිස්සිරිකං අඹබාලං ආජීවිකං පුච්ඡි''යි.....

මේ ප්‍රඥාවයෙහි අවිද්‍යාව ප්‍රධානහේතුකොට ඇත්තාවූ පුණ්‍යාභි සංස්කාරය අපුණ්‍යාභි සංස්කාරය ආනෙඤ්ජාභි සංස්කාරයයි කියනලද අතීතවූ කුසලා කුසලකර්මයද ඒ කර්මය විසින් සුදුසු පරිද්දෙන් ඒ ඒ භවයෙහි උපදවනලද විඤ්ඤාණනාමරූප සළායතන ඵස්සවේදනායයි කියනලද වර්තමාන ඵලධර්මයෝද ආනිසයින් සියුම්වූ ගම්භීරවූ සංසාරවක්‍රය වන බැවින් මෙවනාහි හෙතුධර්මය මේ ඵල ධර්මයයි මහතුඵල සඞ්ඛ්‍යාවෙන් ශ්‍රේෂ්ඨ විහාරකිරීව ළඟවිතුරා බුදුවරයෝය පසේබුදුවරයෝය මහාශ්‍රාවකයෝය යන මේ උතුම් පඬිතයන්වහ ගොචරවෙයි සාමාන්‍යයෙන් පිටත්හිද නියත විවරණ ශ්‍රී ලබනලද මුඛ්‍ය ළඟාව ණැති මහාබෝධිසත්වරයන්ව මුන්සෙසසන්ට ගොචර නොවෙයි එසකයි ත් කිව් හාමි

විපාකය යන මෙම දෙශනාවේ සම්බන්ධයෙන් අතිශයින් සියුම්වූ ගැඹුරුවූ ප්‍රශ්නය අලාතනම් අන්ධබාලවූ සෙසෙනියාගේ බිසව රැවටී අහානි නම් රජ්ජුරුවෝ අඥානවූතීව්‍රකශා, අතින් එවා ළඟිය. ඉක්බිති ඒ අන්ධ බාලවූ ආජීවකතෙමේ තමාගේ මිථ්‍යාවාදය අහානි රජහට මෙසේ ප්‍රකාශකළේයි එසින් සිහ ජාතක අටුවාමෙයනි.

"මහාපිළුවං ප්‍රවිශිතා ප්‍රවිශාහු රූපංබ්‍යාකරණං අවඤ්ඤාවරණතං නොණං දෙඩනපහරමෙන්නාවිය ගත්තාවඛිතාය කවචරංඛිපඥෙන්නා වියව සුණ මහාරාජානි ඔකාසංකාමරෙමා අත්තෙනා, මිවජ්‍යාවාදං පඤ්ඤපෙසි" යී ඒ ආජීවක නිගණ්ඨ මතෙමේද මෙසේ විවාදකාලයේ ප්‍රයෝගයට සුදුසුපරිදෙදන් විසජ්ජනාව නොකියා නිසිබිම තණකන ගවයෙක් දඩකින් පහරණුලබන්නාක්මෙන්ද පිළිකයෙළකරණලද බන්වස්මෙනෙක කසළ දමන්නාක්මෙන්ද මහරජ මාගේ විසජ්ජනාව අසවයි අවසරගෙණ තමාගේ මිථ්‍යාවාදය ඉගණහැර දුක්විඳේය මෙසේ තමාගේ මිථ්‍යාවාදය එළවන පිණිස අවකාශගෙණ එ මිථ්‍යා වාදය එළවනුයේ මෙසේ කිහ —

"වෙදෙහස්ස වචොසුත්වා කාසෙසපා එ තදබ්‍රවී
සුණණාහි මෙමහාරාජ සචචං අළුතපදංසෙ
නාසීධම්ම චරිතස්ස එලංකල්‍යාණ පාපකං
නාසීදවපමරුලොකා ඉඤා තමතාහි ඉඛාගතා
නාසීදව පිතරොවා කුලතාමාතා කුලතාපිතා
නාසීඤාවරි සයානාම අදනතං ඉඤාදළිස්සති
සමතුල්‍යානි හුතානි නාසීජජිඤා පවාසිතා
නාසීබලා ත්‍රියංවා කුලතා උඛාන පොරිසෙ
නියතානිහි භූතානි යථා ඉඤාවිමසාතථා
ලඳ්ධයසං ලභතෙම්මෙවා ගත්තාදනඵලංකුලතා
නාසීදුන එලංඳදව අවඉසාදෙවසීරියා
බාලහි දුනංපණ්ඩිතතා පණ්ඩිතහි පවිවිජිතං
අවසාදදනහිධිරානං බාලාපණ්ඩිතාතිනෙතා" යී

මෙහි භාවය මෙසේයි.

භාග්‍යවත් බුදුරජාණන්වහන්සේ අහානිරජහුගේ හා ආජීවක යාගේද කථාව භික්ෂූන් සුධර්මයෙහි මෙසේ පහළකෙළේයි. මහ මෙනෙහි විඳදනාධිපතිවූ අහානි රජහුගේ විවාහය අසා කාශ්‍යපභාග්

අනවලක්ඛණමේ තේ වචනය කිඹ මහරජ යහපතැවූ නොවරදින සුළුවූ මාගේ වචනය අසව මහරජ ධර්මයයි හැඟිමෙන්නාහුවද එලයක් නැත්තේය කුසල් අකුසල්ද නැත්තේය පරලොවක්ද නැත්තේය ඒ එසේමැයි පරලොවින් මේ ලොවට ආවෝකවරහුද ? මහරජ මුඛනාසිකනිමිත්තක් හෝ පියයක්ද නැත්තේය මවෙක් කොයින් ඇත් තේවේද පියයක් කෙසේඋත්තේවේද ? මහාමහාත් මව්පියෝ නැති බැවින් ඔවුන්ගේ විශෙෂ උපකාරයක්ද නැත්තේමය මව්පියෝද සෘජු සත්වයන්ට සමානවෙත්මය ආචාර්යයෙකුද නැත්තේය නොදැ මුනාවූ සත්වයෙක් කවරෙකු විසින් දමනය කළහැකිවේද ලෝකවාසි සකලසත්වයන්ම සමානවත් නානුත්ථානවීර්යයෙන් වෘධියන්ට ගරුබිහු මන්කිරීමක්ද නැත්තේන බල ධෛර්යක් හෝ වීර්යක් හෝ නැත් තේය උත්සාහ වීර්යසම්පන්නවූ මනුෂ්යයෙක් කොයින්ද? ඒ එසේමැයි නැවපැදීමට ආධාරවූ පඨවිපතවනාදී නැව පසුපසෙහි නැවට අනුවය ගන්නේවේද එපරිද්දෙන් සියළු සත්වයෝ සයුකාලිකවූවාහුය නි යත ඉඛභාවය සත්වයා පසුපස්සේ යන්නාහුය මනුෂ්යත්වයම ලැබිය. යුත්තක්ම ලබන්නේය එසේ ඇතිකල්හි දානයාගේ විපාකයක් කොයින් ලැබේද? මහරජදානඤ්ඤ විපාකයක් නම් නැත්තේය මහරජ ලොකයෙහි කිසියම ධර්මයක් අන්යක් ධර්මයකුහුගේ වසඟයෙහි පැවැත්මක්නම් නැත්තේය වීර්යයය කිනම් නැත්තේය ලොකයෙහි අඥානබාලයන් විසින් දන්දිය යුතුයයි පණවනලද්දේය ඒ දානය පණ්ඩිතයන් විසින් පිළිගන්නාලද්දේය අපි කුවනැතැමහහි සිතන්නාවූ අඥානබාලයෝ ප්රඥාක්නිය නැතහුය යම්සේ ප්රඥාසම්පන්න පණ්ඩිතයන්ට දන්දන්නාහුයයි මෙසේ දානානිසංස නැතිබව ප්රකාශකොට ඊට අනාතුරුව ප්රාණඝාතාදී දුශ්චරිතයන්ගේ විපාක නැතිබව පහළි කරණු පිණිස මතුදක්වන ගාථාපන්තියකිහ.

"සන්තිමෙ සත්තකායා අජෙජ්ජා අවිනාසිනො
නෙජාපයති අාපොව එසො සුබංදුක්ඛඤ්චමේ
ජීවවසත්තිමෙකායා මයසංමඤ්ඤනා නවිජ්ජති.....
නත්ථි හන්තාවා මඤ්ඤතාවා හැදුසද්දෙරවාපි කෙ චිකං
අත්තදරමනවකාසානං සත්ථානිවත්ත දත්තමරං.....
යොවාපි සිරම්හදුය පරෙහං නිසිතාසිනා
නමසාජීඤ්ඤති මතකාමය තත්තපාා එලංඛුමරා.....
චුල්ලාසිති මහාකප්පා සමබ්බ සුද්ධිනාහි සංසරා
අනාගමතතමිනිකාමලා සාදුසද්දෙනාදිනා සුද්ධිනි.....

චරිත්වාපි බහුංහදුං නෙවසුජ්ඣන්ති නාගතෙ
පාපඤචපි බහුංකත්වා තංඛණං නාතිවත්තරෙ.....
අනුපුබ්බන නො සුඛි කපපානං වුල්ලාසිනියා
නියඤ්ඤානි වහනාම වෙලන්තමිවසාගරො'' ඛි.....

මෙහි භාවය මෙසේයි.

එබා මහරජ ධම්මයෝ සත්දෙනෙක් මේ ලොකයෙහි සදහා ලිකව පවත්නාහුය, ඒ ධම්මයෝ ස්ත්දෙන කිසිවෙකු විසින් නොසිදිය හැක්කාහුවෙති විකාපනය නොකටහැක්කාහුවෙති ඒ කවර සත්දෙනෙක්දයත් ? තෙජෝධාතුය පෘථිවිධාතුය ආපොධාතුය වායොධාතුය සුඛෙන්ද්‍රිය දුඃඛෙන්ද්‍රිය ජීවිතෙන්ද්‍රිය යන මේ ධම්මයෝ සත් දෙනායයි දතයුතුයි. මේ සත්වැදුරුම් ධම්මයෝ නොයෙක් රූපකලා පයන්ගේ සමූහයක් බැවින් සමූහධම්මනම් වන්නාහුය ඒ සමූහ ධම් මයෝතුමු සදහාල්කවන්නාහුය මේ ධම්මයෝ සත්දෙන නොසිදිය හැක්කාහුය මහරජ මේ ලෝකයෙහි ඝාතනයකරන්නෙක්ද නැත්ත් තේය සිඳින්නෙක්ද නැත්තේය ඒ සත්වැදුරුම් සමූහධම්මය සිදින් තේද යත්වැදුරුම් සමූහ ධම්මයන් අතුරෙහිවූ පරිවෙජ්දුකාශයාගේ අන්තරන්තරයෙන් ශස්ත්‍ර ආයුධාදීහු විනිවිද ගෙණයන්නාහුය යම්මක් මතමේ අහුන්ගේ හිස අතින්ගෙණ තියුණු මුවහත්ඇති කඩුවෙන් සිඳිමන්වේද ඒ පුද්ගලතෙමේ සප්තදුකාරවූ සමූහ ධම්මය සිදින්නාම් නොවේ එසේ නොසිඳිනකල්හි අකුශලකම්යක් කොපි න්ද ? අකුශලකම්යාගේ විපාකයක්නම් කොයින්දැයි යහුයි මෙහි විශෙෂභාවය මෙසේ දතයුතුයි.

පෘථිවි ආදී සප්තධාතුන්ගේ සමූහයම සත්ත්වයි ව්‍යවහාරකර න්නේය ඒ සප්තධාතුන්ගේ මධ්‍යයෙහි එකෙකි ධාතුන්ගේ හෙවත් සියුම් රූපකලාපයන්ගේ අතරතුර පරිවෙජ්දුකාශයන්ගෙන් වෙන් කරන්නේයි කඩුදුනු හී ආදි ආයුධයෙන් පැහැරුකල්හි මුංබිජු ගොඛකට ඇසුකලක්මෙන් ඒ පරිවෙජ්දුකාශයන්ගේ අතුරෙන්ම ආයු ධය විනිවිදයන්නේය එකද ධාතුවකුත් නොසිදියහැක්කේය එහෙ සින් ප්‍රාණවධාදිය අකුසල් නොවන්නේය යනු භාවයි.

මහරජ සියළුසත්ත්වයාම මහාකල්ප සුවාසුවක් ඔළුල්ලෙහි සසර සැරිසරා නොස්ම සංසාර ශුද්ධි ලබන්නාහුය යම්මක් මතමේ කයලොක් සංයමඇතනාහු ශිලාදිගුණයන් පිරුවාහුද ඒ සුවාසු මහා කල්ප ගණෙවනතුරු සංසාර ශුද්ධිය නොලබන්නාහුවෙති නොයෙ ක් කුසලකම් රැස්කොටද ඒ මහාකල්ප සුවාසුව නොඅඟවනතාක්

සංසාරශුද්ධිය නොලබන්නාහුමය ඉදින් බොහෝවූ අකුසල් රැස්කර න්නාවූ පුරුෂතෙමේද මහාකල්ප සුවාසුව නොඉක්මවන්නේය මහ රජ අනුක්‍රමයෙන් මහාකල්පසුවාසුවකින් අපගේ සංසාර ශුද්ධියවන් නේමය මිනරජ මහාසාගරය තවරල ඉක්ම නොයන්නාක්මෙන් අප ගේ නිත්‍යවූ නියතනතිය ඉක්මවා ලියනොහැක්කෝහයි මෙසේ කා ශ්‍යපතෙම් නිගණ්ඨතෙමේ තමාගේ මිථ්‍යාදෘෂ්ටිය අහාති රජහට ප්‍රකා ශකළේයි.

කෙම් කෙවිවිපාකයන්ගේ ඇදහිම හා
කාශ්‍යපනිගණ්ඨයාගේ මිථ්‍යාවාදයයි. 32

කාශ්‍යප නිගණ්ඨයාගේ වාදයට ශාස්තෘදන්නාවූ
අලාතනම්ඇමතියාගේ කථාව කෙසේදයන් ?

——— 0 ———

33 ඊට අනතුරුව ඒ කාශ්‍යපයාගේ වචනය අසා අලාතනම් අමාත්‍යයාගේ දෘෂ්ටිය විපරිතවූසැටි මෙසේ දනයුතුයි. අවෙලක කා ශ්‍යපතෙම් උවෙදදෘෂ්ටිය ඇසූ අලාතනම් ඇමති තෙමේ ජාතිස්මර නුවණින් නමාගේ අනතුරු යව ආත්මභාවයෙහි පිහලනම් ගොඤ්ඤා තාපයෙක්ව රැස්කළාවූ මහා පාපකර්මය දැක මම යටගියජාතියෙහි මෙබදුදුෂ්ටභත් අකුසල් රැස්කොට්ද දැන් මේ භවයෙහි මහත් ආඪ්‍යවූ සෙනාපති කුලයෙහි ඉපිද සසනෙවිරත් තනතුරු ලැබ පස්කම්සැප නින් සම්පූර්ණවීම අකුසලකර්මයන්ගේ අනිෂ්ට විපාක නොලැබීමෙහි සාධකාංශි වරදවා සිතාගෙණ අවෙලක කාශ්‍යපයාගේ මිථ්‍යාවාදයට ශාස්තෘදනපිණිස මෙසේ ගාථාවෙන් කීහ.

"කස්සපස්ස වචොසුත්වා අලාතෝ එතබ්‍රවි
යථාහදජනතාහණති මස්හමෙපතංව රුච්චති
අහම්පි පුරිමං ජාතිං සරෙ සංසරිතං මත්තනෝ
පිහලාතාමහං ආසිං එද්දදුගොඝාතකොපුරෙ
බාරුණසියං ජිතායං බහුපාපං මයාකතං
බහු මයා හතා පාණා මගිසා සූකරා අජා
තතොචුතා ඉධජාතෝ ඉඩ්ධිසෙනාපනී කුලෙ
නත්ථි නූනඵලං පාපං අහං නනිරයං ගමෙතා"සි.

මහණෙනි අවෙලක කාශ්‍යපයාගේ වචනය අසා අලාතනම් සෙ නාවිතතෙමේ මෙසේ කීහ යම් වචනයක් පින්වත් කාශ්‍යපතෙමේ කීයේද ඒ වචනයම සැබෑවයි ඒ වචනයම මටද රිසිවක්මෙන්ය මම්ද පූර්වජාතිය සිහිකරමි මම වනාහි මිට පූර්වයෙහි ක්‍රෑරවූ පිනලනම්

මහාඝාතකයෙක්වීම් සකල සම්පත්තිවලයන් පිරුණාවූ බරණැස්නුවර මා විසින් බොහෝ අකුසල් රැස්කරණලද්දේය මිසරක්ද හුරන්ද එළුවන්ද අතිකුදු බොහෝ ප්‍රාණීන්ද මා විසින් නසනලද්දාහුය මම ඒ බරණැස්නුවරින් චුතව අවුත් මේ මිනුළුහුවර සකලසම්පත්තිවලයන් ආස්‍යවූ මෙමනව්කුලයෙහි උපනිමි එනයින් අකුශලකර්මයාගේ අනිෂ්ට විපාකයක්නම් ඒකාන්තයෙන් නැත්තේය ඒ පව් රැස්කළාවූ මම අකුසලකර්මය හෙතුකොටගණ නිරයෙහි නුපන්නෙමිසි කිහ මේ අලාතනම් මෙනෙපති මතමේ තමාගේ එකම අනන්තරුජාතියක් පමණක් දක්නාජාතිස්මරත්‍රුවණ ඇත්තෙක්වූ බැවින් යටගිය ජාතියෙහි මම මහාඝාතකර්මය ආදිකොට ඇති බොහෝ පව්රැස්කොට අපායට මහාඝාස් නොයෙක් සම්පත්තියෙන් ආස්‍යවූ මෙමනව්කුලයෙහි උපනිමි එබැවින් අකුශලකර්මයෙහි අනිෂ්ට විපාකයෙක්නම්නැතැයි යන දෘෂ්ටි මහණ මෙසේ කිහයි දතයුතුයි.

ඒ අලාත්නම් මෙනෙව්තෙමේ කස්සප් බුදුන්ගේ සස්තෙහි ඒ බුදුන්ගේ සැයට අනාජා මල්දමකින් පුදා එයින් චුතව එම කුසල කර්මය අවකාශ නොලැබ ඊට පෙර අත්බැව්හි රැස්කරණලද අකුශල කර්මයන් පිරිවරණලද මිශ්‍රවූ ලාමක දුඃඛතුක කුසලකර්මබලයකින් ගොඝාතකකුලයෙහි ඉපිද ජීවිතාන්තය දක්වා මහත්වූ මහාරවූ අකුසල් රැස්කොට ඒ මහාඝාතක කුලයෙන් චුතව අවුත් මහාඝාතක ආත්මභාවයෙහි රැස්කළාවූ අකුසලකර්මයන්ට අවකාශ නොලැබ ඊට පූර්වජාතියෙහි කස්සප් බුදුන්ගේ සැයට කරණලද අනාජාමාලාදාම පූජාමය කුසලකර්මයට අවකාසලැබ මේ මහසැපත් ඇතහාවූ මෙනව්කුලයෙහි ප්‍රතිසන්ධිග්‍රහණ මෙමෙනවිරත් තනතුරුලැබ්මය්ය මෙසේ කුශලා කුශල කර්මයෝතුමු කප් සියදහස්ගණන් ඉක්මහියේ මේවිද සුදුසු භවයක අවකාශලැබ්මෙන්ම විපාකදියයුතු බව පොදු ක්නාලදුවා යවනිය භවය හා මේ භවයත් පමණක් දැක හෙතුඵල යන්හේ සඞ්ඛ්‍ය නොදැන මිථ්‍යාදෘෂ්ටි මහණ මෙසේ ප්‍රකාශකොළේසී එසින් කිහ ජාතක අටුවාමෙහි.

"සොකිරහයසප දසබලස්ස මවතිමය අනාජා පුප්ඵදමෙන පූජංකත්වා මරණසමයය අසක්ඛිදන කම්මේන යථානුභාවං ඛිණත්තා සංසාමර සංසරමනත්තා එකස්ස පාපකම්මස්ස නිස්සන්දන මහාඝාතක කුලෙ නිබ්බත්තිත්වා බහුං පාපමකාසි අථස්ස මරණකාලෙ හස්මා පවි චිජ්ජනනාවිය අගහි එකනකං කාලං යිතං තං පුඤ්ඤකම්මං ඔකාස

මකාසි සෝ තස්සානුභාවෙන ඉධනිබ්බත්තිත්වා තං විඤ්ඤුං පත්තෝ
ජාතිං සරන්තෝ පන අතීතානන්තරතොපරං සරිතුං අසක්කොන්තෝ
භගවතා කම්මංකත්වා ඉධනිබ්බත්තොතාසමීති සඤ්ඤාය තස්ස
චාදං උපච්ඡින්දන්තෝ ඉදං යථා භද්දසෙනාති මබ්‍රවී''ති.

අලාතකම්මං සෙනෙවියාගේ විපරිනදෘෂ්ටි තථාවසි 33.

බිජකනම්දූසකයාගේ කථාව.

34 ඒට අනතුරුව අවෙලක කාශ්‍යපයාගේ හා අලාතකම්
සෙනෙවියාගේත් විපරීතවාදය අසමින් ඒසහා කෙළවරසිරියාවූ
බිජකනම් දූසකතෙමේ මහත් ශබ්දයෙන් හඬත්තවවන්ත එකල්හි
අඟතිනම්රජතෙමේ ඒ බිජකයාගේ හැඬීම අසා මේ පුරුෂයාතෙම
යම්කිසි රොගාබාධයක් වැළඳී නොඉවසියහැකි වේදනාවකින් හඬන්
නේද එසේනැතහොත් අන්කිසි කාරණයක් නිසා හඬන්නේදැයි
සිතා එපාපහඬන්නාවූ කාරණය නොවළඟා කියවයි විචාළේයි.
ඉක්බිති බිජකනම්දූසකතෙමේ රජහුගේ වචනය අසා තමාහැඬුකාර
ණය නොවළඟා ඔහුනුයේ මේ මතුකියනු ලබන ගාථාපන්තිය කීහ.

"භවදෙහස්ස වචොසුත්වා බීජකො එතදබ්‍රවි
නත්ථි භවදනාදුක්ඛා මහාරාජ සුණොහි මෙ.....

අහම්පි පුරිඤ්ජානිං සරාමි සුඛමත්තනො
සාකෙතෙහං පුරෙආසිං භාවසෙසි ගුණෙරතෝ.....

සම්මතා බ්‍රාහ්මණ්ඩභානං සංඝ්භාගරතා සුචි
නවාපි පාපකංකම්මං සරාමි කතමත්තනො.....

තතෝ චුතොහං චෙදෙහ ඉධජාතෝ දුරිත්තියා
ගබ්භම්හි කුම්භදාසියා යතොජාතෝ සුද්ධගහතා.....

එවමපිදුග්ගතා සන්තා සම්චරියං අධිසිතා
උපඩ්ඪභාගං භත්තස්ස දදාමියොමෙ ඉච්ඡති.....

චාතුද්දසී පණ්ණරසී සදා උපවසාමහං
නවාපි භූතහිංසාමී එථය්‍යචාපි විවජ්ජයී.....

සච්චමෙවහිනුඤ්ඤතං සුවිණ්ණංහවති නිප්ඵලං
නිරත්ථංඉඤ්ඣදිදංසීලං අලාතා හායතීයථා.....

කලිඞ්ගවචනුන්ගණ්හාම් අසිඤ්ඡාධිත්තඤකායථා
කථං අලාතෙතා ගණ්හාති කිතඤවාසිකකිතායථා
වාරංනිපඤිපසස්සාම් යෙනඤවජ්ඣාම් සුගහනිං
තස්මාරාජපරොදාම් සූචිවාකසසපහාසිතං" ති

මෙහි භාවය මෙසේයි.

මහණෙනි එසමයෙහි කාශ්‍යපයන්වහන්සේ මිථ්‍යාදෘෂ්ටිය ඇසුරු කිරීම නම්වූ ස්වභාවයෙන් අහානිරජහට සැලකෙල්ලි විඳෙහාධිපතිහුගේ වචනය අසා බිජකනාම් දැසි තෙමේ මම මතුකියනුලබන වචනයකියහ. මහරජමාගේ වචනයඇසුවමැනව මහරජිඳුංවෙන්වහන්සේ මවචනාභිප්‍රායාබාධයකින් භවගත් දුක්වේදනාවක්ද නැත්තේය මමද සුවසේ පූජිජාතිය සිහිකරම් මිටපෙර ජාතියෙහි මම සාගෙතනගම ක්‍රුවර මහධනසැපත් ඇතතාවූ සිට්ඨපුත්‍රයෙක්ව උපනිම් සීලාදිගුණයෙහි ඇළුනාවූ මම ශ්‍රමණ බ්‍රාහ්මණයන් විසින් සාධු සත්පුරුෂයෙකැයි සම්මතකරණලැබුයෙම් දන්දීමෙහිද දන්බෙදීමෙහිද ඇලී වාසයකළෙම් පවිත්‍රවූ පැවතුම් ඇත්තේවීම් තමන් විසින් කරණලද කිසියම් පාපකර්මයකුදු නොම සිහිකරම් පින්වත් විඳෙහාධිපති මහරජිඳුරුවන්වහන්ස එබඳු කුසල් රැස්කළාවූ මම ඒසාගෙතන ක්‍රුවරින් චුතව අවුත් මේ මියුළුනුවර ගුදුවූ කුඹල් කෙල්ලගේ කුස පිළිසිඳගනිම් මමවනාත් උපන්දවසපටන් අතිශයින් බැගැපත්ව දවස්යවම මේසේ අතිශයින් දුප්පත්වූයේද මම මිට පූජිජාතියෙහි සත්හුන් සිත්ඇතිව ගඟපත්වූ සුචරිතක්‍රියාවෙහි හැසුරුණෙම් යමෙක්තෙමේ මාඅතින් ආභරණක් ඉල්වන්නේනම් මාගේ ආභරණයන් කොටසක් මම ඔහුට දන්දුනිම් මම වනාහි සියළුකල්හි තුදුස්වක් පසළොස්වක් දවස්හි උපෝසථසීල විසුයෙම් එසේම සැවිත්තාවද තොකෙළෙම් මෙරමා අසන් වෙතතුදු පැහැර නොගනිම් මවෙහෙ මොහොවට රැස්කරණලද්දුවූ සියළුම සුචරිතකර්මය නිෂ්ඵලවිය එහෙයින් සත්‍යවශයෙන්ම සුචරිත කුශලකර්මය ඉෂ්ටවිපාකයක් නැත්තේ තොවේද? අලාතෙතා සෙතවිඤතමෙ යම්යම් පරිද්දෙකින් කුශලකර්මය නිෂ්ඵලයැයිවේද ඒ ඒ ආකාරයෙන්ම ඒකාන්තයෙන් නිෂ්ඵලතොවූවේද? එබැවින් මේ ශීලය ඉෂ්ටවිපාක නැත්තේයි මම සිතමිහසි කියේයි.

දුසෙළි ශිල්පය මතාසේ හුනත් අඳුනාවූ අසෂ්ඨුතිතෙමේ පරාදුනස ඇවිදින්නාක් මෙන් මම යහපත් සුචරිතක්‍රියාවෙන් කිරිමෙන් පරාදුයක්ම ගත්තේතොවේද? දුසෙළි ශිල්පය

මොනවිට උගත් දක්ෂවූ අක්ෂදෙවතෙමේ දිනුම්පස ඇවමනත් නාක්මත් අලාභ සෙමනවිතතමේ පාපග්‍රියාමකාව පය්කම්සැප විඳිමෙන් ජයක්ම ගත්තේ මනාමවිද ? මහරජ්ජුරුවන්වහන්ස යමසේ කිසියම් දෙරට්ටුවකින් සමනීයව යන්නේමවිද ඒ දෙරට්ටුව මම මනාදකිම්ද එහෙයින් පින්වත් කාශ්‍යපයාණන්ගේ වචනය අසා මම හැඩිණයම්. මහරජ්ජුරුවන්වහන්සැයි කීන මම බිජකනම් දුසමතමමේද අලාභනම් සෙමනවියාමෙන්ම පුළුවනයි එකව අනතුරු අත්බැවක්ම දක්නා ජාතිස්මරඥාණඇතෙකැක්වූමය්ය එහෙයින් අනතුරු ජාතිමයනි සාමකතනම් නුවර අසූමකළක් ධනඇතනාවූ මහධන සිටුව උපන් අත්බැවෙම් දක්මය්ය එයින් චුතව අවුත් චතීමා න භවමයනි දුකඩිනවූ කුඹල්නෙලල කුස උපන්බව ප්‍රතිසන්ධිව දක් මන්ය අනතුරු අත්බැවිහි කරණලද්දවූ කුසලකම්බලමයත් මේ අත්බැවිනි කුඹල් මකල්ලගේ කුසඋපන්මනම්හි හෙතුඵල සඹඩිය වරදවා සිතා අමවලක කාශ්‍යපයාණන් හා අලාභනම් සමනවියාගේද බිජඅසා වරදවූ දෘෂ්ටිගෙණ මහත්හඩින් හැඬුමය්හි කුඹල්මකලලගේ කුසතුපිද මනන්වූ දුකවපත්වූ කම්ය මමයේහි සාමකතනුවර මහධනසිටුව ඉපදීමට පරාතුවූ තුන්මවනිජාතිමයහි සීයා ජීවත්වන්නාවූ මගාවිමයක්ව ඉපිද එක්දවසක් සිසා මගොන්මගේ මුදු තනඛිමටකැර නැවත මගොන්මගේ මසායාඝනකලු එක් ගවමයක් නැතිබව දැනවනමයනි ඇවිද මවමහමව ගවයා නොදක මනාසතුටු සිනින් ඉන්නාකල්හි කසුප් බුදුන්මගේ සසුන්වැද පැවිදිවූ මංමුළාවූ එන්තරා යිකෂූවක්තෙමේ එබා උපාසකයෙනි මීම වනාහි මංමුළාවූ මයම්මව මාගිය දක්වපසි කීන. ඒ මගොවිතෙමේ මගාණු නොදැක මහාසතුටුව මවමහාවපත්වහුන් බැවින් භික්ෂූහුමගේ වචනයට කන් මනාමයාමා තුෂ්ණීම්භූතවහුන්නේයනැවතත් ඒ භික්ෂූනතමේ මාගිය විවාළකල්හි එකාළ මහණ දුසමයෝනම් රඵපරුෂවචන ඇත්තාහ නොපමගේද වචන රඵපරුස බැවින් මතාපිත් දුසමයක් වියහුතුයයි ඒ භික්ෂූනට ආමක්‍රොශ පරිභව බිණුමය්ය එතකුදුවුවත් ඒ භවමයන් චුතවනකල්හි ඒ කම්ය විපාකදීමට අවසර නොලද්දෙන් ඊට වඩා බැරෑරුම් කුශලකම්යන්මගේ විපාකාවසරයලැබ සාමකතනම් නුවර අසූමකළක් වයකුවඇතාවූ මහධනසිටුව උපන්නේය ඒ ආත්මභා වමයහිද දුනවානාදී මනාමයෙක් කුසල් රැස්කළනමුදු ෂඩසන්නකාල මයහි ඒ මනන් කුසලකම්යන්මගේ විපාකාවසරය මනාලැබ සිල්වත් ගුණවත් භික්ෂූනට ආමක්‍රොශ පරිභවකළාවූ අකුශලකම්මයන් පෙළ

නලද දුම්ල කාමාවචර කුසලඤාණ හෙතුවෙන් දැකීනවු කුඛිල්මනල් ලගේ කුසඋපන්නේයි. එතකුදුවුවත් ඒ උපපීළක අකුශලකර්මය නොදැක අනාතුරු අත්බැව්හි රැස්කළාවූ දානාදිකුසලකර්මාරාධිත්ව දැන ඒ කුසල් රැස්කොටත් මෙබඳු නීචකුලයෙහි උපන්හෙවේදැයි විරදවා සිතා මහත්ශබ්දනහා හැඬුවේය. එයින් කිහ ජාතකඅට්ඨවා යෙහි.

"සොකිර පුබ්බ කසසපබුද්ධකාලෙ අරඤ්ඤනසං බලිවද්දං ගමවසමානෙ එකොනමඝ මුල්ගහන ඔකඛිනා මඝං පූජාතුණිහි හුත්වා පුනමතනපුවිතතා කුජ්ඣිත්වා සමණදුසා නාමෙතෙ මුඛරාහෙ නති දුසෙනතු තයා භවිතබ්බං අනිමුඛරා සිති ආහ තංකම්මං තදවිපාකං අදතවා, හසමවශ්‍යෙනාවිය පාවෙකා සීතං මරණසමයෙ අඤ්ඤං කම්මං උපඨාසි සෙ යථාකම්මං සංසාර සංසරනෙතා එකසස කුසල කම්මසසබලෙන සාකෙතෙ වුත්තනපපකාරෙ සෙසිහුත්වා, දානාදිනි පුඤ්ඤානිඅකාසි තමපනසස කම්මංපඨවියං නිහිතනිධිවියසිතං ඔකා සං ලභිත්වා, විපාකං දසසති යමපනතෙනතං භික්ඛුං අමඤ්ඤා ඤන්තෙන කාහං පාපකම්මං තවසසතඤ්ඤං අත්තභාවෙ විපාකං අදසි සසා අජානනෙනා ඉතරසස කලාණකම්මසස බලෙන කුමහදසියා කුවජිමිත් නිබබතතාසම්භවි සඤ්ඤය එවමාහ"

මෙසේ බිජකනාම දැසයාගේ දෘෂ්ටි විපරිතය දතයුතුයි. මෙසේ එකමජානියක් පමණක් සිහිකරන්නට පොහොසත්වූ ජාතිස්මරඥානී ණැති තුන්දෙනකුගේ දෘෂ්ටි විපරිතය අසා, අභාතිරජහුගේ හෘදය දෘෂ්ටි සල්ලයෙන් විදුනාලද්දේ අපි චතාහි පසුනියකාලයෙහි නිෂ්ප ඡොජනවූ පෙහෙවස් රැකීමි දන්දීමාදියෙහි ව්‍යාවෘතවූමිහ අයයාච මයහි වසතු විනාශකොට ශරීරයට දුක්දුන්නුමිහ අප විසින් රැස්ක ළාවූ සියළු කුසල් ගලපිට ශසත්‍රවැපිරීමක් වැන්න මහාපමණ කුසල ධර්මයෙහි හැසුරුනේ විනමුදු මහාකල්ප සුවාසුවක් ඉක්මවාමුත් අන්කිසි ප්‍රතිපත්තියකින් සසරින් නොමිදෙන්නෙමුය එබැවින් අපි විසින් ලබනලද පස්කම්සැපය අනලස්වවිත්ද යුතුය බිජක දැසාදි යහළුවන් තුන්දෙනාගේ දෘෂ්ටිය සමානයයි ප්‍රකාශකරණු පිණිස මෙසේ ගාථාවෙන් කිහ.

"බිජකසසවචොසුත්වා, රාජාඅහාතිමබ්‍රවී
නත්ථිවාරං සුගහාසා, නියතිකඤ්ච බිජක...

සුඛංවා යදිවාදුක්ඛං, නියතේයාකිර ලභතී,
සංසාර සුඛිසම්බබ්ඛසං, මාතුරිච්ඡතා අනාගතෙ,
අහම්පි පුඤ්ඤ ආලය්‍යාණා, බ්‍රාහ්මණිබ්භාසුව්‍යාවරෙවා,
ඉවාහාර මනුසාසත්තෙතා, රහිනිඝනාතදනන්තරා" සී.

මෙනි භාවය,

මහණෙනි අහානි රජතෙමේ බිජකනම් දුසයාගේ වචනය අසා මේ මතු ප්‍රකාශවන ගාථාත්‍රයෙන් මෙසේකියේය එඹල බිජකණ සුනතියට යන්නාවු වාරයෙක් මහාහොත් කුසලකම් සංඛ්‍යාතවූ මෙතුවක්කාම් නැත්තේමය නියතගතියම හෙවත් එකාන්තවම සැමතිවෙව එඹල බිජකය නිවිබ සැපයද සංසාරදුකසද සංසාර යෙහි නියමය වශයෙන්ම ලබන්නේය සියළු සත්ත්වයන්ගේම සංසාර ශුද්ධිය ලැබෙන්නේමය අනාගතයෙහි චුල්ලාසිති කල්ප සංඛ්‍යාතවූ මහාකල්ප සුවාසුවක් ගෙවෙනතුරු නොලැබෙන්නේමය මේද මිට පූර්වයයි කුසලකම්ය ඇතැයි සිතා ශ්‍රමණ බ්‍රාහ්මණාදීන්කෙරෙහි දූනැමීන් අධිකරණ විනිශ්චයකිරීමෙනි නිෂ්ඵනවූයෙම් ලොකයාට අනුශාසනාකරන්නාවූ මම ඒ අනුශාසනාකාලයෙහි පස්කම්සැප විඳීමෙනි ඇළුම්නොකොට මුළාවූයෙමිමි. යනාදීන් කියා අහාතිරජ් තෙමේ ඔවුන්ගේ මිථ්‍යාදෘෂ්ටිය සමානබව ප්‍රකාශකොට එබා කාෂ්‍ය පය තොපගේ සම්පත්හි බොහෝවිලා ප්‍රමාදවීමෙන් හෝ නැවත තොපකරා පැමිණීමෙන් හෝ තොපි සෙවනහජ්නාදියකිරීමෙන් හෝ නොපට ගෞරවකිරීමෙන් හෝ තොපට දූනමානාදියකිරීමෙන් හෝ අපට කිසි ප්‍රයෝජනයක් නැත්තේය එහෙයින් මිත්මතු තොප කරා ඒමට අවකාශ නැතැයි කියා ග්‍රහස්තෙන් නැගිට පළමු පැමිණි වේළඟි වෙන් ඔහුව නමස්කාර කොට රාජභවනයට පිවත්ව ගියේය අනිබාලවූ නිච්චිකාජීවකයාගේ මිථ්‍යාධම්ම දෙශනාවවනානි ධම්මුද්ධිච්චය කොදන්දුත්‍රුවාසයකු වීසින් විදුනාලද නියෙන් පළමු කොට දූත්‍රුවාසාගේ අනස්ථුරුකරගන්නාක්මෙන්ද ගිනිගානා දඩෙන් නසින්නාවූ වඹ්නිය පළමුකොට ඒ ගිනිගානා දඩ දවන්නාක් මෙන්ද තමන්ටම විපාකදී දූනාපකරණාදි ලාභසත්කාර නබා ඇදිලිබැඳීම් මාත්‍රයකුත් නොලැබ තමාගේ මිථ්‍යාධම්ම දෙශනාව තමන්ටම අනර්ථ පිණිසවූයේයි. අනාන් රජතෙමේ වඳනදරුමය රාජභවනයට වැද ඉල්මය අවපැළඳිය දවසපවත් සතරවාසල නිති දත් මැට පවුත්වන්නාවූ දාස්සල් කඩාකිඳුවා පියා රාජ්‍යානුශාසනා කිරීව අවශ්‍යයන්ට පාවාදී නගරයෙහි සියළුතන්හි සඟවාමිකවූ

කුලසන්නීන් හා අවිවාහකවූ කන්‍යාසන්නීන්ද බලාත්කාරයෙන් ගෙන්වා ගණ සූරාවදින්මත්ව දශරාජධර්මයෙන් තොරව තොයෙක් පව් කිරීම් කරන්නට පටන්ගත්තේයි එසමයෙහි සියලු මියුළු නුවරවාසීහු විාගේ අඹුවාරජු විසින් පැහැරගත්තේලදැයි මාගේ දියනියක රජු විසින් පැහැරගන්නාලද්දේය. මාගේ වසතුව රජු විසින් පැහැරගන්නා ලද්දේයයි මෙසේගෙන්ගොස රැස්වෙමින් මහජනයා අතර හටගත් මහත් කොලාහල ශබ්දයෙන් මුළුනගරයම කැලඹුනේයි ඒකුණ්‍යයෝ ලෙහි අත්පැහැර ගඩන්නටවන්හ ධර්ම්ය නැතිවිගියේයයි මුළුනගර යම එකනින් කොලාහලවිය රජක්නැතතාවූ අරාජික රටක්මෙන් රටවැස්සෝ මහත්භයට සන්ත්‍රාශයට පැමිණියාහුය මෙසේ අගාති රජහුගේ දුෂ්ටිය පෙරළීමෙන් රටවිනාශවුනියාව දතයුතුයි.

අගාති රාජ දෘෂ්ටි විපර්යාස නිර්දේශයයි. 34.

රුවා කුමාරිකාවගේ ධර්මදේශනාව.

35 මෙසේ පෘථිවීශ්වරවූ රටවාසීසියල්ලන්ටම එක්වන් ප්‍රතිඅධිකාරවූ අගාතිරජහුගේ දුෂ්ටිය පෙරළී අධර්මයෙන්හා බලාත්කාරයෙන් රට පෙළන්නට පටන්ගත්බැවින් රටවැස්සෝ තන්හි තන්හි මුළුමුළුව හඬන්නට වලප්නට පටන්ගත්කල්හි රුවානම් රාජකුමාරිකාතොමෝ එපවත් අසා මාගේ පියමහරජ්ජුරුවන්වහන්සේ ධර්මයෙන් තොරව රටපෙළන්නට පටන්ගත්තේල මපියාණන්වහන්සේගේ මිථ්‍යාදෘෂ්ටිය හරවන්නට පොහොසත් කිසිවෙක් මානැරනැතැයි සිතා මපියාණන්වහන්සේ පාපමිත්‍ර සංසර්ගය හේතුකොටගෙණ මිථ්‍යාදෘෂ්ටිනැමති සල්ලයෙන් විදුනාලදුව ආතුරව සිටියි. මේ දෘෂ්ටි සල්ලොද්ධරණයකොට පෙරමෙන් සම්‍යක් ප්‍රතිපත්තියට පමුණුවන්නට මේ සුදුසු කලැයි දැන පියරජ්ජුරුවන් වසන වන්දන දරුමය ප්‍රාශාදයට ගියේයි. ඒ රාජකුමාරිකාව රජමාලිගාවට එතබව දුරදීම දැක මාවියින් සොයාගන්නාලද අභිඥව දෘෂ්ටිය මාගේ දියනියන්ටද ලහන්වාලමි සිතා, රාජකුමාරිකාවට ආමන්ත්‍රණයකොට මෙසේ කිහ වලාපවලයෙන් මුකතවූ පුන්සඳ මඩලක්වැනි මුඛයක් ඇතතාවූ මාගේ ප්‍රිය දියනියෙනි සියළුසත්වයන්ගේ හටගැන්මට මූල හේතුභූතවූ සප්තධාතූන් අතුරෙන් සැපදුක් දෙක අහේතුකව අවසර ලැබුකල්හිම හටගන්නාහුය සැපදුක්දීමට අනික් විශේෂහේතුවක් නැත්තේය. එබැවින් මාගේ ප්‍රිය දියනියෙනි මේ දැන් පුස්කම්සැප

පිදුවව සුදුසු අවසරයෙහි මාළිගින් නොපව් දෙනලද රන්රිදී මුතු මැණික් සංඛශිලාප්‍රවාලාදි සප්තවිධ රත්නයෙන් නිමවනලද අසන කපුකාර ආභරණයන් සැරසී රත්සඳුන් සුදුසඳුන් අගිල් දේවදාර ආදියෙන් දෙනලද සවඳ දුම්හා සපුනාපනාදූ සමන් ඉද්ද බොලිද්ද ආදිවන පුෂ්පයෙන් හා රතුපුල් නිල්පුල් රත්පියුම් මහළුපියුම් හෙල් මැලිආදි ජලජ පුෂ්පයෙන්ද සරසනලද සුවපහස් කොටව මෙවට ඇදඇතිරි ආදියෙහි සැහපිමෙණ රත්හැල් සැවදු හැල්ගොධුම තිරිහු ආදිය හා දියගොඩ නොයෙක් මත්ස්‍යමාංශ රසයන්ද අඹදඹ පළුවිර මොර දෙසි දෙඩන් ආදි ඉධුර ඵලාඵල ජාතින්ද කිරිතිතෙල් දීමෝ රු වෙඩරු උක්සකුරු මිපැණි ආදි මධුර රසයන්ද සිත්වූ පරිද්දෙන් අනුභවකරවමින් ආතාවිතත සංඛපණවාදි අනෙක ප්‍රකාර තූර්‍යශබ්ද හා වස්කුළල් වීණාතිනිකාදිශබ්දයන් අසමින් දිව්‍යප්සරාවන් පරයන රූපශ්‍රීන් සුකතා තරුණ සඟින් පිරිවරා මනොමයක් රන්නාලෝකයෙන් විචිත්‍රවූ නොමයක් භූමිඇතතාවූ දිව්‍ය ප්‍රාසාදයන්ට අපගසකරන් නාක්වැනිවූ රාජභවනයෙහි සිත්අලවා වාසයකරමින් දිවාරෑදෙක්හි අප්‍රමාදව දිවිහිමිකොට පස්කම්සැපයම අනුභවකරව පඤ්චකාමයෙහි සිත්අලවා වාසයකරව වසතුවියදන්කොට කිසිම අර්ථයක් නැත්තාවූ විපාකනැත්තාවූ දුනමානාදි කුශලක්‍රියාවෙහි ප්‍රමාදනොවව ආයා රෝපණවශිදයෙන් ශරීරයට දුක්දෙන්නාවූ වෙනෙසකරන්නාවූ පෙ මහටස් මහාරකුව දන්දීම් සිල්රැකීම් ආදිවූ ක්‍රියාවෝ සුගතියට යාහු හු ඥානය නොවෙයි මහාකල්ප සුදානුවඟන් තොපි සඟ අපිත් සං සාරගුබ්ධ ලබමිහ. යහපත් කුශලක්‍රියාවන් රැස්කළේද පාපක්‍රියාවන් රැස්කළේද ඒ වුලුලාශිනි මහාකල්පය නොඅවසන් ඒකාන්තයෙන්ම සැපයක් නොලබමිහයි කීසේක. මේ කථාප්‍රවෘත්ති ඇසූ රුවානවා රාජකුමාරිකාතොමෝ තමන්ගේ ජාතියමර නුවණින් තමන් විසින් දක්නාලද අතීතයෙහි ජාති සතෙක අනාගතයෙහි ජාතිසතෙකාහි යන තුදුස ජාතිය උදාහරණකොට දක්වා පියමහරජහට අනුශාස නාකරණ්‍ඩපිණිය පළමුකොට පාපමිත්‍ර සංසර්ගය හේතුකොටගෙණ ගන්නාලද මිථ්‍යාදෘෂ්ටියෙහි දෙසෙදක්වනුයේමෙසේ කීහ.

මහරජ්ජරුවන්වහන්ස මිනිරිවු අඹරුණ කිරිඅඟුණෙවැලි වැලදගැණිමෙන් ඒ මධුර රසය විනාශවී නිකතරසවූ අඹපල ගන් නාක්මෙන් අඩිබාල ඵලිතයන් දුරින් දුරුකවයුතුවුවද එසේ දුරුනොකොට සෙවනභජනාදිය කරන්නාවූ යහපත් නුවණැති සත්පුරුෂයෝපවා ඒ අඩිබාල දුර්ජනයෝවෙත්යයි පුර්වයෙහි අසන ලද වචනය දැන් සැබෑබව ප්‍රත්‍යක්ෂවිය දන්වනාහි නියත මිථ්‍යාදෘෂ්ටි ගන්නාවූ විලිබිය දුරුකොට නග්නවසිටින්නාවූ අඩිබාල නිර්ලජ්ජයා කරා අසුනවූ අලාභනම් සෙනෙවියාගේ බසට රුවටිගොස් මහියාණ න්වහන්සේද ඒ අන්ධබාලයන්ට සමානවූයේය රාජධර්මනැමති මධු

ර රසයෙන් පහවූයේය දුර්ගන්ධයෙන් පිරුනාලද්දාවූ මියාණන්ව හන්සේ බිලිය ගිලගත් මත්ස්‍යයෙකුමෙන් දුර්ගතිනමැති බිලියෙන් දුන සේ මිදියයුතුය ඉදින් මේ මහාසාවද්‍යවූ නියත මිථ්‍යාදෘෂ්ටිය මියා ණන්වහන්සේ විසින් නොහළේවීනම් අවීචි මහානරකයෙන් ගොඩ ඒමෙක්නම් නැත්තේයයි කියා මත්තෙහිදු මේ මතුදක්වන ගාථාවන් හෙත් අවවාද දුන්හ.

"වෙදෙහස්ස වචොසුත්වා, රුචාරුචිර වණ්ණිනි
ජානාංපුබ්බ, පරංබ්‍රහ්මං, පිතරං එතදබ්‍රවි
සුතමෙව පුරෙආසි, පචචකඛ දිසම්දංමයා
බාඵපසෙවීසාහොති, බාලොවසම්පසංසති"

යනාදි ගාථාවන්හෙන් ධර්මදේශනාකළසේකි එහි භාවය මෙ සේයි.

මහණෙනි එසමයෙහි විදෙහ රටට නායකවූ අභාතිරජහුගේ වචනය අසා සිත්කළු ශරීරවර්ණී ඇත්තාවූ රුචානම් රාජකුමාරිකා තොමෝ අනීත අනාගතයෙහි තුදුස්ජාතියක පැවති සවභාව දන්නේ පියරජහට මෙසේ අවවාදදුන්හ පියරජ්ජුරුවනි සමෙක් අඤ්ඤබාලයන් සේවනයකළේවිනම් මහතම අඥානයෙක්මවෙයි යන වචනය පුර්වයෙහි මාවිසින් අසනලද්දේය. දන්වනාහි ඒ සැබෑබව ප්‍රත්‍යක්ෂවදුටුයෙමි පියරජ්ජුරුවෙනි ඒ කාරණය සැබෑමය අඥානතෙ මේ අඥානයාකරා එලඹ අතිශයින් මුළාවට පැමිණෙන්නේය අලාත නම් සෙනෙවිය බිජකනම් දූසය කාෂ්‍යපනම් ආජීවකය යන අඥාන බාලයන් තුන්දෙනකු හා එක්වූ බැවින් අතිශයින් මුළාවන්නටම සුදුසුය මපියාණන්වහන්සේ හුවණැන්තේය. සතිරවූ ප්‍රඥාවන්තේය පැණවත් බැවින් හෙතුඵල සඞ්ඛ්‍යා දැනීමෙහි දක්ෂසේක කුමක්හෙ සින් මේ අඥානබාලයන් සමන එබදු අඤ්ඤබාලවූ ආජීවකයාකරා ඵල ඕඉස්ද ? පියාණන්වහන්ස සංසාරශුද්ධිය මහාකල්ප සුවාසුවක් හුගේ ඇවෑමෙන් වන්නේයයි කියා පුරාතනයෙහි වරදවූ මිථ්‍යාදෘෂ්ටිය පිළිගැණීමෙන් බොහෝ මනුෂ්‍යයෝ කම්සක් නැතැයි යන නාස්තික මිථ්‍යා දෘෂ්ටිගත්තාහුය පළමුකොටගන්නාලද පරාජය සංඛ්‍යාතවූ අවීය අවීයෙන් ගුණ්‍යවූසේමවෙයි කුමක්මෙන්දයත් ? බිලියගිල ගත් මත්ස්‍යයාහට ඒ බිලිය මුදවාගැනනොහැකිවාක්මෙන් මිථ්‍යා දෘෂ්ටිය වැලඳගත් අඥානයන්ට ඒ දෘෂ්ටියෙන් මිදිය නොහැක්කාහුම යයි කියා මත්තෙහිද පියරජහට අවවාද කරන්නේය මෙසේ කියමි

මපියාණන්වහන්ස මේ ලෝකයෙහි ඇතම් ප්‍රාඥයෝ උපමාවෙනුදු අර්ථාවබෝධයකරන්නාහුය එබැවින් නුඹවහන්සේට උපමාවෙන් මේ අර්ථය ප්‍රකාශකරන්නෙමි අලාතනම් සෙනවිගේ පූර්ව්‍යජාති චරිතය උපමාවිශෂයෙන් ප්‍රකාශකරමිහි කියා මේ ගාථාවන්ගෙන් අනුශාසනාකළේය.

"උපමංතෙකරිස්සාමි, ඉධාරාජතදිච්ඡිය
උපමායපිඒකච්චෙ, අත්ථංජානන්ති පණ්ඩිතා
වාණිජ්ජානං යථානාවා, අප්පමාණ භාරංගරුං
අතිහාරං සවාදය, අණණංව අවසීදති"සී

යනාදින් පියරජ්ජුරුවෙනි නුඹවහන්සේට වැඩපිණිස උපමා වක් දක්වමි උපමා වෙනුදු මේ ලොකයෙහි නුවණැත්තෝ අර්ථාව බොධයකරති ඒ කවර උපමාවෙක්දයත් ? මේ ලොකයෙහි වෙළඳජ නයාගේ අප්‍රමාණ බරපටවනලද්දාවූ නාවූකාතොමෝ ගරුවූ මහත් බර නොතුකොට්ගෙණ මහාසමුද්‍රයෙහි නිදුබස්නේය එපරිද්දෙන්ම අකුශලකර්මයන් මදින්මද රැස්කරන්නාවූ සත්ත්වතෙමේ ඒ සුළුපාපකර්ම යන්ගේ රැස්වීමෙන් අනිශයින් බරවීමෙන් නරකයෙහි යටබස්නේය පෘථිවීශ්වරයන්වහන්ස යම් අකුශලකර්මයක් කරණකොටගෙණ දුග තියටයේද එබදු අකුශලකර්මයන් අලාතනම් සෙනවිතෙමේ පූර්ව්‍යජාති යෙහි රැස්කෙළේය එතකුදුවුවත් ඒ අකුශලකර්ම භාරය යම්තාක් සම්පූර්ණනොවූයේද ඒතාක්කල් දුගතියට නොයන්නේය පෘථිවීශ්වර යාණෙනි ඒ අලාත නෙමේ පූර්ව්‍යජාතියෙහි කුසල්කරණලද්දේය දේව යන්වහන්ස ඒ අලාතනෙමේ දැන් යම් සැපයක් ලැබුවේද ඒ සැපය ඒ කුශලකර්මයාගේ විපාකවන්නේය දෙවයනි අලාතයාගේ ඒ කුස ලකර්මය මේ ආත්මයෙහි ඉවීයන්නේය එසේ පින්ගැවිගිය්‍යකල්හි මේ අලාත නෙමේ උත්තරාගිය හැර විසමමාගී සංඛ්‍යාතවූ නරකයට බස්නේය මෙසේ අලාතයාගේ කුසලාකුසලකර්මයන් උපමාවෙන් දක්වා දැන් බීජකයාගේ කුසලා කුසලකර්මයන් දක්වනුපිණිස මේ ගාථාවන්ගෙන් ධර්මදේශනාකළහ—

"තුලාසථා පග්ගහිතා ඔහිතෙ තුල මණ්ඩලෙ
උන්නමෙති තුලාසීසං, භාරෙ ඔරොපිතෙයති
එවමේව නරොප්‍රඤ්ඤං, ථොකං ථොකම්පි ආචිණං
සග්ගාධිවාහනොදසොච, බීජකසා යාතවෙ රතෝ"සී

මෙහිභාවය මෙසේයි.

යම්සේ තරාදියෙන් යම් කිසි ද්‍රව්‍යයක් කිරන්නාවූකල්හි තරාදියෙහිබහනලද්දාවූ ද්‍රව්‍යභාරය නිස්වූකල්හි තුලා ශීර්ෂය උඩට

නිද එපරිද්දෙන්ම යහපත්වූ කුශලධර්මය මදිහ්ද රැස්කරන්නාවූ මනුෂ්‍යත්වයේ අකුසල්නාමැති බර බහාතබා කුසලකර්මනමැති ශීර්ෂ ඔසවා දෙව්ලෝනගින්නෙහි. එබැවින් මේ බීජකනම් දුසතෙවේද සවගීලොකය කැමතිව කුශලධර්මයෙහි ඇළෙන්ය. ඒ බීජකනම් දුස තෙමේ මෙසින් වුතව දෙව්ලොව උපදනේය පියරජ්ජුරුවන්වහන්ස බීජකනම් දුසතෙමේ මේජාතිභයහි යම්දුකක් අනුභවකරන්නේවේද ඒ දුකවනාහි පූර්වජාතිභයහි බීජකයා විසින් රැස්කරණලද අකුශල කර්මයාගේ විපාකවෙයි. පියරජ්ජුරුවන්වහන්ස බීජකයා විසින් පූර්වජාතියෙහි රැස්කරණලද යම් පාපකර්මයක්වේද ඒ පාපකර්ම මේ ජාතියෙහිම භෙවිනියේය ඒ පාපකර්මය භෙවිනිය බැවින් සිල්රකුනාකිරී මෙහි ඇළෙන්ය මාගේ සවාමිවූ පියාණන්වහන්ස අඩබාලවූ කාශ්‍යප නම් ආජීවකයාගේ බස් අසා අපායමාගීයට නොපිළිපදුවහි මෙසේ රුවානම් රාජකුමාරිකාභෙත්තෙමෝ අලාතනම් භසභෙවියාහා බීජකනම් දුසයා විසින් පූර්වජාතියෙහි රැස්කරණලද අකුශලකර්මයන් ප්‍රකාශ කොට තමන්ගේ අතීතභයෙහි ඔත්ජාතියක අනාගතභයෙහි සත්ජාති යකැහි යන තුදුස්ජාතිභයෙක විඳිනුලැබුවාවූද මතුවිඳින්නාවූද සුව දුක් ජාතිස්මරඥාණයෙන් සිහිකළහැකිබැවින් අතීතභයෙහි සත්ජාති යෙක තමන් විසින් විඳිනලද්දාවූ සුවදුක් ප්‍රකාශකොට ධර්මදේශනා කරණු පිණිස මේ මතුකියන ගාථාවන් ප්‍රකාශකළේයි.

"යාමෙසා සහත්‍රම්ජානි, අහුප්‍රුබෙබ නරාධිප
කම්මාරපුත්තාමගධෙ, අහුරාජගහෙපුරෙ.....
පාපංසහායමාගම්ම, බහුපාපං කතං මයා
පරදාරස්ස පොත්‍රෙහනා, චරිත්‍රිඝ අමරාවිය" යි.....

මෙහිභාවය.

නරශ්‍රේෂ්ඨවූ මහියාණන්වහන්ස මම මීට සත්වන ජාතියෙහි මගධරට රජගහනුවර සවණිකාරපුත්‍රභෙක්ව උපනිමි. නරදෙවයන් වහන්ස සවණිකාර පුත්‍රව උපන්නාවූ මම පාපමිත්‍ර සංසර්ගලාබ බොහෝ අකුසල් රැස්කළෙමි. පරදාරාවන් කෙරෙහි වරදවා පිළිපැදි මෙන් මරණතැනවූවන්හෙමන් හැසුරුණුම් පියමහාරජ්ජුරුවනි මා විසින් රැස්කරණලද්දාවූ ඒ අකුශලකර්මය අළුයට සැඟවීගිය ගිනිදැල් රක්ෂසුන් විධානගතවසිවිගෙහි. ඊවපසු ඒ පරදාර අකුශලකර්මයෙන් අතහරවූ කුශල කර්මබලයකින් වංශර්ට භෙනාසඹැනුවර ආඪ්‍යවූ මහධන ඇදනාවූ සිට්ඨිකුලභයෙහි සියළු සම්පත්තියට හිමිවූ එකම පුත්‍රභෙක්ව

උපනිම් ඒ සිටුකුලයෙහි උපන්ජාතියෙහි නිරනාරයෙන් සියළු මනු
ෂ්‍යයන්ට සත්කාරකෙළෙම්. මම ඒ ජාතියෙහි බහුශ්‍රැතවූ පණ්ඩිතවූ
කල්‍යාණ මිත්‍රයකුලැබ ඒ කල්‍යාණමිත්‍රයාණන් විසින් මම අර්හත්ඵලයෙහි
ධර්මයෙහි සමාදන්වනුලැබුයෙමි වාතුද්දසිපණ්ණාරසි යන පොසතාදින්හි
බොහෝරාත්‍රියක් පෙහෙවස්විසිමි ඒ භවයෙහි රැස්කරණලද්දාවූ කුශ
ලකර්ම ඵලපාලව අවසන්හි කරණලද යහපත්නිධානයක්මෙන්
යහපත්ව පිහිටියේය.

මුක්බිහි පූර්වජාතියෙහි කළාවූ පරදාර අකුශලයාගේම් අපරා
පරීය මවද්‍යඅකුශලකර්මය නැවතත් මාකරා පැමිණ හලා හල විෂයක්
අනුභවකළාක්මෙන්විය විදෙහාධිපතිවූ පියරජ්ජුරුවෙනි ඒ සකාස
ඕත්‍රවරිත් චුතවූ මම් සරෞරව නරකයෙහි ඉපිද ඒ පරදාර අකුශල
කර්මයාගේ දරුණුවිපාකවින්දෙමි. ඒ සරෞරව නරකයෙහි වින්දාවූ
දුක්සිහිකරන්නාවූ මම අතිශයින් භයුමවම්. ඒ සිහිකරන්නාවූ මට
සැපයක්නම් නැත්තේසි. මපියාණන්වහන්ස ඒ සරෞරව මහානරක
යෙහි බොහෝ වර්ෂ ගණනක් දුක්අනුභවකොට ඒ .නරකයෙන්මිදී
අවුත් එම කර්මාවශෂයාගේ ශක්තියේන්ම අනන්තගතතම්රට මහත්
ශක්තිසම්පන්නවූ එළුවෙක්ව ඉපිද බිජෝඩරණයකරණුලැබුයෙමි මද
වයන්වහන්ස ශක්තිබලසම්පන්නවූ එළුවෙක්ව උපන් මම මාගේ
සහෝදරවූ සිටුපුත්‍රයා පිටිපුදු ඉසුළුයෙම් රථයෙනුදු ඉසුළුයෙමි මේද
ඒ දරුණුවූ පරදාරකර්මයාගේ අප්‍රධානඵලයක්වෙයි ජෙතශවරවූ මහ
රජ්ජුරුවන්වහන්ස මම ඒ එළුඅත්බැවෙන් මිදී නැවතත් කර්මාලය
වතෙහි වඳුරෙක්ව ඉපිද ශුරපහිවූ වඳුරුරජ විසින් ඔහුගේ කවින්
ඩැහැගෙණ බිජෝඩරණය කරණුලැබුයෙමි. ඒ ආත්මයද පරදාරකර්ම
යාගේම නිස්සන්දඵලයවෙයි. විදෙහාධිපතිවූ මහරජ්ජුරුවෙනි ඒ වඳු
රු ආත්මයෙන් චුතවූ මම දශීනනගරට ගොමණක්ව ඉපිද බිජෝඩ
රණයකරණුලැබුයෙමි ජවබලසම්පන්නවූ මහාන්ව උපන් මම මහා
මහෝකාලයක් මුළුල්ලෙහි ගැල්ආදි බරඉසුළුයෙමි මේද ඒ පරදාර
අකුශලකර්මයාගේම අප්‍රධානවිපාකයක්වෙයි විදෙහෙශ්වරවූ මපියා
ණන්වහන්ස ඒ ගොන් ආත්මයෙන් චුතවූ මම වැදුරුව මහත් ධන
යෙන් අඩුවූ කුලයෙහි දුලීහවූ මනුෂ්‍යාත්මභාවය ලැබුණද පුරු
ෂාන්නුවූ සත්‍රීන්නුවූ නපුංශකයි ආත්මභාවයක් ලැබ උපනිම් ඒද
පරදාර අකුශලකර්මවිපාකයාගේම අමුඛවූ, අප්‍රධානඵලයක්වෙයි.

මෙසේ සවිණ්ණාගාර පුත්‍රව ඉපිද පරදුර අකුසල්කොටස් එකිනෙක් වුනාව පරදුර අකුශලය අවකාශ නොලැබ අනික් කුශලකර්මයක් අවකාශලැබ මහඩනඅඑහනාවූ සිටුකුලයෙක ඉපිද එයින් චුතවූ ආත්මයෙහි අනතුරු අත්බැවිහි කළාවූ පරදුර අකුශලකර්මය අවකාශලැබ රෞරව මහානරකයෙහි ඉපිද අනන්ත දහස්කල් මහන්වූ නිරුදුක් විඳ එයින් චුතව එම අකුශලකර්මයාගේම නිස්සන්දඵල විපාකවශයෙන් එළුවෙක්වද වදුරෙක්වද හොරණක්වද යන සතරජාතියක් හිම පරදුර අකුශලකර්මයාගේ විපාක අනුභවකොට පස්වෙනි අත්බැවිහි මිනිස්ගතුවෙන් නපුරුකවද මෙසේ ජාතිසතන ඉපිද ඒ අකුශලකර්ම විපාකවින්ද ආකාර දක්වා දැන් අනාගතයෙහි ජානිසත දක්වනුයේ මෙසේ ප්‍රකාශකළහ.

මහරජ්ජුරුවෙනි මෙසේ සත්ජාතියකින් පරදුර අකුශලකර්මය හේතුවා නපුරුකම පණ්ඩකව උපත්ජාතියෙන් චුතව තව්තිසා භවනයෙහි ශක්‍රදිව්‍යරාජයාණන්ට හා ස්ත්‍රීව සතරවරක්ද ජවණ දිව්‍යපුත්‍රයාහට භාග්‍යස්ත්‍රීව එක්වරක්ද ඉපිද රට අනතුරුව දැන් මේ භවයෙහි රුවානම් රාජධිතෘව උපනිම් මෙසේ මේ ජාතිසතයක ඉපිද චිත්තූවූ දිව්‍යමනුෂ්‍ය සම්පත්වලනාන් පරදුර අකුශලකර්මයාගේ විපාකය හේතුව කොයඹැනුවර සිටුපුතුව ඉපිද කළාවූ දානාදි කුශලකර්මයන්ගේ විපාකයමවෙහි එසේවූවේනමුදු ඒ පරදුර අකුශලකර්මවශෂයෙන් පෙළනලද්දාවූ කාමාවචර කුශලකර්මයෙන් මනුෂ්‍යත්වභාවය ලැබගණිද ලාමකවූ සත්‍රී අත්බැවම ලැබුවයම්. දැන් මේ සත්‍රී අත්බැවෙන් චුතවූකල්හි නරදුර පාපනම්වූයන් සම්ප්‍රාණිවශයන්මිදී අම්‍රපවලයෙන් මුකුතාවූ පුණ්ඩවර්ධන බිඹයක්මෙන් තව්තිසා භවනයෙහි මහානුභාවසම්පන්නවූ දිව්‍යරාජයාට උපදිම් මෙසේ සූළුවූ අතීතජාතිසතකත අනාගතජාතිසතකයි යන තුදුස්ජාතියක සතු රුවානම් රාජකුමාරව උපත්නාවූ ජාතියත් සමග ගණන්ගණන් මෙසේ කියනලද්දේනාව පණ්ඩකව උපන් ජාතියෙන්පසු ශක්‍රදිව්‍යරාජයාහට භාග්‍යස්ත්‍රීව උපන් පළමුවන ජාතිය දක්වාලද හෙයිත් ඒ ජාතිය සඳහා කියයුයි දහනුතු මෙසේ තුදුස්ජාතියක් ප්‍රකාශකොට පියමහරජහට මේවූ අකුශලනම්ය හා කුශලකර්මය මා පසුපස්සේ අත්තනාහැර ආවාක්මෙන් සියළු සත්වයන්ගේම කුසලා කුශලකර්මය පසුපස්සේ අවුත් සුගතිදුගති දෙක්හි සැපදුන් උපදවන්නේය කප්අසඞ්ඛ්‍යයක් ගිය්ද කුශලාකුශලකර්මයෝ එනාහතොවන්නාහුය මබාල්මතාවන් නානුයයි දක්වනු පිණිස—

"ඉතිකම්මානි අත්ථෙත්ති අසංඛෙය්‍යාපිජාගිණෝ
කල්‍යාණං යදිවා පාපං නාභිකම්මං විනස්සති"

යන ගාථාව කීහ.

එඹා පියරජ්ජුරුවන් වහන්ස මාවිසින් ප්‍රකාශකරණ්ලද ආකාරයෙන් කුශලා කුශලකර්මයෝතුමූ මා පසුපස්සේ නොහැර කැටුව ආවාක්මෙන් ලොකොමායි සකල සත්ත්වයන්ගේම පසුපස්සෙහි යහපත්වූ කුශලකර්මය හෝ අයහපත්වූ අකුශලකර්මය හෝ කප් අසංඛ්‍යගණන් පසුපස්සෙහි අත්නොහැර කැටුව එන්නාහුය කුශල කුශලකර්මයවනාහි කිසිකලෙක විපාකනොදී විනාශනොවන්නේමැයි. වෙනි කර්මය විනාශනොවන්නේය යනු අපරාපරිය වේදනීය කර්මයම සඳහා කියේයයි දතයුතුයි.

එහෙයින් ජාණකඅටුවාවෙහි "දිට්ඨධම්මවේදනීයං නාමේං යෙව අභිනිහාවේ උපපජ්ජවේදනීයං අනන්තරභවේ විපාකංදෙති අපරාපරිය වේදනීයම්පන විපාකං අදත්වා, නාභවෙත්තං සඤ්ඤායනාභිකම්මං විනාසෙතීති" යනු කීහ. කුසලකර්මයවේවා අකුසලකර්මයවේවා එකම ජවනවීථියෙහි පළමුවන ජවන සහගතවූ කර්මය දෘෂ්ටධර්ම වේදනීය කර්මනම් ඒ කර්මය ඉහාත්මභෙහි කර්මය රැස්කළාවූ සකල පරම්පරා වටම විපාකදෙන්නේවෙයි. සත්වන ජවන සහගතවූකර්මය උපපද්‍ය වේදනීය කර්මනම් ඒ කර්මය ඊට අනතුරු දෙවෙනි අත්බැව්හි විපාකදෙන්නේමය මධ්‍යභවයෙහි පඤ්චජවන සහගතවූ කර්මයෝ පස්දෙන වනාහි අපරාපරියවේදනීය කර්මනම ඒ කර්මයෝ වනාහි විපාක නොදී නොනස්නාසුභාවය. ඒ අපරාපරිය වේදනීය කර්මය සඳහාම "නාභිකම්මං විනස්සති" යනු කියනලදැයි දතයුතුයි. මෙසේ කුශල කර්මය හා අකුශලකර්මයද සත්ත්වයා පසුපස්සේ අත්නොහැර කැටුව ගවන්කොට සුදුසුපරිද්දෙන් සැපදුක් ගෙණදෙනබව ප්‍රකාශකොට මත්තෙහිද එයටවඩා අධිකවූ අභිවෘද්ධිය කැමැත්තවුන්ට හිත පිණිස විශිෂ්ටධර්මය ප්‍රකාශකරණ්පිණිස මේ ගාථාවත්මගින් ධර්මදේශනා කරළ්සි.

"යෝ ඉමෙජි පුරිසෝ මොතුං ජාතිජාති පුනප්පුනං
පරදාරං විවජ්ජයය ඩොතපාමදව කදදමං
යා ඉමෙජ පුරිසෝ මොතුං ජාතිජාති පුනප්පුනං
සාමිකං අපචිත්තයය ඉත්ථිංව පරිචාරිකා
යෝඉමෙජි දිබබෙභොගෙසු දිබබමාසු යසංසුබං
පාපානිපරිවජ්ජෙත්‍යය නිවිධං ධම්මමාචරෙ

කායෙනවාචාමනසා අපපමඤ්ඤා දිවකඛණෙ
අත්තනො මහානිඅත්ථාය ඉත්ථිවා යදිවාපුථූ
යෙකෙචිමෙ මනුජාජීවලෝකෙ
යසඤ්ඤිතොසබ්බසම්පනන මොගා
අසංසයංතෙහි පුරෙසුචිණ්ණං
කම්මස්සකාසෙ පුථුසබ්බසත්තා
ඉංඝානුවිත්තෙතනි සයම්පිදෙව" යි.

මෙහි භාවය,

දේවතයනි යම්පුරුෂයෙක්තෙමේ ජාතියක් ජාතිසක්පාසා නැවත නැවත පුරුෂයෙක්වනුකැමැත්තේවීනම් දෙනාලද පා ඇත්තාවූ පිරිසිදුබව පතන්නාවූ පුරුෂයකු විසින් මඩතලල් සහිත සථානය දුරුකරන්නාක්මෙන් පරදාරසෙවනයෙන් දුරුවන්නේයි. යම් සත්‍රියෙක්තොමෝ ජාතියක් ජාතියක්පාසා නැවත නැවත පුරුෂයෙක්වනුකැමැත්තීවීනම් ඒ සත්‍රිතොමෝ ශක්‍රදිව්‍යරාජයාගේ පාදපරිවාරිකාවූ දිව්‍යස්ත්‍රීහු මහත් ගෞරවයෙන් ඒ සක්දෙවිදුන් පූදන්නාක්මෙන් සවකීය පුරුෂයාහට මහත් ගෞරවයෙන් පූදන්නීය යම් පුරුෂයෙක්තෙමේ දිව්‍යමයවූ උපභොග පරිභොගසම්පත්තියද දිව්‍යමයවූ ආයුෂද දිව්‍යමයවූ යශස්ද කැමැත්තේවි නම් ඒ පුරුෂතෙමේ කායවාඞ් මනොසංඛ්‍යාත දුශ්චරිතයන් හාත්පසින් දුරුකරන්නේයි කයින් හා වචනයෙන්ද සිතින්ද ප්‍රාණඝාතාවන් නේවේද පැණවත්මවේද ගෙතෙමේ සත්‍රියෙක් හෝ පුරුෂයෙක් හෝ වේවා අභිවෘඞ්ධියටම පැමිණෙන්නේයි මිනිස්ලොකයෙහි වාසයකරන්නාවූ සියළු මේ මනුෂ්‍යයෝතුමූ මහත් පරිවාරඇතිකාවූ වෙදද ඒ මනුෂ්‍යයෝතුමූ පුම්ජාතියෙහි විචිකිච්ඡාවෙන් තොරව යහපත් කුසලධර්මයන් රැස්කළෝය සියළු සත්වයෝම කැමැති සවකීය ධනකොව ඇතුනාහ ජනකෙමරවූ පියමහරජ්ජුරුවෙනි බුඩවහන්සේ සිකි එළවූව මැනව බුඩවහන්සේගේ බුවණින්ද නැවත නැවත මෙනෙහිකරවයි මෙසේ අවවාදදුන්නේයි මේ ගාථාපාලියෙහි "කම්මස්සකාසෙ" යන පදයෙහි භාවය මෙසේයි.

මේ ලොකයෙහි මනුෂ්‍යයෝ තම තමන් විසින් රැස්කරණ ලද්දාවූ උපභොග පරිභොග සම්පත්තියන් තම තමන්ටම අයත්ව තම තමන් විසින් අනුභවකරන්නාක්මෙන්ම තම තමන් විසින් රැස්කරණලද්දාවූ කුශලකර්මබලයෙන් ලබනලද සියළු පඤ්චකාමෝපභෝග තම

හුවන්ව අසිනිවෙයි. එපරිද්දෙන්ම තම තමුන් විසින් ඉහාත්මයෙහි රාජනීති ලෝකනීති උල්ලංඝනයෙන් කරණු ලබන අපරාධයන්ට ලැබියයුතු රාජදඩින වධබන්ධනාදිය තම තමන් විසින්ම විඳින්දයුතු වාක්මෙන් කායවාඩ්මනසඃඛ්‍යාත චාරත්‍රයෙන් රැස්කරණලද්දවූ අකුශලකර්මයන්ගේ විපාකයද නරකාදි සතරඅපායෙහි ඉපිද තම තමන් විසින්ම විඳදයුත්තේමැයි. ඒ එසේමැයි මව්පියන් විසින් කරණලද්දවූ කුශලාකුශලකර්මය පුත්‍ර ධිතෘන්ට හෝ දුත්‍රධිතෘන් විසින් කරණලද්දවූකුශලා කුශල කර්මය මව්පියන්ට හෝ දයාදවශයෙන් හෝ ඍනිසංසයෙන් හෝ අයත් නොවන්නාහුය සෙස්සන් විසින් කරණලද්දවූ නම්ය සෙස්සන්ට අයත් නොවීම කියනුමකවරදැ? එහින් කිහ ජාතකඅට්ඨවායෙහි—

"කම්මස්සකම්හි කම්මදායාදා අතීතනාගතපච්චුප්පන්නානං කුසලාකුසලකම්මසෙව විපාකං පටිසංවේදිතෝ හෝති මාතාපිතූහි කතංකම්මං පුත්තධීතූනං විපාකං දෙති නතානි පුත්තධීතූහි කතංකම්මංමාතාපිතූනංදෙති සෙසසඟිකානං සෙසානං නිස්සංවදස්සති" යි. මෙසේ රුවානම් රාජකුමාරිකාවෝ මෝ අංගාතිනම් පියරජහට අනෙක ප්‍රකාර උපමා උපමේය හෙතු දාහරණයන් ප්‍රකාශමකාට ධර්මදේශනාකළේද ප්‍රකෘතියෙන් ප්‍රියවූ සවකීය පුත්‍ර ධිතෘන්ගේ චිත්‍රවූ කථාව ඇසීමට ප්‍රියවූ පමණ මුත් දියනියන්ගේ ධර්මකථා ශ්‍රවණය හෙතුඋකොටගෙණ පියරජහුගේ මිථ්‍යාදෘෂ්ටිය පහවූවේයි මෙසේ අනෙකප්‍රකාරයෙන් ධර්මදේශනා කොට පියමහරජහුගේ විසම්දෘෂ්ටිය දුරුකොකළේද රාජකුමාරිකාවෝ තමාගේ උත්සාහය එපමණින් අත්නොහැර සිව්දිගය සිව්අනුදිගය උඩ යටය සත් දසදිශාවන්ට නමස්කාර කරමින් මෙසේ අධිෂ්ඨානකළේයි. මේ ලොකයෙහි ධර්මය ආරක්ෂාකරන්නාවූ පණ්ඩිත ශ්‍රමණ බ්‍රාහ්මණ සෘෂිවරයෝද ලොකපාල දිව්‍යගණයාද ශක්‍රබ්‍රහ්මාදිහුද විද්‍යමානවන්නාහුමය ලොකයෙහි විද්‍යමානවන්නාවූ ශ්‍රමණ බ්‍රාහ්මණ තාපස ලොකපාල දිව්‍යබ්‍රහ්මාදිහු අපගේ පියාණන්ගේ කිසිගුණයක් නැත්නේද මාගේ ගුණබලයෙන්ද අපගේ පියාණන්ගේ ශීලයක්නැත්නේද මාගේ ශීලබලයෙන්ද අපගේ පියාණන්ගේ කිසිධර්මයක් නැත්නේද මාගේ ධර්මබලයෙන්ද අපගේ පියාණන්ගේ සත්‍යයක් නැත්නේද මාගේ සත්‍යබලයෙන්ද මේ ලොකය බලනසේක්වා අපගේ පියමහරජ්ජුරුවෝ වනාහි අඥාන ඇත්තාහ එක්විටෙක්හි මිථ්‍යාදෘෂ්ටිගතවන්නේය.

අපගේ පියමහරජ්ජුරුවෝ මිථ්‍යාදෘෂ්ටියෙන් අකිව ධර්මයෙන් නොරව රාජනීති උල්ලංඝනයකොට හැසිරෙන්නට පටන්ගත් බැවින් සියළු මිසුළුන්නුවරවාසීන්ට පැමිණි මහත්භයද පියමහරජ්ජුරුවන්ටී අවවාදඇසුට එසින් කිසිපිහිටක් නොලැබ එවෑමිණි මහන්වූ දුකද මාගේ පියරජ්ජුරුවෝ මේ නියත මිථ්‍යාදෘෂ්ටිය කරණකොට ගෙණ මරණින්මතු මහානිරයෙහි පැසීද දිවසින් බලා ලෝවැස්සන්කෙරෙහි කරුණාමෛත්‍රී උපදවා මිථ්‍යාදෘෂ්ටි නමැති මොහාන්ධකාරය යහපත් සම්‍යක්දෘෂ්ටිනමැති සූර්‍යාලෝකය පතුරුවා දුරගසා ලනසේක්වායි අධිෂ්ඨානකෙළේහි.

රුවා කුමාරිකානුනාසනා නිර්දේශයයි. 35.

නාරද බ්‍රහ්මරාජානු ශාසනාව.

36 මෙසේ රුවානම් කුමාරිකාවගේ අධිෂ්ඨානය අපමහා බොධි සත්වූනාරදනම් මහාබ්‍රහ්මරාජතෙමේ දිවකණින් අසා මාහැර අහානිරජහුගේ මිථ්‍යාදෘෂ්ටිය පහකරවන්නට සමර්ථයෙක් නැතැයි සිතා මිනිස්ලොවටනොස් අහානිරජහුගේ විසදෘෂ්ටිය පහකරවන්නට අදහස්කළේයි. ඒ එසේමැයි මහාබොධිසත්වවරයෝ දිව්‍යබ්‍රහ්ම ලොකවල ඉපිද වසනකාලවල දිව්‍යලෝක බ්‍රහ්මලෝක සැපයෙන් ප්‍රමාදනොවී සත්කරුණාව පෙරටුකොට මිනිස්ලොව බලා දුකට පත්වූ මනුෂ්‍යයන්ගේ ඒ දුක් පහකිරීම මහාබොධිසත්වවරයන්ගේ ධර්මතාවයක්වූ බැවින් නාරදනම් බ්‍රහ්මරාජතෙමේ මිනිස්ලොව බලනකල්හි මේ රුවානම් කුමාරිකාවන්ගේ අධිෂ්ඨානය දිවකණින් අසා මිනිස්ලොවට එන්න කැමතිවිය.

ඉක්බිති තවර වේසඝකින් මිනිස්ලොවට ගියේමෝනම් යහපත් වේශ්‍යාහෝයි පරිභාෂාකරණුයේ මිනිස්ලොව වාසයකරන්නාවූ මනුෂ්‍යයෝවනාහි තාපස ශ්‍රමණ බ්‍රාහ්මණයන්කෙරෙහි ප්‍රකෘතියෙන් නොරවනරන්නාහ පරමප්‍රාවශයෙන් මහණබමුණන්ගේ වචනය ගෞරවයෙන් අසන්නාහුය එහෙයින් තාපසවෙශයෙන් යාහුතුයයි. සිතා රන්වන්වූ රූපශ්‍රීන් යුක්තවූ මනුෂ්‍යවේශයක් ගෙණ කසද්රුදු වස්ත්‍රයක් හැඳ එබදුවස්ත්‍රයක් ඒකාංශකොට පොරවා තවුස් පිරිකර කදක් කරින්ගෙණ මෙසේ ඉතා යහපත්දැකුම් කවයුතු තවුස්මෙ

සක්දෙවිඳු දමනය කරණලද ඉදුරන්ඇත්තෙන් පුන්සඳ වැඩිලක්මෙන් සියළුනුවණ වැස්සන් බල බලාසිටියදී රැඳීමාලාවන්ගෙන් දසදිගුන් ශොභවමින් අහසින් අවුත් අහාතිරජහුගේ වන්දනාදරුමය රජභවනයටවැද පෙළුවට නොබැස හුවන්හුස ඔබිමොබ සක්මන්කරමින් සිටියදී එබවදුටු රුවානම් රාජකුමාරිකාතොමෝ මාගේ පියරජ්ජු ඒ වන්ට අනුශාසනාකරණ්හිණිස් මහානුභාව සම්පන්න ශක්‍රබ්‍රහ්මාදී මදවිකෙනෙක් දිව්‍යලොකයෙන් බැස මාගේ අධිෂ්ඨානබලයෙන් ආයේවනැසි සිතා ගෞරවයෙන් නමස්කාරකරමින් සිටියේය අහාති රජතෙමේ හුනස්නෙනි නොසිටියහැකිව බ්‍රහ්මානුභාවයෙන් රූප පයන්කයන් බැස රජගෙමිදුලට අවුත් නමස්කාරනොකොට නම් හොත් විචාරණ්හයේ මේ ගාථාවකිහ.

"කුතොනුආගච්ඡසි දෙවවණ්ණි
ඔභාසයං සබ්බදිසං වදිමාව
අනාගානි මේ පුච්ඡිතො නාමගොත්තං
කථංතං ජානන්හි මනුස්සලොකෙ" යී.....

මෙහි භාවය දෙවියන්ව බදුවූ වණ්ඇතානුවූ නොපි පුණ්වඳු බිඹුයක්මෙන් සියළු දසදිගුන් සිය ශරීර ප්‍රභාවෙන් හොබවමින් ආකාසැන්සිට ආයේදැයි විචාරණ්ලැබූ නෙපි නම්ගොත් ප්‍රකාශකරව ලොකවාසි නෙමේ කතාප කවරෙකැයි හඳුනවිදුසි විචාළේසි අහාති රජතෙමේ මෙසේ විචාලකල්හි නාරදනම් බ්‍රහ්මරාජතෙමේ මෙසේ කල්පනාකළේයි මේ අහාතිරජතෙමේ පරලොවක් නැතැ යන මිථ්‍යා දෘෂ්ටිගත්තේය. එබැවින් මම පළමුකොට මාගේ නාමගොත්‍රයන් දක්වා ඊට අනතුරුව පරලොවක් ඇතිබව හඟවාලන්නෙමි සිතා මේ ගාථාවකිහ,

"අහඤ්හිනිදවතෝ ඉදානිඑමි
ඔභාසයං සබ්බදිසං වදිමාව
අකාමං තෙ පුච්ඡිතො නාමගොත්තං
ජානන්තිභං නාරදෙ කස්සපොවාති" යී.....

එඛා මහරජ මම වනාහි පුන්සඳ වැඩිලක්මෙන් දසදිගුන් ශොභවමින් දිව්‍යලොකයෙන් දැන් මෙහි ආයෙමි නොප විසින් විචාරණ්ලැබූ මම නොපට මාගේ නාමගොත්‍රයන් ප්‍රකාශකරම් නාරදයැයි කීහාද කාශ්‍යපයැයි කීහාද ලොකවාසිහු මා හඳුනන්නාහුයැයි කීහ. මේසේ මහාඅබාධසහිවූ නාරදනම් මහාබ්‍රහ්මරූජයාණන් විසින් කියනලද වචනය ඇසූ අහාතිරජතෙමේ මෙසේ සිතීය මේ නාරද

තාපසතෙමේ මනාඅනුභාවසම්පන්නය ආකාශගතයහිද පොළොවහිමෙන් යාම් සිටීම් ආදි සෘද්ධාතිහාර්යයන් දැක්විය හැක්කේය. එහෙයින් පළමු කොට එබදු මහානුභාවසම්පන්නවූ කාරණය පිළිබඳ තදනන්තරව පරලොවඇති නැතිබව විචාරන්නෙමි සිසිනා, පළමුකොට ආනුභාව සම්පන්නභාවයට හේතුවූ හෙතුව විචාරණුස්සේ මේ ගාථාවකිහ.

"අච්ඡරියරූපං වත යාදිසඤ්ච
පෙහාසයා ගච්ඡසි නිරූසිව
පුච්ඡාමි තං නාරද එතමත්ථං
අථ කෙනවණ්ණෙන තවායමිඛි" ඒ.....

එඹා නාරදය තොපගේ සම්බන්ධ රූපයක්වේද ඒ තොපගේ රූපවර්ණය ඒකාන්තයෙන් ආශ්චර්යය තොපගේ අඟසින් මෙතනට ඒවද අඟසසිටීමද එසේම ආශ්චර්යය එඹා නාරදය මේ කාරණය තා විවාරම් කවරකාරණයකින් තොපි මෙබඳු සෘද්ධිබලයක්ලැබුණේදැයි විවාළේසි. මෙසේ අහාතිරජහු විසින් විවාළ ප්‍රශ්නයට පිළිතුරුදීම් වශයෙන් නාරදතෙම බ්‍රහ්මරාජතෙමේ තමාගේ සෘද්ධාතිහාර්යය ලැබීමට හෙතුව ප්‍රකාශකරණුපිණිස මේ ගාථාවකිහ.

"සබ්බඤ්ඤුධම්මම්මව දම්මාවචාදගා
ගුණා මමෙතෙ පකතා පුරාණා
තතොහෙව ධම්මෙමහි සුසංවුතොහි
මහාජලෙ යෙන කාමංගතොස්මි" ඒ.....

එබිඳා මහරජ සත්‍යවචනකිරීමය සුචරිත ධර්මය හා ධ්‍යානධර්මය පරිපූර්ණවඩින්නයන් නික්මවීමය කෙලෙසුන් දුරුකිරීමය යන මෙතෙක් ගුණධර්මයෝ මාවිසින් පූර්වජාතියෙහි රැස්කරණලද්දාහුය මොනවට සෙවනාවූ හාවිතාකළාවූ මේ ගුණධර්මයන් මහතුකොටගෙණ ලබන ලද්දාවූ ධ්‍යානවිඥානය සඛණ්ඩවූ අනුභාවවර්ණය ඇත්තේ කැමතිතෙනකට අඟසින් නොමනාගමනාකරම්සි මෙසේ කීයේයි මෙසේ මහා ඛඩිසත්වයන්වහන්සේ විසින් කියනලද වචනය අසා අහාතිරජ තෙමේ මිථ්‍යාදෘෂ්ටියෙන් මුළාවූ බැවින් පරලොවක් ඇතැයි නොඅදහනුමයේ කුශලකර්මයාගේ විපාකයක්ඇද්දැයි විචාරණුකැමැතිව මේ ගාථාවකිහ.

"අච්ඡරියමාවිකඛසි පුඤ්ඤසදිසිඛි
සමෙහි එතෙහි යථාදදෙස
පුච්ඡාමිතං නාරද එතමත්ථං
පුමෙඛාවමෙසාඛු විපාක මොහි
අත්ථිනුදවා පිතරොව අත්ථි
ලොකාපරා අත්ථිපරායණාහු" ඒ.....

එබඳු නාරදය තාපසිවනාහි කුසලකම්වලින් ආගමයිවූ විපාක කසිඹිය ඇතැයි කියයි. ඉදින් වනාහි මේ වාක්සත්‍යාදිය හෙතු ඵලාවබෝධ තොව කියාදිද්දෙන් වන්නේනම් ඒ ප්‍රකටකොට ප්‍රකාශ කරව එබඳු නාරදය මේ අර්ථය තොප ඒවාරමේ මෙ විසින් විචාරණලද්දුවු තාපි ඒමට තොවලහා කියව දෙවියෝ හා බ්‍රහ්මයෝ ඇත්තා හුදකමි හා කම්පලඇත්තාහුද මෙසින් නස්නා සඳහයෝ නැවත උපදනා පරලොවක් ඇත්තේවද මේ ජනතමේ දිව්‍යබ්‍රහ්මයන් හා පරලොවකුත් ඇතැයි කියන්නාහුනම් ඒ දිව්‍යබ්‍රහ්මයන් හා පරලොවකුත් විද්‍යමානවේදැයි විචාළේයි මෙසේ අගාතිරජ විසින් විචාරණලද්දුවූ මහාබෝධි සත්වයන්වහන්සේ දිව්‍ය බ්‍රහ්මාදී සත්වයෝ හා පරලොවත් ඇතිබව ප්‍රකාශකරණුපිණිස මෙසේකිහ.

"අත්ථේවදේවා පිතරොව අත්ථි
ලොකාපරා අත්ථි ජනෝයමාහු,
කායෙසු භිඩාව නරාපමුළහා
ලොකංපරං නවිදුමොහයුත්තා" ති.

මහරජ්ජුරුවෙනි දෙවියෝත් ඇත බ්‍රහ්මයෝත් ඇත මේ ලොවත් ඇත පරලොවත් ඇත කුශලා කුශලකම්වලින්ගේ විපාකත් ඇතැයි ලෝකය දන්නා යම් සත්වකෙනෙක්කීයේනම් ඒ ඇත්තේමය චින්තුකාම කෙලඹකාමයෙන් හිඳුවූ මොහයෙන් මුළාවූ සත්වයෝ පරලොවවත් මේ ලොවවත් පරලොවවත්නාවූ විපාකවත් නොදනිති කීවාහුය ඉක්බිති නාරද තාපසයන් කිබිස් අසා අගාති රජ තෙමේ පරිහාසකොට මෙසේ කිහ.

"අත්ථිතිවෙනාරද සද්දහාම්,
නිවසනං පරලෝකා මතානං
ඉධෙවමෙපඤ්ඤවසතානි දෙහි
දසසාමිතෙ පරලෝක සහස්සං" ති.

එබඳු තපස්වීනි මෙලොවින් මැරියන්නාවූ සත්වයන්ට පරලොව වාසයස්ථානයක් ඇතැයි කියා තොපි අදහව්නම් මේලොවදී මට කහවණු පන්සියයක් ණයපිණිස දෙව තොපව පරලොවදී එකමෙක පොලිත් සමග කහවණු දහසක් දෙන්නමිකීවේය ඉක්බිත්තේ මහබෝසතාණන් පිරිත් මැද ඒ රජ්ජුරුවන්ට නිහඬනොව කියන්නාහු මෙසේකීයත් –

"දසෙජ්ජමුඛා පසුවසතානි හොතෙතා
ජඤඤුමුඛෙව සීලවන්තං වදඤඤදෑං
එදදං භවන්තං නිරමෙය වසන්තං,
මකා වොදයෙ පරලොකෙ සහසසං" යි.

ඉදින් අපි මෙතෙම සිල්වත්යයි කියාද සැබවසක්මකියන් නේයයි කියාද බාර්මික මහණ බමුණන්ට මේ අවසථාවෙහි මෙබදු දනවයතුවක් පරිතයාගමකාට මෙසේවූ ඵලයක් ලබමිහයි කියාද දනු මෝනම් එබමෙදකුට පොලී පිණිස කහවණු පන්සියයක් දෙමිහ තෙපිවනාහි මරණද සාහසිකක්‍රියාකරන්නෙක තෙපිවනාහි මිථ්‍යාදෘෂටි මගණ දන්හල් විදුපියා දුගී මනී යාචකයන් නෙරපාහැර පරදරාදි නොමයක් පවමකාට මෙසින් චුතව නරකමයහි උපදුව මෙබදු රෞද්‍ර ක්‍රියාකොට නරකමයෙහි ඉපිද සොරවූ දුක්විඳනාවූ තොපි කරාමගාස් කඟඩණු දහස පොළිලිත් සමග මට මදවයි කියා කවරෙක් ඉල්වන්නේදැයි කියා මත්තෙහිද මේ ගාථාවන්ගෙන් අවවාදකළේයි.

"ඉධෙව මයා හොනි අධම්මසීලා
පාපාචාරා අලසා එදදකමෙමා
නපණඩිතා තස්මිං ඉණං දදනති
නඤඤාගතා මහාති තථාවිධමහා
දකඛඤඤව පොසං මනුජා විදිතවා
උඤඤනකං සිලවන්තං වදඤඤදෑං
සයමෙව මහාමගහි නිමන්තයනති
කම්මංකරිතවා පුනමාගමරසි" යි

තවද මහරජ්ජුරුවෙනි මේ මලවිකිම යමෙක් තෙමේ අදම්වූ සවභාව ඇත්තේමවිද ලාමක හැසිරීම් ඇත්තේවේද අලසවේද මරණද්‍ර ක්‍රියා ඇත්තේමවිද පණිතයෝ ඔහු නොමරණි ණයනොදෙති එබදු මනු ෂයයාමගන් ආපසු ණය නොලැබියහැක්මේය.

තවද මහරජ්ජුරුවෙනි පණිතවූ මහණ බමුණන්ට මෙබදු පරිතයාගයක්කොට මබදු විපාකයක් ලබන්නේයයි කම්පලදන් නාවූ සැබව සක්ම කියන සුළුවූ සිල්වත්වූ උඤඤන වියයීමයෙන් සමන් විනතවූ ශ්‍රමණ බ්‍රාහමණාදි උතතමයන්ට තමන්ගේ ප්‍රමයෝජනයෙහි සලස්වා වෙතුව උපදවාමගණ අප සතුදේ පසුවගෙණහැර මදවයි කියා වසතු සවාමීහු තුමූම සමපතින් පවරති එබඳුන්ට දුන්දේ පසුවලැබන්නේයයිකීහ.

0

මෙසේ මහ බෝසතාණන් විසින් දැඩි කියනලද වචනය අසා රථවැසි තෙමේ තුටුපහටුවූ සිත්ඇතිව දිව්‍යමය සැඩිමත්වූ තපශ්චීන් වහන්සේ මහානුභාව ඇතිසේක අද අපගේ රජ්ජුරුවන්ගේ මිථ්‍යා දෘෂ්ටිය ඒකාන්තයෙන් හරවනසේකැයි කියමින් මුළුමියුළු තුවර ඒක කෝලාහලවිය මහාබෝසතාණන්ගේ සෘද්ධානුභාවයෙන් සත් යොදුන් මිහුළුතුවර මුළුල්ලෙහි ඔවුන්ගේ ධර්මදේශනාව නොඇසුවෙක්නම් නැත්මතය.

ඉක්බිති මහබෝසතාණෝ මේ රජ්ජුරුවෝ ඉතා තරකොට මිථ්‍යාදෘෂ්ටිගත්හ නරකභයින් බිහුනැතිගන්වා මිථ්‍යාදෘෂ්ටිය හරවා නැවත ඔහු දෙව්ලෝසැපත් දක්වා අස්වසාලම්සිතා මහරජ ඉදින් මතාපි අපගේ අවවාදය පිළිනොගන්නේවීනම් මිථ්‍යාදෘෂ්ටිය නොහරණේවීනම් මරණින්මතු මේ මේ ආකාරයෙන් අපමණදුක් කම්කටුළු ඇතිතාවූ නරකයට යන්නේවේ දැයි කියා නිරය පිළිබඳ කථාවට පටන්ගත්හ මෙසේදයන්?

"ඉතොචුතෝ දකඛසි තත්ථ රාජා
කාකොළසංඝෙහි විකාසමානං නිරයෙයවයන්තං
කාකෙහි ගිජ්ඣේඛ්ච මයූරකෙහි
සඤ්ජීවනත්තානං රුහිරං සවන්තං
කෝ වොදයෙ පරලොකෙ සහස්සං....

අඞ්ගතමං තත්ථ නවඤසුරියා
නිරයෝ සදුතුමුල්හෝ ඝොරරූපෝ
මසා නෙවරත්තී නදිවා පයාතයති
තථාවිධෙ කෝ විවරෙ ධනම්පිකෝ"ති....

මහරජ තෙපි ඉදින් මේ මිථ්‍යාදෘෂ්ටිය නොහළේවිනම් මේ ලොවින් චුතවූතෙපි අපමණ දුක්ඇතිවූ ඒ නිරයෙහි උපදනෙහිය ඒ නිරයෙහි ලොහකාමය තිගුණුතුඩු ඇතිවනකවුවුරුල එසින් ඔවුන්ගේ ලොහොතුඩින්විද ඇද ඇද කඩ කඩා කනලද ගාත්‍රාඇතිව වැහෙන්නාවූ ලෙහඉතිම කවුඩු ගිජුල්ලිහිණි දීනබල්ලන් ආදීන් එසින් සිඳිනාලද ගාත්‍ර ඇතත්වූ තොපිකරා ඒ නිරයවමගාස් කවරසැව්වයක් ඔස්සෙත් දහයක් මවදූනමැනවැයි ඉල්වන්නේදැයි කීහ මෙසේ කාමනොළනම් නරකයදක්වා ඊට අනතුරුව ලොකාන්තරික නරකය දක්වන්නා හු මෙසේකීහ.

මහරජ නොපවැනි මිථ්‍යාදෘෂ්ටිගතිකයෝ මිරණින්මිතු ලොකාන්තරික නරකයෙහි උපදනාහ ඒ නරකයෙහි වසුපූර්විඥානයාගේ උත්පත්තිය වළක්වන්නාවූ ඝනාන්ධකාර ඇත්තේය. චඤ්චුස්‍රාවීමයෝ නැතහොත් අතිශයින් අන්ධකාරවන්නේය සැමකල්හි අන්ධකාරයෙන් මුළාවන්නේය ඒ ලොකාන්තරිකනරකතෙමේ ඝෝරවූ දරුණුවූ දුක්ඇත්තේය රාත්‍රියද දවාලද මවන්ස්ව නොපැමිණෙන්නේය. එබදු කටුකදුක් ඇතහොත්වූ නිරයෙහි ඉපිද දුක්විඳිනාවූ තොපිකරාගොස් කවරනම් වසතු සවාමියෙක් ණයඉල්වන්නේදැයි කිහ. මෙසේ අහානි රජහට ලොකාන්තරික නරකවිස්තරදක්වා මහරජ මිථ්‍යාදෘෂ්ටිය නොහරණා තැපි හුදෙක් මේ ලොකාන්තරික නරකයෙහිම ඉපිද දුක්විඳ ඒ අකුශල කර්මය ගෙවන්නේනොවෙයි අනික් නරකයෙක් හිද ඉපිද දුක්විඳින්නේමයයි දක්වනුයේ මේ ගාථාවන්කිහ.

"සබලසොණ්ඩාව සාමොව දුවෙසුණා
පවඩ්ඪකායා බලිනෝ මහන්තා
ඛාදන්ති දන්තෙහි අයොමයෙහි
ඉමෙතා පතුණ්ණකං පරලොකෙ පතන්තං
තංඛජ්ජමානං නිරයෙව සන්තං
එදෙදුකි වාළෙහි අසම්හිකෙහි
සඤ්ජීතනගතානං රුහිරංසවන්තා
කොවොදයෙ පරලොකෙ සහසසං"යි.

මහරජ මිථ්‍යාදෘෂ්ටිගත් මේ ලොකඩාසි මනුෂ්‍යයෝ මෙසින් චුතව පරලෝගියාහු ව්‍යාලනරකයෙහි ඉපිද ව්‍යාඝ්‍රයන්ට බදු නඛදාඨාවන්වූද පිහුවන්වූද මහත්කයක්ඇත්තාවූද මහත් බලසම්පන්නවූද යමක දීනබල්ලෝ දෙපාර්ශ්වයෙන් අවුත් හිතිගෙණ දිලියෙන අයොමය දතින් දෙපැත්තට ඇද ඇද සුණු විසුණුකොට ශරීරමාංශය කඩ කඩා කති මෙසේ ඝෝරවූ රෞද්‍රවූ යමක දීනබල්ලන් විසින් ඇඟ මස් කඩ කඩා කාණ්ඩුලබන්නාවූ නරකයෙහි වසන ඒ නෙරයික සත්ත්වයා දරුණුවූ භයංකාරවූ ව්‍යාඝ්‍රයන් විසින්ද මෙවර මස්ඇද ඇද කඩා කණ්ඩුලබන්නාවූ හාත්පසින් සිදිනාලද ගාත්‍රා ඇත්තාවූ සියලහින් ලේ වැගිරෙන්නාවූ තොපකරා කවරනම් සත්ත්වයෙක් එළඹ කහවණු දහස දෙවයි ඉල්වන්නේදැයි මෙසේ මිථ්‍යාදෘෂ්ටිගතිකයන් පැමිණෙන්නාවූ ව්‍යාළනම් නරක වණීනාව දක්වා ඉදින් ඒ නරකයෙන් මිදුනේනම් නැවත කාලූපකාලනම් නරකයෙහි ඉපිද මෙබදු දුක්කම් කටුඵ විඳිමන්යයි දක්වනුපිණිස මේ ගාථාවන් කිහ.

"උසූභියත්තිභිව සුනිසදෘභි
හතතතති විජ්ඣන්හිව පොථයන්තී
කාලූපකාලානිරයම්හිසොරෙ
පුබ්බනගරං දුක්කටකම්මකාරිං
තංහඤ්ඤමානං නිරයෙ වසන්තං
කුච්ඡියම්පං පස්සසම්පං විප්ඵාලං උදරං
සඤ්ඡීනභාගතතං රුහිරං සවන්තං
කොසවාදයෙ පරලොකෙ සහස්සං
සත්තීඋසුතොමරහිත්දිවාළා
විවිධාවුධං වස්සති තත්ථ දෙවා
පතන්ති අඞ්ගානිම්වවිමෙනතා
සිලාසනී වස්සති එදදකමෙම
සන්ධාවමානමපි රථෙසු යුත්තං
සජොතිභූතං පඨවිං කමන්තං
පතොදලඨිහි සුසවාදයන්තං
කො වොදයෙ පරලොකෙ සහස්සං" ති.

මහ රජ මේ මනුෂ්‍ය ලොකයෙහි දරුණුවූ පවරුස්කළාවූ සත්වතෙම මෙලොවින් චුතව සොරවූ කාලූපකාලානම් නරකයෙහි උපදනේය ඉක්බිති ඒ නරකයෙහි උපන්සත්වයන්ට දුක්කම් කටුළු දෙන්නාවූ පසම්තුරුවූ නිරයපාලයෝවනාහි ගිනිගෙණ දිලියෙන ඊතලවලින් හා සනඟා මුවහත්කරණලද තියුණු අඩයටියෙන්ද දෙසිදුරුකොට හෙවත් විණිවිද සිදුරුකොට අනිනාහුද විදුනාහුද පොළනාහුදවෙති.

තවද මහරජ ඒ නිරයපාලයෝ මේ නාරකික සත්වයා වට කොට ගෙණ නොයෙක් ආයුධයෙන් ඇණ දෙසිදුරුකරන්නාහ මේ සේ එලකාවුධයෙන් ඇණ විද මහත්දුකට පමුණුවනලද්දාවූ නෙරයික සත්වතෙමේ බුර බුරානඟින්නාවූ මහාවග්ගිජ්ජාලාවන් අතුරෙහි දුක්ඉවසාගතනොහැකිව ඔබිමොබ දිවන්නාහ මහරජ බඩඟිද ඇලපත්ගිද නොයෙක් ආයුධයෙන් අනිනුලබන්නාවූ නරකයෙහි ඒ මේඅත දිවමින්පණිමින්වැටෙමින් පැහෙන්නාවූද බඩපළනලද්දාවූද හාත්පසින් සිදිනාලද ගාත්‍රාඇතතාවූද ලේවගුරුවන්නාවූද තොප කරා කඹරක් අවුත් පරලෙව්හිදී කහවණුදහස දෙවයි ඉල්වන්නේද? එඹා මහරජ ඒ කාලූපකාලනම් නිරයෙහි අඩඟට සරතෝමරහෙල්ල ආදී ගිනිගෙණ දිලියෙන අනෙකප්‍රකාර ආයුධයෝ වැසි

වස්නාකලක්මෙන් නෙරයික සත්වයාගේ ඔස්තකයෙහි හෙන්නාහ ගිනිගෙණ දිලියෙන කිඹිරහුරුමෙන් ගිනිපුපුරු ඉසිමින් දිලියන්නාවූ ඝිනියලාඇති නොමයක් ආයුධයෝ දිවෙමින් දිලියෙමින් ගුගුරමින් අහසින් අවුත් නාරකික සත්වයන්ට හයළුවමින් ඇත විද බොහෝදුක් උපදවන්නාහ වැසිවස්නාකල්හි සෙනහඬමෙන් ගිනිගෙණ දිලියන්නාවූ ගල්කුළු සමූහයෝ දුම්මින් ගුගුරමින් දිව අවුත් ඒ නාරකික සත්වයන්ගේ මුදුනෙහි වස්නාහුය. තවද ඒ නරකයෙහි ඉවසිය නොහැක්කාවූ ගිනිරැස්වැනිවූ හුනුපවන්හමන් හේය එසේහෙයින් ඒ නරකයෙහි යවල්පවූ සැපයක්හෝ සිතට කිසි විවේකයක්හෝ නැත්තේය. මෙබඳුවූ ආශ්වාදයක් නැත්තාවූ නරකයෙහි දුක්කම්කටුඑවිදීමෙන් දුපපත්ව සැඟවියන්නට සුදුසුමගක් නොලැබ ගිනිගෙණ දිලියෙන අයොමය භූමියෙහි ඒ මේ අත දිවෙමින් දුක්විඳිනා තෙපිකරුගොස් පරලෝගිදී වහන්ස මට මස්සෙන් දහස දුනමැනවැයි නරක දුක්නොබාසිට කවරතම් කෙනෙක් ණය ඉල්වද්ද ? තවද මහරජ ගිනිගෙණ දිලියෙන අයොමය රථයෙහි වරින්වර යොදුගෙණ ගිනිගෙණ දිලියෙන්නාවූ කැඟැවින් පහරණ ලදුව ගිනිගෙණ දිලියෙන්නාවූ නවයොදුන් බොලය ඇති යමපාල වෙහි වහ්නිජ්ජ්වාලාවන් අතුරෙහි දෙපයින් ගිනිමැඩගෙණ දිවෙමින් ඒ දුක් ඉවසාගතනොහී ඇත් මැත් බලා දිවන්නාවූ තොපිලඟට ගොස් මස්සෙන්දහස දුනමැනවැයී එළවන්නෝ කවිරුහුද ? තවද ඒකාලූපකාලනම් නරකයෙහිම මහත්පවීතයන්ට බඳුවූ ගිනිගෙණ දිලියෙන අයොමය පවීත ඇත්තාහ ඒ නිරිසත්තු ගිනිගෙණ දිලියෙන අයොමය රථයෙහි යොදු ඊට අනතුරුව ඒ අයොමය පවීතයම හා අහුරු පවීතයට නන්වන්නේය. යන අර්ථය ප්‍රකාශකරණු පිණිස මේ ගාථාවකීහ.

"තමාරුහන්නං පබ්බතසන්නිකාසං
අඛාරරූසිං ජලිතං භයානකං
සුදඩ්ඪගත්තං කපණංරුදන්තං
කෝ මෙවාදගෙ පරලොකෙ සහස්සං" ති.

තවද මහරජ්ජුරුමෙනි ඉතා නියුණුකර මුවහත් ඇති හාත් පසින් ගිනිගෙණ දිලියෙන්නාවූ දුටුපමණකින්ම භයළුවන්නාවූ මුදුනට නැඟීමෙත් හා පහතට බැසීමෙන්ද මහත් විඩා උපදවන්නාවූ ගිනිගෙණ දිලියෙනඅයොමය පවීතය මුදුනට යමපලලන් විසින් පහරණලදුව නඟිමින්ද මුදුනින් ගියකල පහළබස්නා පිණිස පහරණ

ලදුව පහළවබසිම්හිද තොපගේ සමීහය මස්ලොඹුවකතබා සැත් බාණාලද මස්කැවියක්මෙන් ඒ කරමුවහතින් කැපි කැපි සුණු විසුණුවන්නේය මෙසේ ගිනිගෙණ දිලිසෙයන්නාවූ කරමුවානින් කැපිකැපිමල් පෙර ඉපරා නොමයක්වර අයොමිය පළිනයට නගිම්හිද බසිම්හිද දුක්විඳිනා තෙපිකරාගොස් ඒ නරක දුකට නොබා පපාලින්සමඟ මස්සෙන් දඟස දුනමැනවැසි තොපඅතින් කවරෙක්නම් ණයඉල්වන්නේද ? තවද මහරජ්ජුරුවෙනි හාත්පසින් ගිනිගෙණ දිලිසෙයන්නාවූ දුටු පමණින්ම අතිශයින් භය එළවන්නාවු අහාරප්‍රීයයට යෙදුලලන් විසින් පහරණලදින් මිදුනට නැඟී විශෙෂයෙන් දවනලද ශරීරඅතුව බැගෑපත් අසරණයෙක්ව දෙයත් ඉසබැඳ ගෙණ හඬාවලප්නා තොපකරා එළඹ ඉස්සෙන්දඟස දුනමැනවැසි කවරෙක් ණය ඉල්වන්නේද? මෙසේ කාලුපකාලානම් නරක වණීනාව දක්වා සිඔලිනම් නරකය දක්වන්නාහු මේ ගාථාවතුසකයකීහ.

"අබ්භාකූට සමා උවවා, කණ්ටකා නිවිතාදුමා
අයොමයෙහි තිනතකෙහි නරලොහිතපාසිනි
තමාරුහන්ති නාරියෝ නරාව පරදාරකු
මොදිතා සන්ති හසෙන්හි යමනිදෙදසකාරිහි
සමාරුහනතා නිරයං සිඔලිං රුහිරමක්ඛිතං
විදඩ්සකායං විවිතං ආතුරං ඝාල්හවෙදනං
පයාසනතාමුහුං උණහා පුබ්බකම්ම පරාධිකං
දුමෙඝාවිතතාවතතා මකා තං යාමචෙය්‍ය තංධනං"සි

"භගවතා නාගසේන අත්ථි සෝපාදිසෝ පුරත්ථිමායවා දිසාය දක්ඛිණායවා දිසාය උත්තරායවා දිසාය පච්ඡිමායවා දිසාය උඩ්ඩං අධෝතිරියංවා යත්ථ නිබ්බානං සන්නිට්ඨාතීති යදිභගවතා නාගසේන නත්ථි නිබ්බානස්ස සෝ ඔකාසෝ තෙනහි නිබ්බානං නත්ථි අථසම්පි තංනිබ්බානං සච්ඡිකතං භවිස්සති තෙසම්පි සච්ඡිකිරියා මිච්ඡා, කිංකාරණං යෙනකාරණේනතංවක්ඛාමි අථාහභගවා නාග සේන මහියා ධාතුදාඨානංඛත්තං ගන්ධානං පුප්ඵානං ඵලානං රුක්ඛානා අත්ථි රත්නානං ඨානං සාගරෝ අත්ථි යොකෝචි යංයං ඉච්ඡති සෝ තත්ථ නත්ථ ගන්ත්වා, තංතං ආහරති එවමේවඛොභගවතා නාගසේන යදි නිබ්බානං අත්ථි නස්ස නිබ්බානස්ස උපාදිශෙෂ කායෝ අත්ථි තස්මා බ්‍රූමි නත්ථි නිබ්බානන්ති අථසම්පි තංනිබ්බානං සච්ඡිකාතං භවිස්සති සච්ඡිකිරියාම්පි අත්ථි මහාරාජ නිබ්බා නස්ස නිස්සිතෝ කායෝ අත්ථිවතං නිබ්බානං සම්මාපටිපදානා සංඛා රානං උදයබ්බයං සම්පස්සමානා නිබ්බානං සච්ඡිකරොතියථාච මහා රාජ අග්ගියෝ අග්ගිනාම නත්ථිව තස්ස අග්ගිස්ස නිස්සිතෝකායෝ මෙකඬ්ඩ ඝසංවට්ටනා අග්ගි අධිවචනං එවමෙවඛෝ මහාරාජ අත්ථි නිබ්බානං නත්ථි නිබ්බානස්ස නිස්සිතෝ කායෝ සම්මාපටිපදානා ඤාණේනසා මඤ්ඤිකාමරත සංඛාරානං උදයබ්බයං සම්පස්සමානා

නිබ්බානං සච්ඡිකරොති යථා මහාරාජ අත්ථි නානී සත්තරතනානි සෙය්‍යථීදං චක්කරතනං හත්ථිරතනං අස්සරතනං මණිරතනං ඉත්ථි රතනං ගහපතිරතනං පරිණායක රතනානන්ති තාවතිංසං රතනානං නික්ඛිත්තාකාරසා අත්ථි ඛත්තියානං සම්මාපටිපන්නානං පටිපත්ති බ්‍රහ්මණා තානිරඤ්ඤානි උපගච්ඡන්ති එවමෙවඛෝ මහාරාජ අත්ථි නිබ්බානං තත්ථිව තස්ස නිබ්බානස්ස නික්ඛිත්තාකාරසා සම්මාපටි පත්තියා අයානිසා මනසිකාරෙන උදයබ්බයං සම්පස්සමානා නිබ්බානං සච්ඡිකරොතීති'' යනු මිලින්දප්‍රශ්නපාඨයි.

මෙහි සංක්ෂේපභාවය මෙසේයි.

ආයුෂ්මත් නාගසේන මහාස්ථවිරයන්වහන්ස යතරදිග සතර අතුදිග උඩුවට යන දසදිශාවන් අතුරෙන් යම් දිශාවක්හි පිරිනි වන්පානා මහරහතුන්ගේ පිනිපිටව ආධාරවූ නිර්වාණධාතුව විද්‍යමා නවන්හේදැයි මිලිඳුමහරජතුමා විසින් විචාළකල්හි මහරජ රහතුන් ගේ පිරිනිවීමට මත්තෙහි උත්වහන්ස්ගේ පිනිපිටමට සුදුසු නිර්වාණ ධාතුව යම් දිසාවක්හි පිහිටා නැත්තේසයයි විචාළකල්හි සවාමිනි එසේ කැත්තේවීනම් නිර්වාණනම්වූ යම් ධර්මයක් ඇතිවීය හෙයින් ශාශ්වතාණය උදුම්බර පුෂ්පය යනාදියසේහි නිර්වාණනාමවූ පැණවීම් මාත්‍රයක් වියයුතු හෙයිනි විචාළේය සවාමිනි මේ නිර්වාණ නාමති ප්‍රඥප්තිමාත්‍රයට කාරණවූ ශරීරධර්මයක් නැත්තේදැයි ඉක්බිතිගිදු විචාළේසේ. තවද සවාමිනි මේ ලෝකයෙහි විද්‍යමානවූ මුක්තාමාණි ක්‍යාදි රත්නයන්ම ආධාරයක් ඇත්තේය සුගන්ධියට පුෂ්පයක් ඇත්තේය ධාන්‍යයන්ට කෙතක් ඇත්තේය ඵලයන්ට වෘක්ෂයක් ඇත්තේය එසේමන්ම නිර්වාණධර්මයටද ආධාරයක් කැමතිවියයුතු හෙයිනිදැයි. විචාළකල්හි ආයුෂ්මත් නාගසේන මහායථවිරයන්වහන්ස මේ ඉතුදක්වතාක් ශෛක්ෂ සෝපාදිශෂ අනුපාදිශෂ සංඛ්‍යාත ප්‍රකාර නිර්වාණධර්ම උපමාවෙන් ප්‍රකාශකොට විදහළේසි මහරජ හිනිඵපදවනු කැමති පුරුෂයෙකුගේ යම්සේ හිනිගහනාදඬුමදක ඒකට ගැටීමෙන් හිනි උපදවාගන්නේවිද ? එපරිදෙන් කෙලෙස් නසනුකැමති කෘතාධිකාර ඇතැම්වූ උත්සාහවන්වූ අයාගාවචර මතෙම් නාමරූප ධර්මයන් අනිත්‍යදුඃඛ අනාත්ම යනා ත්‍රිලක්ෂණයට ආරොපනයකොට විදර්ශනාවඩන්නේවිද ? ඒ විදර්ශනා භාවනා බලයෙන් සටකීනයින් සෝවාන් ආදි සතරවග සගරඵලයන් කරණ මහාප්‍රභාව ගෞවන් මැණිඵල ඳුන නැමැති ඇසින් ඒ නිර්වාණධාතුව ප්‍රත්‍යක්ෂකාරන්නේය භාග්‍යවන්ත් ප්‍රඥනැමැති ඇසින් දක්නේය රහ තන්වහන්ස්ගේ මේ ප්‍රත්‍යක්ෂකිරීම කෙලෙස්රහිතවූ පඤ්චස්කන්ධ හා සඵල පවත්නා නිර්වාණය යන අර්ථයෙන් සෝපාදිශෂ නිර්වාණයයි කියන්නේමැයි.

තවද මහරජ සක්විතිරජය ලැබීමට කෘතාධිකාර ඇතැම්වූ පුණ්‍යවන්තවූ ක්ෂත්‍රිය රාජකුමාරයෙක්මතෙම සටකීනයින් දස සක් විතිවත් පුරන්නේවිද? ඒ සක්විතිවත් නැමති ප්‍රතිපත්තිය කරණ

සොවිගෙණ භගවන්ගේ මහාකුශලචිත්ත ජනිත තෙජෝධාතුව පරම්ප රාවශයෙන් ඉපිද ඉපිදමගාස් දාච්ච මලාකධාතුවෙන් චක්‍රරත්නය ආදි සප්තවිධරත්නය පහළවෙයි. ඉක්බිති ඒ සක්විතිරජගමේ ඒ චක්‍රරත්නයට පැන්වඩා චක්‍රවර්තාරූඪව සතරමහ දිවයිනා අනුශා සනාකාරමින් කැමති පරිදෙදුන් හැසිරෙයි එමෙන්ම ලබනලද අතීත් එල ඇතතාවූ මහරහතුන්වහන්සේගේ සකාඩි ප්‍රතිඛඩව පවත්නාවූ අතීත්එල සංඛ්‍යාතවූ නිවීණධාතුව නිමිත්තකොටගණ පඤ්ච ස්කන්ධයන්ගේ අනුත්පාද නිරොධයවෙයි එනැන්පටන් ඒ අසංඛ්‍ය ධාතු සංඛ්‍යාත නිවීණධාතුමාත්‍රය සදෘකාලිකව අවිපරිතාකාරයෙන් පරමශාන්ත ශීතල සවභාවවත් ශුකතාව පවත්නේයයි වදාළකල්හි මිලිදුමහරජතෙමේ සංකාවිනොදනයෙන් පරම ප්‍රීති ප්‍රමොදාදයට පැමිණියේය මෙසේ මේ උභතරාරණී අඛරාරණී යන ඉතිහාසා දඩිමදක එනට ඉඇවිමත්මෙන් විදගීනාභාවනාවෙහි උත්සාහ වැඩි මද ඒ උත්සාහයෙන් පෙර නොපැවති ගින්න පහළවීමක්මෙන් සතා රමග සතරඵලයෙන් පත්‍යක්ෂකරන්නාවූ සෙසාපාදිශෙෂ නිවීණ ධාතුවලැබීමද සක්විතිරජගට පහළවන්නාවූ චක්‍රරත්නය මෙන් මහරහතුන්වහන්සේගේ පිරිනිවීමෙන් අවශිෂ්ටවන්නාවූ අනුපාදි ශෙෂ නිවීණධාතුවද දතයුතුයි සෝදාන් ආදි ත්‍රිවිධමාගීඵලලැබූ යන් අනිරුඬව පවත්නාතාක්කල් මුළුල්ලෙහි ඒ මාගීඵලලැබූ නොසෙව නිවීණධාතුව අරමුණුවනබවද ඒ මාගීඵලත්‍රය නිරුඬව ගියාවපසු නැවත නිවීණධාතුව මුවහළි යන බවද අතීත් මාගීඵල ලැබූයන්වහමුවූ නිවීණධාතුව සුසෙඛීදයෙහිමෙන් නැවත මුළුහ නොවී දිවිනිමගහා ප්‍රත්‍යක්ෂවම පවත්නාබවද දතයුතුයි ඊට උපමාවක්නම් තෙල්පහණක් දැල්වූකල්හි යම් සිතුයම්පවක් දෘෂ්‍ය මානවී ඒ පහණනිවීගියකල්හි සිතුයම්පව මුවහළි යන නුමුත්සූක්ෂ්ම උදවූකල්හි කිසි මුවහළිමක්නොවී සිතුයම්පව ප්‍රත්‍යක්ෂවපෙණන්නාක්මෙන් සෝවාන් සකෘදගාමී අනාගාමී මාගීඵලක්ෂණත්‍රයගේ නිවන්හමුවී මාගීඵලයන්ගේ නිරෝධයන්පසු නිවීණය මුවහළිද අතීත්මාගීඵලක්ෂණත්‍රයගේ හමුවනනාවූ නිවීණධාතුව පිරිනිවන්පානා තුරු මුවහළනොවී ප්‍රත්‍යක්ෂව පැවතා පිරිනිවන්පෑමෙහිදි පඤ්චස්කන්ධය නැවතා නුපදනා පරිද්දෙන් නිරුඬවී සෙසාපාදිශෙෂවශයෙන් (ප්‍රවස්කන්ධය හා සමග) පැවති නිවීණධාතුව අනුපාදිශෙෂභාවයට මහවන් පඤ්චස්කන්ධය නිරුඬවී ඒ අසංඛතධාතුත්‍රයකට පැමිණි කල්හි ඒ ධර්මය අවිද්‍යාදි ප්‍රත්‍යයෙන් හවනොගන්බැවින් කිසිකලයා විනාශදහනවෙයි ඒ නිවීණධාතුවට වඩා ප්‍රභාශවරතරවූ බබලන්නාවූ දීප්තිමත්වූ ශුභවණීවූ ධර්මයක්නැතිබව ඇවැසී අවුවා පායියන්නෙහි දතයුතුයි. සත්වයාගේ නැවත නැවතා හවයෙහි ඉපදීම වැළැක්වීයහැකි ධර්මයක් මේ අසංඛතධාතුහැර නැත් තේය අවිද්‍යාදි අකුශල පක්ෂයෙහි මහතු ශක්තියෙන් සසර පැවැත්ම ඇතිකරන්නාක්මෙන් හවත් පිරිසයින් කප්ලක්ෂයක් මුළුල්ලෙහි රශ්මිකරණලද දානාදිදස පාරමිවිදගීනානැමති දුරු සහන මහතුබලයෙන් මේ අසංඛතධාතු රත්නය පහළව පැවැ

සකාන්ධයව සපගිවුකල්හි යම් දිව්‍ය ඖෂධයක් යුපගීවීමෙන් නැවත භවමනානන්නාපරිදී උගුහ විෂයක් නසන්නාක්මෙන් ඒ තුවජවූ නිඤ්ඤනවූ පඤ්චස්කන්ධය නැවත නුපදනා පරිද්දෙන් නිරුඩව ඒ පඤ්චස්කන්ධය අසංඛතධාතුවට පෙරළෙන බැවින් ඒ සත්ත්වතෙමේ නිවන් දුටුයේය නිවනටඛිණේයහි ව්‍යවහාරකරන් සත්ත්වතෙමෙන් නිවන්නිණේය යන්නෙහි අදිවියනම් ඒ සඬයාට අයිගිවූ පස්කඳ නිර්‍ඝණධාතුවට පෙරළීවිණේය යනුයි. සුඛණහඩගුර පඤ්චස්කන්ධය නිරුඩව අසංඛතධාතුව ඉතුරුව පවත්නා බැවින් උපවජ්දයට හෝ අවිද්‍යාතෘෂ්ණා සංස්කාරමහතුමවන් පඤ්චස්කන්ධය ඉපද සදුකාලිකව පැවැත්මක්නැතිබැවින් ශාස්වතයට හෝ ඇතුළත්නොවී පරමශාන්තභාවයට පැමිණ සදුකාල සැපයට පැමිණෙන්නේමැති. ඉදින් පඤ්චස්කන්ධය අසංඛතධාතු සංඛ්‍යාත නිර්‍ඝණධර්මයට පෙරළී සදුකාලිකව පවත්නේනම් එහි වඳින්නේකවිද? ඊට සැපය ගන වාව හාරය කෙසේලැබෙන්නේද්දැයි සැකකව යුත්තේය නිරන්තරයෙන් උත්පාදස්ථිති භඟ සංඛ්‍යාත සංඛාරදුකඛයන් හා කලින්කල තෙරඅපායාදි දුනවපැමිණීමෙන් ජාතිජරාව්‍යාධි මරණශෝක පරිදේවාදි බිදුමුඛයන්පවා කිසා නිමනොකව හැකි අනන්ත අප්‍රමාණ දුක්ඛද උපද්‍රවතවූ මේ පඤ්චස්කන්ධයාගේ පරමලෙමින් පැවැත්ම නුවණැති උතුමනාවූ ඉතුමාශයයකුව. ඒ කාරණ දුක්බව වැටහෙන්නේමැති. හවිරුදු කප්දහස්ගණන් දිව්‍යබ්‍රහ්මලෝකවල දිව්‍යසැපවිඳ එතිත් චුතවකාඔධාතුවට එන්නාවූ සත්ත්වයෙක් සංජීවාදි මහානරකමයක මහා ක්ෂුධාග්නියෙන්දවන්නාවූ ප්‍රේතාත්මයහි මහා අනුන්ව ගොදුරුවන්නාවූ තිරිසන්ආත්මයහි මහා එකාන්ධකාරවූ ලෝකාන්තරික නරකමයක මහා ඉපිද මදකලක් විඳිනාවූ දුක්කම්බැවුළුණැණ කල්පනාකර බලනකල්හි දිව්‍යබ්‍රහ්මලෝකාදියෙහි ඉපිද අනන්දාදහස්කල්මුළුල්ලෙන් විඳිනාවූ සියළු සැපය ඒ අපායදුකෙහිම ඇතුළත්වෙයි ලෝකාගඤණ කල්පනාකරන්නාවූ නුවණැත්තනුට සදුකාලිනව යම්තැනෙක සැපවිඳිම එකාන්තයෙන් සිඳනොවිසහැකි බාලජන සම්මාදිට්ඨ්‍යාදික්බව හස්තාමලකයක්මෙන් වැටහෙන බැවින් මේ සත්ත්වයාගේ පවත්කන්ධ නිරොධය මහතුතුවූ අසංඛතධාතු සංඛ්‍යාත නිර්‍ඝණයම පැමිණිමෙන්මුත් අන්ත්‍රුයකින් සැපයක් නොලැබියහැකිබව කල්පනාවට ගතයුතුයි.

නිර්‍ඝණධර්මයැති විස්තරකථාව අප විසින් ලියනලද "නිබ්බුති නිබ්බුතා මහදීපනී" නම්වූ පාලිග්‍රන්ථිකථා සුමාසුවකින් උදහරණ දක්වනලද්දවූ මේ ඝනරධර්මසංග්‍රහය බලා දතයුතුයි.

මේඝතනායම්‍යුප සංකමම්
ලොකාලොක දිවාකරං
සුත්වාසඩ්ඩම මමලං
පාපුමණ්‍යං සිවංපදං

ශීලනන්දිගය නිම්.

දැන්වීම යි.

අවවාද පරිවෙජදය, දූනපරිවෙජදය, සහ සීලපරිවෙජදය, යන කාණ්ඩ තුණකින් යුත් මෙම ශ්‍රී සද්ධර්ම පුස්තකයෙහි පළමු වෙනි කාණ්ඩයවූ අවවාද පරිවෙජදයේ වැඩ නිමවූ බැවින් එය ඉතා සතුටින් ලොකයා අතට එවීමු. ඉතුරු කාණ්ඩදෙකද මෙ සේම අවිවුගස්වා ප්‍රසිද්ධ කරන්නෙමු.

මෙම පොත් ඕනෑකරණ මහතුන් දිනකරප්‍රකාශ අච්චු කන්තෝරුවේ මාර්ෂල් රුද්‍රිගුහාරයේ යූ. ඇල්. ජී. ප්‍රේරා වෙත ටයි කියා ලියුම්පිට ලියා එවිය යුතුයි.

මේ පොත මාස්පතා කලාපවශයෙන් දිගන එන පොත ක් බවත් මේ ගැන ලියාතිබෙන සංශුපනය මුළුපොත අච්චු ගස්වා නිමවුනාම ඊට අඩුඩිගුකර දෙන බවත් සැලකිය යුතුයි.

පිටු 64 කින් යුත් පළමුවෙනිකාණ්ඩය
අවවාද පරිවෙජදය ශත 50
තැපැල් වියදම 2

U. L. G. Perera,

වර්ෂ 1892 ජූලි මස 16 වෙනි
දින කොළඹදීය.

ශුද්ධිපත්‍රය.

පිට	පෙළ	අශුද්ධ	ශුද්ධ
2	18	ඛඤ්ඣනාදිවූ	ඛඤ්ඣනාදිවූ
3	10	චක්‍රවාටාදී	චක්‍රවාටාදී
4	1	නාසාදිවූ	නාසාදිවූ
4	7	අදනතාදුනාදිවූ	අදනතාදුනාදිවූ
4	8	පාදවෙජ්දුදිවූ	පාදවෙජ්දුදිවූ
4	31	දුනශිලාදිවූ	දුනශීලාදිවූ
5	16	දහසක් යෙදුන්	දහසක් යොදුන්
8	12	මනුෂ්‍යලොකයෙහිදී	මනුෂ්‍යලොකයෙහිදී
8	29	සැවත්නුවර	සැවැත්නුවර
8	31	ඒඇර	ඒහැර
8	32	ගම්නුත්	ගම්නුත්
8	35	නෙවේලෙහි	නොවේලෙහි
9	8	උදුසනක්සේ	උදුසනක්සේම
9	22	කියේවින්නම්	කියේවිම්නම්
11	30	කටයුතු	කටයුතු
12	26	ප්‍රඥුඇතිව	ප්‍රඥුඇතිව
13	14	ගිහිගෙන් නික්ම	ගිහිගෙන් නික්ම
13	14	මහණවින්නම්	මහණවිම්නම්
16	18	මහණවින්නම්	මහණවිම්නම්
17	11	මවුපිය	මවුපිය
17	21	කොසීතනම්ගම	කොසීතනම්ගම
18	1	ගිහිගෙය	ගිහිගෙය
18	11	කියයුතු	කියයුතු
18	30	අනවරාග්‍ර	අනමතාග්‍ර
19	20	සිපිනාවූ	සිවිනාවූ
19	21	රක්‍ෂාකෙරෙති	රක්‍ෂාකෙරෙති
20	22	රඩාප ල	රඩපාල
20	36	නෑයන්ගෙන්	නෑයන්ගෙන්වත්
23	24	කටයුත්තෙයසි	කටයුත්තේයසි
24	15	අගුළු	අගුලු
25	24	කරණුපිණිස	කරණුපිණිස
25	31	අපිතිකො	අපීතිකො
27	11	දණ්ඩායුධාදියෙහි	දණ්ඩායුධාදියෙහි
27	30	ගතනොහෙන්නවූ	ගතනොහෙන්නාවූ
28	31	තීරයෙහි	තීරයෙහි

පිට	පෙළ	අශුඛ	ශුඛ
29	13	ජීවිතානකය	ජීවිතානඤය
30	26	ගතනෙගේනම්	ගතනොගේනම්
30	37	චිතතසන්‍ඤාන	චිත්තසඤ්ඤාන
33	5	පයසෝදවම්හ'සී	පයසෝදවම්හ'සි
33	17	දැන්	දැන්
33	22	භාවග්‍රය	භවාග්‍රය
33	24	පැමිණියෙමි''	පැමිණියෙමි''සි
34	6	සුදුසුදැ''සි	සුදුසුදැ''සි
34	10	ප්‍රමොදු	ප්‍රමෝද
36	15	පැමිණමෝද	පැමිණෙමෝද
36	19	ලොහිතං	ලොහිතං
36	24	කෙලෙද	කෙලද
36	36	හෙසින්දැසි	හෙසින්දසි
37	22	ගහනව	ගහණව
37	23	ගහනව	ගහණව
37	24	ගහනව	ගහණව
38	9	ගහනව	ගහණව
38	27	කොළපත්	ඔකාලපත්
39	11	නාතිරිවෙවය්‍ය	නාතිරිවෙවය්‍ය
40	1	ඝඩලපයහඝ	ඝඩල්පයඝ
40	9	පිරවරාගෙන	පිරිවරාගෙන
41	6	නොවැටි	නොවැටී
41	29	තිසරණදී	තිසරණදී
43	1	චන්‍ද්‍රදෙවී	චන්‍ද්‍රාදෙවී
43	6	චන්‍ද්‍රදෙවී	චන්‍ද්‍රාදෙවී
43	11	චන්‍ද්‍රදෙවින්	චන්‍ද්‍රාදෙවින්
43	13	චන්‍ද්‍රදෙවින්ගේ	චන්‍ද්‍රාදෙවින්ගේ
46	4	චන්‍ද්‍රදෙවින්ට	චන්‍ද්‍රාදෙවින්ට
47	8	මහොතතමයො	මහොතතමයෝ
47	16	නිතොර	නිතර
47	34	වැඩහිඳිනා	වැඩහිඳිනා
48	35	ගතනොහි	ගතනොහි
49	5	එකදවසකත්	එකදවසෙකත්
49	9	සිතා	සිතා
51	10	නොසිතා	නොසිතා
51	14	සෘතුවට	සෘතුවට

පිට	පෙළ	අශුඛ	ශුඛ
52	1	එකදවසකත්	එකදවසෙකත්
52	5	දූනශීලාදිවූ	දූනශීලාදිවූ
52	10	ම්පිතෙනෙහි	ම්පිතැනෙහි
52	16	නෑවිසිහිනුවණ	නොවිසිහිනුවණ්
52	25	රජ්ජුරුවන්	රජ්ජුරුවන්
53	17	රැදුවල්	රැඳුවල්
54	35	විශ්වකම්ම්	විශ්වකම්ම්
55	5	කුම්ට	කුම්ට
55	11	සම්ජ්ඣිඤා	සම්ජ්ඣිඤා
55	18	නමූහොස්ම්ං	නමූහොසම්ං
55	20	ඛිහිරි	ඛිහිරි
56	6	පහූතහකෙඛා	පහූතහකෙඛා
56	7	බහූනං	බහූනං
56	23	අලංමෙමතෙන	අලමෙමතෙන
56	26	අකූසල්	අකුසල්
56	33	ප්‍රයෝජන කින්ද	ප්‍රයෝජන කිම්ද
57	29	සාලිව්‍රිහාදි	සාලිවිහාදි
60	28	ඇතුළත්කෙට	ඇතුළත්කොට
62	17	එමේ	ඒමේ
63	24	කවරේදැ''සි	කවරේදූ''සි
64	21	ගිණිම්ව	ගිණීමට
64	33	ලොකාතතරඃගී	ලොකොතතරමාගී

අවවාද පරිවෙජදය.

නමොතස්ස භගවතො අරහතො
සම්මා සම්බුධස්ස,

නත්ථිහං භවකන්තාර තරණං රතනත්තයං
පකාසෙස්සාමි හාසාය සබ්බේසං දීප වාසිනං,

සකල සත්වවගීයා කෙරෙහි පතල කරුණාවෙන් සාරාසඞ්ඛ්‍ය කප්ලක්ෂයක් මුළුල්ලෙහි දැන ශීලාදි සමතිස් පෙරුම්පුර බොධි පඨ්ඛාරුඪව මාර පරාජයකොට සවාසනා සවීකෙලෙශයන් නසා බුදුවූ සවීඥ රාජෝත්තමයාණන්වහන්සේගේ සබ්බඤ්ඤ පවතිනාකාලය බුඩොත්පාද කාල නම.

එබදුවූ බුඩොත්පාදයට පැමිණි ශ්‍රඛා බුඩි සම්පන්නවූ සත් පුරුෂයනි තොප විසින් මෙසේ සැලකියයුතු.

කෙසේදයත් ?

"ලොව කසිසළු නම්වූ වසතු ජනපයෙක් ඇත, හේ කපු විළි තුනකින් ගත් සුලුනොන් එක වල්ලක් බැගින් සිහින් වලු අඹරා සිහින් නූල් කැට ඉන් වියන ලද්දේය. ඒ වසතුය කාන්පිවින් අග්‍රය නොකළහැක්කේය, දෙකඩ සරිවූකල නිල කාෂාපණයෙන් තිස්දහසක් අගය ඇත්තේය, මහලුවූකල දසදහසක් හෝ දෙලොස් දහසක් හෝ අගය ඇත්තේය, ඉන් එක් කාෂාපණයෙක් නම් දැන් ලඞ්කාවේ පවත්නා පණමින් පස්විස්සක් හෝ තිසක්හෝ අගනේය, එබදුවූ කසිසළුවක් ඇදගෙන යම් සෘඩිමත් පුරුෂයෙක් අවුරුදු සියයක් ගියකල එක එක වරක් බැගින් ඇමදීමෙන් දිගින් සතර ගව්වක් පලලින් සතර ගව්වක් උසින් සතර ගව්වක් පමණ ඇති පස් මිශ්‍රනොවන්නාවූ සිදුරු නැත්තාවූ එකඝනවූ ගල්පර්වතයක් අමදනේවිනම් ඒ එසේ අවුරුදු සියයක් පිරුණු තැන එක එක වරක් ඇමදීමෙන් ඒ ගල්පර්වතය උදු ඇටක් පමණව ගෙවීනමුත් කල්පයෙක අවුරුදු ගෙවියන්නේ නොවෙයි" බුදුන් බුදුව වදාරණලද.

එසේ කල කල්ප පරිවෙජදය කෙසේ වේදැයි යතහොත් ? මෙරු යුගුඤ්ඣර පෘථිවි සමුද්‍රාදීන්ගේ නැසී හටගැන්මෙන් වන්නේය, එසේවූ කප් අසඞ්ඛ්‍යයකුත් බුදුකෙනකුන් ලොව ඉපදී

මක් නැත්තේය, එහි "අසංඛ්‍යයෙක්" නම් කෙපමණ කලෙක් දැයි යතහොත් ? මෙලොව කෙළෙමණ ගණිත ශාස්ත්‍රයක් දන්නා කෙනකුත් විසිනුත් අසඞ්ඛ්‍යගණන් සුඛුකොට කියාගත නොහැක්කේය, එබැවින් නවලක්ෂ සැටදහසක්ගව් ගැඹුරඇති වවින් චක්‍රවාට පර්වතය අවසන්කොටඇති සතිස්ලක්ෂ දසදහස් තුන්සිය පණස් යොදුන් වට ඇති මහපොළොව පස්කපා රැස් කොට ඒ පස් තිබ්බටු පමණ බෙබරඇට පමණ ගුළිකොට ගිණුවත් අසංඛ්‍යයකට පමණ කටනොහැක්කේය, එබඳු කප් අසංඛ්‍යයකුත් බුදුකෙනකුන් ලොව ඉපදීමක් නැතිකල්හි යම්සේ චන්ද්‍ර සූර්‍යයන්ගේ ලොව ඉපදීමක් නැතිකල්හි සංවත්සර සෘතු මාස තිථි නක්ෂත්‍රාදීන්ගේ ලොව ව්‍යවහාරයක් නැත්ද එමෙන් එබඳුවූ අබුබොත්පාද කාලයෙහි සබ්බඤ්ඤ නොපවතිනා හෙයින් "පව් මේය පින් මේය" යි කියන විභාගයක් නැතිහෙයින් පින් රැස්කිරීමත් සවියාට නොපිළිවන, ලොවුතුරා බුදුන් ලොව පහළවූවත් සත්වතෙම සංජීව කාලසූත්‍රාදි අටමහ නරකයෙන් එක් නරකයෙක හෝ ඔසුපත් නරකයෙක හෝ උපන් නේවිනම් සබ්බඤ්ඤුත්වඥාණයක් තබා "බුදුන් උපනැ" යි යන බස් පමණකුත් අසන්ට නැති හෙයින්ද එහි පවිබ්බ බන්ධනාදිවූ කම්කටුල් කිරීමෙන් කායික මානසික දුඃඛයෙන් අතුරු නැතිව පවතිනා හෙයින්ද පින්කිරීම නොපිළිවන, එසේම බුබොත්පාදයෙහි උපදනා සත්වයා මනුෂ්‍යව නොයිපද තිරිසන්ජාතියෙක උපන්නේ වීනම් "පව් මේය පින් මේය" යි යන විභාගයක් නැති හෙයින්ද ඔවු නොවුන් කෙරෙහි භයින් නැතිගත් සිත් ඇති බැවින්ද කාමක්‍රෝධාදිය බලවත්ව පවත්නා හෙයින්ද පින්කිරීම නොපිළිවන. තවද බුබොත්පාද කාලයෙහි මිනිස්ලොව නොයිපද සත්වතෙම ප්‍රේතලොකයෙහි උපන්නේ වීනම් "පෙර මම පින් නොකොට මෙබඳු දුක්විඳිමට පැමිණියෙමි" යන පශ්චාත්තාපය නිරන්තරව පවත්නා හෙයින්ද සාපිපාසා දෙකින් මඩනාලද බැවින්ද පින්කිරීම නොපිළිවන.

තවද බුබොත්පාද කාලයෙහි මිනිස්ලොව නොයිපද පන්සියයක් කල්පයට ආයුෂය ඇතිව චිත්තයනැතිව රූපමාත්‍රයක් පවතිනා අසංඥතලයෙහි උපන්නේ වීනම්ද,

එසේම රූපදෙහයක් නැතිව සිත පමණක් පවත්නාවූ විසි දහසක් කල්පයට ආයුෂඇති ආකාසානඤ්චායතන ලොකය, එසේම සතලිස් දහසක් කල්පයට ආයුෂඇති විඤ්ඤාණඤ්චායතන ලොකය, එසේම සැටදහසක් කල්පයම ආයුෂඇති ආකිඤ්ඤායතන ලො

කය, එසේම අසූසාර දහසක් කල්පයට ආයුෂැති නොවසඤ්ඤ නාසඤ්ඤ යතන ලොකය යන අරූපලොක සතරෙහි උපන් නේවිනම්ද බුදුන් දැකීමද සඬ්ම ශ්‍රවණයද නොපිළිවන් හෙයින් පින් නොකළහැක්කේය.

තවද බුඩොත්පාදකාලයෙහි මනුෂ්‍යජාතියෙහි උපන්නොත් පිටසක්වල උපන්නේ වීනම් එහිත් පින් නොකටහැකි වන් නේය. කවරහෙයකින්දයත්? චන්ද්‍ර සූර්‍ය්‍ය දෙදෙනාගේ රශ්මින් එලිවන පමණක් එන් සක්වලෙන් නම හේ සතිස්ලක්ෂ දස දහස් තුන්සිය පණස් යොදනක් වටය එපමණ සක්වලවල් කෙළලක්ෂයක් විවින් ගෙන රිට මෙරු යුගන්ධර චක්‍රවාටාදි පවී තයන් උපුටා බිම සමකොට උඩින් ගල්පවිතයක් දැමූකල සාර මස් දෙපෝයකින් බිමට එයි, එපමණ උසඇති භවාග්‍රය දක්වා අඩ පුරලා සතර දිගින් එකදිග සක්වලවල් නියම දනිනා පිණිස යම් සෘඩිමත්වූ පුරුෂයෙක් එක සක්වලකට එක අඩ ඇටක් බැගින් දැමුයේ වීනමුත් කෙළලක්ෂයක් සක්වල පිරූ අබගොඩ නිමාවට යේනමුත් සක්වලවල් නිමාවට යන්නේ නොවෙයි. සතර දිග මෙසේම අප්‍රමාණවූ සක්වල වන් නේය. එසේවූ අප්‍රමාණ සක්වලවල් අතරෙන් මේ මගුල් සක්වලමුත් අන් එකද සක්වලකත් බුදුවරයෝ උපදනාහු නොවෙති. අනෙක් සක්වලෙක බුදුබණ පවත්නේ නොවෙයි. සඬ්ඝයාවහන්සේගේ දැකීමෙක් නැත. එබදු පිටිසක්වලෙක උපන්නාවූ සත්වතෙම කෙසේනම් පින්කරන්නේවේද? පිටී සක්වලතබා බුදුන් උපන් මේ මගුල්සක්වල සත්දහසක් යොදුන් පූර්වදිගෙහය, රිට පිරිවරවූ පන්සියයක් දිවයිනා, එසේම අට දහසක් යොදුන් උතුරුකුරු දිවයිනය, රිට පිරිවරවූ පන්සියයක් දිවයිනා, සත්දහසක් යොදුන් අපරගොයානය, රිට පිරිවරවූ පන්සියයක් දිවයිනා යන මෙහි තැන්වල උපන්නාහටත් නිවන් දැකීමට සුදුසුවූ පින් පිරෙන්නේ නොවෙයි. මේ ජම්බුද්වීපයට පිරිවරවූ දිවයින් පන්සියයෙහුත් මේ ලඬකාද්වීපයහැර සෙසු දිව යින්වල උපන්නාහටත් පින්පිරෙන්නේ නොවෙයි. ජම්බුද්වීප යෙහුත් බඹුරන් වැද්දන් ඉන්නා ප්‍රත්‍යන්තවල උපන්නා හටත් පින් සිඳවන්නේ නොවෙයි. එසේවූ ප්‍රත්‍යන්තයෙක නොසිපද බුඩොත්පාද කාලයෙක දඹදිව උපන්නොත් ජාත්‍ය න්ධ ජාතිබධිරව උපන්නේ වීනම් නුවණැත්තන් දැකීමක් හෝ ඔවුන්ගෙන් බණඇසීමක් හෝ ඒ සිතතබා කිමෙක් හෝ නොපිළිවන් හෙයින් පින්සිඳවන්නේ නොවෙයි. එසේ ඇස් කන්

නාසාදිවූ ඉන්ද්‍රියයන්ඇතිව තුනුරුවන් පවත්නා ප්‍රතිරූප දෙශ යෙක උපන්නොත් මෙ ලෝ නැත, පරලෝ නැත, කම්නැත, කම්පලනැත යනාදීන් දක්වනලද ලබ්ධිඇති මිථ්‍යාදෘෂ්ටි කුල යෙක උපන්නේවීනම් රතනත්‍රයට විරුඛව පවතිනා හෙයින් නිර්වාණගාමිවූ කුශලයක් කළහෙන්නේ නොවෙයි. එසේ ජාත්‍යන්ධ ජාතිබධිර නොව මිථ්‍යාදෘෂ්ටි නොව ප්‍රතිරූප දෙශ යෙක උපන්නාවූ යමෙක් ප්‍රාණඝාත අදත්තාදානාදිවූ අකුසල් කොට හස්තවෛශ්‍යද පාදවෛශ්‍යාදිවූ මහත් කම්කවුලට පැමිණ මහත් දුක්විඳිමින් මනුෂ්‍ය නාරකික වූයේද? යමෙක් තමා පෙර කළ අකුසල් බලයෙන් අශන වසන මාත්‍රයකුත් නොලැබ සාපිපාසා දෙකින් පීඩිතව කපාල හස්තව සිගාකා ඇවිදිමෙන් මනුෂ්‍යප්‍රෙත වූයේද? යමෙක් අනුන් අයතිව අනුන්ගේ මහත් භාරදියක් උද්වහනයකොට ඇවිදිමෙන් ලොකසිම්බව ඉක්මවා අනාචාර ශීලීව අනුන්විසින් භයගන්වනලදුව කැලෑවැද දුක් බහුලව හිතාහිත නොදැන ඇවිදිමෙන් මනුෂ්‍ය තිරශ්චින නම්විද? එසේවූ අයටත් බොහෝසේ පින් පිරෙන්නේ නොවෙයි.

අපිවූකලී එසේනොව නාරකාදි සතරඅපායෙන් මිදී පිටිසක්ව ලෙකනොසිපද අසංඥ අරූපලොකයෙක්හි නොසිපද අද ගොඑ බිහිරිනොව මිථ්‍යාදෘෂ්ටිනොව මනුෂ්‍ය නාරකිකනොව මනුෂ්‍ය ප්‍රෙතනොව මනුෂ්‍යතිරශ්චිනානොව කප් අසංඛ්‍යයකිනුත් ලැබ ගත නොහැක්කාවූ දුර්ලඞ්ඝවූ බුඩොත්පාද කාලයෙහි බුදුන් වදුල ත්‍රිපිටක ධර්මය සම්පූර්ණවම පවත්නාවූ දැගැප් මහබෝ ආදිවූ පූජ්‍ය වසතුවෙන් සැදුම්ලද්දාවූ මේ ශ්‍රීලඞ්කාද්වීපයෙහි උප නුම්ඹ බුදුකෙනකුන් විසිනුත් නියා නිමවාලිය නොහැක්කාවූ අනන්තා පර්‍යන්තවූ සංසාර දුඃඛය අප ගියදවස ච්න්දේ මෙබදු බුඩොත්පාදයක් ලැබ පින්කොටගත නුහුනු නිසාය. එසේ ලැබ පින්කළමෝනම් ත්‍රිවිධ බොධියෙන් එක්තරා බොධියකට පැමිණ සසර දුකින් මිදී අමාමහ නිවණට පැමිණිය මෝ වම්හ.

දැනුත් බුදුන් වදුළ සබ්ම්මය අසා දැන ශීලාදිවූ ගුණධර්ම යන් පුරා නිවන්දැකීමට සුදුසුවූ පින් සිඛනොකලමෝනම් මතු කවරකලෙක කෙසේ සසර දුකින් මිදියමෝද?

හේ මෙසේ දතයුතු.

කිසි සෘඩිමහිමයක් නැත්තාවූ යම්පුරුෂයෙක් තමාගේ බල පරාක්‍රමතා "මහාමේරු පර්වතමස්තකයෙහිපිහිටියාවූ තවතිසා

දෙව්ලොවරට මේ මිනිස්නයින් යෙමි" යන සිතින් මේ පෙනෙන් නාවූ මහමුහුද පිනාගොස් ගව්වකින් අධිකවූ සත්‌යිය සපණස් * යොදුනක් උසඇති අශ්‍වකණ්ණ නම් පර්වතයට නැගී එයින් බැස දෙගව්වකින් අධිකවූ එක්දහස් තුන්සිය දෙලොස් යොත් නක් පලලඇති පලමුවෙනි සීදන්‍ත සමුද්‍රය පිනා එපමණ උස ඇති විනතක පර්වත මස්තකයට නැගී එයින් බැස දෙදහස් සසිය පස්විසි යොදනක් පලලඇති දෙවෙනි සීදන්‍තසමුද්‍රය පිනා එපමණ උසඇති නෙමින්ධර පර්වත මස්තකයට නැගී එයින් බැස පන්දහස් දෙසිය පණස් යොදුන් පලලඇති තුන්වන සීදන්‍ත සමුද්‍රය පිනා එපමණ උසඇති සුදර්ශන පර්වත මස්තකයට නැගී එයින් බැස දසදහස් පන්සියයක් යොදුන් පල ලඇති සතරවන සීදන්‍ත සාගරය පිනා එපමණ උසඇති කර වීක පර්වත මස්තකයට නැගී එයින් බැස එක්විසි දහසක් යොදුන් පලලඇති පස්වන සීදන්‍තසාගරය පිනා එපමණ උස ඇති ඊසධර පර්වත මස්තකයට නැගී එයින් බැස දෙස ලිස් දහසක් යොදුන් පලලඇති සවෙනි සීදන්‍ත සමුද්‍රය පිනා එපමණ උසඇති යුගන්ධර පර්වතයට නැගී එයින් බැස අසූසාර දහසක් යොදුන් පලලඇති සත්වෙනි සීදන්‍ත සාගරය පිනා එපමණ උසඇති මහාමේරු පර්වත මස්තකයෙහි ශක්‍රපුර යට පැමිණ සිහිනුවණින් යෙදිසිටීනට සුදුසුකැනක සිටගත නොහි ඉන් පෙරලා වැටී වෙරම්බ වාතයෙන් අශ්වකණ්ණ පර්වතයෙන් පිටත සමුද්‍රයෙහි හෙලනාලද්දේ යම් පශ්චාත්තාපය කට පැමිණේද? එමෙන් මේ බුඩොත්පාදයෙහි දුර්ලභවූ මනු ෂ්‍යත්මභාවය ලදින් නිවන්දැකීමට සුදුසුවූ කුශලයක් සිඩ කොට ගතනුහුනුවොත් සසර සිවිනාතෙක්විදිනා පශ්චාත්තාප දුඃඛය ප්‍රමාණයෙන් නැත්තේය.

තවද මේ කාලයෙහි බුදුන්ගෙන් බණඅසා පින්කොට නුව ණුත්තන්ට ඇතුලත්නොවී පව්කිරීමෙන් බාලයන්ට ඇතුළත් වූ සඩයන්ට බාලපණ්ඩිත සූත්‍රයෙහි තියනාලද ක්‍රමයෙන් මෙ ලොවත් දුක්විඳ මෙයින් මියපරලොව ගියකල සතර අපායට පැමිණ දිව්‍යලොක බ්‍රහ්මලොකාදි මහත් සැපඇති තැන ඉප දීම තබා මනුෂ්‍යලොකයෙහි ඉපදීම පමණකුත් දුර්ලභනියාව දන්වන්ට බුදුන් වදාළ කාණකච්ඡපොපමාව සිහිකටයුත්තේය.

---

* සසිය පණස්.

ඒ කෙසේදයත්?

"දුල්ලභඤ්ච මනුස්සත්තං බුද්ධුප්පාදෙච්ච දුල්ලභෝ,
දුල්ලභාඛණ සම්පත්ති සඛෙමා පරම දුල්ලභෝ."

"සතිස් ලක්ෂ දසදහස් තුන්සිය පණස් යොත්නක් වටඇති චක්‍රවාටය ඇතුළත දිගින් පුළුලින් දෙලොස් ලක්ෂ තුන්දහස් සාරසිය පණස් යොත්නක් පමණ තැන් එකම මහමුහුදෙන් වීනම් ඒ මහමුහුදෙහි එකම කණකැස්බෙක් වීනම් ඒ මහමුහුදට බඹයක් පමණ දිගඇති එක වියසිඳුරන් ඇති වියදණ්ඩක් දමනලදුව සැඩපවනින් පුවී චක්‍රවාල පර්වතය පටන් පශ්චිම චක්‍රවාල පර්වතය සමීපයට යේනම් උත්තර චක්‍රවාල පර්වතය පටන් දක්ෂිණ චක්‍රවාල පර්වතය සමීපයට යේනම් අවුරුදු සිය යකින් හෝ අවුරුදු දහසකින් හෝ අවුරුදු ලක්ෂයකින් හෝ එනවරෙක ඉස ඔසවන්නාවූ ඒ කාණකච්ඡපයාගේ ඇස පව නින් පෙරලා ඇවිදිනාවූ ඒ වියසිඳුරට අසුවේද" සි බුදුහු සඞ්ඝයාවහන්සේ අතින් විචාරා වදාළසේක.

එසේ විචාරණ ලද්දාවූ භික්ෂූන්වහන්සේ වදාරණසේක් "ස්වාමිනි භාග්‍යවතුන්වහන්ස ඒ මුහුදේ දියත් නොසිඳී ඇම කල්ම පවත්නේවිනම් ඒ කාණකැස්බාත් ඇමකල්හිම ජීවත්ව හිඳ අවුරුදු සියයකින් දහසකින් ලක්ෂයකින් වරෙක ඉස ඔස වන්නේ වීනම් ඒ වියදණ්ඩත් නොදිරා ඇමකල්හිම පවත්නේ වීනම් ඒ වියසිඳුරත් කිසිවෙකිනුත් නොවැසී පවත්නේවීනම් 'හෙතුව ඇතිකල්හි ඵලය සිඳවෙයි' යනු නියමයක් හෙයින් යම්කිසි දිඝීකාලයෙකින්වත් එසේ නොවෙයි කියන්ට බැරි ය" සි සැලකර වදාළසේක.

එවිට තිලෝගුරු බුදුරජාණන් වහන්සේ වදාරණ සේක් "ඉදින් මනුෂ්‍ය ලොකයෙහි උපන්නාවූ ඒ බාලතෙම තමා නොවගත් දානශීලාදි කුශලධර්මයන් නැතිහෙයින් මිය සතර අපායෙහි උපන්නේවිනම් එහි උපන්නාහට කායවාක් මනො සංයමයෙක්වත් දාන ශීලාදිවූ සුචරිත කරණයෙක් වත් නැත් තේය. ඔවුනොවුන්ගේ ඇඟමස් කෑම් ආදියෙන් ප්‍රාණඝාතාදි අකුසල්ම සිඳවන්නේය. එබැවින් "හෙතුවක් නැතිව ඵලය සිඳනොවෙයි" යනු නියමයක් හෙයින් ඒ කාණකැස්බාගේ ඇස වියසිඳුරට අසුවීම අවුරුදු ගණනකින්වත් දෙසක් බෙන් සැලකියයුතුය.

"පව්කොට සතර අපායෙහි උපන් බාලයාගේ නැවත මේ මනුෂ්‍යත්මභාවය ලැබීම ඊට්ත්වඩා ඉතා දුර්ලභ දෙයකැ" සි වදාළහේක.

එබඳු දුර්ලභවූ මනුෂ්‍යත්මභාවය ලද්දුවූ එම්බා සත්පුරුෂයෙනි නොපවිසින් දිවා රාත්‍රි දෙක්හිම අප්‍රමාදව සිහිනුවණින් යෙදී පින්කටයුතුසි.

තවද මෙතනදී පින්රැස්කොට ගතනුහුනුවාවූ සඩයාට මතු නරකාදිවූ දුඃඛය අප්‍රමාණ නියාව දක්වන්ට මෙබඳු උපමාවක් දක්වම්හ.—හේ කෙසේදයත්?

යම්කිසි මනුෂ්‍යයෙක් යම් ක්‍රියාවකින් පෘථිවීශ්වරවූ රජක්හුගේ සිත් ගනීද රජතෙම ඕහට ප්‍රසන්නව අමාත්‍ය තනතුරක්දී රටකුත් දුන්නේවේද ඒ පුරුෂතෙම ඒ රටලැබ යෙහෙන් අනුහවකල නොහෙන්නේ බත්මුලක් ලත් රිලවකුමෙන් රට නාස්නේවේද යම්ක්හුගේ යහපත් යානාවක් හෝ වාහනයක් හෝ කෙල්ලක හෝ නොල්ලකු හෝ ආරාමයක් හෝ කෙතක්වතක් හෝ දුටුයේවීනම් ඒ සියල්ල බලාත්කාරයෙන් ඇරගන්නේවේද මනුෂ්‍යයෝ ඒ දැක "මේතෙම රජක්හුගේ අබ්භන්තාරයෙකැ"සි කිසිවක් කියාගත නොහෙද්ද එතෙම තමාටත්වඩා රජ්ජුරුවන්ට විශ්වාසවූ අමාත්‍යයකුගේ සහායක දෙයක් බලාත්කාරයෙන් උදුරගත්ද ඒ අමාත්‍යතෙම ඒඅසා ඔහු අල්වා දැඩිකොට තළා ඔහු පිට සමයහාතෙක් බිම හෙලා අද්දවා රජහුකරපැමිණ 'දෙවයන්වහන්ස අසවල් පුරුෂතෙම මෙසේ රට නාසන්නේය' සි කිද රජතෙම ඔහු අල්වා ගෙන්වාගෙන සිරගෙහි මසාතිබාලා "අසවල් පුරුෂතෙම රටවැස්සන්ගෙන් බලාත්කාරයෙන් භාවරභාවර බඩුවක් ඇරගත්තේද ඒ නොබා කියන්ව" සි කියා නුවර බෙරලැවීද ඒ අසා මනුෂ්‍යයෝ අවුත් මගෙන් මෙනාම් මෙනාම් දෙයක් ඇරගත මගෙන් මෙනාම් මෙනාම් දෙයක් ඇරගතැ" සි නොයෙක් දහස් ගණනෙක් මුරගා කිවෝවෙද්ද රජතෙම ඒ අසා යම්සේ වැඩියක් කිපුනේ සිරගෙහි දමා නොයෙක් නිග්‍රහකරවා මරා සොහොන්හි දමා "පයමැසූ දම පමණක් ගෙනොව" සි කියා නියොග කෙලේවේද?

මේ මනුෂ්‍යත්මභාවය ලැබ පින්කොට ගතනොහි නරකාදි දුගතියෙහි ඉපද දුක්විඳිමත් ඒහා සමානය.

ඒ කෙසේදයත්?

ඒ පුරුෂයා විසින් යම්කිසි ක්‍රියාවකින් රජහුගේ සිත් ගෙන රට ලත්තැන් මෙන් සසර බොහෝ අනුසල්කොට චුතිප්‍රති

සන්ධි වශයෙන් පවත්නාවූ සත්වයා පෙර කළාවූ යම්කිසි කුශල කර්ම්මයකින් මේ මනුෂ්‍යලොකයෙහි උපන්නාවූ කාලය දනයුත් තේය.

ඒ පුරුෂයා රට නසා දනව් චැසියන්ගේ බොහෝ බඩුගන්නා කල්හිද ඔහු කෙරෙහි හසින් ඒ රටවැස්සන් කිසිවක් කියාගත නොහෙන බව මෙන් මොහු මිනිස්ලොව ඉපද සිටිනාතෙක් පෙර ජාතියෙහි කළාවූද මේ ජාතියෙහි කළාවූද අකුශලයන් විපාකදීමට අසමර්ථව සිටිනාබව දනයුත්තේය.

එක් දවසක් රජවල්ලභවූ අමාත්‍යයකුගේ බඩුවක් ගත් හෙයින් කිපියාවූ ඔහු විසින් තලා රජගටහිසා මසාතිබූ කලක් මෙන් මනුෂ්‍යලොකයෙන් මිය නරකයෙහි උපන්නාවූ ඕහට පෙර මනුෂ්‍යලොකයෙහිදී දිගහ නුහුනු අකුශලයන් විපාක දීමට අවසරලත් නැන දනයුත්තේය.

අමුසොහොනෙහි දමා මැසූ දම පමණක් ගෙනාතැනමෙන් එහි එහි කර්ම්මයන් කෙරියවූකල්හි අනෙක් අනෙක් කර්ම්මයෙ කැසි ගනාදින් ඉස ඔසවා ගතනොහි කල්පය මුළුල්ලෙහි දුක් විඳීම දනයුත්තේය.

මෙසේ පච්චානන්තර්‍ය්‍ය කර්ම්මය නොකොට කල්පයක් මුළුල් ලෙහි නරකයෙහි පැසුනු මනුෂ්‍යයෝ මෙතෙකැසි පමණ නැත් තාහුය. නරකයෙන් තිරිසන්ජාතියෙහි ඉපද තිරිසන්ජාතියෙන් නරකයෙහි ඉපද නරකයෙන් ප්‍රෙතලොකයෙහි ඉපද මෙසේ කප් කෙළගණනාකුත් සතර අපායෙන් මිදී ගතනොහි දුක් විඳිනා සත්වයෝ අප්‍රමාණය එසේහෙයින් මේ මනුෂ්‍යජාතියෙ හිම මේ බුඩොත්පාදයෙහි උපන්නැනදීම මෙබඳු සංසාර දුකඛ යෙන්මිදි නිවන්දකිනා පරිද්දෙන් එක දවසකුත් ප්‍රමාදනොවී පින් කටයුත්තේයයි සැලකිය යුත්තේය.

තවද බුදුන් වදුල "පබ්බතොපම" සූත්‍රයෙනුත් සැලකිය යුත්තේය—ඒ කෙසේදයත්?

සැවත්නුවර රජ්ජයකොට වසන්නාවූ කොසොල් මහරජ නෝ ජෙතවන විහාරයෙහි වැඩහිඳිනා බුදුන්කරා උපස්ථානයට දවසකට තුන්වරක් නොවරදවාම යෙති, ඒ ඇර අතරතුරේ ගමනුත් බොහෝසේ ඇති. එසේ නිරන්තරයෙන් විහාරයට යන්නාවූ මහරජාණන් කැටුව සෙනඟ මහත්ව යනවත්ඇත, සඬ්ල්පව යනවත්ඇත. එබැවින් එක් දවසක් සොරුන් පන් සියයක් එසේ යන රජ්ජුරුන් දැක මේ රජතෙමේ නොවේලෙහි

සවල්පවූ පිරිවරගෙන බුදුන්ට උපස්ථානයට යන්නේය. එබැ
චින් 'මොහු අතරමගදී අල්වා මරා රාජ්‍යයගනුම්හ'යි සිතා සැ
වැත් නුවරටත් ජේතවනාරාමයටත් අතර අඤ්ඤතර නම් වෙහෙ
හි මගදෙපිට බෙදී සිටගත්තාහුය, මෙලොවට රජවන්නෝ
නම් මහ පින්ඇති අයෙක එබැවින් ඒ මහරජාණන්ගේ පිණි
න් ඔවුන් අතුරෙන් එක් සොරෙක් ගොස් රජ්ජුරුවන්ට එපවත්
දැන්විය. රජ ඒ අසා මහසෙනහ පිරිවර ගොස් අඤ්ඤතය
ව ට ලා සොරුන් අල්වා නිග්‍රහකොට උදැසනක්හේ
බුදුන්වඳින්වයහා ගමන මදක් පමාවවේලා ඉක් මවා
යියේය, එසේ ගොස් වැඳලන්නාවූ මහරජහට 'එම්බා මහරජ
උදැසනක්හේම එන ගමන් පමාව අදකලි ඉක්මවාආයේ කව
ර කාරණෙකින්දැ'යි විචාර වදාළසේක. එසේ විචාර වදාළා
වූ භාග්‍යවතුන් වහන්සේට 'මෙබඳු ප්‍රාණවධයක් කරන්නිසා
පමාවීමි'යි ඉදුරා කියාගතහොහි වාඃජයෙන් කියන්නාවූ මහ
රජ තෙම 'ස්වාමිනි භාග්‍යවතුන් වහන්ස ලොව අඤ්ඤෙකලද්
දුවූ ඵෙශ්වයෂ්‍ය මදයෙන්මත්වූ කාමතෘෂ්ණවෙන් මඩනාලදසින්
ඇත්තාවූ තමතමන්ගේ රට ස්ථිරකොට පවත්වනු කැමැත්තාවූ
එහෙයින් සතුරන් ජයගෙන වසන්නාවූ රජදරුවන් විසින්
කටයුතු යම් රාජ්‍යාශ්‍රයෙක් ඇද්ද අදදවස් එබඳු රාජ්‍යාශ්‍ර
යෙහි ප්‍රමාදව ඇමි'යි දැන්විය. එසේ කීවාවූ මහරජහට බුදුහු
'මා වැනි' බුදුකෙනකුන් අසල විහාරයෙහි ඉන්දදී මෙබඳු දරු
ණුවූ අනුසල්කිරීම නොපට සුදුසු නොවේ'යි මම කියේවින්නම්
'මේ මහරජතෙම නිස්සොජස්ව හැම්මිගත නොහි සිතූ එකහ
නොවන හෙයින් මතු මා කියන බණත් අසාගත නොහෙන්
නේය. එබැවින් වාඃජයෙන් කථාකළාවූ මේ මහරජහට
මමත් වාඃජයෙන් ධම්මදෙශනා කෙරෙමි'යි බුදුරජාණන්
වහන්සේ වදාරණසේක් 'එම්බා මහරජ නා විසින් අදහා
ගන්ට සුදුසුවූබස් ඇති සත්‍යවාදිවූ පුරුෂයෙක් නාහෙර අදිත්
මෙසේ දන්වාද එම්බා මහරජ්ජුරුවන් වහන්ස මම පූර්වදිග
හෙළවරපටන් එන්නෙමි එතැන්හි අහසවැනිවූ ගැල්පවිත
යෙක් බිමපටන් අකනිට්ඨබ්‍රහ්මලොකය දන්වා දිව්‍යබ්‍රහ්ම මනු
ෂ්‍යමනුෂ්‍ය තිරශ්චීනාදිවූ සියලූ සත්වයන් ද ගලෙහිලා අඹරණ
තලසුන්නක් මෙන් පෙරලි මැඩ සුණුවිසුණු කොට එන්නේය.
එබැවින් නුබවහන්සේ විසින් කටයුතු කාර්‍යයෙක් ඇත්නම්
ශ්‍රුඝවකොට 'ගතමැනවැ'යි කියේද එසේම දෙවෙනි පුරුෂ
යෙක් පශ්චිම දිගින් අවුත් මෙම අස්නා කියන්නේ ඒද එසේම
තුන්වෙනි පුරුෂයෙක් උතුරුදිගින් අවුත් මෙම අස්නා කියන්

නේවේද එසේම සතරවෙනි පුරුෂයෙක් දකුණුදිගින් අවුත් මෙම අස්න හියන්නේවේද මෙසේ අදහාගන්ට සුදුසුවූ බස් ඇති පුරුෂයන් සතරදෙන සතර දිගින් අවුත් අඟසවැනිවූ පවීත සතරක් සතරදිගින් සියලු සත්වයන් මැඩ සුනුවිසුනු කොට ගෙන පෙරලීඑන්නේය. 'එම්බා රජ්ජුරුවන් වහන්ස නුබවහන්සේ විසින් කටයුතු කායකීයෙක් ඇත්නම් යුහුව කොට ගතමැනවැ'සි හියද්ද මහරජ මෙබඳු මහත් භයක් පැමිණි කල්හි මනුෂ්‍යයන්ට ඉතා දරුණුවූ සැඟයවීමක් පැමිණිකල්හි මතු මනුෂ්‍යත්ම භාවය නැවත ලැබගැන්මත් ඉතා දුල්ලභකල්හි රට කැමත් කටයුතුදැ'සි විචාරා වදුලසේක.

එකල්හි සීමගරජ හියනුයේ 'මෙබඳු මහත් භයක් දරුණුවූ මනුෂ්‍ය විනාශයක් පැමිණිකල්හි මතු මනුෂ්‍යත්ම භාවය දුල්ලභවන කල්හි ප්‍රාණඝාතයෙන් වැලකීමය, අදත්තාදාන යෙන් වැලකීමය, කාමමිථ්‍යාචාරයෙන් වැලකීම්ය, යනාදින් දක්වනලද දශකුශලකර්ම පථය හැර අන්කටයුත්තෙක් නැතැ' සි කියේය. එසේ හියාවූ මහරජහට බුදුහු වදුරණසේක් 'එම්බා මහරජ මේ මා හියේ උපමායෙක මේ උපමායෙන් කටයුතුවූ අර්ථය-මෙසේ දතයුත්තේය.

ජරාවනම් එක් පවීතයක්හා සමාන වන්නේය. මරණයත් එක්පවීතයක්හා සමානවන්නේය. ව්‍යාධියත් එක් පවීතයක් හා සමානවන්නේය. විපත්තියත් එක් පවීතයක් හා සමාන වන්නේය.

මෙසේ ජරා, මරණ, ව්‍යාධි, විපත්ති, යන පවීත සතර එක සත්වයකුත් නොහැර මැඩ සුනුවිසුනුකොට එනකල්හි කාණනැස්බාගේ උපමාවෙන් කිහෙයින් මනුෂ්‍යත්ම භාවයත් නැවත ලැබගැන්ම දුල්ලභවනකල්හි රට කුමක් කටයුතුදැ'සි විචාරා වදුලසේක.

එබසට මහරජ නොම හියනුයේ 'මෙසේ ජරාය, මරණය, ව්‍යාධිය, විපත්තිය, යන සතරින් එකානතායෙන් ආත්ම විනාශ වනකල්හි නැවත මනුෂ්‍යත්ම භාවයත් ඉතා දුල්ලභවනකල්හි පින්මුත් අනිත් කටයුතු දෙයෙක් නැත.

හේ එසේමය.

සඞ්ඝමිත්‍රා භාග්‍යවතුන් වහන්ස තවද නුබවහන්සේට දැන්විය යුත්තෙක් ඇත. ඓශ්වර්‍යයේ මදයෙන් මත්වූ අප රජ්දරුවන්ගේ ඇත්සෙනහාක් මෙනහ කටයුතු යුධයක්ඇත ප්‍රතිමල

ණදිවූ උපද්‍රව නැවතන්නාවූ ඇත්සෙනඟ ගෙන යුඹකුරන්ටත් නොපිළිවන අස්සෙනඟත් රථසෙනඟත් පාබල සෙනඟත් ගෙන යුඹකරන්ටත් නොපිළිවන, අප රජදරුවන්ගේ මන්ත්‍රණ භෙදයෙන් සතුරන් ජයගැන්මකුත් ඇති, ජරාමරණාදිවූ උපද්‍රව ඒ මන්ත්‍රණ යෙන් භෙදත් නොකට හැක්කේය. නැවත මේ රජකුලෙහිඳ සතුරන්ට වසනුදී සිත්ගෙන කරණ ධන යුඹයකුත් ඇත. ජරාමරණාදිවූ උපද්‍රවයට එසේ වසනුදී සිත්ගෙන සන්හිඳුවා ගත නොහැක්කේය. එසේහෙයින් සවී ප්‍රකාරයෙන් කවරනම් නුවණකින් පරීක්ෂාකොට බැලුවත් පින්කිරීම හැර අන්කටයුත්තෙක් නැතැ'යි දැන්විය. එසේ කී වාවූ මහරජහට බුදුහු මේ ගාථාවෙන් මෙසේ වදාළසේක.

'නක්ඛත්තපඤ්ඤතොපොසෝ
සම්පස්සංඅත්තමත්තනෝ
බුද්ධෙධම්මෙච සඞ්ඝෙච
ධිරොසව්වංනිවෙසයේ.

යොධම්මචාරීවාචායා
කායෙනාඋදචෙතසා
ඉධචෙවනංපසංසන්ති
පෙච්චසග්ගෙපමොදතී.

එම්බා මහරජපුරුවෙනි ඉදින් සතියාගේ ජරාමරණාදිවූ උපද්‍රව වැලකීමට පින්මිස අන්කටයුත්තෙක් තමාට නැත්තේද එබැවින් දුර්ලභවූ මේබුඩොත්පාදයෙහි මනුෂ්‍යත්තභාවය ලත් නුවණැත්තාවූ සත්පුරුෂතෙම තමාට වන වැඩ සලකන්නේවී නම් බුබරත්නයෙහිද, ධම්මරත්නයෙහිද, සඞ්ඝරත්නයෙහිද, යනමේ රත්නත්‍රයෙහි සරණශීලාදි වශයෙන් ශ්‍රද්ධාව පිහිටුවා ගන්නේය, මෙසේ බුබාදිවූ රත්නත්‍රයෙහි ගුණ අදහාගැන්ම යයි කියනලද ශ්‍රද්ධාවෙන් යුක්තවූ යම්කිසි පුරුෂයෙක් කයින් සිඳවන ප්‍රාණඝාත නම් අකුශලය, අදත්තාදාන නම් අකුශලය කාමමිථ්‍යාචාර නම් අකුශලයද දුරුකොට බුබාදී රත්නත්‍රයට හා මවු පියගුරු වෘඛාදීන්ට කටයුතු වතාවත් ආදිවූ කායික පින් කම් කරන්නේවේද බසින් සිඳවන මුසාවාදීමය, කේලාම්කීමය, අනුන්ට බිණීමය, සැඟී මොසොඳෙකට බාධකවූ වැඩ නැතිබස් කීමයයි කියනලද අකුසල් සතර දුරුකොට බණකීමය, රත්නත්‍රයෙහිගුණකීමය යනාදිවූ වාචසික පින්කිරීමෙහිඥේදී වාසයකරන්නේවේද නැවත සිතින් සිඳවන්නාවූ අනුන්ගේ සම්

පත්තියක්දැක 'මේසැපතමටවිහාම් යෙහෙකැ'යියන අභිද්ධාවය, 'මේසැවයා නැසිගියේනම් යෙහෙකැයි'යන ව්‍යාපාදය, කම්නැ න, කම්පලනැත, කුසල්නැත, අකුසල්නැතැ'යි යනාදීන් ගන් නාලද මිථ්‍යාදෘෂ්ටිය, යන අකුසල්තුන දුරුකොට බුධානුස්මෘති, ධම්මානුස්මෘති, සංඝානුස්මෘති, ආදිවූ මානසික කුසල් සිඛකොට ගන්නේවේද මෙසේපින්කරන්නාවූ පුරුෂයාට බුඩාදි මහොත්ත මයෝ මේ ලොකයෙහි ප්‍රශංසාකරති පරලොව ගියේ චාතුම්මී හාරාජිකභාවතිංසාදිවූ සදිව්‍යලොකයෙහි හෝ බ්‍රහ්මලොකයෙ හි හෝ උපන්නේ මහත්වූ දිව්‍යඓශ්වර්‍යයෙන්ද සතුටුවන් නේය.

මෙසේ භවභොග සම්පත් විඳ කෙළවරතමා කළාවූ ප්‍රාඥ නාපරිද්දෙන් තුන්තරබොඩියෙන් එක්තරා බොඩියනට පැමි ණ සසරදුකින් මිදී අමාමහනිවන් දකින්නේය'යි වදාළසේක.

මෙසේ ජරාමරණාදීන්ට පඨිත සකරක් උපමාකොට මනු ෂ්‍යාත්මභාවාදියත් දුල්ලභයයි දක්වා බුදුන්වදාළ මේ අවවාදය නිරන්තරයෙන් සිතතබාගෙන දියබුබුලක් මෙන් ඉතා දුල්ල භවූ නෙසෙල්කදක් මෙන් අසාරවූ විදුල්ඔක්මෙන් වහා නාශ්‍ය වූ මේ මනුෂ්‍යාත්මභාවයට ප්‍රතිලොභනූපදවා නැසෙන්නාට පළමුකොට සගමොන් සිඛකරන්නාවූ කුසල්රැස්කොට කල කින් ලද්දාවූ මේ මනුෂ්‍යාත්ම භාව ප්‍රතිලාභය සඵලකටයුත් නේය.

මෙසේ අවවාද වශයෙන් පඨිතොපම සූත්‍රය දක්වා මෙසේ ම කුශලකරණයෙහි පමානොවීම පිණිස රඨපාලසූත්‍රයෙන් එන දෙශයක් දක්වම්හ—හේ කෙසේදයත්?

එක්කලෙක භාග්‍යවත්වූ සම්බුදයන් වහන්සේ පූර්ව බුඩවරයන්ගේ කාලයෙහි පින්කොට මුනුකළ ප්‍රඥාවන්ව සිටි වෛනෙය ජනයාට ධම්මදෙශනාකොට නිවන්දක්වනු සඳහා මහාසඞ්ඝයා පිරිවරා ගෙන සැරිසරා චඩනාසේක් කුරු දෙශයෙහි 'ථුල්ලකොට්ඨිත' නම්වූ නියම්ගම සමීපයට පැමිණි සේක් ඒ නියම්ගම වාසයකරන්නාවූ බ්‍රාහ්මණයන්හා ගෘහ පතීන් බුදුන්ගේ 'ඉතිපිසො භගවා' යනාදීන් ලොවපහළුවූ බුදුගුණ අසා වෙබඳු මහොත්තමයන්ගේ බස්අසා මෙලොව පර ලොව වැඩෙහි පිහිටාගැන්ම නැතත් ඇසඇර මෙබඳු මහොත් තමයන්ගේ රුවදැකීමද අපට මහවැඩක්මය'යි සිතා බුදුන්ක රුණවුත් වැඳ එකත්පස්ව උන්නාහුය. එලස උන්නාවූ බ්‍රාහ්ම

ණයන්ටහා ගෘහපතීන්ට භාග්‍යවත්වූ බුදුරජාණන් වහන්සේ ධර්ම්දෙශනාකිර්මෙන් මෙලොව පරලොව වැඩදන්වා වදළ සේක. සමාදන්කළ පිළිවෙත්හි සිතත්‍යුත්‍පාදකරවා වදළසේක.

එහි 'යහපත යහපත යහපතැ'යි කියා ප්‍රශංසාකරවූ සේක.

ඒ බණපිරිස් අතුරෙහි උළුලකොවිතිත නම්ගම නායන කුලයෙහි උපන්නාවූ 'රඨපාල' නම් කුලපුත්‍රයෙක්ද බණ අසා උන්නේය එසේ උන්නාවූ රඨපාල නම් කුලපුත්‍රයාහට මෙබඳු කල්පනාවෙක් උපන.

'මේ භාග්‍යවතුන්වහන්සේ යම් ධර්ම්දෙශනාවක් කළසේක්ද ගිහිගෙයි වසන්නාත්හු විසින් ඒ සබර්ම්ය සම්පුණ්කොට ඉතා පිරිසිදුකොට රැකුණාකිරීම නොපිළිවන.

එබැවින් මම ඉසකෙස් දැලිරවුළු කපාහැර කසට රැදූ පිළි හැඳපෙරව ගිහිගෙන් නීක්ම ශාසනයෙහි මහණවීන් නම් යෙහෙකැ'යි සිතුය. එසේ සිතුවාවූ ඒ කුලපුත්‍රතෙම ඒ ඉ්‍රාහ්මණ ගෘහපතීන් බුදුන්ට වැඳ අවසරගෙන ගියකල්හි තෙමේ නැවත බුදුන්වැඳ 'සඩාමිනි භාග්‍යවතුන් වහන්ස නුබවහන්සේ වදළ ධර්ම්ය ගිහිගෙහි සිට රැකුණාකිරීම නොපිළිවන එබැවින් ශාසනයෙහි මහණවෙම්' කියා අවසර ඉල්වීය එබසට බුදුහු 'තෝ මවුපියන්ගෙන් අනුදන්නාලද්දේදැ'යි විචාර වදළ සේක.

'මම මවුපියන්ගෙන් අනුදන්නා ලද්දෙම් හොවෙමි'යි කිය බුදුහු 'මවුපියන්ගෙන් අනුහොදන්නාලද දරුවන් බුදුවරයෝ මහණ හොකරති' වදළසේක. ඒ අසා කුලපුත්‍රතෙම බුදුන්ට වැඳ අවසර ඉල්වාගෙන මවුපියන්ගේ සමීපයට ගොස් මවුපිය දෙදෙනා වැඳ 'මැණියන්වහන්ස පියාණන්වහන්ස මම සර්ව්ඥයන් වහන්සේගෙන් බණඇසීමි ඒ ගිහිගෙයි සිට රැකුණාකිරීම දුක. ඉන් මම ශාසනයෙහි මහණවනු කැමැත්තෙමි. එබැවින් මට අවසර දුන මැනවැ'යි කියේය.

එබසට මවුපිය දෙදෙන කියන්නාහු 'තෝ වනාහි අපගේ එකම ප්‍රියවූ මහාපවු පුත්‍රයෙක. සැපයෙහි පිහිටියෙහිය. සැපයෙන් වඩනා ලද්දේය. කිසි දුකක් නොදන්නෙහිය. තා කැමැත්තක් අනුභවකොට තා කැමැත්තක් පානයකොට කැමති දෙයක ඉඳුරන් පවත්වා කැමති සැපතක් අනුභවකොට

පිනුත්කෙරෙමින් ගිහිගෙහි වාසයකරව. අපි මරණයෙනුත් කොහා වෙන්වනු නොකැමැත්තම්හ. ජීවත්ව ඉන්නාවූ තොපට අවසරදෙමෝද අවසර නොදෙම්හ'යි කිවාහුය.

ඒ 'රඨපාල' නම් කුලපුත්‍රතෙම දෙවෙනිව තුන්වෙනිවත් මෙසේනියා යාච්ඤාකෙරේය. දෙමවුපියෝ දෙවෙනි තුන්වෙනි වත් මෙසේමකියා ප්‍රතික්ෂේප කළාහුය. එකල්හි රඨපාල කුල පුත්‍රතෙම 'මෙතැන්හිම හෙව මරණහෝවෙමි. නැත පැවිදි වීමට අවසරහෝ ලබම්. නැතනැයි නොසිටිමි'යි කියා කිසි වක් නොඅතුලාවූ බිම හොත්තේය.

එසේ හොත්තාවූ ඔහුදැක දෙමවුපියෝ පළමුපරිද්දෙන් කියා යාච්ඤාකළෝය. එසේ දෙතුන්වරෙක යාච්ඤාකළ කල් හිත් ඒ කුලපුත්‍රතෙම මුවෙන් නොබැණ හොත්තේය. එකල් හි ඔහුගේ දෙමවුපිය දෙදෙන රඨපාල කුලපුත්‍රයාගේ යහලු වන්කරු ගොස් එම්බා කුලපුත්‍රයෙනි තොපගේ යහලුවූ 'රඨපා ල' තෙම ශ්‍රමණ භවත් ගෞතමයාණන් වහන්සේගේ සමීප යෙහි මහණවීමට අපගෙන් අවසර ඉල්වීය. අපි අවසර නුදුන්නම්හ. එතෙම 'මෙතනාම මරණහෝවෙමි පැවිදිවීම ට අවසරහෝ ලබමි'. කියා 'කිසිවක් නොඅතුලාවූබිම සයනය කෙළේය. තොපි ගොස් යාච්ඤාකරවයි' කිවාහුය. එබස් ඇසූ වාවූ ඒ කුලපුත්‍රයෝ ගෘහයින් තුන්වරක් දක්වා යාච්ඤාකොට එනබසකුත් නොලැබ මෙසේ සිතුවාහුය. 'මේ රඨපාල තෙම මෙතනාම හෙව මෙලේනම් කිසි ගුණයකුත් නොලබන්නේය. ඉදින් පැවිදිවූයේ වීනම් කලින්කල මවුපියන්ටත් දැකීම ලැබෙ යි. මහණව විසීමනම් 'ඉතා බැරිදෙයෙකැ'යි මැවී පෙක්ගෙ න දවස්පතා ලත් අහර වැළඳියයුතුවෙයි. එක්වේලෙකම් අනුභව කටයුතුවෙයි. බ්‍රහ්මචර්‍යාවත් ඉතාදුෂ්කරය. මේ රඨ පාලතෙම ඉතා සිවුමැලි එකෙක. නාගරිකය. හෙතෙම ඒ බ්‍රහ්මචර්‍යාව කෙසේ රක්‍ෂාකෙරේද? නැවත සිවුරුහැර එන් නේමය. එබැවින් 'දෙමවුපියන් ගිවිස්සම්හ'යි සිතා දෙමවු පියන් සමීපයට ගොස් එපවත්කියා පැවිදිවීමට අවසරදෙන්ට කිවාහුය.

මවුපිය දෙදෙනා එසේ වීනම් 'කලින්කල අවුත් අපදැක යෙත්ව'යිකියා ප්‍රතිඥාගෙන අවසර දුන්නාහුය. එනනාම සඳ වසක් නිරාහාරව හොත් බැවින් සැප අහර අනුභවකිරීමෙන් කිපදවසකින් ශරීරය සතප්පායෙන මවුපිය දෙදෙනා වැඳ අවසරගෙන බුදුන් සමීපයටගොස් 'මා මහණකරවාගන මැන

වැ'සි යාචිඤ්ඤකෙලේය. බුදුහු එක් භික්ෂුකෙනකුත් වහන්සේ ට' මොහු මහණකරවා උපසම්පදා කරව'සි වදාළසේක. උන් වහන්සේ වදාළ පරිද්දෙන්ම මහණකරවා උපසම්පදා කරවූ සේක. උන්වහන්සේ පැවිදිව සාමණයකුත් පමාණොවී නිවන් කරා මෙහෙයනාලද සිතින් වීර්‍යයකරණසේක් දෙලොස් අවුරුද්ද දකින් රහත්ව දෙමවුපියන්ට කියා ආවාවූ ප්‍රතිඥ සිහිකොට 'දෙමවුපියන්දැක එමි'සි යන සිතින් බුදුන්ටදන්වා වැඳ අවසර ගෙන තමන්වහන්සේගේ පා සිවුරු පමණක් ගෙන ක්‍රම යෙන් සැරිසරගොස් කුරුරට ථූලලකොට්ඨිතනම් නියම් ගමට පැමිණ කොරව්‍ය රජ්ජුරුවන්ගේ 'මිගාචීර' නම් උයන්හි එක් රුකක් මුල දිවාවිහරණයෙන් වැඩඋන්සේක.

එදවස් කොරව්‍ය රජ්ජුරුවෝ මිගාචීර නම්වූ උයන්ගොව් වා කැඳවා 'අපි උයන දක්නා පිණිස යම්හ උයන ශුඛකරව'සි කීයේය. ඒ උයන්ගොවිතෙම උයනට ගොස් උයන ශුඛකර ණුයේ එසේ වැඩඋන්නාවූ රඨපාල තෙරුන්වහන්සේ දැක 'මෙබඳු මහසැපතක් හැර පැවිදිවන්ට ගියාවූ රඨපාල තෙම නැවත නොඅයේය. 'මේ ඉතා දුෂ්කරයෙකැ'සි අපගේ රජ්ජු රුවන් වහන්සේ නඑවන්ගේ මැදත් අමාත්‍යයන්ගේ මැදත් රඨපාල තෙරුන්වහන්සේගේ ගුණවදාරණසේක. එසේහෙ සින් මුන්වහන්සේ වැඩිබවනිම මට පඩුරෙකැ'සි රජහුකරා ගොස් වැඳ දෙවයන්වහන්ස නුබවහන්සේ 'මේ ථූලලකොට්ඨිත නම් නියම්ගම අග්‍රකුලයෙන් මහණවූ යම් රඨපාල නම් කුල පුත්‍රයාණ නෙනකුන්ගේ ගුණ කියනාසේක්ද ඒ රඨපාල නම් තෙරුන්වහන්සේ අවුත් උයනේ එක් රුකක්මුල වැඩඋන්සේ කැ'සි කීයේය. ඒ අසා කොරව්‍ය රජ්ජුරුවෝ 'උයන්කෙළි තබා රඨපාල තෙරුන්වහන්සේ දකින්ටයම්හ'සි යහපත් යානාවක් යොදවා මහත්වූ රජසමෘඛියෙන් නික්ම යානාවෙන් යන්ට සුදුසුතැන් යානාවෙන් ගොස් යානාවෙන් බැස පයින්ම රඨපාල තෙරුන්වහන්සේ උන් රුකමුලට ගොස් සමගසතුටු වන්ට සුදුසු කථාඉනාට එකත්වපස්ව උන්නේය. එසේ උන් නාවූ මහරජතෙම කියනුයේ 'එම්බා රඨපාල තෙරුන්වහන්ස මෙලොව මනුෂ්‍යයන්ට පිරිහිම් සතරෙක් ඇත ඒ පිරිහිම්නිසා මනුෂ්‍යයෝ හිසකෙස් දැලිරවුළු කපාහැර කසාපිළිහැඳ පෙරව පැවිදිවෙති.

ඒ පිරිහිම් නම්

ජරාපිරිහිමය, ව්‍යාධිපිරිහිමය, භොගපිරිහිමය, ඤාතිපිරිහි මයයි යන සතරය රඨපාල තෙරුන්වහන්ස මෙලොව ජරාපිරි

හිම නම් කවරේද? යමෙක් ජරාවෙන් ජීර්ණවේද වයොවෘද්ධවේද පශ්චිම වයසට පැමිණියේවේද එතෙම මෙසේ සලකන්නේය. 'මම ජරාවෙන් දිරාගියෙමි වයොවෘද්ධයෙමි පශ්චිම වයසට පැමිණියෙමි මට නොලත් වසතුවක් ලැබගන්නත් නොපිළිවන ලත්වසතුව වඩාගන්නත් නොපිළිවන එසේ හෙයින් ඉසතෙස් දැලිරවුළු කපාහැර කසපිළිහැඳ පෙරව මහණව ගියෙම්නම් යෙහෙකැ'යි සිතා පැවිදිවන්නේය. මේ ජරාපරිහිමෙන් පැවිදි විමය.

. එම්බා රඪපාල තෙරුන්වහන්ස! නුබවහන්ෂේ තරුණ සේක, යහපත්වූ යොවන වයස ඊවිෘස්න, තවප්‍රථම වයස ඉක් මනොහියේය. එසේ හෙයින් නුබවහන්ෂේට ජරාපිරිහිමෙක් නැත, කුමක්දැන කුමක්අසා මහණවූෂේක්ද.

එම්බා රඪපාල තෙරුන්වහන්ස ව්‍යාධිපිරිහිම නම් කවරේ දයන්? මෙලොව යම් පුරුෂයෙක් ව්‍යාධියෙන් දුකට පැමිණියේ ද බලවත් ගිලන්කමක් ඇත්තේද එතෙම මෙසේ සලකයි 'මම ව්‍යාධිගතයෙමි මට දැන් නොලත් ලාභයෙක් ලැබගන්ටත් නොපිළිවන ලත්ලාභය වඩාගන්ටත් නොපිළිවන එසේහෙයින් ඉසතෙස් දැලිරවුළු කපාහැර ශාසනයෙහි මහණවින්නම් යෙහෙකැ යි සිතා පැවිදිවේද මේ ව්‍යාධි පිරිහිමෙන් පැවිදිවීමය නුබවහන්ෂේවූ නලී කිසි ව්‍යාධියෙක් නැතිෂේක. ඉතා සීතල නොවන්නාවූ ඉතා උෂ්ණ නොවන්නාවූ සමකොට අහර පැසවන්නාවූ ජඨරග්නියෙනුත් යුකතෂේක. එබැවින් නුබ වහන්ෂේට ව්‍යාධිපිරිහිමෙක් නම් නැත කුමක්දැන කුමක් අසා මහණවූෂේක්ද.

එම්බා රඪපාල තෙරුන්වහන්ස භොග පිරිහිම නම් කව රේද? 'මෙලොව යම් පුරුෂයෙක් දුසිදස් කම් කරුවන්ගෙන් ආඪ්‍යවේද මහත්වසතු ඇත්තේද උපභොග පරිභොග වසතු වත් බොහෝවේද ඔහුගේ ඒ පරිවාර සම්පත්තිය හා වසතුව ක්‍රමයෙන් නැසීගියේද එ තෙම මෙසේ සලකන්නේය 'මම පෙර මහත් ආඪ්‍යයෙමි මහත් ධන ඇතියෙමි මහත් භොග ඇත්තෙමි මාගේ ඒ භොගය දැන් විනාශයට ගියේය. මට දැන් නොලත් ධනයක් ලැබගන්ටත් නොපිළිවන ලත්ධන යක් වඩාගන්ටත් නොපිළිවන එසේ හෙයින් ගිහිව සිවීමෙන්

එල කිව්ද කසාපිළී හැඳපෙරව ශාසනයෙහි මහණවූයෙම් නම් යෙහෙකැ'යි සිතා පැවිදිවේද මේ හොඟ පිරිහිමෙන් පැවිදිවීමය.

නුබවහන්ඉේ විනාහි රට නැසි ආ රජකුටවත් රටවැස්සන් වත් උපසථානකරන්ට පුළුවන් හෙයින් 'රඨපාල'යයි ප්‍රසිඩවූ මහත් සැපඅති කුලයෙක උපන්ඉේක. එඉේහෙයින් නුබවහන්ඉේට ධනයෙන් පිරිහිමෙක්නැත කුමක් දුන කුමක් අසා කුමක් දුක මහණවූ ඉේක්ද.

නැවත නැයන්ගෙන් පිරිහිම නම් කවරේද?

මේ ලොකයෙහි යම් පුරුෂයක්හට මිත්‍රයන්හා යහලුවොත් බොහෝවෙද්ද මවුපිය දෙපක්ෂයෙහි නැයොත් බොහෝවෙද්ද ඒ සියලු නැයෝම කුමු කුමයෙන් නැසිගියෝද ඒ පුරුෂතෙම මෙසේ සලකන්නේවේද "පළමු මට මිත්‍රයෝද යහලුවෝද නැයෝද බොහෝවෙති. ඒ සියල්ලෝම දුන් නැසීගියෝය. එබැවින් මට දුන් නොලත් හොඟයන් ලැබගන්ටත් නොපිළිවන ලත්හොඟය වඩාගන්ටත් නොපිළිවන. එබැවින් එකාකිව ගිහිගෙයි සිටීමෙන් ප්‍රයොජන කවරේද? හිසකේ දැළිරවුළු කපාහැර කසාපිළී හැඳ පෙරව මහණවීම්නම් යෙහෙකැ" යි සිතා පැවිදිවන්නේ වේද, මේ ඤුති පිරිහිමෙන් පැවිදිවීමය.

"එම්බා රඨපාල තෙරුන්වහන්ඉ! නුබවහන්ඉේට මේ ථූලල කොනීත නම් ගම බොහෝ මිත්‍රයන් හා යහලුවොත් ඇත, මවුපිය දෙපක්ෂයෙහි නැයොත් ඇත, මවුපිය දෙදනත් ඇත, එඉේ හෙයින් නුබවහන්ඉේට නැපිරිහිමෙක්නැත, එබැවින් කුමක් දුක කුමක් අසා මහණවූ ඉේක්ද" යි විචාළේය. එඉේ විචාළාවූ කොරව්‍ය රජහට රඨපාල තෙරුන්වහන්ඉේ වදාරණ ඉේක් "එම්බා මහරජ සවීඥතාඥානයෙන් සියල්ල පිරිසිඳ දත් නාවූ භාග්‍යවත්වූ බුදුරජාණන්වහන්ඉේ සංක්ෂපයෙන් බණ පද සතරක් වදාළඉේක. ඒ ධම්මිකථාවන් අසා මම් මහණවීමි" යි "මෙලෝ වැසිතෙම ජරාව විසින් ගෙනයනු ලබන්නේය. බොහෝකල් නොපවත්නේය" යනු එක ධම්මයෙකැ.

"මෙලෝ වැසිතෙම නිසි පිහිටක් නැත්තේය, මොවුන් රක්ෂාකරණ එකකුත්නැත" යනු එක ධම්මයෙකැ.

"මෙලෝ වැසිතෙම තමාඅයත්වූ නිසිබඩුවකුත් නැත්තේය, තමා අයතියයි සිතූදෙයක් ඇත්නමුත් ඒ සියල්ලම දමා යායුතු දෙයකැ" යි යනු එක ධම්මයෙකැ.

"මෙලෝ වැසිතෙම නොපිරුණු සිත්ඇත්තේය, ආශාවට දාසව සිටිනේය" යනු එක ධම්මයෙකැ. මෙඉේ බුදුන්වදාළ ධම්ම

පදයත් සතරදෙනා අසා ගිහිගෙය හැර මම් මහණවීම් " සි වදාළසේක.

එකල්හී කොරව්‍ය රජ්ජුරුවෝ කියන්නාහු " එම්බා රඨපාල තෙරුන්වහන්ස! නුබවහන්සේ 'මෙලෝ වැසිතෙම ජරාවසිත් ගෙනයනු ලබන්නේය, බොහෝකල් නොපවත්නේය' සි වදාළසේක, මේ වචනයට අර්ථ කවරේදැ" ? සි විචාළේය.

" එම්බා මහරජ ! තෝ පෙර විසිවයස් ඇතිවිද පස්විසිවයස් ඇතිවිද ඇත්සරමත් කෙලෙහිද අස්සරමත් කෙලෙහිද රථ සර මත් කෙලෙහිද දුනුසරමත් කෙලෙහිද කඩුසරමත් කෙලෙහිද පය සවිත් ඇතිවිද අතසවිත් ඇතිවිද 'යුඛයට සමර්ථය' සි කියයුතුවිදැ" සි විචාරා වදාළසේක.

රජතෙම කියනුයේ " එසේය වහන්ස ! මම විසිවයස් ඇති වීම් පස්විසිවයස් ඇතිවීම් ඇත්සරමත් කෙලෙමි අස්සරමත් කෙ ලෙමි රථසරමත් කෙලෙමි දුනුසරමත් කෙලෙමි කඩුසරමත් කෙ ලෙමි පයසවිත්ඇතිවීම් අතසවිත්ඇතිවීම් යුඛනිර්මටත් සමර්ථ වීම් සමහරකලෙක සැවිමතක්හු මෙන් 'මාගේ බලයට සමබල ඇත්තෙක් නැතැ'සි සිතිමි " සි කිය.

එසේ කීවාවු රජහට තෙරුන්වහන්සේ වදාරණසේක් "එම් බා මහරජ තෝ පළමු පරිද්දෙන් දැන් අතසවිත් ඇත්තේවිද පයසවිත් ඇත්තෙහිවිද යුඛයට සමර්ථදැ" සි විචාරා වදාළසේක.

එබසට රජ්ජුරුවෝ කියන්නේ " වහන්ස ! මම දැන් ඉතා ජරායෙන් පීඩිත්‍යෙමි අසූවයසට පැමිණියෙමි 'මෙතෙක පය තබම්' සිතා පයතබන මම අනික්තැනක පයතබම් දැන් පළමු කටයුතු ඇත්සරම ආදි කිසිවකුත් මට නොපිළිවනැ"සි කියේය.

" මහරජ ! ඒ බාල වයසෙහි කටයුත්ත පශ්චිම වයසෙහි නොකළහැක්කේද යම්සේ දණ්ඩකින් ගසා ගවයින් ගාලට ගෙනයන්නාක්මෙන් ජරාවෙන් පැහැර සවතෙම මරණට පමු ණුවනු ලබන්නේද එබැවින් එසේ එක ජාතියකට ප්‍රයොජන නකා කරන්නාවූ ඇත්සරම ආදිවූ දෙය බාලවයසෙහි පළමු කොට සිඛකටයුතුවේද එසේකල අනාවරාග්‍ර සංසාරයෙහි අප්‍ර මාණවූ සංසාර දුඃඛයෙන් මිදීමට කරන්නාවූ උත්සාහය එක පැයකුත් පමානොව පළමු පළමුවෙන් කටයුතුවන්නේ වේද නවද උපන්නාවූ සවයාට පැමිණෙන්නාවූ මරණය 'අසවල් දවසකය අසවල් මසකය අසවල් අවුරුද්දෙකැ' සි නියමයෙන් නැතිව පැමිණේද සමහර කෙනෙක් ගැබඇතුලේ හිදීම මියන්නාහු වෙද්ද බිහිවූ දවස්ගණනකින් මස්ගණන

කින් අවුරුදුගණනාකින් මියන්නාහු වෙද්ද ඉතා බොහෝ කලක් ජීවත්වන්නෝත් අවුරුදු සියයෙන් ඇත බොහෝසේ ජීවත්නොවෙද්ද ඒ නිසා බුදුන් විසින් "සත්වතෙම ජරාව විසින් ගෙනයනු ලැබෙයි බොහෝකල් නොපවත්නේය" යි වදාරණ ලද යම් ගෘහයක මල් පලඟත්නාකල සමහරෙක් මල් අවස්ථා, වෙහිම වැඟිර යන්නේ වේද ලාඅවස්ථාවෙහිත් වැඟිර යන්නේ වේද මූකල අවස්ථාවෙහිත් වැඟිරයන්නේවේද එමෙන් කලල අවස්ථාවෙහිද අර්බුද අවස්ථාවෙහිද ප්‍රසව අවස්ථාවෙහිද තරුණඅවස්ථාවෙහිද මහලු අවස්ථාවෙහිද මියන්නාහුවෙති. එසෙසින් මියන්නාවූ ඒ මනුෂ්‍යයන්ට මේ බුඩොත්පාද කාලයෙහි ලද්දාවූ මනුෂ්‍යත්මභාවය නොලද්දාහා සමානවන්නේය. එසේ හෙයින් 'මේ කලනින් ලද්දාවූ මනුෂ්‍යත්මභාවය නිරර්ථක නොකොට පින් රැස්කොට සසර දුකින් මිදුනොමෙනම් යෙහෙකැ' යි යන සිතින් දෙමවුපියන්ද අඹුදරුවන්ද ඛනඛානාඥදිවූ සියලු සමාඛියද හැර ප්‍රථම වයසෙහිදීම මහණවිමි" යි වදාළ සේක.

එබසට මහරජතුරුවෝ "ඒ එසේමය එම්බා රඨපාල තෙරුන්වහන්ස! අප රජදරුවන්ගේ ඇත්සෙනඟත් අශ්සෙනඟත් රථසෙනඟත් පාබලසෙනඟත් ඇත, ඇත්ම සමානව කඩුගෙන රැකවලෙහි සිටිනාවූ බොහෝ යොධඝටයොත් ඇත, ඔහු විපත්තියක් පැමිණි කල්හි රක්ෂාකෙරෙති. එසේව සිටැදී සුබ වහන්සේ 'මෙලෝවැසිතෙම කිසි පිහිටක් නැත්තේය. ඔවුන් රක්ෂාකරණකෙනකුත් නැතැ' යි වදාළසේක. මේ කෙසේ දතයුතුදැ" යි විචාළේය.

එබසට රඨපාල තෙරුන්වහන්සේ වදාරණසේක් "කිමෙක්ද මහරජ! නොපට නොහැර පවත්නාවූ යම් ව්‍යාධියෙක් ඇද්දැ" යි විචාර වදාළසේක.

"එසේය මහතෙරුන්වහන්ස! මට වාතව්‍යාධියෙක් ඇත සමහරකලෙක මාගේ මිත්‍රයන් හා අමාත්‍යයෝද ඤාතිගණයෝද 'කොරව්‍ය රජ්ජුරුවෝ දැන් මියනසේක් දැන් මියනසේකැ' යි වටකොට සිටිති" කියේය.

එබසට තෙරුන්වහන්සේ වදාරණසේක් "කිමෙක්ද මහරජ! මිත්‍ර අමාත්‍යයන් හා නෑයන් නැදෑවා එම්බා මිත්‍රයෙනි එම්බා අමාත්‍යයෙනි එම්බා නෑයෙනි 'මේ දුඃඛවෙදනාව මට ඉවසාගන්ට නොපිළිවන නෙපිත් ඇරගනුව' යි කියා බෙදා දෙනවාත් ඇද්ද නොඉහාත් නොපිම විඳුදැ" යි විචාර වදාළ සේක.

රජ්ජුරුවෝ කියන්නේ "එම්බා තෙරුන්වහන්ස' දුඃඛ වෙදනාවනම් අනික්කෙනෙකුන්ට බෙදාදීලිය නොහැක්කේය. උන්විසිනුත් හැරගත නොහැක්ක එබැවින් ඔම්ම විඳිනොමි" යි කියේය.

"මහරජ! 'මෙලෝවැසිතෙම කිසිපිහිටක් නැත්තේය. රැකෙන කරණ කිසිකෙනෙකුත් නැතැ'යි බුදුන් වදාළේ ඒනිසාය. එබැවින් පින්විනා වෙන පිහිටක් නැත 'පින්මිස සත්වයා රැකෙන කරණ වෙනකෙනෙක් නැතැ'යි නුවණින් පරීක්ෂාකොට මම සියලු සම්පත්තියත් බන්ධුවර්ගයාත් හැර බාලත්වයේම පැවිදි වීමි" යි වදාළසේක.

"එම්බා රඳපාල තෙරුන්වහන්ස! අපගේ රජගෙයි නිධානකලාවූද නොකලාවූද කෙළගණන් රන්රුවන් මුතුමැණික් ආදිවූ වස්තුඇත එසේ තිබැදී නුබවහන්සේ 'මෙලෝවැසිතෙම තමා අයතිවූ කිසි බඩුවකුත් නැත්තේය. තමා අයතියයි සිතූ දෙයක් ඇත්තමුත් ඒත් දමා යායුත්තේය' යි වදාළසේක. ඒ කෙසේ දනයුත්තේදැයි" විචාළේය. එබසට තෙරුවහන්සේ "එම්බා මහරජ තෝ දැන් යම් යම් සැපතකින් ඉදුරන් සතුටු නොට වාසය කරන්නෙහිද පරලොවත් මේ වස්තු හෙතාගොස් මෙයින්ම සතුටුව වාසයකරන්නෙහිද නොහොත් මේ වස්තු වෙනකෙනෙක් ඇරගැනිද්ද තෝ කළ කම්පරිද්දෙන් පරලොව යන්නෙහිදැ" යි විචාරා වදාළසේක.

එබසට රජතෙම "එම්බා රඳපාල තෙරුන්වහන්ස! මෙතන මාගේ වස්තුවේන් එක කහවණුවකුත් පරලොව ගෙනයා හැක්කෙක් නැත, මේ වස්තුවට අනික්කෙනෙක්ම හිමිවෙති. මමවනාහි මාකළ කුසල් අකුසල් පරිද්දෙන් පරලොව දුක් සැප දෙකට පැමිණෙමි" යි කියේය.

"මහරජ! මේනිසා බුදුහු 'මෙලෝවැසිතෙම තමා අයතිවූ කිසි බඩුවකුත් නැත්තේය. තමා අයතියයි සිතූදෙයක් ඇත්තමුත් ඒ සියල්ලත් දමා යායුතුය' යි වදාළසේක. මම ඒ අසා වස්තුව නිසා සත්වයාගේ ආයු බොහෝවන්නේත් නැත ඒ වස්තුවනිසා ජරාව නැසෙන්නේත් නැත කොතෙක් වස්තුව ලදත් ජීවිතය සුළුපකාලයක්වත් පවත්නේ නොවෙයි. මලකල්හිත් 'මාගේ මැණියෝ මලෝය. පියාගෝ මලෝය' යි කියා හඬන්නෝත් කඩනැබල්ලනින් මුහුණවසා ගෙන් නික්මුත්නොට සොහොන් හිතබා දවන්නාහු වෙති. මිය පරලොවයන්නන් කැටුව යන වස්තුවකුත් නැත. එසේ යන අයට ඥාතියන්ගෙන් යහලුවන්

ගෙන්වත් රැකීමවකුත් නැත. මේ සියල්ලටම රැකීමවෙන්නම් 'තමා කොටගත් පින්මය' යි දැනගත්තාවූ ඔම සියලු සම්පත් නියද බන්ධුවර්ගයාද හැර බාල වයසේදීම මහණවීමි" යි වදාළසේක.

එම්බා රඨපාල තෙරුන්වහන්ස නුබවහන්සේ "මෙලෝ වැසි තෙම නොපිරුණු සිත්ඇත්තේය. ආශාවට උසව සිටිනේය" යි වදාළසේක. "මේ කෙසේ දනයුත්තේදැ" යි විචාළේය. එම්බා මහරජ අදහාගතයුතු බස්ඇති සත්‍යවාදීවූ එක් පුරුෂයෙක් පූර්වදිගින් නොපකරා අවුත් "එම්බා මහරජුරුවන් වහන්ස මම පූර්වදිග්හි මහරටක් දුටුයෙමි ඒරට සියලු සම්පත්තියෙන් පිරුණේය. ගැවසී සිටියා බොහෝ මනුෂ්‍යයෝත් ඇත, ඇත් සෙනඟත්ඇත, අස් සෙනඟත්ඇත, රථ සෙනඟත්ඇත, පාබල සෙනඟත් ඇත, බොහෝ රන්පණම් මුතු මැණික්ඇත, අනඝීවූ කසිසළු පලස් ආදිවූ වස්තුජාතියත් ඇත, දිව්‍ය සම්පත් වැනිවූ යශපත් සම්පත්තුත් ඇත නුබවහන්සේගේ දැන් මේ ඇත් සෙනඟින් ජයගන්ටත් පිළිවන්මය. ශ්‍රද්ධාව හැරගත මැනවැ" යි කියාද "එම්බා මහරජ! නෝ 'සියලු සම්පත්තියෙන් පිරුණාවූ හස්ත්‍යශ්වාදිවූ චතුරඞ්ගිනී සෙනාවෙන් අඩුවක් නැත්තාවූ මේ තුරුදෙශයට එකාත පත්‍රව රාජ්‍යය කරන්නෙමි. මේ මට අන්රටකින් ප්‍රයෝජන කිම්දැ'යි සිතන්නෙහිද නොහොත් මේ රටත් ජයගන්නෙහිදැ" යි විචාළසේක.

එබසට රජතෙම කියනුයේ "එම්බා තෙරුන්වහන්ස! රටවල් ඇතැයි යන සිතෙක් අපට නැත. මේ රටත් ජයගෙන වසම්හ" යි කියේය. තෙරුන්වහන්සේ නැවත වදාරණසේක් "එම්බා මහරජ! එසේම පුරුෂයෙක් පශ්චිම දිශාභාගයෙන් අවුත් 'මේ දිගත් එබඳු රටක් ඇතැ' යි කියාද, අනික් පුරුෂයෙක් උතුරු දිගින් අවුත් 'මේ දිගත් එබඳු රටක් ඇතැ' යි කියාද, අනින් පුරුෂයෙක් දකුණුදිගින් අවුත් 'මේ දිගත් එබඳු රටක් ඇතැ' යි කියාද, අනිත් පුරුෂයෙක් මුහුදින් එතරසිට අවුත් 'එතර එබඳු රටක් ඇත්තේය' යි කියාද එම්බා මහරජ නෝ මේ සියලු රටවල් ජයගෙන වසන්නෙහිදැ" යි විචාරා වදාළසේක.

"එම්බා තෙරුන්වහන්ස! එසේය මේ සියල්ලත් ජයගෙන වසමි. 'මේ රට ඇතැ'යි යන තෘප්තියෙක් අපට නැතැ" යි කියේය. "මෙලෝ වැසිතෙම නොපිරුණු සිත්ඇත්තේය. ආශාවට උසව සිටිනේයයි බුදුන් වදාළේ මේනිසාය. එසේ ඇහුවාවූ මම මේ ලොකවාසි සත්වයෝ කොබඳු ධනයක් ඇතත් දන් නො

දෙති නැවත ඛනයම ප්‍රාර්ථනා කෙරෙති. රජදරුවෝද සෙසුත් බොහෝ මනුෂ්‍යයෝද වසතුවෙහි ආලය හැරගත නොහිම මියෙති. ඒ තුමන්ගේ සිතෙහි ආශාව හැරගත නුහුනුනිසා නරකාදිවූ සතර අපායෙහි උපදිති. මම වනාහි මේ සියල්ලම නුවණින් සලකා ඒ ආශාවෙන් පැවතිය යුතුවූ වසතුවත් නිර පෙක්ඛාව හැර ශාසනයෙහි මහණවීම් " යි වදාළසේක.

මෙසේ බුදුන් වදාළෙන් ඒ ඇතු උතතමයන් මවුපියන් අඹු දරුවන් ආදිවූ බන්ධුවගීයාත් කෙළගාණන් වසතුවත්හැර බාල වයසේදීම මහණවූයේත් 'මේ බුඛොත්පාදය ලත් තැනදී දුල්ලභවූ මනුෂ්‍යත්මභාවය ලද්දුවූ අපි කාමතෘෂ්ණාවට වසඟව පින්කිරීමෙහි පමාවූමෝනම් සංසාර දුඃඛය කෙසේ දුරුකරමෝ ද'යි යන යහපත් කල්පනාවෙනැයි දැන,

" අජෙජව කිච්චං ආතපපං කොජඤ්ඤ මරණංසුවේ
නාහිනෝ සංගරතෙනන මහාසෙනෙන මච්චුනා "

යනමේ ගාථාවෙහි අපිත් සිහිකොට එම්බා සත්පුරුෂයෙනි තොපිද මදනුත් පමාෘනාවී පින් රැස්කරව.—ඒ ගාථාවිය කෙසේ සැලකිය යුතුදයත් ?

මෙලොව සතුරන්ගෙන් වන උපද්‍රව වැලකීමට ග්‍රහචාරක චාටාදියෙන් යොදනාලද රැකවලෙක පරිඛාප්‍රාකාර ගොපුරාදියෙන් යොදන ඇසිල්ලෙක ඛඩ්ගකොනතා තෙමෙරදියෙන් කරණ අභ්‍යාසයෙක මණිමනෙත්‍රෂධාදියෙන් පුරුදුකිරීමෙක භාෂ්‍යාශාස්ත්‍ර රූපාදීන්ට කරණ සංග්‍රහයෙක මුකනාමාණික්‍ය භිරණ්‍ය සුවණ්ණයන්ගේ රැස්කිරීමෙක සතුරන්ගේ බලාබල පරීක්ෂාකිරීමෙක යනාදින් අනෙකප්‍රකාරඇත. මෙහි එකප්‍ර කාරයෙහිනුත් මරහු නවතාගත නොහැක්කේය.

තවද " සතුරන් ඉන්නේ අසවල් දිග අසවල් රට අසවල්ගම ය"යි නියමයක් ඇතිහෙයින් ඔවුන් වලකාගන්ට සුදුසුඋපායක් යොදාගත හැක්කේය. මේ මරහු ඉදිනි යන දෙශනියමයන් දිශානියමයක් නැතිහෙයින් එබඳු උපායකුත් නොකළ හැක්කේය.

තවද සතුරන්ගේ හා තමාගේ නක්ෂත්‍ර යොග රාශි දශා ලග්න ග්‍රහගති නියමයෙක් කාලනියමයෙක් වනහෙයින් අස වල් සෘතුයෙහි අසවල් මස අසවල් පක්ෂයෙහි අසවල් නක්ෂත්‍ර යෙන් එති නියම දැනෙන හෙයින් ඔවුන් ජයගන්ගා පිණිස පළමුවෙන්ම කරණ ප්‍රයොගයකුත් ඇතිව තිබෙයි. "මේ සත්ව යාට වනාහි ගැබ පිළිසුන්තැන් පටන් අසවල් නැකතෙක අස

වල් දවසෙක අසවල් පක්ෂයෙක අසවල් මාසයෙක අසවල් ඍතුයෙක අසවල් අවුරුද්දෙක මරණපැමිණෙ”යි යන ඥානය කුහ් නැත්තේය. ඒ නාවතනට කටයුතු ප්‍රයොගයක්ද නැත් තේය.

තවද මරහු නම් මහ සෙනඟක් ඇති එකෙක වැසි වතුරු ගිනි විස ගිජ සූලං ආයුධ සිංහ ව්‍යඝ්‍රාදි බාහිරෙපද්‍රවයත් ඔහු ගේ සෙනඟය. ශරීරයේ හටගත්තාවූ කාශසඩාසාතිසාර හිඤ්ඤා ප්‍රමෙහාදිවූ ව්‍යාධීත් ඔහුගේ සෙනඟය. ශරීරසථවූ වාත පිත්ත ශ්ලෙෂ්මාදිවූ දොෂයෝත් ඔහුගේ සෙනඟය. සිතයි උපදනා රාග ද්වෙෂ මොහ මදමාත්සර්‍ය්‍ය දෘෂ්ටිමානාදි අකුශල යෝත් ශරීර විපත්තියට කාරණව සිවිනාගෙයින් ඔහුගේ සෙනඟය. යටත්පිරිසෙයින් ශරීරරක්ෂාව පිණිස අනුභවකළ ආහාරයත් අමාදි දොෂයට පැමිණෙන ගෙයින් ඔහුගේ සෙනා ගට ඇතුළත් වන්නේය. මෙසේ මහසෙනඟක් ඇත්තාවූ මරහුගෙනුත් ඔහුගේ සෙනාවගෙනුත් ගැලවීම නොපිළිවන. මා කිපදවසක් පින්කොට ගත්තාතුරු අනාථ නොකරව නො පට සියයක්දෙමි දහසක් දෙමි ලක්ෂයක් දෙමියි කියා අල්ලස්දී සින්ගන්ටත් නොපිළිවන. ආයුධ ශික්ෂාවෙහි දක්ෂවූ ශොඛයට යන් ගෙන බලරාශි කරන්නේ ජයගන්ටත් නොපිළිවන. මේ සියලු කාරණයෙන් සෙට මරණ නොවෙතියි සිතාගන්ට නො පිළිවන. ඊට සුදුස්සෙක් නැහ, අද රක්ෂාකෙරෙමී සිතූ ශීල යද අද ශද්ධා සිතූ ඥානයද අද කෙරෙමියි සිතූ කුශලයද අදට ප්‍රමාදය අදවත් සෙටවත් අනිද්දුවත් සිඹකොට ගනිමියි නො සිතා අදඅදම සිඹකිරීමට වීර්‍ය්‍යකටයුත්තෙයයි යනමේ ගාථාර්‍ථය සිහිකොට දිවාරාත්‍රි දෙක්හි අප්‍රමාදව නිද්වජ්ජිත කිරීමෙන් යුක්තව පින්කටයුත්තේයයි වදාළසේක.

තවද අප්‍රමාදව පින්කටයුත්තේයයි යනමේ අවවාදය හුදක් බුදුන් විසින්ම වදාරණලද්දේ නොවෙයි. ලොවට කරුණුඇති හිතෙයිවූ දෙවියන් විසිනුත් කියනාලද්දේමැයි.—හේ කෙසේද යත් ?

එක් කලෙක බුදුහු ජේතවන මහාවිහාරයෙහි වැඩවාසය කර වදාරණසේක. එකල්හි එක්දවසක් මධ්‍යම රාත්‍රියෙහි එක් දිව්‍යපුත්‍රයෙක් වෘද්ධ සුශ්‍රීයන් මෙන් ජේතවන මහාවිහාරය හාත්පසින් බබුළුවාගෙන බුදුන්කරා අවුත් වැඳ එකත්පස්ව සිටියේ මේ ගාථාවෙන් මෙසේ කීයේය.

“ සතතියා විය ඔමට්ටා ඛණා මානොව මච්චකෙ
කාමරාගප්පහානාය සතොභික්ඛු පරිබ්බජෙ ”

තුන්ලොවට ගුරුවූ භාග්‍යවත්වූ සර්ව්ඥයන්වහන්ස! මෙලෝ වැසිතෙම තමාට මේ වැඩය මේ අවැඩයයි කියා හිතාහිත නොදන්නේය. එබඳු නොදන්නාවූ ඒ ලොකවාසීන්ට නුබවහන්සේ ගිවිස්වා මාකියන අවවාදයෙක් ඇත ඉදින් මේ සංසාර දුඃඛය මහත් භයකැයි දන්නාවූ නුවණැති යම් පුරුෂයෙක් ඇත්නම් ඒ පුරුෂයා විසින් මෙසේ සැලකිය යුත්තේය. හේ කෙසේදයත්?

මෙලෝවැසි පුරුෂයන්ට වදනාවූ ශර පහරෙක්වත් තෙප් පහරෙක්වත් ඇත්නම් ඒ සියල්ලම සතර චැදැරුම් වන්නේය. හේ කෙසේදයත්?

ඔමවිට නම් එක් පහරෙක උම්මවිට නම් එක් පහරෙක මවිට නම් එක් පහරෙක විමවිට නම් එක් පහරෙක ඉන් උඩ සිට පල්ලට දෙනලද්දාවූ පහර "ඔමවිට" නම් වන්නේය. යට සිට උඩට විදුනාලද්දාවූ පහර "උම්මවිට" නම් වන්නේය. අඟුළු පෙත්තක් මෙන් සම්කොට විදුනාලද්දාවූ පහර 'මවිට' නම් වන්නේය. මේ තුනින් පිටත් යම් පහරෙක් ඇත්නම් ඒ 'විමවිට' නම් වන්නේය. ඔවුන්අතුරෙන් යටින් උඩටවිදුනාලද 'උම්මවිට' නම් පහරටත් පිළියම්නැල හැක්කේය. සරස විදුනා ලද පහරටත් පිළියම්නැල හැක්නේය. එසින් පිටත් 'විමවිට' නම් පහරටත් පිළියම්කලහැක්කේය. උඩින් පල්ලටවිදුනාලද පහරට පිළියම්නැල නොහැක්කේය. ඒ කුමක් හෙයින්දයත්? ර්තලය හෝ තෙප්තලය හෝ ගැලවී ඇතුලත්හිම රඳගියේ වීනම් ර්තලය ඇදගැන්මත් ඉතා දුෂ්කරය ඇතුලේම ලේහා පූයාපිරීවන ඹුනතත් වසා සිවිනේය. ර්ට පිළියම් කරණකල පය උඩබැඳ යවිකුරුකොට හොවා ර්තලය හෝ තෙප්තලය හැදදමා ලේහා පූයා දුරුකොට ඖෂධ ධූමාදියෙන් වණය වියලා දුකසේ වෙදකම් කටයුත්තේය. මදක් පමාවුවහොත් ඒ පුරුෂයාගේ ජීවිතරක්ෂාව නොහැකිවන්නේය. එහෙයින් අප්‍රමාදව කටයුතු වෙදකමෙක එබැවින් එසේ ඔමවිටකොට විදුනාලදුව දුන්විදිනා පුරුෂතෙම ශලෙලාබරණ වන පිළියම් පිණිස මහත් උත්සාහ කරන්නේවේද මදකුත් පමානොවන්නේද යම්සේ ඉසබැඳි කඩෙහි ඇවිලුනු ගිනිඇත්කාවූ පුරුෂයෙක් ඒ ගිනි නිවානොගෙන වෙන කෘත්‍යවණ්ක් කම්මානායකට ව්‍යවෘතනොවන්නේද පළමුකොට ඉසගිනි නිවාගැන්මටම උත්සාහ කරන්නේද එමෙන් සසර දුක් බොහෝයයි නුවණැසින් දක්නාවූ පුරුෂයා විසින් දිවා රාත්‍රි දෙක්හි අප්‍රමාදව රාගාදි අකුසල් දුරුකිරීමට උත්සාහකොට වාසය කටයුතු වන්

නේද එබැවින් මාවිසිනුත් නිරන්තරයෙන් යව් දුරුකිරීමට උත් සාහ කටයුතුය.

ඒ එසේමය—බොලොව් හිතෙසිවූ ලොවට කරුණාඇති දෙවී සන්වත් මනුෂ්‍යයා විසින් කිකරු වියයුතුය. නැවත සාරසංඛ්‍ය කප්ලක්ෂයක් මුළුල්ලෙනි ඉස් ඇස් මස් ලේ දන්දී දශපාරමී ධර්මයන් පූරා දිව්‍ය බ්‍රහ්ම නාග සුපණ්ණාදිවූ සියල්ලවුන් දත් දෙය නොදත්නාකොට තමන් වහන්සේ දත්දෙයම ලොවට උපදෙශකොට ලොකගුරුවූ සර්ව්ඥ පදප්‍රාප්තවූ භාග්‍යවත්වූ බුදුරජාණන්වහන්සේ "දෙව්කෙනකුන් කිබස් මම කුමට කියම්ද" සි සිතා නොවදුරා සර්ව්ඥතාඥානයටත් අවිරුඬව සිවි ගෙයින් මේ අවවාදය ලොවට දෙශනාකොට වදාළසේක.

"එසේ දෙවියන් ති අවවාදයෙහිත් බුදුන් වදාළාවූ අවවාද යෙහිත් අපි පිහිටාගත නුහුනුමෝනම් කවරක්හුගේ අවවාද යෙහි පිහිටාගෙන කවර වැඩන් සිඛකරමෝද එසේ නොනී කරුවූ අපට වැඩෙන්නම් සිඛවන්නේකෙසේද" සි සලකන්නාවූ ඥාඛ්‍රජනයා විසින් දුර්ලඝවූ මේ මනුෂ්‍යත්වභාවයෙහිදිම අප මාදව පින්කටයුත්තේය.

තවද පමානොවී පින්නිරීමට පසේබුදුවරයන් වදාළ අව වාදත් ඇත ඒත් ඉසා සිත තබාගෙන පින්කටයුත්තේය—හේ කෙසේදඉන්?

එක් කලෙක බහාබාහ්‍ය සමාධියෙන් යුක්තවූ මහත් ගම් සැට දහසකින් සැදුම්ලද්දවූ මගධදෙශයෙහි රජගහනුවර අරිඳම නම් රජෙක් රජ්‍යශ්‍රී අනුභව කරන්නේය. ඔහු එසේ රජ්ජය කරණකල්හි ඕහට අවවාද කරණු පිණිස සොණක නම් පසේබුදු කෙනකුන් වහන්සේ රජහුගේ මඬුලොදකුණ ඉට වැඩ මහුල්සල්ගසමුල වැඩඋන්සේක. උන්වහන්සේ වැඩ උන්නේසි ඉසා ඒ අරිඳම නම් මහරජතෙම මහසෙනාඉ පිරී චිරා උනට ගියේය. ඒ පසේ බුදුන්වහන්සේදැක නොවැදම එකත්පස්වහිඳ,

"නපණ්ණවතායං භික්ඛු මූලෙඝාසඛ්භාවි පාරුතො
අමාතිකෝ අපිතිකෝ රුක්ඛමූලසමිං ඝායති."

සන වේ හාස්‍යවෙන් "මේ මහණතෙමේ ඉසමුඩුය කඩනැ බලි එක්කොට ගොතා කසටදියෙන්රඳු ඇඳ පෙරව උන්නේය. මොහු රජිණිකාරණ මැණිකෙනොතුත් නැත පියාණ කෙනෙ කුත්නැත මේ රුක්මුල තමා බැහැපත් හෙයින් නොයෙක් සිති විලිසිතා උන්නේවනැ" සි කිය. එසේ හිවාවූ මහරජහට "සොණක" නම් පසේබුදුන් වහන්සේ,

"යොඛම්භිං නිරංකත්වා අධම්ම මනුවත්තති,
සරාජකපණ්ඩහති පාපො පාප පරායණෝ."

යන මේ ගාථාවෙන් "එම්බා මහරජ! මෙලොව යම් පුරුෂයෙක් අන්‍යී ධර්ම්මය සිතින් ඇතුරුකොට වසන්නේවේද ඒ කෘපණයාම නොවන්නේය. දුගීයාම නොවන්නේය. යමෙක් කුශලධර්ම්මය සිතින් දුරුකොට අධර්ම්මයෙහි පවත්නේද තමා පවුකරන්නේද පවුකරණ අයටත් පිහිටවේද ඒ පුරුෂතෙම මහරජ්ජුරුවෙනි කෘපණයාම වන්නේය. දුගීයාමුත් වන්නේය" යි වදාළසේක. එසේ තමාහට නින්දාකළාවූ පසේබුදුන් වහන්සේගේ වචනය ඒ නොදන්නා දෙයක්මෙන් උන්වහන්සේ හා සමග පිළිසඳර කථාකරන්නාවූ මහරජතෙම මේ ගාථාවෙන් මෙසේ කියේය.

"අරිඤ්ඤමොතිමනාමං කාසි රාජාති මංවිදූ,
කච්චිභොතො සුඛාසෙය්‍යා ඉධපත්තස්ස සොණික."

එම්බා සොණක පසේබුදුන්වහන්ස! මට 'අරිඤ්ඤම' යන නමෙක 'රජ්ජුරුවෝය' යන නමෙක 'කසිරජ්ජුරුවෝය' යි කියාත් දනිති. මට වනාහි කිසි දුකෙක් නැත්තේය. සුඛ වහන්සේට "මේ උදකනාපෙහි සැතපීම සැපද දුන්දැ" යි විචාළේය. එසේ විචාළාවූ මහරජහට ඒ පසේබුදුන්වහන්සේ,

"සදුපහද්‍රමතිනාස්ස අනාගාරස්ස භික්ඛුනො,
නානෙසංකාඛෙඔපෙති නකුතොචන නඛලොපියං,
පරනිඛිත මෙසානා තෙනයාපෙනති සුඛබනා."

එම්බා මහරජ්ජුරුවෙනි! රක්‍ෂාකටයුතු කිසි ධනයක් නැත්තාවූ ගිහිගෙන් නික්ම මහණවූවාවූ භික්‍ෂූන් වහන්සේට දුකෙක්නම් නැත්තේය. ඇමදුම සැපයෙක්ම වන්නේය. ඒ එසේමය. උන්වහන්සේලා සතහකවූ කිසි බඳුවකුත් නැත්තේය. උන්වහන්සේලාගේ බඳුවක් කොටුවෙකවත් සැලතාලි ආදියෙකවත් තබා රක්‍ෂාකරණ කෙනෙකුත්නැත. ඒ මහාවූ චාරිත්‍රගුණ ඇති මහොත්තමයෝ අනුන්ගේ ගෙහි පිස සැපයූ ආහාරය සිහාගෙන එසින්ම ජීවිකාවෘත්තිය කෙරෙති. යනාදින් ගාථා අටකින් ශ්‍රමණගුණයන්හියා ශ්‍රමණයන්ට සැප නියාවත් කාමභොගී පුරුෂයන්ට දුක්නියාවත් ප්‍රකාශකොට වදාළසේක. එසේ වදාළාවූ ශ්‍රමණගුණයන් අසාද තමා කාම සම්පත්තියෙහි ගිජුවසිටිනා හෙයින් මේ ගාථාවෙන් මෙසේ විචාළේය.

"පියාමෙ මානුසකාමා අපොදිබ්බිාපි මෙපියා,
අථකෙනානුභවෙණ්ණා උභොලොකෙලභාමසෙ."

"එම්බා පඥේබුදුන්වහන්ස! සියලු ධනධාන්‍යයෙන් සමෘබවූ සැටදහසක් මහගමින් සැදුම්ලද්දුවූ මේ මගධදෙශයට එකාත පත්‍රව රාජ්‍යයකරන්නොමි. ඒ මාගේ රන්පොරෝදු බැඳ රන්කම් කළ කවච හා සව්ලඞ්කාරයෙන් සරහණලද සැටදහසක් පමණ හසතිහු ඇත. එසේම කාරණ කාරණ දන්නාවූ සිඹු ගබ්බාතිරයෙහි උපන්නාවූ සිඹුජවබල සම්පන්නවූ සියලු අශ්වාලඞ්කාරයෙන් සැදුම්ලද්දුවූ සැටදහසක් අශ්වයෝඇත. විපිචම්බි වජ්‍රඝචම්මයෙන් විහුෂිතවූ නාගහලද ඛවජඇති සැට දහසක් රථයෝඇත. ඛඩ්ග කොදණ්ඩ දණ්ඩාවුධාදියෙහි කෘත හස්තවූ නොයෙක් ලක්ෂගණන් පාබලසේනාවත් ඇත. සව්ා ලඞ්කාරයෙන් විහුෂිතවූ බහා පලඳනාලද මාණික්‍ය කුණ්ඩලා භරණඇති සොළොස්දහසක් නාටක සහිතුත් ඇත. මඬහල්ය වෘෂභයන් ප්‍රධානකොට සිවින්නාවූ සැටදහසක් කපිලවණ්ඩ නුහුත්ඇත. සෙසු මුතු මැණික් රන්රුවන් ආදිවූ ධනය කෙළ ගණන් වන්නේය. එසේහෙයින් මේ මනුෂ්‍යලොකයෙහි ඒ ශ්වයශ්‍යත් මට ප්‍රියය. එහිත් ආලය ඇරගත නොහෙන්නොමි. දිව්‍යලොකයෙහි ඒශ්වර්යත් මහත ඒත් ලබනු කැමැත්තෙමි. එසේහෙයින් ඒ දෙකම ලබන්නට යම් කාරණයෙක් ඇත්නම් ඒ කාරණව මට වදුලමැනවැ" සි කියා යාච්ඤාකෙළේය.

එකල්හි පඥේබුදුන්වහන්සේ වදුරණුසේක්,

"කාමගිබ්බා කාමරතා කාමෙසුඅධිමුච්ඡිතා,
නරාපාපානි කම්මානා උපපජ්ජන්ති දුග්ගතිං.
යෙචකාමෙ පහත්වාන නික්කඛන්තා අකුතොභයා,
එකොඩි භාවාඩි ගතා නතෙ ගච්ඡන්ති දුග්ගතිං."

යනාදී ගාථා දෙකින් "එම්බා මහරජ්ජුරුවෙනි! මේ ලොකයෙහි ලාමක යම් නෙතොත් රූප ශබ්දාදිවූ කාමවස්තුවෙහි ගිජුවෙද්ද එහිම සිත් ඇලවා වාසයකෙරෙද්ද ඇමිත් වැසුනු බිලියන් ගැල ඉන් වෙන්ව ගතනොහෙන්නාවූ මත්සයන් මෙන් එහිම ඕර්වශාව වෙසෙද්ද ඔහු ඒ කාමවස්තුව නිසාම ප්‍රාණඝාතාදි අකුසල්කොට දිව්‍යලොක සම්පත්තියක් මනුෂ්‍යලොකසම්පත්තියක් ඇප්පනයෙනුත් දැක්ක නොහැක්කාවූ නරකාදි චූසතර අපායෙහි උපදනාහුවෙති. යම් කෙනෙක් ඒ කාමසම්පත්තිය කෙළපිඬක් මෙන් දමා කාවත්ම්ණගසන් වෙහෙව

ගියෝද කාමරගාදි කිසිවෙකිනුත් එන භයක් නැත්තෝද විවෙක විහාරයට පැමිණියෝද ඒ සත්වයෝ කිසිකලෙකත් අපායට නොයන්නාහු වෙති" යි වදාරා,

"උපමනෙත්‍ථ කරිස්සාමි තංසුණෙහි අරින්දම,
උපමායපිධෙකච්චෙ අත්‍ථං ජානන්ති පණ්ඩිතා."

යනාමේ ගාථායෙන් "එම්බා අරිඳුමනාම් මහරජ්ජුරුවෙනි! තොපට උපමාවක් දක්වමි ඒ උපමාවත් අසා බරගතුව මෙලොව සමහර පණ්ඩිත ජනකෙනෙක් නුවණැත්තන් කි උපමා අසාත් තමන්ට වන වැඩ දැනගනිති" යි වදාරා උපමාවක් දක්වනසේක.

"ගම්භීරයකුණපං දිස්වා වුය්හමානං මහණ්ණවේ,
චායසෝ සම චිත්තොසි අපපපඤ්ඤෙසු අචෙතසෝ."

යනාදි ගාථා සතරකින් උපමාවක් දක්වූසේක. ඒ උපමාව මෙසේ දතයුතු.

"එම්බා මහරජ්ජුරුවෙනි! ගවුගණනක් පළල ඇත්තාවූ එපමණ ගැඹුරුඇත්තාවූ ගඞ්ගානම් නදිතීරයෙහි ගොදුරුකා ඇවිදිනා එක් හයානියෙක් ගංදියෙහිවැටුනේ දියපිනාගොඩනැගිගතනොහී එහිමමෙලේ ගංවතුරේයන්නේද අහසින් යන්නාවූ එක් කෘප්‍රවූවෙක් එසේ යන්නාවූ ඇත්කුණ දැක තමා නුවණ නැති හෙයින්ද ඔහපත් කල්පනාවක් තමාට නැති හෙයින්ද මෙසේ සිතීය. අඞ්කුශාදියෙන් සන්කොට කරණලද උත්සාහයක් නැතිව තමාම තමාට යන්නාවූ හයානියාගාවක් ලදිමියි ඥානාවක් නැගීගිය පුරුෂයකු විසින් අන්තැනකින් අහර සොයා අනුභව කටයුතු වන්නේය. මේවූනලී එසේ නොවෙයි මාවැනි දහස්ගණන් කපුටුවන් විසිනුත් නා නිමවාලිය නොහැකි මහත් ගොදුරක එබැවින් මෙහිම ඉඳිමියි සිතීය. එසේ සිතුවාවූ කපුටුතෙම රත්‍රියෙහිත් එහිම උන්නේය. දුවලුත් එහිම උන්නේය. දිවාරාත්‍රි දෙක්හිම ඔහුගේ සිත එහිම ඇලුනේය. සිතූ සිතූ විට ඒ හයානියාගේ මස් අනුභවකෙරෙමින් පිපාසවූවිට ගඞ්ගාජලය පානයකෙරෙමින් උන්නේය. උභය තීරයෙහි අඹදඹ වැලවරකාදියෙන් සැදුම්ලද්දාවූ වනාන්තරයන් දැක නොයෙක් මත්ස්‍ය මාංස පූදුතිබෙන දෙවොල්රුක්ද දැක රිට ඉගිල්ලනොහියේය. මුහුදටම අභිමුඛව දිවන්නාවූ ජල ප්‍රවාහයක්ඇති ඒ ගඞ්ගානොම තමා රක්ෂාකිරීමෙහි සිහි නැත්තාවූ ඒ කුණෙහි ඇලී උන්නාවූ ඒ කපුටුවා ඔබ් නැනකට

ගියාවූ පක්ෂීහු නැවත ගොඩට ආනොහෙද්ද එපමණ මුහුදු මැදට ගෙනගියේය. එසේ ගියාවූ ඒ ඇත්කුණු මුහුදු රළින් සොබාගිය හෙයින්ද මසුන් වැද මස්කැ හෙයිනද ඇට සම් පමණක් ඉතිරිව ඒත් මුහුදු ගිලිකල කපුටුතෙම තමා වඩබඳි යෙහි ගිලුහුහෙයින් ඉඟිල තමා ආදිශාවටම ගියේය. ඒ දිගත් දිවයිනක් නුදුවිද නැවත ඉදිරියට දිවුයේද ඒ දිගත් දිවයිනක් නුදුවුයේද උතුරුදිගට දකුණුදිගට දිවුයේද ඒ දිගත් දිවයිනක් නුදුවිද එසේ පිහිටක් නැතිව දිවන්නාවූ ඒ කපුටුතෙම පක්ෂපත්‍ර බිඳී දියෙහිම හුනුයේද එසේ වැටුනාවූ ඒ කපුටුවා විණඩ මත්ස්‍යයෝ ගසා කැවාහු වෙද්ද එමෙන් එබඳු මහරජුනි රුවෙණි නොපිද නොපසේම කාමභෝගීවූ අන්‍ය සත්වයෝද සත ශම්මතෙනොත් වසතුවෙහි ආලය හැරගතනොහි ඒ වසතුවෙහි ජීවිතාන්තයෙ දක්වාම ආලය ඇතිව වෙසෙන්නාම් ඔහුද කපුටුවාගේ කල්පනා වැනි කල්පනා ඇත්තෝය" යි වදාළ සේක.

මේ උපමායෙන් කුමක් වදාරණ ලද්දේදයත්? අනමතාග්‍ර සංසාරය ගඹිගාවක්කොට දැක්වූසේක. සසර බොහෝ කලක් සත්වයාට්පුරුදුවූ පඤ්චකාම වසතුව ඇත්කුණුපයක්කොට දැක්වූ සේක. නුවණැත්තාවූ සත්වයා කපුටුවකුකොට දැක්වූසේක. ඒ ප්‍රථග්ජනයා පඤ්චවිධ කාමගුණාස්වාදය අනුභවකොට සොම්නස්වීම් ඇත්කුණ කා ගඟෙහි දියබිමක්කොට දැක්වූසේක. පඤ්චවිධ කාම කොඩාසයෙහි ලුබ්ධව නුවනැත්තන්ගේ බස් අසාත් කායගතාසති, මරණානුස්සති බුද්ධානුස්සති ආදිවූ භාවනා යෙහි නොපැවැත්ම ඇත්කුණෙහි සිත්ඇලුනුබැවින් ගඹිගාව ගේ උභයතීරයෙහි පෙනෙන්නාවූ විලිකුම් පලඇති වනයන්ද දෙවොල්රුක්ද දැක රිට ඉඟිල නොයාමක්කොට දැක්වූසේක. පවුකරන්නාවූ පඤ්චවිධ කාම කොඩාසයෙහි ගිජුවූ ඒ අඥාන ප්‍රථග්ජනයා කුසල් නැමති පිහිටක් නොලැබ සංසීව කාලසූත්‍රාදි අවීමහා නරකයෙහිවැටී දුක්විඳිම ඇත්කුණ මුහුදමැදට ඔය කල්හි කිසි පිහිටක් නොලැබ කපුටුවා මුහුදේම වැටී විනාශවූවාකොට දැක්වූසේක.

මෙසේ මේ උපමාවෙන් පසේබුදුන් වහන්සේ ධර්මදේශනා කොට වැඩකල්හි රජ්ජුරුවෝ ඒ උසනට රැස්වූ මහසෙනඟ මැද,

"අජ්ජවපබ්බජිස්සාමි කොජඤ්ඤ මරණංසුවෙ,
මාහං කාකොව දුම්මේධෝ කාමා නං වස මන්වගා"

සතා මේ ශාස්තෘවෙන් එම්බා අමාත්‍යයෙනි මනුෂ්‍යයන්ට හෙට මරණ ඇත නැතැයි නියමකොට කියන්නෙකුත් නැත ඒ දැක ගැන්මත් නොපිළිවන. එබැවින් එක දවසක් රක්‍ෂාකලාවූ තපසත් සසර බොහෝකලකට පිහිටවන්නේයයි දැන මම අදම පැවිදිවන්නෙමි. ඇත්තෙණිඟ ආලය හැරගතනොහී මුහුදු මැදට පැමිණ නැසුනාවූ නුවණැති ඒ කපුටුවා මෙන් මම කාමසම්පත්තීන්ගේ වසඟයට නොපැමිණෙමියි කිය. ඒ සියලු රාජ්‍යසම්පත්තිය හැර හුදකලාවම උයනින් නික්ම හිමාලවන යටගොස් පන්සැලක්කොට තාපස ප්‍රව්‍රජ්‍යයෙන් පැවිදිව වාසය කෙළේය.

මෙසේ පසේ බුදුවරයන්ගෙන් අවවාද ඇසූපෙර මහොත් තමයෝ එම්බා පියාණන්වහන්ස යම්සේ වනා දුග්ගහගිරිදුග්ගාදිවූ සමවිෂමස්ථානයෙහි යන්නාවූ ඇතාහාසමග ඇත්පැටියාත් කැටිවම යන්නේවේද එමෙන් නුඹවහන්ඉඬේගේ පාත්‍රය ගෙන මමත් කැටිවම එමියි කියමින් විලාපකියා හඬන්නාවූ 'රඨවඩ්ඪන' නම් කුමාරයා ප්‍රධානකොට ඇති දරුවන්ද සොළොස් දහස් අන්තඃපුර සත්‍රීන්ද සියලු රාජ්‍යසම්පත්තියද දමා සිරගෙය කින් මිදියන මිනිසෙකු පරිද්දෙන් නුවර දසාවත් නොබලාම තපසට ගියෝද මේ බුඩොත්පාදයෙහි උපන්නාවූ එම්බා සත්පුරුෂයෙනි ඒ රජදරුවන්ට මෙන් නොපෙනේ කවර ඓශ්වර්‍යයක් ආලය හැර යානොහැක්කේද එබැවින් දුඃඛදායකවූ මේ ගෘහවාසයහැර කායවිවේක චිත්ත විවේකයට පැමිණ පින්කට යුත්තේය.

අනාදිමත්වූ සංසාරයෙහි බොහෝ කලක පටන් වෙන්නොකොට පැවැත්නාවූ තෘෂ්ණා බන්ධනය නිසා ගෘහවාසය හැරගත නොහේනම් ප්‍රාණඝාතාදිවූ දශඅකුශලයෙන්දුරුව නිත්‍ය පංචශීලයත් පොහොය අටසිලුත් රක්‍ෂාකොට රත්නත්‍රයට කටයුතු පූජාවෙහිත් අප්‍රමාදව පින්රැස් කටයුත්තේය. මෙසේ මේ බුඩොත්පාදයෙහි පින්කිරීමෙහි පමානොවිය යුත්තේය. යනාවේ අවවාදයපෙර අප්‍රමාදව කුසල්කලාවූ මහොත්තමයන්ගේ චාරිත්‍රයඅසාත් සලකාගත යුත්තේය—හේතොසේදයත්?

මේ ශ්‍රීලඞ්කාවීපයෙහි 'මහාසීව' නම් තෙරකෙනෙකුන් වහන්සේ අටලොස් ගෙණෙහි මහාසඞ්ඝයාටම අසනාතැන් වදාරණසේක් උන්වහන්සේගේ අවවාදයෙහි සිට භික්ෂුවහසක්, භික්ෂුන්වහන්සේ රහත්වූසේක. ඒ භික්ෂුවහසක් භික්ෂුන්වහන්සේ අතුරෙන් එක් භික්ෂුකෙනෙකුන් වහන්සේ මාගේ චිත්තසන්තානයෙහි ගලාගොසාතාර ගුණ අප්‍රමාණය 'අපගේ ගුරුන්වහන්

න්සේගේ සාසනායෙහි තුණ කෙබඳුද'සි ආචිජ්ජනාකොට නුවණින් බලා උන්වහන්සේ නිවන්නුදුවු බව දැන අපගේ ගුරුන්වහන්සේ ඔබට පිහිටවන සේක. තමන්වහන්සේට පිහිටවගත නොහෙනසේකැයි උන්වහන්සේට අවවාදකෙරෙ මි සිතා අහසින් අවුත් විහාරය සමීපයට බැස දිවාඨානයේ වැඩඋන්නාවූ තෙරුන්වහන්සේ දැක වැඳවත් දක්වා එකත් පස්ව උන්සේක. 'එම්බා මහණ කුමට අසිදැ'සි විචාළකල්හි එක්අනුමොදනා බණක් උගන්නා නිසා ආමි'සි වදුලසේක ඒ අසා තෙරුන්වහන්සේ 'අවසරනැතැ'සි වදුලසේක 'නුඹව හන්සේ විතර්කීමාලකයෙහි වැඩසිටි කල්හි විචාරමි' කීසේක. තෙරුන්වහන්සේ 'එතනදී බණවිචාරන්නාවූ අන්මහණෙක් ඇතැ'සි වදුළ සේක. 'අහර සිහන්ට ගමට යන අතරමගදී විචාරමි'සි කීසේක. 'එහිත් අන්කෙනෙක් විචාරති' කීසේක. 'ගැටගැන්වීමට අදනා සිවුරු අඳින්නැහැදී සිවුරුගෑගමගන්වන තැනදී පාත්‍රය නිකුත්කරණ තැනදී ගම්වැද ඡොජන ශාලා වෙහිකැද වළඳ උන්තැනදී විචාරමි' කීසේක. 'ඒඇමතැනම අට්ඨකථායෙහි අපීවිචාරණ මහණෙන් විචාරති'කීසේක. 'පිඬුසි හාගෙන වෙහෙරට එන අතරේදී විචාරමි' කීසේක. 'එතන ප්‍රශ්නවිචාරණ මහණුන්ට නියමකළ නැතැ'සි වදුළසේක. 'සෙනස්නට අවුත් වැඩ උන්තැන විචාරම්දැ'සි කීසේක. එතැනත් ප්‍රශ්නාවිචාරන්නෝ ඇතැසි' වදුළසේක.

සාමිණි මුහුණෝදැ සෙනස්නට වැද දෙතුන් අස්නක් උණුවනතෙක් යොනිසොමනසිකාරයෙන් ඉන්දයුතුවේද එහි අවසරයක් දැක විචාරමි කීසේක. එතනත් විචාරන්නෝ වෙනඇතැසි කීසේක. මෙසේ දෙවෙනි දවස් අරුණෝදගමන වෙලාදක්වා ක්‍රමයෙන් විචාරමිසි එකතැනකත් අවසරයක් නැතැසි කීකල්හි සාමිණි නුඹවහන්සේට මරණට අවසරයෙන් ලැබේද නුඹවහන්සේ අනුන්ට පිහිටවනසේක තමාට පිහිට වගතනොහෙන සේක. 'නුඹවහන්සේගේ අනුමොදනාවෙන් මට කම් නැතැ'සි අහසට පැනනැගී වැඩසේක.

එකල්හි මහාසිවනම් තෙරුන්වහන්සේ මේතෙමේ පයිඟ් ජකියක් නිසා ආ මහණෙක් නොවෙයි 'ප්‍රමත්තවූ මට අකුසල් වෙමි'සි සිතා ආශේයයි දැන දැන්මට අවසරනැත අලුයම්වේ ලෙහි නික්මෙමියිසිතා පාසිවුරු සමීපයෙහි තබාගෙන සියලු දිවාභාගයෙහිද ප්‍රථම මධ්‍යම යාමයෙහිද භික්ෂූන්ට බණකියා පශ්චිම යාමයෙහි එක් භික්ෂූකෙනකුත් වහන්සේ පෙළ කියවා ගෙනාගහකල්හි උන්වහන්සේගේ පස්සේම පාසිවුරු ගෙන

නිත්මගිය ඡේක. සෙසු අන්තෙවාසික භික්ෂූහු සෙසු ශරීර කෘත්‍යයක් නිසා වඩිනාසේකැයි සිතුවාහුය. පළමු භික්ෂා ගෙනඅයන මහණතෙම තමා පස්සේ යන මහණෙකැයි සිතීය. ඒමහ තෙරුන්වහන්සේ රහත්බව ලැබීමනම් ඔට බැරිදෙයෙන් නොවෙයි දෙතුන්දවසකින් රහත්ව එමියි සිතා අතවැසි භික්ෂූන්ට නොකියාම ඇසලමස පූර තෙලෙස්වන්ලත් දිනයෙහි නික්ම වැඩිසේක් ගමන් පව්ලෙණට පැමිණ කමට හස්සිතින් ගෙන සක්මණට බැස සන්මන්කරණ සේක් එදවස් රහත්වන්ට නොහැකිවූ සේක. 'පොහෝදිනය පැමිණි කල්හිම දෙතුන් දවසකින් රහත්වෙමි'සි සිතා ආයෙමි එසේ නොපිළිවන්විය. 'ඉතින් වස්තුන්මස තුන්දවසත් මෙන් වියැසිකොට වස් මස මැදි පොහෝදිනයෙහි රහතුන් හා සමග විශුද්ධි පවාරණයෙන් පවරමි' සිතා වියැසිකොට එසේත් නොහැකිව එම සිතන්නාවූ උන්වහන්සේගේ ඇසින් කඳුළුබාර වැගිරෙන්ට පටන්ගත එවිට සිතනසේක් 'සතර ඉරියව්වෙන් පවත්නාවූ මට රහත්බව සිඹනොවෙයි' සැකපිමත් ඇර පයසේදීමත් ඇර වියැසිකරණ තැනැත්තන් වහන්සේ දෙවෙනි අවුරුදු පවුරුණටත් රහත්ව ගත නුහුනුසේක. නිරන්තරයෙන් වියැසිකරන්නාවූ උන්වහන්සේට විසිනව අවුරුද්දක් ඉක්මිණ. ගම්දරුවෝ උන්වහන්සේගේ පය පැලුනුතැන් කටුගෙන මසති කෙළියවත් 'නොපගේ පය අපගේ මහාසිව තෙරුන්වහන්සේගේ පය වැනිවෙ'සි කියති. තෙරුන්වහන්සේ තිස්වෙනි අවුරුදු මහා පවුරුණුදිනයෙහි පිටාවූ පූවරුවෙහි වැතිර සිටිසේක් 'මම දැන් තිස්අවුරුද්දක් මහත් වියැසි කරන්නෙමි රහත්වගත නුහුනුයෙමි මට මේ ආත්මභාවයෙහි මාර්ගඵලයක්වත් ඵලයෙක්වත් නොපිළිවන සබ්‍රහ්මචාරීන් හා එක්ව විශුද්ධි පවාරණයෙන් පවරගත නොහෙන්නෙමි' සිතූසේක.

ඒ සිතිමහාසමග ඇසින් කඳුළුබාර වැගිරෙන්ට පටන්ගත එකල්හි නුදුරුතැනක එක්දිව්‍ය සත්‍රියක් අඬඅඬා සිටියාය. තෙරුන්වහන්සේ 'මේ අඬන්නාවූ කෝ කවරෙක්ගිදැ'යි විචාරා වදාළසේක. සාමිනි "මම් එක් දිව්‍ය සත්‍රියකැ'සි කීවාය. 'කුමක්නිසා අඬාදැ'සි විචාළසේක. "ඇඹිමෙන් එක මාර්ගඵලයක්වත් ඵලයෙක්වත් ලැබෙනාම මමත් එක් මාර්ගඵලයක්වත් ඵලයක්වත් ලබමියි සිතා අඬමි"සි කීවාය. තෙරුන්වහන්සේ "එම්බා මහාසිවය දිව්‍ය සත්‍රිය කාහා සමග කෙළිති. මේ තව සුදුසුදැ" සි සංවේග උපදවා විදර්ශනාවඩා සිව්පිළිසිඹියා පත් රහත්බවට පැමිණ 'දැන් සැතපෙමි'සි සිතා සෙනාසන

ඇමද ඇදළුලා අතුට දිය ගෙනවුත් 'පය සෝදම්'යි ඉනිපෝරු වේ වැඩඋන්සේක. අතවැසි තිස්දහසක් රහත් භික්ෂූන්වහන්සේ උන්වහන්සේ රහත්වූ බවද පයසෝදන්ට දියගෙනවුත් වැඩඋන් බවත් දිවැසින් දැක අහසින් අවුත් වෙන් වෙනම වහන්ස වහන්ස අපි පයසෝදවම්හ'යි දැන්වූවාහුය. තෙරුන් වහන්සේ වදුරණසේක් 'ඇවැත්නි දැන් තිස් අවුරුද්දක් පය සේදුවේ නැත. එබැවින් මම්ම පය සෝදම්' වදුලසේක. ශක්‍ර දෙවෙස්සියාද ආවජ්ජනාකරන්නේ "මහාසිව තෙරුන්වහන්සේ රහත්ව තිස්දහසක් භික්ෂූන්වහන්සේට පය සෝදන්ට නොදී වැඩඋන්සේක. උන්වහන්සේගේ අතින් පයසෝදන්ට ඇරියෙම් නම් මාගේ නුමන උපාසක කමෙක්ද"යි සුජාතා නම් දෙවිදුවහා සමග භික්ෂූන්වහන්සේ සමීපයෙහි පෙනී "වහන්ස පහඋනමැනව මාගමෙකැ"යි කියා අවසරගෙන තෙරුන් වහන්සේගේ සමීපයට ගොස් වැඳ උන්කුටුකයෙන් හිඳ "සඵා මිනි පයසෝදවමි"යි කියා අවසර ඉල්වීය. එකල්හි මහ තෙරුන්වහන්සේ වදුරණසේක් "එම්බා ශක්‍රදෙවෙන්ද්‍රය දැන් තිස්අවුරුද්දක් පයසේදුවේ නැත දෙවියන්ට සඵභාවයෙන්ම මනුෂ්‍යයන්ගේ ශරීරය දුගඳහඬවන්නේය. ඔබදුන් සිය යකසිවි දෙවියන්ගේ බෙල්ලේ බැඳි කුණක්මෙන් පිළිකුල මම පයසෝදම්"යි වදුලසේක.

ශක්‍රතෙම කියනුයේ "සඵාමිනි! මේ දුගඳහඬය නොපෙනෙයි නුඹවහන්සේගේ ශීලසුගඬය සදෙව්ලොව ඉක්ම සාවගුය දක්වා පැතිරසිටියේය. ශීලසුගඬයට වැඩිතරම් සුගඬයෙක් නැතැයි ඒ අසා මම මෙහනට පැමිණියෙමි" වම් අතින් ගොප්මස අල්වාගෙන දකුණතින් පය පිරිමැද සේදිය. බාල කුමාරයක්හුගේ පාදයන්මෙන් ඡවිප්‍රසන්නව ගියේය. ශක්‍රතෙම දිව්‍යලොකයට ගියේය. මෙසේ මහාසිව තෙරුන්වහන්සේ වියදීකොට රහත්වූසේක.

නවද සැවැත් නුවර වසන තිඤ්ඤනම්වූ එක්කෙලෙඹි පුත්‍රයෙක් බුදුන්ගෙන් බණඅසා සතලිස් කෙළක් වසතුවහැර සස්නෙහි මහණව භාවනාකොට මඟවල වසන්නේය. ඔහුගේ මලණුවන්ගේ භාර්‍යාතොම සොරුන් පන්සියයකට අත්ලඟදී "තිඤ්ඤ නම් මහණ මරා එව"යි ගමන්කර චූවාය. ඒ සොරහු ගොස් වනාන්තරයේ වැඩඋන්නාවූ තෙරුන්වහන්සේ වට ලූහ. එවිට වදුරණසේක් "එම්බා උපාසකවරුනි කුමක්නිසා මෙතැන්හි අවුදැ"යි විචාළසේක "නුඹවහන්සේ මරන්ට අම්

හ"සි කිවාහුය. තෙරුන්වහන්සේ වදාරණසේක් "එම්බා උපාසකවරුනි අද එකරැයකට මාගෙන්ඇපයක් ගෙන දිවිනොනසව"සි කියසේක. "මහණ! මේ වනාන්තරයෙහි නොපට,ඇපචන්නෝ කවුරුදැ"සි කිවාහුය. තෙරුන්වහන්සේ මහත් ගලක් උසුලාගෙන කලවා ඇටදෙකම බිඳ "එම්බා උපාසකවරුනි මේ ඇපය සුදුසුදැ"සි විචාළසේක. ඒ සොරහු එතනින් ඉවත් ව සන්මන් කෙළවර ගිනිමොලවාගෙන ගොත්තාහුය. තෙරුන්වහන්සේ එසේම වැඩහිඳ භාවනා ශක්තියෙන් දුඃඛවේදනා ව සන්හිඳුවා තමන්වහන්සේගේ සිව්පිරිසුදු සිල් පරීක්ෂාකොට ප්‍රීති ප්‍රමොද්‍ය උපදවා ක්‍රමයෙන් විදර්ශනා වඩා තුන්යම් රාත්‍රියෙහිම මහණදම්පුරා අරුණෝද්ගමන වේලෙහි සියලු කෙලෙසුන් නසා රහත්වූසේක.

"උභොපාදුන් හිහිඬිවා සංයම්ඣාම්වෝ අහං
අවවියාමි හරයාම්ඕ සරාග මරණං අහං."

යනාදීන් ප්‍රීතිවාක්‍ය පවත්වා වදාළසේක.

තවද සඟ තිස්නමක් බුදුන්ගෙන් කමටහන් ගෙන වනානතරයෙක * වස්ඉටා වාසය කරන්නාහු "ඇවැත්නි තුන්යම් රාත්‍රියෙහි අප්‍රමාදව මහණදම් කටයුත්තේය. ඔවුනොවුන්ගේ සම්පයට අවුත් කථාපමණකුත් නොකටයුත්තේය"සි කතිකාවක් කළාහුය. එසේ රාත්‍රියෙහි මහණදම් කොට අලුයම් සැතපෙන්නාවූ උන්වහන්සේලා අතුරෙන් දවසකට එක එක මහණකුබැගින් එක් ව්‍යාඝ්‍රයෙක් අල්වා ගෙනගොස් කන්නේය. "කථානොම කටයුත්තේය"සි කතිකාකළ බැවින් "ව්‍යාඝ්‍රයෙක් මා අල්වාගතැ"සි යන බස්පමණකුත් නොකිවාහුය. එසේ පසළොස් නමක් ව්‍යාඝ්‍රයා කැකල්හි පසළොස්වක් පොහෝ දිනය පැමිණියේය. එදවස් එකතැනට රැස්වූ සඞ්ඝයාවහන්සේ "සෙසුභික්ෂූහු කොයිදැ"සි විචාර ව්‍යාඝ්‍රයාගෙන් උපද්‍රවවූ බව අසා එකැන්පටන් ව්‍යාඝ්‍රයාගෙන් උපද්‍රවවූ විට "අඩගා කියයුත්තේය"සි කිවාහුය. ඉක්බිති පළමු පරිද්දෙන්ම ව්‍යාඝ්‍රයෙක් එක් භික්ෂුකෙනකුන්වහන්සේ අල්වාගත, උන්වහන්සේ "ව්‍යාඝ්‍රයෙකවහන්සැ"සි කියසේක. භික්ෂූහු සැරයටි දඬුත් පන්දමුත් ගෙන 'යුහුව ගලවාගනුම්හ'සි සිතා ආවාහුය. ව්‍යාඝ්‍රයාද ඒ මහණ ඇරගෙන භික්ෂූන් යානොහැක්කාවූ ඉවුරුරු උස් ගල් මුදුනකට ගෙනගොස් පය මාපට ඇඟිල්ලේ පටන්

---

*වනානතාරයේ එක් විහාරයෙක—පොත්.

කන්ට පටන්ගත. ඒ භික්ෂූහු ගොස් බලාසිට "ඒවිබා සත්පුරු ෂය මෙතන අප විසින් කටයුත්තෙන් නැත දුලිභවූ මනුෂ්‍ය ත්මභාවය ලද්දුවූ සත්පුරුෂයා විසින් වියදීකටයුතු තැනය"සි චදාළඉස්සේක්ලාය. උන්වහන්සේද ව්‍යඝ්‍රයාගේ මුඛයෙහි ගොත් ඉස්සේක්ම ඒ දුඃඛ වෙදනාව සිහිනොකොට විදර්ශනාවඩා පය ගොඇමස කනකල්හි සොවාන්වූසේක. දණමඬල කනකල්හි සකෘදාගාමිවූසේක. නාභිමණ්ඩලය කනකල්හි අනාගාමිවූසේක හදවතකනවාට පළමුකොට සිව් පිළි සිඹියාපත් රහත බවට පැමිණ,

"පඡරස්මිං ගහෙඨානා සිලාය උපනීතකෝ
කාමංඛාදතු මංව්‍ය ගෙඝාහකෙඛිකාකායෝ අචිත්තකෝ
පවිලඛෙකවමඬානාමහි මරණංඝොති භද්දකං."

යනාදීන් ප්‍රීතිවාක්‍ය පැවැත්වූසේක.

අනිකුදු ප්‍රීතිමල්ලනම් එන්තෙරකෙනෙකුන්වහන්සේ ගිහිකා ලයෙහි චොලකෙරළ පාඬියයන රටතුනෙහි මල්ල යුඛයට බව ජබැඳ ලඬකාවිපයට පැමිණ අනුරාධපුරයට අවුත් ඒමහ රජ්ජුරු වන් දැක සත්කාරසම්මාන ලැබ 'ලඡකාසන ශාලා' නම් සෙන ස්න සමිපයෙන් යන්නේ ඒ සෙනස්නෙහි වැඩහිඳ භික්ෂූන් වදරන්නාවූ සංයුත් සඟියෙහි, නතුඉභාක, නම් වගීයෙහි " රූපංහික්ඛවෙ නතුමහාකං තංපජහථ තංවොපහිණං දිඝ රත්තංහිතාසුඛායභවිස්සති" යනාදීන් මේ පාඨය අසා "රූප යත්තොප අයති නොවෙයි වෙදනාදිගුත් තොප අයති නොවෙ ති. එසේ හෙයින් ඒ රූපාදිවූ පඤකන්ධයෙහි තෘෂ්ණාව දුරු කරව ඒ දුරුවීමෙන් තොපට ඛිත සැපවන්නේය"යි යන අර්ථය තමාගේ චිත්තනමැති මත්තඟසතිහට අකුස්සක්කොට ගෙන ලෝවාමහා ප්‍රාසාදයට ගොස් පැවිදි ඉල්වාගෙන පැවිදිලැබ උපසම්පදාවූයේ උභයමාතෘකාව සූහුණුකොට තිසක් භික්ෂූන් කැඳවාගෙන "ගහුරුවැලිඑලි" නම් තැනටගොස් මහණදම් කළසේක. බොහෝ සක්මන්කිරීමෙන් පය සවිනැති කල්හි දණමඬලින් සක්මන්කළසේක. එසේ සක්මන්කරන්නාවූ උන්වහන්සේ එක් තෙප්වැද්දෙන් රාත්‍රිභාගයෙහිදැක 'මූවෙකැ' සි යන සිතින් තෙබදමා ඇන්නේය. තෙබ බඳ ගසා ගියේය. තෙරුන්වහන්සේ තෙබඅද්දවා වණමූනත්දෙකම තණවැවිදෙ කකින් පිබානයක්සේ ගස්වා තමා ගලපිට ඉන්ට සලස්වා එත නා අවසර කරවාගෙන විදර්ශනා වඩා සිව්පිළිසිඹියාපත් රහත්ව උකසි පැහැරි ගඬින් එතනාට ආවාවූ භික්ෂූන්ට,

"භාසිතංබුඛසෙට්ඨ සඞ්ඛලොකගරුවාදිනා
නානුමඤ්ඤාමි ඉදංරූපං තංජෙගුච්ඡපථ භික්ඛවෝ."

යනාදීන් උදන් අනාවදුලඝේක.—මෙසේ ශාසනයෙහි සිය ගණන් දහස්ගණන් භික්ෂූන්වහන්සේ වියත්කොට නිවීණ පදප්‍රාප්තවූ ඝේක. එසේ උන්වහන්සේලා අධික වියත්කෙලේ ලොකවාසී සත්වයන්ට වඩා තමන්වහන්සේලාටම සංසාර දුඃඛය ඉතා බලවත් හෙයින් කළ උත්සාහයකුත් නොවෙයි ශරීරයෙහි දුඃඛවෙදනාව සැල්පනිසා කලදෙයකුත් නොවෙයි. එසේකල කුමක්නිසා මෙබදු උග්‍රවියත්කළ සේක්දයත්? කප අසංඛ්‍යය කිනුත් දුලීභවූ මේ බුඩොත්පාදයෙහි එසේම දුල්ලභවූ මනුෂ්‍යත්මභාවය ලදින් බුදුන් වදුල සඞ්ඝ්මය අසා වියත් කරන්ට සුදුසු තැනදී අප වියත්නොකලමෝනම් මතු බුඩොත් පාද කාලයක් කවරකලෙක ලබමෝද? කෙසේ මනුෂ්‍යත්මභාව යට පැමිණෙමෝද? කෙසේ අන්ධබධිරාදිවූ ඉඳිය විකලයෙන් දුරුවමෝද? කෙසේසත්පුරුෂ සංසෙවසඞ්ඝ්මශ්‍රවණයට පැමිණ මෝද? තවද "සෙය්‍යථාපි භික්ඛවෙ අපමත්තකොපි ගූථොදු ගඤ්ඤොහොති අපමත්තකම්පිමූත්තං දුග්ගන්ධංහොති අප මත්තකොපිඛෙලෝ දුගඤ්ඤොහොති අපමත්තකොපිපුඬෝ දුගඤ්ඤොහොති අපමත්තකම්පිලොහිතං දුග්ගන්ධංහොති එවමෙවඛෝ භික්ඛවෙ අපමත්තකම්පි භවංනාව ණෙණමි අනත්තමසෝ අඵ්ඵරාසඞ්ඛාතම්පිතතම්පි" යනාදීන් සසර දුක් දක්වන්නාවූ භාග්‍යවත්වූ බුදුරජාණන් වහන්සේ "එම්බා මහණෙනි යම්සේ සැල්පමාත්‍රවූ ගූථයෙක්ද සැල්පමාත්‍රවූ මූත්‍රද සැල්පමාත්‍රවූ කෙළද සැල්පමාත්‍රවූ පූයාද සැල්පමාත්‍රවූ ලේද දුග්ගන්ධමවේද යටත් පිරිසෙසින් මේ සියල්ල තණකුදු අගින් ගෙන සිඹිනාලද්දේත් දුගන්ධමවේද එමෙන් යටත් පිරි සෙසින් අසුරුසණක් පමණ කලුත් භවයෙහි සිටීම යහපතැ" සි නොකියම් වදුලඝේක.

තවද යම් පුරුෂයෙක් එකදවසකුත් අඹුනොව අවුරුදුසිය යක් පුරා ජීවත්වේද ඒ පුරුෂ තෙම නුවණැති පුරුෂයකුකරා පැමිණ "නිවන් කෙසේ ලැබේදැ"සි විචාළේවිනම් "ඒ පුරුෂ තෙම දවස්පතාම දැඩිපහර තුන්සියයක් තුන්සියයක් ලැබ මේ කෙසේ විදිම්දැ"සි පශ්චාත්තාප නොව එකදවසකුත් අඹුනොව අවුරුදු සියයක් මුළුල්ලෙහි මේදුක් වින්දේවිනම් නිවන් ලැබෙසි"කිද එබදු දුක්වීද නිවන් සිඹකටයුත්තේය.

ඒ කවර හෙයින්දැයි යතහොත්? "සසරදුක් ඉතාමහත් බැවිනැ"සි වදුලඝේක. "මෙසේ බුදුන් වදුළු අවවාද අපි නොකලි

මෝනම් කවරකලේක නිවන් සිඛකොට ගනුමෝද?" යන කල්පනාවෙන් උන්වහන්සේලා එසේ වියහීකළසේක.

එම්බා සත්පුරුෂයෙනි කොපට ඒ මහොත්තමයන් මෙන් මේ ජාතියෙහිම වියහීකොට නිවන්දකින්ට බැරිවිනමුත් දැනගී ලාදිවූ ගුණධර්මයන් පුරා මේ බුඛොත්පාදයෙහි නොයෙක් පින් රැස්කොට සතර අපායෙහි නොසිපද සදිව්‍යලොකයෙහි ඉපද අන්තඃකල්පයක් සඳෙව්ලොව සැපවිඳ මතු මෙතේ බුදුන් බුදුවූ කල්හි ඒ බුදුන් අතින් බණඅසා නිවන්දැකීමට උත්සාහකට යුත්තේය.

සතරඅපායෙහි නොසිපදීමට බලවත් වියහී කලොත් විනා බැරිනියාවද එසේ සතර අපායෙහි උපනහොත් එයින් මිදී සුගතියෙහි ඉපද මෙතේ බුදුන් දැක බණඇසීම දුර්ලභ නියා වද මේ මතුකියනකාරණ අසා දතයුත්තේය.—හේකෙසේද යත්?

නරකයෙහි දසදහසක් යොදුන්තැන් හුණනලෙක්හි පිරූ තුඛ සුණුමෙන් හැමකල්හිම අඛුනොව පිරිසිවිනාවූ සත්වරාශියෙක එසේම ඒඒ තැන ඔසුපත නරකවල පැසී දුක් විඳිනාවූ සත්වයෝත් අ ප්‍ර මා ණ ය. ප්‍රෙතලොකයෙහිත් සක්වළගල් තුණක් එක්වූතැන සුවාසූ දහසක් පමණතන්හි හිරුසඳ දෙදෙනාගේ රශ්මියෙනුත් එලිනොවන්නාවූ ඝනාන්ධකාරයෙහි පැසී සිවිනාවූ සත්වරාශියෙක ගව්දෙගව් තුන්ගව් ද්ගපළලඇති ප්‍රෙත නගරවල ගහනව සිවිනාවූ ප්‍රෙතයෝය. අහස පැසී ඇවිදිනාවූ ප්‍රෙතයෝය, සියලු ලොව ගහනව සිවිනාවූ පාංශු පිශාචාදිවූ ප්‍රෙතයෝය, ඔවුන් ලොව ගහනව සිවිනා බවට මේ කථාවෙන් අසා දතයුත්තේය.

එක් ප්‍රෙතදුවක් තමාගේ දරුදෙදෙනා ථූපාරම වහසල් දෙර සමීපයෙහි සිටුවා අනුරාධ පුරය ඇතුළට හොදුරු සොයා ගියාය. ඔහු දෙදෙනා පිඬු සිහාවඩිනා එක් තෙරකෙනකුන් වහන්සේ දැක වහන්ස! අපගේ මැණියෝ ඇතුළු නුවරට ගොදුරුසොයා ගියාය. ඈදැක මෙසේ වදාළමැනව. නොප දරුවෝ සාදුක් ඉවසාගත නොහෙති, "ලත්යම් කිසිදෙයක්ගෙන ශුඛ ව යවයි වදාළමැනවැ"යි කිවාහුය. තෙරුන්වහන්සේ "ඒ ප්‍රෙත දුව කෙසේ දනිමෝදැ"යි වදාළසේක.

එබසට ඔහු මේමූල ගත්කල පෙනෙයි මුලක්දී තමන්ගේ මැණියන්ගේ සලකුණු කියා කිවාහුය. තෙරුන් වහන්සේ

නොයෙක් දහස්ගණන් ප්‍රේතයන්දැක මහඇරයාමෙන් බොහෝකලක් ඉක්ම කෙවුළන්ගේ වීථියෙහි ගැබමල කැමතිව සොයාඇවිදිනාවූ ප්‍රේතදුවදැක දරුවන් කී පවත් වදුලසේක. ඒඅසා ඕතොමෝ 'වහන්ස මාකෙසේ දුටුසේක්දැ'සි විචාළිය. 'මේමුල නිසායැ'සි වදුලසේක. එබසට ඒප්‍රේත දූතොමෝ ''මුන් වහන්සේඅත මේ මුල තිබූයේවීනම් ප්‍රේතයන්ට මහඇරීමෙන් අහර සිහාගතනොහි අදකලිසුන්බත් වනසේකැ''සි සිතා ඒ මුල ඇරගත්තිය. මෙසේ පවිකොට ප්‍රේත ලොකයෙහි උපද නාවූ සත්වයන්ගෙනුත් ලොව ගහනව තිබෙන්නේය.

නැවත තිරිසන්ජාතිවල උපන්නාවූ සත්වයන් බොහෝබව දක්වන්නට බුදුහු මෙසේ උපමාවක් වදුලසේක.—හේකෙසේ දයත්? එම්බා මහණෙනි දසදහසක් යොදුන් දිග පලල ඇති මේ ජම්බුද්වීපයෙහි වෙළුවන පේතවනාදිය වැනිවූ රමණීයවූ පුෂ්පාරාම ඵලාරාම ඉතාඇවලපවේද වලගොඩව තිබෙන්නාවූ ගඩහාදියෙන් දුර්ගවූ පවීතාදියෙන් විෂමවූ කණු කවු ආදියෙන් ගැවසී සිටිනාතැන් බොහෝවේද නැවත යම්සේ හිරිදුගී නාදිදුර්ගාදියෙන් වෙන්වූ කණුකවු නැත්තාවූ සමභූමියෙහි පිහිටියාවූ නාගවන සල්වනාදිවූ රමණීය වනානතර ඇවලපවේද සෙසුතැන්ම බොහෝවේද එසේම මාගධක්ෂේත්‍රාදිය වැනිවූ සමතල භූමිභාග ඇවලපවේද සෙසුතැන් බොහෝවේද පේතවන පුෂකරණීය ගහීර පුෂ්කරණීය වැනිවූ රමණීයවූ, පුෂ්කරණී ඇවල්පවේද එසේම රමණීය නොවන නොහියගාලද විසම තැන්ම බොහෝවේද ''එමෙන් මහණෙනි! ගොඩ උපදනා සත්වයෝ ඇවලාවෙති. දියෙහි උපදනා සත්වයෝම බොහෝවෙති''සි වදුලසේක. ඒ කවරහෙයකින්දයත්! ගොඩ ඉතා ඇවලාහෙයින දිය ඇතිතැන්ම ඉතා බොහෝහෙයින්. යම්සේ පොකුණෙක එක පියුම් පදුරෙක්වීද ඒපියුම් පදුරෙහි කොළ පත් සතරෙක්වීද මැද එක් මල්කැකුලෙක්වීද අහසින් යන සෘඩ්මතුන්ට ඒ කොළපත් සතරමෙන් සතරමහා දිවයින පෙනෙන්නේය. මැද මල්කැකුලක්මෙන් මහමෙර පෙනෙන්නේය. පොකුණෙහි දිය ඇති සෙසුතැන්මෙන් චක්‍රවාට පවීතය අවසන්කොට ඇති මහමුහුදු පෙනෙන්නේය. ඒ හැමතැනම මත්ස්‍යයන් නැතිතැනෙක් නැත. ඒ එසේමය—එක්කලෙක මේලඛ්කාවට සත්සියක් යොදුන් දුරඇති සුවණ්ණ භූමියට මේ ලඛ්කාවේ සිට යන නැවෙක් කුදුමසුනැයි නම් ලද කුනසින් පිටින්ම ගියේය.

තවද ජලජමත්ස්‍යයන් බොහෝබව දක්වන්නාවූ බුදුන් විසින් "පන්සියක් දිවසින් පිරිවරනොටඇති සියලු ජම්බුවීප යෙහි වෘක්ෂ ශාඛා ලතා තෘණ පණ්ණමූලාදිවූ සියල්ලම නොතබා උදුරා උල්කොට දියෙහිඇති ප්‍රාණීන්ගෙන උලතිබත හොත් සියලු වෘක්ෂ ශාඛා ලතා තෘණ පණ්ණාදියම මදවන්නේය. ජලජ සත්වයෝම බොහෝවෙති"යි වදාළසේක, තවද ගොඩ උපදනා තිරශ්චීනයන්ගේ පමණ බැලුවෝහිනුත් එක තුඹසෙක වේයන්පමණකොටගත නොහැක්කේය:— ඒ එසේ මය.

"පිපීලිකානං පූජෝහිබිලාඒකාවිනිග්ගතෝ
කිනන්නුසොනාතිරීඒවෙය්‍යමනුස්සෙජම්බුදිපෙක."

යනමේ ගාථාවෙන් "එක බිලයෙකින් නික්මුණවූ කුහුඹි රැලකුත් සියලු දඹදිව මනුෂ්‍යයන්ට බොහෝය"යි දන්වනාලද තවද ඒ සියලු මනුෂ්‍යයන් අතුරෙන් එකි එකි මනුෂ්‍යයන් හුගේ ශරීරයෙහි ඉපද සිටිනා පණුවෝත් කුල ගණනාවෙන් අසූකුලයෙකැයි කියනාලද සතර අපායෙහි ඉපද සිටිනා මේ සියලු සත්වයන්ට එකද පිණකුත් සිඛවන්ට කාරණ නොපෙනෙයි. "නරකයෙහි උපන්නාවූ සත්වයන් යමපලුන්ට ප්‍රොඛ කොට නැවතත් එම අකුශලයෙන් නරකයෙහි උපදිති"යි වදාළහෙයින් නරකයෙහිත් අකුසල්ම පිරෙන්නේය. තිරිසන් ජාතියෙහි හා ප්‍රෙතලොකයෙහි උපන් සත්වයාට පිරෙණ පව් පමණෙක් නැත්තේය. මෙසේ මනුෂ්‍ය ලොකයෙහිත් පව්කොට නිරන්තරයෙන් පව් සිඛවන්නාවූ සතර අපායෙහි උපන්නාවූ සත්වයෝ කෙසේනම් සුගතියෙහි උපදිද්ද නරකයෙන් නරකයෙහි තිරිසන් ජාතියෙන් තිරිසන්ජාතියෙහි ප්‍රෙත ලොකයෙන් ප්‍රෙතලොකයෙහි ඉපද දුක්විඳ ඇවිදිනාවූ සත්වයන්ට කප් අසංඛ්‍යයකිනුත් ගොඩනැඟීමට කාරණ නොපැනෙන හෙයින් මෙසේ සතර අපායම සත්වයන්ගෙන් පිරීසිවිනේය.

නැවත දිව්‍යලොක මනුෂ්‍ය ලොකයෙහි උපන් සත්වයනුත් නරකාදිවූ සතරඅපායෙහි උපදිනබව දක්වන්ට බුදුහුම තමන් වහන්සේගේ නඛාග්‍රයෙන් පස්ගෙන 'එඛා මහපොළොවේ මාගේ නඛාග්‍රයෙහි තිබෙන්නාවූ පස් ඉතා සුළුපටුවේද එමෙන් මනුෂ්‍ය ලොකයෙන් මිය මනුෂ්‍යලොකයෙහි උපදනා සත්වයෝත් සුළුපටුය හා මනුෂ්‍ය ලොකයෙන් මිය දිව්‍ය ලොකයෙහි උපදනා සත්වයෝත් සුළුපටුය. දිව්‍යලොකයෙන් මිය මනුෂ්‍යලොකයෙහි

උපදිනාසත්වයෝත් සැලපයහ හදිව්‍යලොකයෙන් මිය දිව්‍යලොකයෙහි උපදිනා සත්වයෝත් සැලපයහ. යම්සේ මානියගින්ගත් පසටවඩා දෙලක්ෂ සතලිස්දහසක් යොදුන් ඝනය ඇති මහපොළොව පඤ්ච බොහෝවන්නේවේද එමෙන් මනුෂ්‍යලොකයෙන්ද දිව්‍යලොකයෙන්ද මිය නරකාදි සතරඅපායෙහි උපදනා සත්වයෝම බොහෝය"යි විදුළුසේක;— ඒ මෙසේ දතයුත්තේය.

එක්කලෙක සුබ්‍රහ්මනම්වූ දිව්‍යපුත්‍රයෙක් දිව්‍යස්ත්‍රීන් දහසක් පිරවරාගෙන නන්දනොද්‍යානයට ක්‍රීඩාපිණිසගියේ පරසතුරුක්මූල පැනවූ අස්නෙහි උන්නේය. පන්සියක් දිව්‍යස්ත්‍රිහු ඔහු පිරිවරා උන්නාහුය. අනික් පන්සියක්දෙන තමන්ගේ ආනුභාවයෙන් නැමී බිමටපැමිණි ශාඛාවෙන් ගසට නැගී මිහිරිකටහඬින් ගී කියා කියා මල් කඩ කඩා ඵලන්නාහුය. බිම උන්නාවූ දිව්‍යස්ත්‍රිහු එමල්ගෙන ගොතති. එකල්හි උපවේදකවූ අකුශල කර්ම්යකින් ඒ ගෘහයෙහි උන් දිව්‍යස්ත්‍රිහු පන්සියයම එකවිටම නැසී අවීචිමහානරකයෙහි ඉපදමහදුක්විඳිමට පැමිණියෝය. ඉක්බිත්තෙන් ඒ සුබ්‍රහ්මනම් දිව්‍යපුත්‍රතෙම ඔවුන් කඩාහෙලනා මලුත් නොදැක ගී කියන ගී හඬත් නැසුවෙන් "ඔහු කොයිදැ"යි විමසන්නේ නරකයෙහි උපන්බව දැක ප්‍රියවිප්‍රයොගයෙන් මඩනාලද සිත්ඇත්තේ මෙසේ සිතීය. මොහුවනාහි තමන්කළ කර්ම්පරිද්දෙන් මිය නරකයෙහි උපන්නාහුය. 'මාගේ ආයුෂ කෙපමණදැ'යි බලා තමාත් සත්වෙනි දවස් සෙසු දිව්‍යස්ත්‍රීන් පන්සියය හාසමග එම අවීචිමහානරකයෙහි උපදනාබවදැක මහත් ශොකයට පැමිණ 'ඒමාගේ ශොකාග්නිය නිවන්ට බුදුන්හැර සදෙවිලොව අන්කෙනෙක් නැනැ'යි දැන බුදුන්කරා එළඹ වැඳසිටියේය.

"නිබ්බංඋත්‍රසකමිදංචිත්තං නිබ්බංඋබ්බිග්ගකමිදංමනෝ,
අනුප්පන්නානසුනිබ්බෙසු අඤ්ඤුපපත්තිතෙසුච"

ඝනාදීන් විචාළේය. එසේ විචාළාවූ දිව්‍යපුත්‍රයාට බුදුහු ධර්ම්දෙශනාකොට වදුළුසේක. ඒ ධර්ම්දෙශනාව අසා දිව්‍යපුත්‍රතෙම සොවාන්ව අපායදුකින් මිදුනේය. මෙසේ සමුදුයට පැමිණෙන ගඟහා ප්‍රවාහයක්මෙන් බොහෝ දෙවියන් හා මනුෂ්‍යයෝ අපායට පැමිණෙති. සැබිමහිමයක් නැතිව මනුෂ්‍යයන්ට අහස ගමන් බැරිවන්නාක්මෙන් පින් රැස්කොටගත නුහුනු සත්වයාට සුගති

යෙහි ඉපදීම නොඉඩලිවන. ඒ කුශලකර්ම 'සද්ගරුකය, සද්බහුලය, සදුසන්නාය කෘතඋත් කර්මය'යි සතර වැදෑරුම් වෙයි. එහි ධ්‍යනමය කුශලය සද්ගරුක නම් වෙයි. ඒ ධ්‍යනමය කුශලය දැන් උපදවා ගත නොහැක්කේය. කෘතඋත් කර්මය නම් නුවණින් නොසලකා කළ කර්මය ඒ සම්පේ වියරුහුනු එකකු විදි ශරයෙන් ලකෙයි නොවැටී යම් තිසි තැනකම වැවිද එමෙන් ඒ කුශල කර්මයයම්කිසි කලෙකදී විපාක දෙන කර්මය ඒ නිසා එයින් අපායෙන් මිදෙමියි සිතන්ට නොපිළිවන සදුසන්න කර්මය නම් මරණසන්නයෙහි සිහිකරන්ට පුළුවන්වූ කුශල කර්මය—හේ මෙසේ දතයුත්තේය.

මිළිලිනම් ගම දෙමළ දෙරවුපාල නම් එක් පුරුෂයෙක් උදෑසනම බිලිකවු ලනු ගෙනගොස් මසුන් බාගෙනවුත් දෙතුන් කොටසක්කොට එක් කොටසකින් සඟල් ගත්තේය. එක් කොටසකින් දී ගන්නේය, එක් කොටසක් මාලු පිසගත්තේය. මෙසේ පණස් අවුරුද්දක් ප්‍රාණඝාතකොට මැත භාගයෙහි මහලුව ගියේ මරණාසන්නයෙන් හොත්තේය. එකල්හි ගිරි වෙහෙර වැසි සුලු පිණ්ඩපාත තිස්ස නම් තෙර කෙනකුන් වහන්සේ 'මට පෙනී මේ සත්වයාගෙ නැත්තේව'යි යනා කරුණාවෙන් ඔහුගේ ගෙදොරට වැඩිසේක.

ඔහුගේ භාර්‍යාතොම උන්වහන්සේ වැඩසිටි බව පුරුෂයාට කිවාය. ඒ පුරුෂතෙම 'පණස් අවුරුද්දක් මා තෙර කෙනකුන් වහන්සේ සමීපයටගිය විරුදු නැත. මාගේ කවර උපකාරයක් නිසා වැඩිසේක්ද වඩින්ට කියව'යි කියේය. ඒ සඳහා 'එපරිද්දෙන්ම වැඩියමැනැවැ'යි කිවාය. තෙරුන්වහන්සේ 'උපාසකයාගේ ශරීර ප්‍රවෘත්තිය කෙබඳුදැ'යි විචාළසේක. 'ඉතා දුර්වලය'යි කිවාය. එසේවීනම් දැන සම්පයි නියා ගෙට ගොස් උපාසකයාට සිහි උපදවා 'සිල් ගන්ට පුළුවන්දැ'යි වදාළසේක. 'එසේය වහන්ස පුළුවනැ'යි කියේය. තෙරුන්වහන්සේ උපාසකයාගේ ශරීර ප්‍රවෘත්තිය දැන තිසරණාදී සිල් දෙන්ට පටන්ගත්සේක. ඔහු පඤ්චශීලය යන බස කියන්ට පටන්ගත් කල්හි දිවගලවැටී න තෙරුන්වහන්සේ 'මෙවිචරෙක්ම මොහුට පමණැ'යි වැඩිසේක. එතෙම මියගොස් චාතුම්හාරජික දිව්‍යලොකයෙහි උපන. එසේ උපන් කෙණෙහිම 'මා විසින් කවර පින්කමක්කොට මේ ලබනලදදැ'යි සලකන්නේ තෙරුන්වහන්සේ නිසා ලත් බව දැනදෙවුලොවින්අවුත් තෙරුන්වහන්සේවැඳ සක්මන්කළවර

සිටියේය. 'තෝකවරෙක්හිදැ'යි විචාරණලද්දේ 'දෙමළ දෙරට්ට පාලයයි කියන්නේ මටය'යි කිය. 'තෝ කොයි උපන්නෙහිදැ'යි විචාළකල්හි 'මම චාතුම්මහාරාජික දිව්‍යලොකයෙහි උපනිමි ඉදින් නුඹවහන්සේ මට පන්සිල් දුන්සේක්විනම් මතු තවුතිසා දෙව්ලොව උපදින්නෙමි වේදැ'යි කියා තෙරුන්වහන්සේ වැඳ දිව්‍යලෝකයටම ගියේය.

මෙසේ සුගතියෙහිඋපදවන්ට සමර්ථවූ මරණාසන්නයෙහි සිහිකොටගතහැකි කුශලකර්ම'යදුසන්න'නම්වෙයි.සත්වයාට බොහෝ වාතපිත්ත ශ්ලේෂ්මාදියෙන් ආබාධ පැමිණෙන හෙයින්ද යමක්ෂණපද්‍රවාදිය ඇති හෙයින්ද නැයන්ගේ ඇඬිම් වැලපිම් ආදියෙන් සිත වික්ෂිප්ත හෙයින්ද ධනධාන්‍යාදිවූ සම්පත්තියෙහිද අඹුදරුවන්ආදි බන්ධු වර්ගයා කෙරෙහිද තමාගේ ආත්මය කෙරෙහිද සෙනහ බලවත්ව පවතිනා හෙයින්ද සිත එකඟ කොට කුශලය සිහිකොට ගැන්මත් දුක එසේ සිහිකරවන්ට සුදුසු සත්පුරුෂයෝත් නොලැබෙන්නාහ. යම්කිසි ආසන්න පිණකින් දිව්‍යලොකයෙහි උපන්නෝතිනුත් ඒ දිව්‍යලොකයෙහි මදක්කල්සිට කෙලවර අපායෙහි ඉපදීම අවශ්‍යයෙන්ම වනදෙයෙක. එබැවින් යදුසන්න කුශලයෙනුත් ප්‍රයෝජන බොහෝ නොවෙයි නැවත යම් කුශලයක් බොහෝසේ පුරුදුකරණලද්දේ වේද යම් කුශලයක් සිහිකළ සිහිකළවිට සන්තෝෂ උපදිනා පරිද්දෙන් බලවත්කොට කරණ ලද්දේද ඒ කුශලය 'ඡද්බහුල' නම් වන්නේය.

එබඳු පින්කළාවූ පුරුෂතෙම ඒ කුශල මහිමයෙන් දිව්‍යලොකයෙහි ඉපද එක කුශලයක් ගෙවුනුකල අනික් කුශලයෙක යනාදීන් පරම්පරාවෙන් විපාකදීමෙන් කප් අසංඛ්‍යයකුත් සුගතියෙහි සිට බුඩොත්පාදයක් ලත්විට නිවන් දකින්නේ වෙයි. එහෙයින් එම්බා ශ්‍රද්ධාබුද්ධි සම්පන්නවූ සත්පුරුෂයෙනි නොපිදමතු අපාය දුඃඛයට නොපැමිණ සුගතියෙහි ඉපද නිවන්දකිනාපරිද්දෙන් සියලු පව් දුරුකොට නිරන්තරයෙන් පින්කරව ගිය දවස නොපිටුන් අපායේ දුක් භවයෙන් සැඟවුනු හෙයින් නොදැනෙනත් පව් කළහොත් මතු විඳිනා අපායදුඃඛය සලකාගන්ට සුදුසුවූ ප්‍රඥාව නැතත් තමන් උන් අපාය දුඃඛය ජාතිස්මරණ ඥානයෙන් දැක මතු අපායෙහි නුපදිනා පරිද්දෙන් ගිය දවස මහොතනමයන් කළ වීර්‍ය්‍ය අසාත් උත්සාහකටයුතු—මහ කෙසේදයත්?

එන් කලෙක බරණැස් නුවර 'කසි' නම් මහරජක් විය. ඔහුගේ අග බිසව 'චන්‍රදෙවී' නම ඕතොමෝ සිල්වත්ව සිට 'මාගේ ශීලානුභාවයෙන් දරුකෙනෙක් මට උපදිත්ව'යි නියා සත්‍යක්‍රියා කළාය. ඇගේ ශීලානුභාවයෙන් ශක්‍රයාගේ පණ්ඩු කම්බල ශෛලාසනය හුණුවිය. එකල්හි ශක්‍රදේවෙන්‍ර තෙම දිවසින් බලා 'චන්‍රදෙවී පුතකු පතන්නිය. ඇට දරුකෙනකුන් දෙමි' බලා පරීක්ෂාකරන්නේ එයින් සැව මතු දිව්‍යලොකයෙහි උපදනා කැමතිව සිටි බෝසතාණන්වහන්සේ සමීපයට ගොස් යාච්ඤාකෙළේය. මහ බෝසතාණන්වහන්සේද 'යහපතැ'යි ගිවිස පන්සියක් දෙවතාවන් හා සමග එයින් චුතව තමන් වහන්සේ චන්‍රදේවීන් කුස පිළිසිඳගත්සේක. සෙසු දෙවතාවෝ පන්සියක් අමාත්‍ය භාර්‍යාවන්ගේ කුස පිළිසිඳගත්තාහුය. ඒ බෝසතාණන්වහන්සේ චන්‍රදෙවීන්ගේ කුසින් දසමසක් ඇවැමෙන් බිහිවූසේක. අමාත්‍යපුත්‍රයෝ පන්සියයද එදවස්ම බිහිවූවාහුය. එවේලාවට රජ අමාත්‍යගණයා පිරිවර මතුමහල්තෙ ලඟ හි උන්නේය. එසේ උන්නැනට ගොස් කුමාරයා උපන් බව කිවාහුය. ඒ ඇසීමෙන්ම පුත්‍ර ස්නේහය සිඹ ආදිය විනිවිද ගොස් ඇටමිදුලු පැහැර සිවියේය. සිතෙහි බලවත් ප්‍රීති උපන. රජ අමාත්‍යයන් අතින් 'නොපින් සන්තොෂවූදැ'යි විචාළේය. දෙවයන්වහන්ස කුමක් වදරණසේක්ද පෙර අපි අනාථයම්හ. දැන් වේදහිමි කෙනකුන් ලද්දේයයි කිවාහුය. රජ මහාසෙන නම් අමාත්‍යයා කැඳවා 'මාගේ පුත්‍රයාට පිරිවර ලබන්ට වට නේය. නෝ ගොස් අද දවස් අමාත්‍යයන්ගේ ගෙවල උපන් කුමාරයන් ඇත්නම් බලා එව'යි කියා ගමන්කරවිය. ඒ ගොස් එදා උපන් පන්සියක් කුමරුවන් දැක අවුත් දැන්විය. රජ ඒ පන්සියයටම කුමාරාභරණ හා සමග කිරිමවුන් පන්සියයක් ගමන්කරවිය. රාජකුමාරයාට නම් තබන දවස් ලක්‍ෂණ පාඨක බ්‍රාහ්මණයන් කැඳවා 'කුමාරයාට අන්තරායෙක් ඇද්දැ'යි විචාළේය. ඔහු ඒ කුමාරයාගේ ලක්‍ෂණබලා 'මහරජ්ජුරුවෙනි මෙතෙම මහා පින්ඇති කුමාරයෙක. මේ එක දඹදිව තබා සත රමහා දිවයිනට සක්විතිරජ්‍යය කරන්ට පින් ඇත්තේය. මෝ හට නිසි අන්තරායකුත් නැත්තේය'යි කිවාහුය. රජතෙම කුමා රයන්ට නම් තබන්නේ යම්හෙයකින් ඒ කුමාරයා උපන් දවස් සියලු කසිරට වැසි වටද කුමාරයා උපනැයි යනු අසා තමාගේ හා අමාත්‍යයන්ගේ සිත ප්‍රීතියෙන් තෙත්විද එසේහෙයින් 'තෝ මිය කුමාරයෝය'යි නම්තැබූයේය, ඒ කුමාරයා එක්මැසිවූකල්හි

සරහා රජ්ජුරුවන්ගේ සමීපයට වඩාගෙන ගියෝය. රජ ඔහු වඩාගෙන උකුලෙහි තබාගෙන උන්නේය. එසේ උන් තැනට සොරුන් සතරදෙනකු බැඳ ගෙනාවාහුය. රජ ඔවුන් සතරදෙනාටවඩ යොදන්නේ 'එකක්හට කවුසැමිවියෙන් පහර දහසක් ගසන්ට' කියේය. 'එකකු සිරගෙයි මසා තිබන්ට' කිය. 'එකකු නෙඹින් අන්ට කිය. 'එකකු උලතිබන්ට' කිය. උකුලෙහි හොත් බෝසතාණන්වහන්සේ ඒ අසා හසින් තැතිගෙන 'ඉතා නපුරෙක මාගේ පිය රජතෙම රාජ්‍යය නිසා නිරයගාමිවූ අකුසල් කරන්නේය'සි සිතූසේක. දෙවෙනිදවස් සේසතයට සරගාලූ යානාවෙහි බෝසතාණන්වහන්සේ සතප්පවූවාහුය. උන්ව හන්සේද මදක්නිදා පිබිදිසේක් සෙතවජත්‍රාදිවූ රාජ්‍යසම්පත් බලා ඉතාභයපත්ව පහලවූ ජාතිස්මරඥානයෙන් 'මේරජගෙට කොසිසිටගම්දැ'සි බලනසේක් දෙව්ලොවින්ආබවදුටුසේක, ඉන් ඇතත් බලනසේක් 'අසූදහසක් අවුරුදු ඔසුපත් නරකයෙහි පැසුනුබව' දුටුසේක. ඉන් ඇතත් බලනසේක් 'මෙම බරණැස් නුවර විසිඅවුරුද්දක් රාජ්‍යය කලබව' දුටුසේක. 'මෙසේ මම මෙ නුවර විසිඅවුරුද්දක් රාජ්‍යයකොට අසූදහසක් අවුරුදු ඔසුපත් නරකයෙහි පැසුනොමි දැනුත් එබදු සොරුන්ගේ ගෙයි උපනිමි මාගේ පියරජ රූයේ සොරුන් ගෙනාකල්හි නරකයෙහි උපද වන්නාවූ ඉතාපරුෂ කථානලේය. ඉදින් මම රාජ්‍යයකොලෙව්වීම් නම් මනුත්නරකයෙහිඉපද මහත්දුක් විඳිනොමි'සි සැලකූසේක. එසේසලකන්නාවූ උන්වහන්සේට මහත්භයන්උපන. රන්වන් වූසරීරය අතින් පිරිමැද මලානිකකරණලද පියුමක්මෙන් මලා නිකවදුවී ණිවිය. උන්වහන්සේ 'කෙසේ මේසිරගෙයින් මිදෙම්දැ'සි සිතා හොත්සේක. එකල්හි සෙතවජත්‍රයෙහි අධිගෘහිත වූපෙර ජාතියෙහි බෝසතාණන්ට මව්වූ දිව්‍යස්ත්‍රීතොම බෝස තාණන් අස්වසා කියන්නී 'එම්බා තෙමිය කුමාරයෙනි තොපි මින් මිදෙනු නැමැත්තේවීනම් අත් පා කොරනැතිවම අත් පා කොර ඇති බව ඟොළු නැතිවම ඟොළු ඇති බව බිහිරි නැති වම බිහිරි ඇති බව මේ කාරණතුන ඉටාගෙන තමා නුවණැති බව ලොවට පහළකරනාකරව'සි අවවාදකරන්නී,

'මාපණ්ඩිච්චං විඤ්ඤාවය බලමතො * භාව සබ්බපාණීනං
සබ්බිජ්ජනො ඔච්චාගතු චිවංතවඅජ්ජා භවිස්සති.'

සතරවේ ගාථාව කීවාය. 'එම්බා තෙමිය කුමාරයෙනි තොපි තොපගේ නුවණැති බව කාටත් ප්‍රකාශකරනාකරව සියලු

* බලමතො

මනුෂ්‍යයන් විසින් කිසිවක් නොදන්නාවූ මූගයෙකැයි දැන ගතයුතු බවට පැමිණේවයි සියලු අන්තඃපුර පිටි පුරවාසි ජනතෙම මේ කාලකන්නියෙක මොහු ගෙන් නිකුත්කර වයි කියා තොපට නින්දාකෙරෙත්වයි ඒ ආකාරයෙන් තෝ දවස් හළුයෙහිවීනම් තොපට සිතූ වැඩ සිඳවන්නේය'යි කිවාය. ඒ තෙමිය කුමාරයන්වහන්සේ දිව්‍යසත්‍රියගේ බස් අසා අස්වස් ලැබ,

කරොමිතෙතං වචනං යංමංභණසි දෙවතෙ
අත්ථකාමාසි මංඅම්ම හිතකාමාසි දෙවතෙ.'

යන ගේ ගාථාවෙන් මෙසේ වදාළසේක—'එම්බා දිව්‍ය සත්‍රිය නී මට යම් අවවාද වචනයක් කියන්නීවිනම් නීගේ අවවාදය කරන්නෙමි. ඒ එසේමය—එම්බා මැණියෙනි නී මට වැඩ කැමැත්තිය'යි කියා ඒ කාරණ තුන දැඩිකොට ඉටාගත් සේක. මෙසේ ඒ තෙමිය කුමාරයන්වහන්සේ එක්මැසි වය සේ සිට තුන්සියයන් යොදුන් දිග පළල ඇති කසි දෙශයෙහිද අටසාලිස් ගව්වක් දිග පළලඇති බරණැස් නුවරෙහිද එකාත පත්‍රව කරණ දිව්‍ය සම්පත්තියක් වැනිවූ රජ්‍ය සම්පත්තියෙහි ඇලය ඇරියෙන් කොරනොව කොරව බිහිරිනොව බිහිරිව ගොළුනොව ගොළුවූයෙන් තමා නුවණැතිබව කාටත් නොහඟවා දවස් අරිමිසි ඉටාගත්තේත් නරක දුක ඉතා දැඩිහෙයින. ඒ මහොත්තමයන්ට දැඩිවූ නරක දුඃඛය එම්බා සත්පුරුෂයෙනි තොපට මොලොක්වන්නේ නොවෙයි. එබැවින් ඒ මහොත්තමයන්ට කොර ගොළු බිහිරි නොව එන්මැසි වයසේ පටන් සොළොස්ඇවිරිදි වන තෙක් අත පය වක්නොකොට මුයෙන් බසක් නොබැණ කණින් ඇසූවක් නැසූවන්ව දවස්අරින්ට පුළුවන්වූකල අද පටන් අපි දැන දැන සතක්හු දිවි නොන සම්හ. අනුන් සතතක දෙයක් සොරවත් බලාත්කාරයෙන් වත් නොගනුම්හ. පරසත්‍රි සෙවනය නොකරම්හ. බොරු නොකියම්හ. රා නොබොම්හයි ඉටාගැන්මත් ජීවිතාන්තය දක්වා පැවතීමත් අපට බැරි කවරේදැයි කියා සිතාගැන්මෙන් නුවණැත්තන්ට ඇතුලත්ව දවස්අරීමත් තොපට බැරි කවරේද එබැවින් අපාය දුකින් මිදී දිව්‍යලොක සම්පත්තිය විඳිමට උත්සාහ කටයුත්තේය.

තවද ඒ කසි රජ්ජුරුවෝ තෙමිය කුමාරයන් උකටලී නොවන පිණිස පන්සියයක් කුමාරයන් ගෙනවුත් තෙමිය කුමාර

යන් සම්පයෙහි හිඳුවා පොෂ්‍යය කලෝය, කුමාරවරු කිරට ඔඩති. තෙමිය කුමාරයන්වහන්සේ අපාය දුකට ඔයගෙන 'රජ්‍යය කිරීමට වඩා චියලි මියයාම උතුමැ'යි නොහඬනසේක. කිරිමවු චන්‍ද්‍රදේවීන්ට එපවත් කිහ. බිසවු ගොස් රජ්ජුරුවන්ට කිහ. රජතෙම නිමිත්ත පාඨකයන්ට කිය. බමුණෝ කියන් නෝ මෙතෙක්ද කිරිදෙන වේලා ඉක්මවා කිරි දෙන්ට කිවුය. එකල්හි 'රජකුමාරතෙමේ ඔඩමින් තනය දැඩිකොට අල් චාගෙන කිරි බොන්නේය'යි කිවාහුය. එතැන් පටන් පලමු වෙන් කිරි බොන වේලා ඉක්මවා දෙති. කිසි කලෙක දවසක් මුළුල්ලෙහිම කිරි නොදෙති. බෝසතාණන්වහන්සේ නරක දුකට නැතිගත්සේක් චියලෙනසේකුත් කිරි නිසා නොහඬන සේක ඒ නොහඬන්නාවූ බෝසතාණන්වහන්සේට මාගේපුත්‍ර යාණන්වහන්සේ සාදුකින් පිඬිනසේකැයි මවුබිසව්හෝ කිරිමවු හෝ කිරිපොවති. මෙසේ උන්වහන්සේ නොහඬනසේක. නිද්‍රා චත් නොකරණසේක. අත්පාවක් නොකරණසේක. ශබ්දයත් නොඅසනසේක. ඉක්බිත්තෙන් කොර පිළි අයගේ අත් පා මෙරඟ තිබෙන්නේ නොවෙයි ගොළුවන්ගේ හනු කෙළවර මෙසේ තිබෙන්නේ නොවෙයි. බිහිරන්ගේ කන් සිදුරු මෙසේ තිබෙන්නේ නොවෙයි. මෙසේ කොර බිහිරිවන්ට කාරණය කින් චියයුතුය'යි සිතා අතුරතුරේ දවසක් දවසක් මුළුල්ලෙහි කිරිනොදී අවුරුද්දක් පරීක්ෂාකලාහුය. එසේත් හඬන දෙයක් චත් ගැසෙනදෙයක්චත් නුදුවූවාහුය නැවත 'බාලපැවිඉයෝනම් පූපාපූප කැමතිවෙති. එසින් පරීක්ෂාකරම්හ'යි කියා ප්න්සියක් කුමරුවන් බෝසතාණන් සම්පයෙහි හිඳුවා නොයෙක් කැවුම් ගෙනවුත් නුදුරු තැන තබා 'තොප තොප කැමැත්තක් ඇර ගනුව'යි කියා තුමූ සැඟවී සිටිති. සෙසු කුමාරයෝ ඔවුනොවුන් පැහැර කලහකොට උදුරගන්නාහු වෙති. බෝසතාණන් වහන්සේ 'එම්බා තෙමියකුමාරයෙනි නරකදුක් කැමතිඑකෙක් වේද පූ කැමතිවන්නේය'යි ඒ දිසාවත් නොබැලූසේක.

නැවත බාලපැවිඉයෝ නම් එලාඵල කැමතිවෙති ඔඹදඹ චැලවරකාඇදිවූ ඵලගෙනවුත් රැස්කොටතබා ඉනුත් අවුරුද්දක් පරීක්ෂාකොට සිදුරක් නුදුවූවාහුය නැවත පැවිඉයෝ නම් ක්‍රීඩා භාණ්ඩයට කැමතිවෙති. රත් රිදියෙන් ඇතුන් අසුන් ආදිවූ රූ ඉදිකොට ගෙනවුත් නුදුරුතැන තිබූවාහුය. සෙසු පැවිඉයෝ දිවගොස් උදුරා ගනිති බෝසතාණන්වහන්සේ ඒ දිසාවත් නොබලනසේක. මෙසේ ක්‍රීඩා භාණ්ඩයනුත්

අවුරුද්දක් පරීක්ෂාකාට 'සතරඇවිරිදි පැවීයෝ භොජනයට ප්‍රියවෙති එසින් පරීක්ෂාකරම්හ'යි සිතා නොයෙක් රසමස වුලෙන් යුක්ත ආහාරය ගෙනවුත් තිබුවාහුය. සෙසු පැවියෝ පිඬුපිඬු කොට අනුභවකරන්නාහුවෙති. ඒත් බෝසතාණන් වහන්සේ වූකලී 'එම්බා තෙමිය කුමාරය මේ සසර අහර නැති වම උන් ජාතිගණනෙක් නැත මේත් ඉන් එක ජාතියෙක්වේ දැ'යි නරක භයින් භයපත්ව ඒ දීසාවත් නොබැලූසේක. මෙසේ මහොත්තමයෝ උපන්තැන් පටන් පස් අවුරුද්දක් අතර තුරෙහි බොහෝසේ අහරනොදී පීඩාකලදිත් කිවිවුව තිබූ අහරට අනුදික්කරන්නක්වත් ඉල්වන්නක්වත් ලොභ වශයෙන් ඒදිසාව බලන්නක්වත් නොකෙලේ එකජාතියෙක තමා විදි නරකදුක් දැකය. එම්බා සත්පුරුෂයෙනි තොප විසින් බුදු බණින් ඇසූ නරකදුඃඛයත් තිරශ්චීන දුඃඛය හා ප්‍රෙත දුඃඛයත් ජාතිදුඃඛාදිවූ සංසාර දුඃඛයත් සලකා එකවේලෙක හරිනා චිකාල භොජනාදියෙහි ලුබ්ධනොවී පොහොය අටසිල්වත් නිතොර දසසිල්වත් රක්ෂාකොට සසරදුකින්මිදී නිවන් දකිනා පරිද්දෙන් උත්සාහකටයුත්තේය.

නැවත බෝසතාණන් පස්ඇවිරිදිවූ කල්හි පස් ඇවිරිදි දරුවෝ ගින්නට භයගනිති යනු හෙයින් 'එසින් මුන් පරීක්ෂාකරම්හ''යි සිතා නොයෙක් දෙරවල් ඇති ගෙයක් කරවා තල්කොලින් සොයවා තෙමිය කුමාරයන් හා පන්සියයක් කුමරුවන් රැඳෙන් රැඳෙන්ද ඉන්ට සලස්වා ගේ ගිනි අවුලවන්නාහු වෙති. සෙසු පැවියෝ ඒදැක මහත්භයින් භඬා දිවෙති. මහබෝසතාණන් වහන්සේ ''නරකඝින්නොහි පැසීමට වඩා මෙම උතුමැ''යි ධ්‍යානයට සමවන්නාක්හුමෙන් නිශ්චලව හිඳිනා සේක. ගිනි ආසන්නවනා කල්හි වඩාගෙනයෙති, මෙසේ ගින්නෙනුත් අවුරුද්දක් පරීක්ෂාකොට නැවත සාවිරිදි කුමරුවෝ මනැතුන්ට භයගනිති. ඇතුන් ශික්ෂාකරවා බෝසතාණන් වහන්සේද ඒ පන්සියයක් කුමරුවන්ද රජ ගෙයි මලුවෙහි ඉන්ට සලස්වා ඇතුන්හරිති. ඒඇත්හු කුච නාදකොට සොඬ බිමගසමින් කන්තල හිඳුවා භයගන්වාඑති. සෙසුපැවියෝ මරණභයින් තැතිගෙන භයපත්ව ඒ ඒ දිග දිවෙති. බෝසතාණන්වහන්සේ අපායභයම සිතසිතා නිශ්ව ලව විඩහිඳිනාසේක. මොනවට ශික්ෂිතවූ ඒ හස්තිහු බෝසතාණන් වටුකොට දිව පීඩාවක් නොකොටම යන්නාහුවෙති.

"සත්ඇවිරිදි පැටියෝ සජීයන්ට භයගනිති"යි යනුහෙයින් සජීයන්ගේ දළි උපුටා මුඛ බන්ධනයකොට මැදට හළුවාහුය. සෙසු පැටියෝ හඬමින් දිවගත්හ. බෝසතාණන් වහන්සේ නරයකුදුක් සලකා 'මේ චණ්ඩපරුෂ සජීයන්ගේ මුඛයෙහි මිය යාම උතුමැ'යි නිශ්චලව වැඩඋන්සේක. එසේ උන්නාවූ බෝස තාණන්ගේ සවිඤ්ඤය වෙලා ඉසමුදුනේ පෙනය තබාඉදිති. එවිටත් උන්වහන්සේ නිශ්චල්ව උන්සේක්මයමෙසේ පස්ඇවිරි ද්දේපටත් සත්අවුරුද්ද දක්වා තුන්අවුරුද්දක් නොයෙක් භය ගැන්වියදීත් ඒ මහොත්තමයෝ නිශ්චලවම උන්නාහුය. ඒ මහොත්තමයන් නරක දුනිත් මිදෙන්ට එසේ උත්සාහනළකල එම්බා සත්පුරුෂයෙනි නොප විසිනුත් අපායදුක් ආදිවූ සසර දුනිත් මිදෙනුනිසා 'මේපින්කම කලහොත් දහස් දඬගනුම්හ මරම්හ'යි කියන කෙනෙක් ඇත් නමුත් රටත් භය නොගෙන ආහාර නොලැබීමෙන් දුකෙක· වසතු නොලැබීමෙන් දුකෙක වසතු නැසීමෙන් දුකෙක, නැගන් නැසීමෙන් දුකෙක තමාට වැඩි ඉපදීමෙන් දුකෙක යනාදීන් නොයෙක් දුක් නොසිතා අප්‍රමාදව පින්කටයුත්තේය.

ඉක්බිත්තෙන් බාලපැවිදෝ නම් නළුනාටකයන් දක්නා කැමැත්තාහුවෙති. පන්සියක්කුමාරයන් හාසමග මහබෝසතා ණන්වහන්සේ රජගෙයි මලුවේ හිඳුවා නැටුම් දැක්වූවාහුය. සෙසු පැවිදෝ නැටුම්දැන "යහපත යහපතැ"යි කියති මහ හඬින් සිනාසෙති. බෝසතාණන් වහන්සේ වනාහි "නරක යෙහි උපන්නාවූ නට කැළණියකුත් සිනාවෙක්වත් සොම්න සෙක්වත් නැත්තේවේදැ"යි නිශ්චලව නොබලාම වැඩහිඳිනා සේක.

මෙසේ අතුරතුරේ පරීක්ෂාකොටත් සිදුරක් නුදුටුවාහුය. නැවත කඩුවෙන් පරීක්ෂාකරම්හ'යි සිතා මහබෝසතාණන් වහන්සේ කුමරුවන් හා සමග රජගෙයි මලුවේහිඳුවා පැවියන් කොළිනාකල්හි සඵවිකවණ්ණවූ කඩුවක් ඉසවට කරකවමින් මහත්තොට හඬගසාඋඩපනිමින් 'කසි රජ්ජුරුවන්ගේ කාල කන්නිවූ පුතෙක්ඇත්ල ඔහුගේ හිස මේකඩුවෙන් ගසාදමමි'යි දිවඇය ඔහුදැක සෙසුපැවිදෝ මරණභයින් තැතිගොන දිවපලුය. බෝසතාණන්වහන්සේ නොදන්නාක් මෙන් නිශ්චලව වැඩ උන්සේකළුපුරුෂතෙම කඩුවෙන් හිස ගසාදමමියි තැතිගන් වන්නේත් භයගන්වාගත නොහි පහවිය නැවත දස හැවිරිදි

වූනල්හි "බිහිරිබව් පරීක්ෂාකරම්හ"යි යන සිතින් යානාව වට තීර අවුරා සතරපිට සිදුරුතබා බෝසතාණන් නොදන්නවාම ඇඳයට සත්පිඹිනාවුන් ඉදුවා එකවිට සත්පිම්බවූය. ටාලිහාව එකානින් නාදවිය. අමාත්‍යයෝ සතරදෙනෙක් සතරපිට සිදුරෙන් බලාසිටින්හෝ එකදවසකත් බෝසතාණන් වහන්සේගේ සිහිමූලාවීමත් හෝ හස්තපාදවිකාරයක් හෝ ඇඟ චලිතවීමක් හෝ නුදුටුවාහුය, මෙසේ අවුරුද්දක් පරීක්ෂාකොට බෙරහඬි නුත් එසේම අවුරුද්දක් පරීක්ෂාකොට නැවත "පහණින් පරීක්ෂාකරම්හ"සි සිතා ඝණඅන්ධකාර රාත්‍රියෙහි අතවත් පයවත් චලිත කෙරෙති සිතා ඒ විමසනු පිණිස ගෙයි පාන්නිවා කලතු ලෙහි පාන්වසාතබා මදක්නල් ඉක්මවා පහන් එකවිටම ඉගන එළිකොට හස්තපාදයන් පරීක්ෂාකෙරෙති, මෙසේ අවුරුද්දක් පරීක්ෂාකරන්නෝත් පාදචලන මාත්‍රයකුත් නුදුටුවාහුය. එම්බා සත්පුරුෂයෙනි ඒ බෝසතාණන් වහන්සේ නැවුම් දැක සතුටුනුවූයේත් ඉසඟසන්ටගෙනා කඩුවදැක භයනුවූයේත් සන් හඬ බෙරහඬ අසා චලිතනුවූයේත් අන්ධකාරයෙහි එකාකිව සැතපෙමින් සිට හස්තපාදාදිය චලන නොකෙළේත් සිතෙයි සොම්නස් නැතිහෙයිනුත් නොවෙයි භයනැති හෙයිනුත් නොවෙයි එකාකාරව සැතපීමෙන් ශරීරයට දුඃඛවෙදනාව නූපදනා හෙයිනුත් නොවෙයි. එසේනම් කුමක්හෙයින්දැයි යතහොත් තුන්වෙනි භූමියෙහි අපායෙහි ඉපද විඳිදුඃඛ රාශිය තමන්වහන්සේගේ නුවණැසට පෙණෙනනිසාය. එහෙයින් නොපෙණෙන් නුවණැසට නොපෙණෙනත් සත්‍යවාදිවූ බොධිසත්වචරයන් බුදු පසේ බුදු මහසව්වන් වදාළාවූ වචනයම තමා දුටුදෙයක් මෙන් අදහාගෙන මතු අපායදුක් නොවිඳිනා පරිද්දෙන් දිවාග්‍රි දෙන්හි අප්‍රමාදව පින්කොට සැඟීමොක්ෂ සම්පත්තිය සිඛකට යුත්තේය.

නැවත සියලු ශරීරය උක්පැණියෙන් නවරා බොහෝ මැස්සන් ඇති තැනෙක පිනවූවාහුය. මැස්සෝ වසා ඉදිනවු මුනයෙන් විඳිනාහුමෙන් විඳිති උන්වහන්සේ අපායදුක් සිතා නිරොධයට සමවන්නාක්හුමෙන් නිශ්චලව වැඩහිඳිනාසේක. මෙසේ අවුරුද්දක් පරීක්ෂාකොට සිදුරක්නුදුටුවාහුය. නැවත තුදුස්වයස් පිරුණුකල්හි මේපවිත්‍රවන වයසය අපවිත්‍ර නොකැමැත්තේය. එබැවින් 'අපවිත්‍රයෙන් පරීක්ෂාකරම්හ'සි සිතා එතැන් පමන් උන්වහන්සේ සනානය නොකරවති. අපවිත්‍රත් නොදමති. උන්වහන්සේ මලමූත්‍රකොට රැකවරී සැතපෙන සේක.

බඩවැල් නික්මෙන්නාක්මෙන් දුගීන්ධය මැස්සෝ වසාකති, එකල්හි උන්වහන්සේ වටකොටසිට 'එම්බා තෙමියකුමාරයෙනි! තෝ දැන් වැඩිවිය පැමිණියෙහිය කවරෙක් හැමදාම මල මූත්‍රසෝදු පවිත්‍රකෙරෙද්ද නිමෙක්ද ලජ්ජාවකුත් නැද්ද නැතිසිට මලමූත්‍ර සේදුව මැනාවැ'සි ආක්‍රොශබණිති උන්වහන්සේ ප්‍රතික්ක්‍රුලවූසේක. හේ මලමූත්‍රයෙහිම ගිලී සැතපුන සේක්මය. ගුථනරකයෙහි සාරසියක් ගව්වකින් එපිට ඕවියවුන්ගේ හඳවත උපුටාගන්ට සමර්ථවූ දුර්ගන්ධය සලකා මේ දුර්ගන්ධය ඉවසූසේක. මෙසේ අචුරුද්දක් මුළුල්ලෙහි පරීසන්‍නාකොටද සිදුරක් නුදුටුවාහුය.

නැවත 'ගිනිඋළුණ ඉවසාගතනොහි අතපය චලිතකරණසේකැ'සි උන්වහන්සේ සැතපෙන ඇඳයට ගිනිකබල් තිබුවාහුය. උන්වහන්සේගේ ඇඟ බිබිලි නැගෙනකල්හි බෝසතාණන්වහන්සේ 'නරකගිනි පිටතට සාරසියක් ගව්පැතිරෙන්නේය. ඒ නරකාග්නියෙහි පැසී විඳිනාදුනට මේගින්නෙන් චන්නාවූ දුන් සියක් ගුණෙන් දහසක් ගුණෙන් ලක්ෂයක් ගුණෙන් උතුමැ'සි නිශ්චලව හොන්සේක. මවුපිය දෙදෙන එසේ සැතපෙන්නාවූ උන්වහන්සේ බලා ගිනි කබල් ඉවත් නොට උළුණ සන්හිදුවා 'පුත තෙමිය කුමාරයෙනි! තොප නොර ගොඩි බිහිරි නොවන බව දනුම්හ. ඔවුන්ගේ පාද හනුකණ්ණශ්‍රොත්‍රාදිහු මෙසේ නොතිබෙයි. තොප අපදෙවියන්ට යැදලද්දවූ ප්‍රිය දරුකෙණෙක. එබැවින් අප නොනාස ච සියලු දඹදිව රජදරුවන්ගෙන් චන්නාවූ නින්දාවෙන් අප මුදව'සි නියා මව්පිය දෙදෙන සමහර කලෙක අඬඅඬා එක්ව සිටත් යාච්ඤාකෙරෙති. සමහර කලෙක වෙනවෙන සිටත් යාච්ඤා නොරෙති. බෝසතාණන් වහන්සේ ඔවුන්ගේ ඛස් නැසුවන්ව සැතපෙන සේක්මය. මෙසේ අතුරතුරේ අවුරුද්දක් මුළුල්ලෙහි පරීක්ෂාකරන්නාහුද සිදුරක් නුදුටුවාහුය මෙසේ සියළු ශරීරය මැසි තුඩුනින් විඳිනාකල්හිද ශරීරයෙහි තැවරුණු මලමූත්‍ර ගන්ධයෙන් ඛඩවැල් නැගෙනා තරම් පිළිකුල්වනා කල්හිද අග්නිදාහයෙන් ඇඟ බිබිලිනැගෙන කල්හිද අඬඅඬා සිට යාච්ඤාකරන්නාවූ දෙමව්පියන්ගේ බැගෑපත් වචනයෙන් ද කම්පානොවී විකාරයක් නොදක්වා මුවෙන් නොබැණ සැතපුනේ මේසියල්ලට චලිතවූවහොත් 'මතු පැමිණෙන අපාය දුඃඛයෙන් ගැලවීම බැරිය'සි යන සිතිනා. එම්බා සත්පුරුෂයනි ඒ මහාබෝසතාණන් වහන්සේමෙන් මේආකාරයෙන් නිවා

එක්සේ පැවත පිත්නොට ගනුම්හයිසිතානොගන්නාවූ තොපට මතු අපාය දුනින් ගැලවීම දුක. එබැවින් 'මැසිමදුරු ඇදින්ගේ පිඩාය දැන් කෙසේගොස් දැගැප්මහබෝ වඳුමෝදැ මල්පහන් පුදමෝදැ'සි නොසිතා 'මේ ගිලනුන්ගේ ඇඟ ක්‍රිමිකුල යන්හෙන් ඇකුලය. දුග්ගන්ධය. පිළිකුල මුන්ට කෙසේ අත්පා මෙහෙකරමෝදැ'සි නොසිතා 'දැන් ඇඟ උෂ්ණය. අවිසුලඟ දැඩිවිය කෙසේවත් පිළිවෙත් කරමෝදැ'සි නොසිතා 'දැන් දෙව්වූපියෝ අඬති අඹුදරුවෝ අඬති නැයන්ගේ බාධාය දැන් කටයුතු කෘත්‍යවණ්ඩිත්කම්මානතා ඇත කෙසේ පින්කරමෝදැ'සි නොසිතා අප්‍රමාදව පින්කටයුත්තේය.

නැවත සොළොස්වයස් පිරුණුකල්හි මෙසේ සිතුවාහුය. කොරවූවත් වයස මූනලඟෙසින් ඇලිම්කටයුත්තෙහි නැලෙන්නාවූ වෙෂකටයුත්තෙහි නොකිපෙන්නාවූ සවිකෙනොක්නම් නැත්නාහ. ඒ ඒ සෘතුවට මල්පලගන්නාවූ වෘක්ෂලතාදිය මෙන් මේත් එක් ලොකාසවභාවයෙක එබැවින් 'නාථක සත්‍රුන්ට භාරකොට පරික්ෂාකරවම්හ'සි සිතා දිව්‍යසත්‍රුන්සේ රූපසම්පන්නාවූ සත්‍රුන් කැඳවා 'එම්බා සත්‍රුනි තොප අතුරෙන් යමෙක් මේ කුමාරයා සිනාසෙන්ටවත් ලොකාඩාදරතියෙන් සිත්ගන්ටවත් සමර්ථවූවාහුනම් ඕම අඟමෙහෙසුන් වන්නීය'සි කියා ඒ තෙමිය කුමාරයන්වහන්සේ සුවඳපැණි්ඉස්සෝදු නහවා සවීහරණයෙන් සරහා දිව්‍ය විමානයක් බඳුවූ ශ්‍රියහන් ගබඩාවෙහි පණවනලද ස්ථානාවෙහි සතප්පවා සුවඳ මල්දම් සුවඳ සුණු ආදියෙන් සුවඳ ගන්වා පහව ගියාහුය. ඉක්බිත්තෙන් ඒ සත්‍රුන් නාෘත්‍යගීතයෙන්ද මිහිරිකටහඬින්ද ආදිනොයෙක් ආකාරයෙන් සිත්ගන්ට උත්සාහකළාහුය. බෝසතාණන් වහන්සේ ඔවුන් බලා 'මොහු මාගේ ශරීරසපත්තිනොලබත්ව'සි තමන්වහන්සේගේ ආස්වාසප්‍රාශ්වාසදෙක නවතා ශරීරය දැඩිකොට අනම්ණ්‍යකෙළේ නරක දුක් සිතාමය. එබැවින් 'එබදු නරකදුන් නොවිඳුම්හ'සි සිතන්නාවූ එම්බා සත්පුරුෂයෙනි පරදාරසෙවනයෙන් දුරුව පවසීලය රක්ෂාකිරීමෙන්ද අබ්‍රහ්මචර්‍යාවෙන් දුරුව අෂ්ටාඞ්ගශීලය දශශීලය රක්ෂාකිරීමෙන් සතර අපාය දුනින් මිදී සඳගීමොක්ෂ සම්පත්තිය සිඹකොට ගන්නා පරිද්දෙන් උත්සාහ කටයුත්තේය.

තවද එන්මැසිවයසේ පටන් සොළොස්වයස් පිරෙණකල් මහණවූණෙතිව මෙලෝ පරලෝ විශෙෂකොට දන්නාවූ ඒ මහබොසතාණෝ මහත් ඓශ්වර්‍යඇති කසී රජ්ජුරුවන්ට

පුත්‍රව රජ්‍යසම්පත්තියට හිමිව වැඩසිටි ශෝභිත එකදවසක ත් 'මේ මලමූත්‍රාදිමාපියව'යි කියන්නාක්ඛත් තමා අතින් පවිත්‍ර කරන්නාක්වත් විලිවසා පවිවඡනනා වන්නාක්වත් නැතිව ලජ්ජා ; නැත්තාක්මෙන් දවස්හලේ මතු නරක දුඃඛයෙන් මිදීමට දැනශීලාදිවූ කුශලකර්මයෙන් විනා ලොකාචාරයෙන් ප්‍රයොජන නැතිනිසාය. එම්බා සත්පුරුෂයෙනි බොධිසත්ව චරිතය ඇදුරුකොට තකාගෙන 'අපි මහත් වංශඇති අයෙක මේ හිනායන්ට නෙසේ ආදරකර්මෝද'යි නොසිතා සිල්වත් ගුණවත් අයට වැඳීම් පිදීම් ආදියෙන් ආදරකොට බණ අසන කලත් 'අපි මිවීතෙනොහි ඉඳ අසන්නේ නෙසේද ඉසකඩ අරින් නේ නෙසේදැ'යි ඕනය නොසිතා දැහැප මහබෝ ආදිය දැක චාහනයෙන් බසින්නේ නෙසේද ඡත්‍රාදිය අරින්නේ නෙසේද'යි දුර්බුබි නූපදවා 'අද බණඇසීමට යන්ට ඉනකඩ කිලිවිවිය කැවුවයන්ට සහාය නැත' යනාදින් ලජ්ජානොකටයුතු තන්හි ලජ්ජානූපදවා තමා ගරුකොට සිතා රත්නත්‍රයට අගරුකොට පැවැත්මෙන් අපායභාග් නොවී සිහි නූවණ ඇතිව සැදිගීමොඃ සම්පත්තිය සිඛකොටගත යුත්තේය.

මෙසේ දහසාවුරුද්දක් මුළුල්ලෙහි මහත් පරිසඳා දසසය කින්ද අනෙකප්‍රකාර කුෂුද්‍ර පරිසඳාවෙන්ද පරිසඳාකොටක් උන්වහන්සේ කොර ගොඨි බිහිරි නොවෙයි කියාත් දැනගත නුහුනුවාහුය. එකල්හි කසිමහරජණෝ ලක්ෂණ පාඨකයන් ගෙන්වා "තෙපි කුමාරයා උපන්කල්හි මේකුමාරතෙම මහපින් ඇත්තේය. මෝහට කිසි අන්තරායක් නැතැ'යි කිවෝවේද ඒ කුමාර දැන් කොර ගොඨිබිහිරිවූයේය. කොපගේ බස් සබාතොවෙ'යි කියේය. 'මහ රජ්ජුරුවන්වහන්ස අප නුදුටු දෙයක් නැත රජකුලයෙහි දෙවියන් පනා ලත් පුත්‍රයා කාලකන්නියා යයි කිමෝනම් නුඹවහන්සේගේ සිතෙයි දෙම්නාස් උපදනේ යයි සිතා නොකිම්හ'යි කිවාහුය. 'දැන් ඕහට කළමනා කිම් දැ'යි විචාළේය. 'එම්බා දෙවියන්වහන්ස ! මේරජගෙයි වසන් නේවිනම් නුඹවහන්සේගේ ජීවිතයටවත් රජ්‍යයටවත් අග මෙහෙසුන් බිසවුන්ටවත් අන්තරාය පෙණෙන්නේය. එසේ හෙයින් අවමඟුල් රථයෙන ඔහුනබා පශ්චිමචාරයෙන් ඔහු පිට ත්කොට අම්බොඛාන්හි වලගසා එහිබහා පස් ගැසියයුත්තේ යයි' කිවාහුය. රජ, 'ඒ යහපතැ'යි ගිවිස්සේය. චන්ද්‍රාදේවී ඒ අසා රජහුකරා අවුත් දෙවියන්වහන්ස ! නුඹවහන්සේ පෙර මට වරයක් දුන්නාඇත. 'ඒ කැමති දවසෙක ඇරගනිමි'යි කියා

කිබිමි. ඒවරය මට දුන් දුනමැනවැ'යි කිවාය. රජ 'ඇරගන යනපනැ'යි කිය. ඒබිසවුතොම 'එසේවීනම් මාගේ දරුවන්ට රජ්‍යය දෙව'යි කිවාය. රජ 'එසේ නොපිළිවහැයි තොපගේ පුත්‍රයා කාලකන්නියාය'යි කිය. 'දෙවයන්වහන්ස! එසේවීනම් ජීවිතාන්තයට නොදෙනත් සත් අවුරුද්දකට රජ්ජය දෙව'යි කිවාය. රජ 'එසේ නොපිළිවනැ'යි කියේය. 'එසේවීනම් සාවුරුද්දකට දෙව පස්අවුරුද්දකට දෙව. සතර අවුරුද්දකට දෙව. තුන්අවුරුද්දකට දෙව, දෑවුරුද්දකට දෙව අවුරුද්දකට දෙව එසේනොදෙනත් සත්මසකට සමසකට පස්මසකට සාරමසකට තුන්මසකට දෙමසකට මසකට දෙව, අඩමසකට දෙව'යි කිවාය. 'එම්බා දෙවිනි! නොපිළිවනැ'යි කිය. 'එසේවීනම් සත් දවසකට දෙව'යි කියා යාච්ඤාකළාය. රජ 'යහපනැ'යි කියා ගිවිස්සේය. එකල්හි චන්ද්‍රාදෙවිතොම පුත්‍රයා සරහා 'තෙමිය කුමාරයන්ගේ ආඥය'යි නුවර බෙරලවා නුවර සඳවා ඒ කුමාරයා හසතිසනාන්ධාරූඪ කරවා නුවර ප්‍රදක්ෂිණකරවා ආවාවූ ඒ කුමාරයා ශ්‍රියහන් ගබඩාවෙහි සතපපවා 'පුත තෙමියකුමාරය නොපනිසාදුන් සොළොස්අවුරුද්දක් රැඳුවල් අඬන්නාවූ මා ගේ ඇස කබව ගියේය. ලය පැලියන්නාක් මෙන් ශොකය නොප කොර ගොළුබිහිරි නොවනවා දනිමියි මා නොනසව'යි තුන්යම් රාත්‍රියෙහි සිට යාච්ඤාකළාය.

මෙසේ සඳවසක්ම සිට යාච්ඤාකළාය. සත්වෙනි දිනයෙහි කසිරජතෙම සූනඳ නම් රථාචාර්‍යයා කැඳවා 'එම්බල සගය! තෝ උදුසනාක්සේ අවමඟුල් රථයක් යොදාගෙනාවුත් අපගේ තේමිය කුමාරයන් රෑ හොවා නුවර පශ්චිම චාරයෙන් නිකුත් කොට අමුසොහොණෙන්හි සතරැස්වලක් කැණ ඔහුර්ට දමා උදුවිකොවෙන් හිසබිඳ ජීවිතක්ෂයකොට මත්තෙහි පස්වසා පොළොව වැඩකම්කොට ඉස්නානයකොට එව'යි කියා විධාන කෙළේය. එදවස් රාත්‍රියෙහි එම්බා තෙමිය කුමාරයෙනි! 'තොප අමුසොහොන්හි වළගසා පස්ගසව'යි කියා රජ නියොගකෙළේය. 'තෝ සෙටදවස් මරණට පැමිණෙන්නෙහිය'යි මවු බිසවුන් තුන්යම් රාත්‍රියෙහිසිට හැඬුවාය. ඒඅසා 'මා සොළොස් අවුරුද්දක් කල්ගත් උත්සාහය දැන් මසකට ප්‍රාප්තවිය'යි සිතන්නාවූ බෝසතාණන් වහන්සේගේ ශරීරය ප්‍රීතියෙන් පිරුණේය. ඉක්බිත්තෙන් ඒරාත්‍රිය පහන්වූකල්හි උදුසනම සූනඳනාම් රථාචාර්‍යතෙම රථය සරහාගෙනාවුත් වහාල්දෙර තබා තෙමේ ශ්‍රියහන් ගබඩාවට වැද දෙවින්වහන්ස! නුඹවහන්සේ දෙම්නස් නුවමැනව. රජ්ජුරුවන් වහන්සේගෙන් නියොග

ලදිමිසි බෝසතාණන් ආලින්ධනායකොට හොත්නාවූ බිස වුන්අතින් ඉවත්කොට මල්කළඹත්මෙන් කුමාරයන් ඔසවා ගෙන මාලිගාවෙන් බවුයේය. බිසවු ලෙසි අත්පැහැර මහ හඬින් හැඬුවාය. එසේ හඬන්නාවූ මෑණියන් බලා කථාකෙනා කලහොත් මොහු ලයපැලියන්නේවන. එබැවින් කථාකර්ම් දොනොයි යන සිත්ඇතුවත් එසේ කථාකෙලෙම් වීම්නම් සොළොස් අවුරුද්දක් මාකළ උත්සාහය නිරර්ථකවන්නේය. කථා නොකරන්නාවූ මම මටත් දෙමවුපියන්ටත් පිහිටවන්නෙම්වේ දැයි ඉවසා වදාළසේක.

ඒ රථාචාර්යයාද උන්වහන්සේ ගෙනගොස් රථයට වඩා 'පශ්චිම චාරයට රථය පදිමි'සි පූර්වාභිමුඛව පැද්දේය. රථය වහසලදෙරින් නික්ම දෙවතානුභාවයෙන් තුන් යොත්නක් ගෙවාගියේය. එතත පැමිණියාවූ චනාන්ත්‍රය රථාචාර්යයාට අමුසොළොණක්සේ පෙණුනේය. 'මෙතන යහපතැ'සි රථය එතින් ඉවත්කොට තබා බෝසතාණන් වහන්සේ පැළඳි ආභරණ ගලවා උපාදියක්කොට බැඳතබා උදැල්ල ගෙන නුදුරු තැන්හි වළක් කණින්ට පටන්ගත. බෝසතාණන්වහන්සේ 'මෙමා උත්සාහකරන්ට සුදුසුකලැ'සි දැන 'මම වනාහ සොළොස් අවුරුද්දක් මුළුල්ලෙහි අත් පා චලිතනොකෙලෙමි. කිමෙක් දෝහොයි මට අත්පා වසඟවෙද්දැ'සි වමතින් දකුණතත් දකුණතින් වමතත් දැනින් දෙපයත් මිරිකා නැනීසිවීමි"සි සිතූසේක. එසේසිත්ම හා සමග වාහු පිරූ සම්පය්‍යඤ්ඤසේ පොළොව උඩනැගී රථයාගේ පසුකෙළවර ශ්‍රීපාදය බිමතබනතැන් සම වසිවියේය උන්වහන්සේ රථයෙන් බැස ඇතමෑත කිපවාරයක් සන්තන්නොට' දවස යොදුන් සියයක් යන්ට පැ සවි ඇත. ඉදින් මේ රථාචාර්යයාහා සමග විරුඩවීම්නම් ඔහු මැඩපවත්වන්ට මට අතසවිඇද්දැ යි පරීක්ෂාකරණසේක් පැවියන්ගේ ක්‍රීඩා යානාවක්මෙන් රථයෙන් එක්කෙළවරක්ගෙන උසුවාසිට 'අත බලඇතැ'සි දැන වැඩසිටි බෝසතාණන්වහන්සේ 'වස්ත්‍රාභරණයෙන් සැරහුනොම්නම් යෙහෙකැ'සි යන සිත්උපන එකෙණහි ශක්‍රයාගේ පාණ්ඩුකම්බල ශෛලාසනය උණුවිය. ශක්‍රතෙමේ තෙමිය කුමාරයන්ගේ මනොරථය අද මසතක ප්‍රාප්තවිය. වස්ත්‍රාභරණයෙන් සැරහෙමි'සි සිත උපන. ඕහට මනුෂ්‍ය වස්ත්‍රාභරණයෙන් ප්‍රයොජන කිම්ද දිව්‍යවස්ත්‍ර දිව්‍යාභරණයෙන් සරහවයි කියා විශ්වකර්මී දිව්‍යපුත්‍රයා එවීය. ඒ අවිත් දසදහසක් දිවසඵවෙන්ද දිව්‍යාභරණයෙන්ද මනුෂ්‍යාභරණයෙන්ද මහබෝසතාණන් වහන්සේ ශක්‍ර දෙවෙන්ද්‍රයා

මෙන් සැරහිය. එසේ සැරහුනාවූ බෝසතාණන් වහන්සේ ඒරථාචාර්‍යයා වළ කණනතැනට ගොස් වළඉවුරේ වැඩසිට,

ඝින්නුසන්තරමාතෙනාව කාසුංඛණසිසාරථී
පුච්ඡතොමෙසම්මඅක්ඛාහි කාසුයාකිංකරිස්සසි

"එම්බා රථාචාර්‍යය! යුහුසුලුව මේවල කුමට කණන්නෙහිද? එම්බා රථාචාර්‍යය මා විචාරණලද්දාවූ වචනය නෝ මට නොවලහා කියාලව මේවලින් කවර ප්‍රයෝජනයක් සිඛකරන් නෙහිදැ"සි විචාර වදුළසේක. ඒරථාචාර්‍යතෙම එබස් අසා උඩනොබලාම වළකණන්නේය

රඤ්ඤොඉමඤ්චපඤ්හංච පුච්ඡතා ජානතොඅවෙතසෝ
සොම්හිරඤ්ඤාසමජ්ඣම්හි මූළ්හොපුත්තනමෙමනිඛණංවතෙ.

යනමේ ගාථාවෙන් 'එම්බා පුරුෂය අපගේ රජ්ජුරුවන්වහන්සේට ගොඑබිහිරි පිළුවූ සිත්නැත්තාවූ පුතෙක් උපන එබැවින් මාගේ පුත්‍රයා වනාන්තරයෙහි වලක්කැණ එහි වලලා එව'සි කියා 'රජ්ජුරුවන්වහන්සේ විසින් අනුදන්නාලද්දෙමි. ඒනිසා මේවල කණන්නෙමි'සි කිය. එසේනි රථාචාර්‍යයාට බෝසතාණන්වහන්සේ

නඛ්ඩිරෙනමූලොස්මිං නපඤ්ඤානපිපඬ්ඩුලෝ
අධම්මංසාරථිකසිරා මවෙත්වංනිඛණංවතෙ.

යනාදී ගාථාවෙන් 'එම්බා රථාචාර්‍යය! බිහිරිවූයේමුත් නොවෙමි, ගොළුවූයේමුත් නොවෙමි. පිළුවූයේමුත් නොවෙමි. එසේ ගොළු බිහිරි නොර පිළිනොවන්නාවූ මා වෙනෙහි වල ගසා වළලන්නෙහිවීනම් එසේකරන්නාවූ රථාචාර්‍යය! නෝ අධර්‍මයක් කරන්නේවේදැ'සි වදුළසේක. ඒ රථාචාර්‍යතෙම බෝසතාණන් දිශාවබලා 'නුඹවහන්සේ ඒක් ගණ්ඩිපෙක්ද නොහොත් ශක්‍රදෙවෙන්ද වනසේක්ද කවරක්හුගේ පුත්‍රවනසේක්ද අපි කෙසේදැනගනුමෝදැ'සි විචාර මහබෝසතාණන් වහන්සේ විසින් 'නෝ යමක්හුණිසා ජීවත්වන්නෙහිද මම ඒ කාසිරජ්ජුරුවන්ගේ පුත්‍රවෙමි'සි වදුර

යස්සරුක්ඛස්සජායායනිසීදෙය්‍යසයෙය්‍යවා
තස්සසාඛංඔලුජෙය්‍යමිත්තාදුබ්භිහිපාපකො.

යනමේ ගාථාවෙන් "එම්බා රථාචාර්‍යය යම් පුරුෂයෙක් යම් රුක්සෙවනෙහ සැතපී උන්නේහෝවේද, හාත්තේ හෝවේද ඒපුරුෂතෙම ඒ රුකින් සාඛාවක් පමණවත් කැඩුයේවී

නම් ඒ ලාමක පුරුෂතෙමේ මිත්‍රද්‍රෝහිනම් වන්නේය'යි කියනලද එසේකල කසීරජ්ජුරුවන්ගේ රජ්ජුරුවන්ගේ වෘත්තියෙන් ජීවත්වූ තෝ රජ්ජුරුවන්ගේ ඔරස පුත්‍රවූ මා වෙනෙහි වළලුවේවීනම් නවරඟයකින් තෝ මිත්‍රද්‍රෝහියොවන්නොහිදයනාදීන් අමිත්‍රගුණය දක්වා,

පත්‍රුතහඤ්ඤාභවතිච්චිපවුච්චෝසකාඟර
බහුනංඋපජීවන්තියොමිත්තානංනදූභති.

යනාදි ගාථා දසයකින් ඒවනාහතරයෙහි දෙවියන් සාධුකාර දෙවමින් තමන්වහන්සේගේ අතිමධුරවූ වචනයෙන් වහලැහැබ එකනින්නාදකොට මෛත්‍රිඅනුසස් කථාවෙන් ධර්මදේශනාකොට වදාළසේක. ඒඅසා සුනන්දනම් රථාචාරිතෙම රථය සමීපයටගොස් බෝසතාණන්වූත් ආභරණ පොදියත් නොදැක බෝසතාණන් සමීපයට අවුත් 'මොවුන්වහන්සේ තෙමියකුමා රයන්වහන්සේය'යි දැන

එහිතංපවිනෙත්වාමිරජ්ජුත්තාසකංඝරං
රජ්ජංකාරෙහිභද්දන්තෙනානිංඅරඤ්ඤෙකරිස්සති.

යනමේ ගාථාවෙන් එම්බා රජපුත්‍රයාණන්වහන්ස නුඹවහන්සේට මතුවැඩෙක්සිඛවේවයි මාහා කැටුව වැඩිය මැනවැයි නුඹවහන්සේ රජගෙටම කැඳවාගෙනයෙමියි මේ ජනශූන්‍යවූ වනාන්තරයෙහි වැඩහිඳ කවරවැඩක් සිඛනරණසේක්ද කයි දෙශයට එකාතපත්‍රව රජ්ජය කළමැනවැ'යි කියේය. එසේ යාච්ඤාකොට කිවාවූ රථාචාර්‍යයාට

අලංමෙමතෙනාරජ්ජනාඤ්ඤතෙනාඛනෙනවා
යමෙමඅධම්මචරියාය රජ්ජංලබ්භෙථසාරථී.

"එම්බා රථාචාර්‍ය! යම්හෙයකින් මතු ප්‍රාණඝාත අදත්තාදානාදිවූ අකුශල්සිඛවීමට කාරණවූ රාජ්ජයලැබේද ඒ රාජ්ජයෙන්ද මවුපියන් ආදිවූ නැයන්ගෙන්ද මුනතා මාණික්‍යාදිවූ වස්තුවෙන්ද මට ප්‍රයෝජනනැත. මම පැවිදිවෙනු කැමැත්තෙමියි වදාළසේක. ඒඅසා සුනන්දනම් රථාචාර්‍යතෙම මේ තෙමිය කුමාරයන්වහන්සේ මෙබඳු රාජ්‍ය ඓශ්වර්‍යය කුණපයන්මෙන්ද තමන්වහන්සේ ඉටාගත් අධිඥානයනොහැර පැවිදිවනනිසා වනාන්තරයට වැඩිසේක. මට මේදුඃඛ ජීවිකාවෙන් ප්‍රයෝජනකින්ද මමත් මහණවෙමියි සිතා.

අහම්පිපබ්බජිස්සාමිරජ්ජුත්තානවත්තිකෙ
අවඤ්ඤස්සුමංභද්දන්තෙපබ්බජ්ජාමම්අරුඛති.

යනාමේ ගාථායෙන් පැවිදි ඉල්වීය. එසේ කිවාවූ රථාචාරියාට,

රථංනීයන්තයිත්වාන අණ්ඩොහොහි සාරථී
අණ්ණාසසඟ්ඝපඛිජ්ජා එවංඉසිහිවණ්ණිතං.

යනාමේ ගාථායෙන් රථය ගෙනගොස් පාවාදී නසින් මිදී ඒ නාය නැත්කාවූ පුරුෂයාගේම බුබාදී මහොත්තමයන් විසින් පැවිදි පසස්නාලදැයි වදුරා ඒ රථයදී රථාචාරියා නුවරට ගමන් කරවා තමන්වහන්සේ පැවිදිවීම කැමතිවූ සේක. ඒ දැක ශක්‍රදෙවෙන්ද්‍රතෙම විශ්වකර්ම්ම දිව්‍යපුත්‍රයා එවීය. ඒ අවුත් යොත්නක් දිගපුළුල ඇති වනාන්තරයෙක පන්සැලක් කොට මවා රාත්‍රිස්ථාන දිවාස්ථාන පුෂ්කරණී ආදීන්හා එලවෘක්ෂයෙන් සදා සියලු නවුස්පිරිකර මවාහියේය. බෝසතාණන් වහන්සේ ඒ දැක මහණවූසේක. ඝිය රථාචාර්‍යයීයාද රජ්ජුරුවන් හා බිසවුන්ටකියා නුවර වැස්සන්ට හා රටවැස්සන්ටද කියා චතුරඞ්ගිනී සෙනාව පිරිවැරූ රජ්ජුරුවන් හා බිසවුන් කැඳවාගෙන ආයේය, එසේ ආවාවූ රජතෙම බෝසතාණන් වහන්සේ දැක බරණැස්නුවර රාජ්‍ය කිරීමට ආරධනා කරණුයේ

ඉච්චාචදහරෙචාසි පඨමුප්පත්තිකොසුසු
රජ්ජංකාරෙහිභද්දන්තෙ කිංඅරඤ්ඤකරිස්සසි.

"එම්බා තෙමිය කුමාරයන්වහන්ස නුඹවහන්සේට වැඩෙක් වේවයි නුඹවහන්සේ නව යෞවනයෙහි පිහිටිසේක තව ප්‍රථම වයස ඉක්ම නොනියේය. ඉතා තරුණසේක නුඹවහන්සේ මේ ඡනශූන්‍යවූ වනාන්තරයෙහි වැස කවරනම් වැඩක් සිඛාරණසේක්ද බරණැස්නුවරට ගොස් රාජ්‍ය කළ මැනවැයි යාච්ඤාකෙළේය, එසේ යාච්ඤාකළාවූ පියමහරජ හට ධර්ම්ම දේශනාකරන්නාවූ බෝසතාණන්වහන්සේ,

කිංඛනෙහයංජීයෙථ කිංහරියායමරිස්සති
කිංයොඛිනෙනවණ්ණෙන යංජරාඅභිහෙස්සති,

"එම්බා කසිරජ්ජුරුවන් වහන්ස යම් මුතුමැණික් ආදිවූ ධනයෙන්වත් සාලී ව්‍රීහාදී ධාන්‍යයෙන්වත් ඛොටකොසයාදිවූ වස්තු ජාතියෙන්වත් හයස්‍යාශ්වාදිවූ වාහනයෙන්වත් රාජ්‍යවෙරදින්ගෙන් විනාශයට යේද හෙවත් වස්තූන්ගේම ඉන්දදී වස්තුවගේ විනාශයෙන්වත් වස්තුතිබැදී වස්තූන්ගේම විනාශයෙන්වත් වස්තුසෙවීමෙන්වත් ලොවපෙණේද සොකපරිදේවාදිවූ දුඃඛයට කාරණවූ ඒ වස්තුවෙන් මට කවර ප්‍රයෝජනද ආත්මයසේ මා විසින් පොෂ්‍යයකරණ ලද රූපශ්‍රීසාරවූ යම් සතියක් මා බලබලා සිටියදී නැසෙන්නීද ඇ බලබලා සිටියදී මම

හෝ නැසෙම්ද මෙසේ ප්‍රිය විප්‍රයොගදුඃඛයට කාරණවූ ඉපදීම් නැසීම් දෙක්හි තමාගේ ආදිනවයක් නැත්තාවූ ඒ භාග්‍යවතුන් වහන්සේ ගෙන් මට කවර ප්‍රයෝජනයෙක්ද යම් ප්‍රියමනාපවූ යෞවනයෙක් ජරාව විසින් මඩනා ලැබේද හෙවත් ජරාවට නොපැමිණෙන්නාවූ යෞවනයෙක් නම් නැද්ද ඒ ජරාව විසින් මඩනා ලබන්නාවූ යෞවනයෙන් මට කවර ප්‍රයෝජන යෙක්ද.

තථෙකානඤ්ච කාඛිඩ්ඩා යාරතිකාඛනෙසනා
කිලේමප්පතෙතාහිදුරෙහි රජ්ජුතෙතාස්මිබන්ධනා.

මෙසේ වස්තුවෙනුත් භාග්‍යවතුන් වහන්සේ ගෙනුත් යෞවනයෙනුත් ප්‍රයෝජනයක් නැති මෙලොව උපන්නාවූ මට මේ වස්තුව යහපත මනොඥයයි කියා කවර සන්තොෂයෙක්ද දුකෙළි උයන් කෙළි ආදිවූ ඒ කාමන කෙළියෙන්ද රූපශබ්දාදිවූ පංචවිධකාම ස්වාදයෙහි මට කවර ඇල්මෙක්ද තමාකෙරෙන් වෙන්වන්නාවූ රජචොරුද්වූ බොහෝ දෙනාට සාධාරණවූ දුක් දොම්නස් උපදවන්නාවූ ඒ වස්තුසෙවීමෙන් මට කවර ප්‍රයෝජනයෙක්ද මාගේ සිත්වූ පරිද්දෙන් ඉපදීමත් නැසීමත් නැත්තාවූ අඟු දරුවන්ගෙන් මට කවර ප්‍රයෝජනයෙක්ද මම වනාහි පංචවිධ කාමගොචරයය විෂයකොට පවත්නාවූ තෘෂ්ණයෙන් මිදිනියෙමි හෙවත් ධ්‍යානයෙන් සන්සිඳුවන ලද තෘෂ්ණ ඇත්තෙමි.

සොහංඑවංපජානාමි මඛුමෙනප්පමජ්ජති
අනත්ථකෙනාධිපන්නාසස කාරතිකාඛනෙසනා.

නොයෙක් අසංඛ්‍ය ගණන් කප මුළුල්ලෙහි දැහැගිලාදිවූ සම්භාර පෙරුම්පුරා තමාත් සසරින්මිදී අනුනුත් මුදවන්නාවූ බුදු පසේබුදු මහරහතුන් කෙරෙහි යම් ලජ්ජාවක් කරුණාවක් නැතිව ඒ මහෝත්තමයන්ගේ ජීවිත විනාශයෙහි පමාවන් නැත්තාවූ මරතෙම අපකෙරෙහි පමා නොවන්නේයයි මම විශෙෂයෙන්ම දැනගත්තෙමි මෙසේ කිසි කරුණාවක් නැත්තාවූ මරහු විසින් මඩනාලද්දුවූ මාගේ කවරසම්පත්තියෙහි ඇලීමෙක්ද කවර වස්තු සෙවීමෙක්ද ඒ ධනධාන්‍ය සම්පත්තියෙන් මට කවර ප්‍රයෝජනයෙක් ඇත්තේද.

එලානමිවපක්කානං නිච්චංපපතතොභයං
එවංජාතානමච්චානං නිච්චංමරණතොභයං.

එම්බා කසිරජ්ජුරුවන්වහන්ස තල් පොල් අඹ දඹ වැල වරකාදිවූ ඵලයෝ පැසී මදක් තුවටුයෙන් ගිලිහි ලිහිල්ව සිටියාහු දැන් දැන් වැටෙති කියා වැටීමෙන් භයකට යුතුවෙද්ද නොවැටෙති ස්ථිරදෙයකැයි කියා සලකාගතයුත්තෝ නොවෙද්ද

එපරිද්දෙන්ම මවුතුමා උපන් කලල අවස්ථාවෙහි පටන් ලොකා වාසී සත්ත්වතෙම ජරාවෙන් මිරිකී ලිහිල්වූයෙන්ම එහැන්පටන් අදය සෙටය සවසය උදැසනය පෙරවරුය පස්වරුය ඉඳිනාතැනය සිවිනා තැනය පය ඔසවන තැනය පය තිබන තැනය යන්නාදිවූ ඇමතැන්හිම මරණයෙන් භය කටයුත්තේය ඒ එසේ මය.

සායමෙකෙ නදිස්සන්ති පාතොදිඨාබහුජ්ජනා
පාතොචෙකෙ නදිස්සන්ති සායංදිඨාබහුජ්ජනා.

එම්බා කසිරජ්ජුරුවන් වහන්ස උදයකාලයෙහි දක්නා ලද බොහෝජනයා අතුරෙන් සමහර කෙනෙක් මරණින් මැකුණු හෙයින් සවස නොපෙණෙන්නාහ. සවස දුටුවාවූ බොහෝ ජනයා කෙරෙන් සමහර කෙනෙක් රාත්‍රියෙහි පැමිණි මරණයෙන් මැකුණු හෙයින් උදැසන නොපෙණෙන්නාහු වෙති.

අජ්ජෙවකිඩංආතප්පං කොජඤ්ඤමරණංසුවෙ
නහිනොසංගරන්තෙන මහාසෙනෙන මච්චුනා.

එබැවින් එම්බා කසිරජ්ජුරුවන් වහන්ස කුසලයට අද අද මයයි වියත්කටයුත්තේය. හෙවත් සවස් වන්නාට පළමුවෙන් උදැසනම පින්කමට වියත්කටයුත්තේය. ඒ කවර හෙයකින්ද යත් අද මරණය නැත සෙට මියන්නේයයි තෝරා කියනකෙනෙකුත් ලොව නැත්තාහුය. ඒ තමා දැනගන්ට සුදුසුවූ හස්තපාදාදියෙහි සලකුණකුත් නැත්තේය එසේ නැතව තිබැදී ඒමරණවෙලා දැනගන්ට සුදුසු සඤ්ඤකෙනෙක් නම් ලොවකවරේද? තවද පස්විසි මහාභයක. දෙතිස් කම්කටුල් ලක අටානූවක් රෝගය නවානූවක් වැඩියයි කියනලද මහ සෙනඟක්ඇති සියලු සත්වයන් මැරීමෙහි දක්ෂවූ කරුණවක් නැත්තාවූ ඒමරහු හාසමග මාස සංවත්සරාදියෙන් ඇපකොට ගත්තාවූ සංකෙතයෙක් ඇපයෙක් නැත්තේය. ඒ නිසාත් සෙට මරණවෙයි සලකාගන්ට සුදුසු කාරණයෙන් නැත්තේය. එබැවින් කටයුතු හැඟී මොළඟ ප්‍රතිලාභයට කාරණවූ කුසලයට වියත් කාලක්ෂේපනොකොට අදඅදම කටයුත්තේය.

චොරබනස්ස පත්තෙන්තිරජම්මූත්‍යොස්මි බන්ධනා
එහිරජනිවත්තස්සුනාහං රජ්ජන මත්ථිකො

එම්බා කසිරජ්ජුරුවන් වහන්ස වසතුකැමතිව ජීවිත විනාශය නොතකන්නාවූ සොරහු වසතුවම පතන්නාහුවෙති, මම චනාහි බන්ධනාගාරයෙහි බන්ධනයෙන් මිදුනෙමි.

"එම්බා කසිරජ්ජුරුවන් වහන්ස! මේසේ වැඩිය මැනව නුඹවහන්සේත් ඒධනද්‍රාදීනායෙන් නැවතුනමැනව. හෙව ත් නුඹවහන්සේත් රජ්‍යසම්පත්තිය හැර අවුත් ඔබසමීපයෙහි වාසයකළමැනව. මම වනාහි නරකොත්පත්තියට කාරණවූ ඒ රජ්ජ්‍යසම්පත්තියෙන් ප්‍රයෝජනයක් නැත්තෙමි"යි වදාළ සේක.

මෙසේ වදාළාවූ මහබෝසතාණන්වහන්සේගේ ධර්මදෙශ නාව අසා කසිමහරජ්ජුරුවෝද චඤ්ඩාදෙවී ප්‍රධානකොට ඇති සොළොස්දහසක් අන්තඃපුර සඳහුද සියලු අමාත්‍යයෝද පැවිදි වන්නා කැමතිවූවාහුය. ඒකසිරජතෙම මාගේ පුත්‍රයාගේ සමීප යෙහි පැවිදිවෙනු කැමතිනෙහෙයක් පැවිදිවෙත්වයි කියා නුවර බෙරලැවිය. මෙසේ සියලු රන් රුවන් ගබඩා දොර හරවා අස වල් අසවල්තැන මහත්ණ්ඩාන තබනලද. ඉක් ඒ කැටතිකෙ නෙක් ඇරගනිත්වයි කියා රන්පොත ලියවා මතුමහලේ ටැඹෙ ක බැඳවිය. නුවරවැස්සෝද අතුළුවනම් තිබූ සල්ලිල්ද පිරු ණුවනම තිබූ ගෙවිල්ද හැර රජ්ජුරුවන්ගේ සම්පයට ආවා හුය රජ ඒසියල්ලවුන් සමග බෝසතාණන් සමීපයට ගොස් මහණවිය. ශක්‍රයාවිසින් මවනලද සතරගවු දිගපළුල ඇති ආශ්‍රමපදය පිරුණේය. මෙසේ රටතුනක රජදරුවෝද තමන් තමන්ගේ රජ්‍යසම්පත්තිය දමා අවුත් බොධිසත්වයන් සමීපයෙ හි මහණවූවාහුය. ඒ සියල්ලෝම ධ්‍යානඋපදවා බ්‍රහ්මලොක යෙහි උපන්නෝය, තිරශ්චීනගතවූ ඇත්අස් ආදිහුද තාපස වරුන්කෙරෙහි සිත් පහදවා දිව්‍යලොකයෙහි උපන්නාහුය. මෙසේ ඒ බොධිසත්වයන්වහන්සේ විදි අපාය දුඃඛයට හසින්ද දසසාවුරුද්දක් මහාවියහිකොට තමනුත් තමන්වහන්සේගේ මවුපිය දෙදෙනා ඇතුළුවූ නොයෙක් ලක්ෂගණන් මනුෂ්‍යයිනු ත් සතර අපායෙන් මුදා සඳිගීසම්පත්තියට පමුණුවා කෙලවර අමාමහනිවන් ලබන්නාවූ වෙනොඇ ජනයන්ට ඇතුළත්කෙ ට වදාළසේක්ද එමෙන් දැනුත් සබ්බඤ්ඤුතඥාණ සතර අපායට පැමිණ විඳිනාවූ අපාය දුඃඛය හා ජාතිජරා මරණාදිවූ සංසාර දුඃඛයද තත්වූ පරිද්දෙන් දැන ඉන් මිදෙනු කැමැත්තාවූ රජ රජමහාමාත්‍යාදිවූ යම්ප්‍රධාන පුරුෂකෙනෙක් තමනුත් ශ්‍රද්ධා බුද්ධියෙහි පිහිටා ලොව ඇත්තනුත් ශ්‍රද්ධාඅඟුණෙහි පිහිටුවම් හයි සිතුනම් එසේ සිතන්නාවූ ඔහෝතනමයන්ටත් උන්ගේ වචනයෙහි පිහටා දන් පින් කරන්නාවූ ලොක වාසීන්ටත් සදි ව්‍ය ලොකයෙහි දිව්‍යසම්පත්තිය හා කෙලවර අමාමහනිවන් සම්පත්තිය සිඳවනාහෙයිනුත් එසේ පවත්නාවූ පුරුෂ කෙනෙ

ක් ඇත්නම් අසවල් රජ්ජුරුවෝ මෙසේ පැවැත්තෝය. අසව ල් අමාත්‍යයාණෝ මෙසේ පැවැත්තෝය. අපිත් එපරිද්දෙන් පවතුම්හයි කියා මතු පින්කිරීමෙහි පවත්නා කෙනෙක් ඇත් නම් ඔවුන්ගේ පැවැත්ම නිසාත් පින්කිරීමට ඇදුරුකමක්ව සිටියාවූ මෙකියන මහොතතාමයන්ට පත් සිඛවන හෙයින් එම්බාසත්පුරුෂයෙනි මේනිවාවූ බොධිසත්වචර්තය සිතින්සිතා ගෙන එසේපැවතීමෙන් තමාටත් ලොකවාසින්ටත් කුසල් සිඛ වන පරිද්දෙන් නිරන්තරයෙන් අප්‍රමාදව වියයුතුතේය.

පූරෙත්වා පාරමිසඛ්ඛා පත්වාසම්බොධිමුත්තමං
ඛොධෙය්‍යංසඛ්බසත්තානංචතුසඩංසුණාමඛලං.

අ ව වා ද ප රි වේ ජ ද ය
නිමි.

දානපරිවෙජදය.

නමොතස්ස භගවතො අරහතො
සම්මාසම්බුද්ධස්ස

වන්දෙ සුගතගුණංබුධං බුධං බුඛෙනිසිඛිජං
ධම්මංසඛම්ම සම්භූතංගණංචවිහතඛගණං.

මෙසේ ධම්ශ්‍රවණපරිවෙජදයෙන් ලෝවැඩ දක්වා දශපුණ්‍යක්‍රියාවන්ට හා දශපාරමි ධර්මයන්ට ආදිකොට දක්වූගෙයින්ද සතර සංග්‍රහවස්තූන්ට මුල්කොට දක්වූ හෙයින්ද පළමු කොට දානසංවිභාගය දක්වම්හ. ඒමෙසේ දානයුත්තේය.

දන්දීමනම් ධර්මදානය ආමිසදානයයි නියා විප්‍රකාරවන්නේ ය. එහි බුදුන් විසින් වදාළ පිටකත්‍රයෙන් එක ගාථාවක්වත් පුහුණුකොට මෙයින් මොවුන් සසරදුකින් මුදමි යන කරුණාවෙන් ලාභාපෙක්ෂාහොව අනුන්ට බණකීම ධර්මදාන වන්නේ ය. භික්ෂූන්ට දියයුතු චීවර පිණ්ඩපාතාදිවූ ප්‍රත්‍යයද කථික පථික පොරාණිකාදිවූ යාචකයන්ට දියයුතුවූ ධනධාන්‍ය හෝ මහිෂවසභාහරණාදියද ආමිස දානයනම් වන්නේය. ඒවිප්‍රකාරවූ දානයන් අතුරෙන් ධර්මදානයම ලොවඋතුම්වන්නේය.

එමේකථාවෙන් අසා දනයුත්තේය.

එක්කලෙක තවුතිසා දිව්‍යලොකයෙහි දෙවියෝ රැස්ව ප්‍රශ්න සතරක් ලොවපහළකාලාහුය. දන්න් කවර දන් උතුම්ද යන එක් ප්‍රශ්නයෙක. රසයෙන් කවර රසයක් උතුම්ද යන එක් ප්‍රශ්නයෙක. රතියෙන් කවර රතියක් උතුම්ද යන එක් ප්‍රශ්නයෙක. සිතඇල්මෙන් කවරෙක සිත ඇලීම උතුම්ද යන එක් ප්‍රශ්නයෙක. මෙ[illegible] ප්‍රශ්න සතරින් එක් ප්‍රශ්නයකුත් ලොව කියන්ට සමර්ථවූ දේවතාවෙක් නුවූයේය. සියලුදෙවියෝ ම ඔවුනොවුන් විචාරා නිශ්චාවක් නැතිව දසදහසක් සක්වල දෙවියන් හා එක්ව දෙලොස් අවුරුද්දක් මුලුල්ලෙහි විචාරා ඇවිදින්නාහුද ප්‍රශ්න විසඳන්නාවූ එකක්හු නොදැක ඒ දස දහසන් සක්වළ දෙවිඟෝ මේමහුල් සක්වලට රැස්ව චරම් රජ දරුවන්ගේ සමීපයටහොස් ඔවුන් විසින් "කුමක්නිසා දෙවියෝ රැස්ව අවුදැ"සි විචාළකල්හි ප්‍රශ්න සතරක් විනිශ්චය

කළහොඟි ආම්හයි නියා ප්‍රශ්න සතර නිවාහුය. ඔහු ඒඅසා අපිත් මේ ප්‍රශ්නයන්ගේ අපි නොදනුම්හ. අපගේ ශක්‍ර දෙවෙ ඳුයෝ වනාහි දහසක්දෙනා සිතූ අපිය කෘණයකින් සිතන්ට සමර්ථයෝය. අපටවඩා ප්‍රඥාවෙනුත් භාග්‍යයෙනුත් විශිෂ්ට යෝය. එව ඔවුන්ගේ සම්පයට යම්හයි දිව්‍යගණයා ගෙන ශක්‍රදෙවෙඳුයන් සම්පයට ගොස් "මේමහත් දිව්‍යසමාගමයෙ ක් කුමක්නිසාවිද" යි විචාලකල්හි තමන් සැලකූ ප්‍රශ්න නිවාහුය එකල්හි ශක්‍රදෙවෙන්ද්‍රතෙම "එම්බා සගයෙනි තුන් කල් දත් සර්ඒශ්වරයන්හැර මේ ප්‍රශ්නයන්ගේ අපිකියන්ට අන් නිසි සත්වයෙකුට නොපිළිවන බුදුවරයන්වම විෂයවන්නේය. එබැවින් එබුදුන් අතින්ම විචාරම්හ. නොපිත් එව" යි ඒදිව්‍ය ගණයා කැඳවාගෙන මධ්‍යම රාත්‍රියෙහි සියළු ජේතවනය හාත් පසින් බබුලුවා අවුත් බුදුන්වැඳ එකත්පස්ව සිටියේය. මහ රජ කුමක්නිසා අසිදැසි බුදුන් විචාළකල්හි "සැවැමිනි භාග්‍ය වත්වූ බුදුරජාණන්වහන්ස මේ දිව්‍යගණයා විසින් ප්‍රශ්නයෝ සතර දෙනෙක් කල්පනාකරණ ලද්දාහුවෙති ඔවුන් තෝර කියන්ට සමර්ථකෙනකුන් නොලැබ නුඹවහන්සේ කරා පැමිණියම්හ. එබැවින් මේ ප්‍රශ්න තෝර වදාළමැනවැ" යි නියා ආරාධනාකෙළේය. ඒඅසා බුදුහු යහපත මහරජ ! මා විසින් දශ පාරමිධර්ම්මයන්පුරා පඤ්ච පරිත්‍යාගයකොට නොප සියල් ලවුන්ගේ සැකදුරුකරණනිසාම සර්ඒඥතාඥානය ප්‍රතිවෙධකර ණලද එබැවින් නොපසිතා ආ ප්‍රශ්න සතරින් "සියලු දනින් කවරදානය උතුම්ද" යි යන ප්‍රශ්නයට ධර්ම්දානය උතුම. 'සිය ලු රසයන්ට උතුම් රසය කවරේද' යි යනහොත් ධර්ම්රසය උතු ම. සියලු රතින්ට ධර්ම්රතිය උතුම. සියලු සසරදුක් නසන හෙයින් තෘෂ්ණාක්ෂය උතුමැයි දක්වන්නාවූ භාග්‍යවත්වූ බුදු රජාණන්වහන්සේ මේ මතුකියන ගාථාවෙන් මේසේ වදාළ සේක.

සබ්බදානං ධම්මදානංජිනාති සබ්බංරසංධම්මරසොජිනාති
සබ්බං රතිංධම්මරතිජිනාති තණ්හක්ඛයොසබ්බදුක්ඛංජිනාති.

එම්බා ශක්‍රදෙවෙන්ද්‍රයානෙනි, චන්ද්‍ර සූර්‍යාදියන්ගේ ආලෝ ක පැතිරෙන්නාවූ මේඝක්වල ඇතුළත බබලොව අවසන්කොට ඇමැතැනම අතුරු නැතිව වැඩඋන්නාවූ බුදු පසේබුදු මහ රහතුන්ට යම් පුරුෂයෙන් කෙහෙල් ගොප වැනිවූ ඉතා සිහින් මොළොක්වූ තුන්සිවුරු දන්දුන්නේද එසේ දන්දී ඔහු ලද්දාවූ කුශල රාශිය එකකු සතර පදයෙන් යුක්තවූ ගාථාවකින් අනු

මෙවේනි බණකියා ලද්දවූ කුශලයාගේ ඵලය සොළොස් භාගයක්කොට ඉන්එක භාගයකුත් අගණන්නොවෙයි එසේ ම සක්වළ ගැබපුරා බබළොව අවසන්කොට වැඩඋන්නාවූ බුදුපසේබුදු මහරහතුන්ට හොඉයක් රසමසවුලෙන් සපයා ලද ප්‍රණීතවූ ආහාරයෙන් පාත්‍රාපුරා දන් දුන්නේවී නමුත් නැවත එසේම වැඩඋන්නාවූ බුදුපසේබුදු මහරහතුන්ට ගිතෙල් සකීරමධූඵාණිතාදිවූ බෙහෙත්බඩු පාත්‍රා පුරා දන් දුන්නේවී නම්ද එසේම බුදු පසේබුදු මහරහතුන්ට අනුරාධපුරයෙහි මහාවිහාරය වැනිවූ නොයෙක් ලක්ෂගණන් විහාරයන්ද ලෝ වාමහාප්‍රාසාදය වැනිවූ ලක්ෂගණන් ප්‍රාසාදයන් කරවා දුන් නේවිනම්ද අනේ පිඬුමහසිටාණන් මෙන් නොයෙක් ලක්ෂ ගණන් වස්තු පරිත්‍යාගකළේවිනම්ද ඒසියල්ලටම වඩා ඒ සතර පදයෙන් යුත්තවූ එක ගාථාවකින් බණකිම ඉතා උතුම්වන් නේය. ඇසිමත් එසේම උතුම්වන්නේය, අනුන්ලවා කියවීම ත් එසේම උතුම් වන්නේය. ඒ කවරහෙයින්දයි යතහොත් මෙබඳු පින්කාරන්නෝ බණඇසූ අයමය. බණනැසූ අය පින් නො කරති. ඉදින් සත්වයෝ බණ නැසුවාහුවිනම් කොණ්ස සක් පමණ කැඳවත් සැන්දක් පමණ බත්වත් අනුන්ට දන් දෙන්නාහු නොවෙති, එබැවින් සියලු දානයට වඩා ධර්ම දාන යම උතුම්වන්නේය. තවද නල්පයක් මුළුල්ලෙහි වට වැස්සෙ හි දියබින්දු ගිණීමට සමර්ථවූ ප්‍රඥාවිශෙෂයක් ඇති දම්සෙනෙ වි සැරියුත් මහතෙරුන්වහන්සේ වැනි මහනුවණැති මහොත් තමයෝ පවා බුදුන්ගේ බණහාසා නිවන් දැක්ක නුහුනුවා හුය. අසසජී මහතෙරුන්වහන්සේ වදුල ගාථා අඩියක් අසා ම සොවාන්වූවාහුය. එබැවින් එම්බා ශක්‍රදෙවෙන්ද්‍රය ධර්ම දානය උතුම්වන්නේය. මෙලොව විද්‍යමානවූ පුෂ්ප රසය, ඵල රසය, ඛණ්ඩරසය ආදියම්ම රස ජාතියෙක් ඇද්ද දෙව්යන් ගේ සුධාභොජනයයි කියනලද යම් භොජන රසයෙක් ඇද් ද ඒසියල්ලම සත්වයන්ගේ තෘෂ්ණාවඩා සසරහෙලා දුන්විදී මට කාරණවන පමණක්මුත් සසරදුකින් ගොඩනැගීමට කා රණ නොවන්නේය,

එබැවින් ඒ සියලු රසයන්ට වඩා සත්තිස් බොධිපාක්ෂික ධර්මසඞ්ඛ්‍යාතවූද ලොකාත්තර මාර්ග සඞ්ඛ්‍යාත ධර්මරසයම සසරදුක් නාසනාහෙයින් උතුම් රසයෙක්නම්වන්නේය. යම් මේ පුතුන්කෙරෙහි ඇල්මෙක, දුන්කෙරෙහි ඇල්මෙක ධනධාන්‍ය යෙහි ඇල්මෙක, වස්ත්‍රාභරණයෙහි ඇල්මෙක, සත්‍රීන් කෙරෙහි ඇල්මෙක, නාවිනාටකාදීන්කෙරෙහි ඇල්මෙක, ගීතවාදිතයෙහි

දාන පරිවෙජ්දය.

නමොතස්ස භගවතෝ අරහතෝ
සම්මා සම්බුද්ධස්ස.

වසෙ බුද්ධගුණං බුද්ධං බුද්ධං බුද්ධ නි සිද්ධියා
ධම්මං සද්ධම්ම සම්භූතං ගණසාව විභත්ථගණං

මෙසේ සබ්බඥගුණ පරිවෙජ්දයෙන් ලෝවැඩ දක්වා දස පුඤ්ඤ ක්‍රියාවන්ට හා අස පාරමී ධර්මයන්ට ආදි කොට දැක්කු හෙයින්ද ස්තර සංග්‍රහ වස්තූන්ට මුල් කොට දැක්කු හෙයින්ද පලමුකොට දාන සංවිභාගය දැක්වම්හ, ඒ මෙසේ දතයුත්තේය.

දන් දීම්හි ධර්‍ම දානය ආමිස දානයයි කියා විප්‍රකාර වන්නේන එහි බුදුන් වදුල පිටකතුයෙන් එක ගාථාවක්වත් ප්‍රගුණ කොට මෙයින් මොවුන් යහර දුකින් මුදම්යි යන කරුණාවෙන් ලාභ උපෙක්ෂා නොව අනුන්ට බණ කීම ධර්‍ම දානයනම් වන්නේය, භික්ෂූන්ට දියයුතු චීවර පිණ්ඩපාතාදිවූ ප්‍රත්‍යයද කාර්ෂික පාර්ෂික පෙතරා ණිකාදිවූ යාවකයන්ට දියයුතු ධන ධාන්‍ය ගවමහිෂ වස්ත්‍රාභරණා දියද ආමිස දානයනම් වන්නේය, ඒ විප්‍රකාරවූ දානයන් අතුරෙන් ධර්‍ම දානයම ලොව උතුම් වන්නේය, ඒ මේ කථාවෙන් අසා දතයුත්තේය.

එක් කලෙක නවිසියා දිව්‍යලෝකයෙහි දෙවියෝරැස්ව ප්‍රශ්න සතරක් ලොව පහල කලානුය, දනින් කවර දන් උතුම්ද යන එක් ප්‍රශ්නයෙක, රසයෙන් කවර රසයක් උතුම්ද යන එක් ප්‍රශ්නයෙක, සිත ඇලීමෙන් කවරෙක සිත ඇලීම් උතුම්ද යන එක් ප්‍රශ්නයෙක, නැළුණාව කෑය සළ නැහැත්තේ කුමක් දිනුවානම් වේද යන එක් ප්‍රශ්නයෙක මේකී ප්‍රශ්න සතරින් එක් ප්‍රශ්නයකුත් ලොව කිසි නුත්ව සමර්ථවූ දෙවතාවෙක් නූසේය ඔයලු දෙවියෝ ඔවුනොවුන් අතින් විමසුවා නිමාවක් නැතිව දසදහසක් සක්වල දිවියන් එක්ව ශුද්ධලොව අනුත්තරදේවයන් මුලුලෙලහි විචාරා ඇවිදිනාහුද පුශ්ණ

විසඳන්නාවූ එකක්හු නොදුක ඒ දසදහසක් සක්වල දෙවියෝ මෙම මහුල්සක්වලම රැස්ව වරම්මහරජදරුවන්ගේ සැමීපයටගොස් ඔවුන් විසින් කුමක්නිසා දෙවියෝ රැස්ව අවුදැයි විචාල කල්හි ප්‍රස්ණ සතරක් විනිශ්චය කලනොහී ආමහයි කියා ප්‍රස්ණ සතර කීවාහුය. ඔහු ඒ අසා අපිත් මේ ප්‍රස්ණයන්ගේ අර්ථ නොදනුම්හ අපගේ ශක්‍රදේවේන්ද්‍රයෝ වනාහි දහසක්දෙනා සිතූ අර්ථය ඤනයකින් සිතාග්ම සම්පෝය අපම වඩා ප්‍රඥාවෙතුත් භාග්‍යයෙනුත් විශිෂ්ටයෝය ඒ ඔවුන්ගේ සැමීපයට යමුයයි දිව්‍ය සමූහයාගෙන ශක්‍රදේවේන්ද්‍රයන්ගේ සවමීපයට ගොය් මේ මහත් දිව්‍යසමූහයා කුමක් නිසා අවිදැයි විචාල කල්හි තමන් සැලකූ ගැලතූ ප්‍රස්ණ කීවාහුය එකල්හි ශක්‍ර දේවේන්ද්‍ර නෙම එම්බා සගයෙනි තුන්කල්දත් සම්බුදුරජාන් හැර මේ ප්‍රස්ණ ඤන්ගේ අර්ථයන්ට අන්කිසි සත්වයෙකුට නොපිලිවණ බුදු වරයන්වම විසයවන්නේය එබැවින් ඒ බුදුන් අතින්ම විචාරමහ. නොපිත් එවයි දිව්‍යගනයා කැඳවාගණ සියලු හාත්පසින් බබුලුවා අවුත්බුදුන්වැඳ එකත්පසෙක සිටියේය. මහරජ කුමක්නිසා අවුදැයි බුදුන් විසින් විචාලකල්හි සැමීනි භාග්‍යවත් බුදුරජානන්වහන්ස මේ දිව්‍යසමූහයා විසින් ප්‍රස්ණ සතරක් විචාරණලදුහුවෙති ඒ ප්‍රස්ණ තෝරා කියන්ට සම්පීකෙණෙකුත් නොලැබ සෙයින් මෙහි ආමහ එබැවින් මේප්‍රස්ණ තෝරා වදුලමැනවයිආරාධනාකලේය ඒ අසාබුදුහු යහපත මහරජ මවිසින්ද ශ්‍රමණබ්‍රාහ්මණයන්පුරා පංචමහාදාන යන් පරිත්‍යාගකොටි තොප සියලුලවුන්ගේ සැකදුරුකරණ නිසාම සම්බුදානුත්තය ප්‍රතිවේධ කරණ ලද බැවින් තොප සිතා ආ ප්‍රස්ණ සතරින් සියලු දනින් උතුම් දානය කවරේදැයි යන ප්‍රස්ණයට ධර්ම දානය උතුම්යැයි සියලු රසයන්ට උතුම් රසය කවරදැයි සතහොත් ධර්මරසය උතුම සියලු රතීන්ට ධර්ම රතිය උතුමැයි සියලු සසරදුක් නසන හෙයින් තෘෂ්ණා ක්ෂය උතුමැයි දක්වන්නාවූ භාග්‍යවත් බුදුරජානන්වහන්සේ මේ මතු කියන ගාථාවෙන් මෙසේ වදුළ සේක.

"සබ්බදානං ධම්මදානං ජිනාති
සබ්බංරසං ධම්මරසෝ ජිනාති,
සබ්බං රතිං ධම්මරති ජිනාති
තණ්හක්ඛයෝ සබ්බදුක්ඛං ජිනාති"

එම්බා ශක්‍රදේවේන්ද්‍රයානනි චක්ෂුස්සුයන්ගේ ආලෝකය පැතිරෙන්නාවූ මේ සක්වල ඇතුලත බඹලොව අවසංකොට ඇති ඇම්තැන අතුරුනොදක්වා වැඩහුන්නාවූ බුදුපසේ බුදු මහරහතුන්ට යම් පුරුෂයෙකු කෙසෙල් ගොප් වැනිවූ ඉතා සිහින්වූ මොලොක්තුන් ගිරිරැදන්දුන්නේවේද එසේ දන්දී ඔහුලද්දවූ කුශලරාශිය එක

සතරපදයකින්යුත් ගාථාවකින් අනුමෙවෙනි ඔත වදුරණ ලදැවූ කුශලයාගේ ඵලය සොළොස් භාගයක්කොට ඉන් එකභාගයකුත් අගනේනොවෙයි. එසේමසක්වලගැබපුරාබඹලොව අවසන්කොටවැඩ උන්නාවූබුදුපසේබුදුමඟරඟතුන්ට ශීතල්මධුසර්කරාදිප්‍රනීතබෙහෙත් බඹුආදියපාත්‍රාපුරා දන්දුන්නේ විහාම්ද එසේම සිදු පසේ බුදු මඟ රඟතන්වඅනුරාධ පුර මහා විහාරයමෙන්ලක්ෂගණන් විහාරයන්ද ලොවාමඟපායවැනි ලක්ෂගණන් ප්‍රාසාදයන්ද කරවාදුන්නේවිනාම්ද දනේපිඹු මහා සිටානන්මෙන් නොයෙක් කෙලගණන් වසතු පරිත්‍යාග කළේවිනම්ද ඒ සියලලවම වඩා එකසතරපදයෙකින් යුක්තවූ එකම ගාථාවකින් බණකීම ඉතා උතුම්වන්නේය, ඇසීමත් එසේම උතුම්වන්නේය. අනුන්ලවා කියවීමත් එසේමඋතුම්වන්නේය ඒ කවරහෙයින්ද යතහොත් මෙබඳු පින්කරන්නෝ බණඇසූ අයමය බණනැසූ අය පින්නොකරති, ඉදින් සම්‍යක් බණනැසුවාහුවිනම් කොතෙකසක් පමණ කැඳවත් සැකැස්පමණඛත්වත් අනුන්ට දන්දෙන්නාහු නොවෙති එබැවින් සියඵදනයට ධම්දනය උතුම්වන්නේය තවද කල්පයක් මුළුලෙලඟි වවැසෙසඟි දියබිඳු ගිනීමට සමර්ථවූ ප්‍රඥාවිශෙසයක් ඇති දම්සෙනෙ විසරියුත් මහා තෙරුන්වහන්සේවැ නිමඟාහුවනැති මඟොනතවමයෝ පවා බුදුන්ගේ බණකාසානිවන්දුකනුහුනුවාය අසසජිමහාතෙරුන්වහන්සෙ වදල ගාථාවක් අසාමසොවන්වූවාහුය, එමබාශක්‍රදේවේන්‍දුය ධම්දනයම සියඵ දුනයවිම උතුම්වන්නේය. මෙලොව විද්‍යමානවූ පුෂ්පරසය ඵලරසය කඳරසය ආදි යම්රස ජාතියෙක් ඇද්ද දෙවියන්ගේ ඝෘතා හොජනයහි කියනලද යම් හොජන රසයෙක් ඇද්ද ඒ සියලලම සත්වයන්ගේ තිෂණාව වඩා සසරඵලා දුක්වැදීමට කාරනා පමණක් මුත් සසරදුකින් මගාඩනැගීමට කාරනා නොවන්නේය. එබැවින් සියලු රසයන්ට වඩා සතතීස්බොධිපාක්ෂික ධම්සංඛ්‍යාතවූද ලෝකොතතර මාගීසංඛ්‍යාත ධම්රසයම සසරදුක් නසන හෙයින් උතුම් රස යෙක් නම් වන්නේය. යම්මම්පුතුන් කෙරෙහි ඇල්මෙක දුන්කෙරෙහි ඇල්මෙක ධන ධාන්‍යයෙහි ඇල්මෙක වස්ත්‍රාභරණයෙහි ඇල්මෙක සත්ත්‍රින් කෙරෙහි ඇල්මෙක නළුකාවකාදියෙහි ඇල්මෙක ශිල්පාදින යෙහි ඇල්මෙක යන මේරතී කෙනෙක් ඇද්ද ඒ සියලලෝම සසර නොයෙක් දුක්විඳීමට කාරණාවෙති එබැවින් ඒ ඕයඵ රත්නවට වඩා ඛණඅසන අයව හෝ කියනඅයව හෝ උපදනා යම් ප්‍රීතියෙක් ඇද්ද සතුටුකඳුළු උපදවා ඇඟලොමුදහැකරවාද ඒ ප්‍රීතිය කියනලද ධම් රතියම සසරදුකින් මුදා නිවන්දක්වන උතුම් රතියෙක් නම් වන්නේය. තිෂණොෂයහි කියනලද අඟින් ඵලය වනාහි සියඵ සංසාර දුක්ඛය නසනහෙයින් උතුම් වන්නේයයි මෙසේ මේ ගාථාවට බුදුන්

අපි වදුලතාල්නි සුවාසුදහස්ත් ප්‍රාතිහාර්ය අවබෝධනිවත් දුටුවාහුය. ශක්‍රදෙවෙක්‍රතෙම බුදුන්ව වැඳ සවාමීනි භාග්‍යවතුන්වහන්ස මෙබඳු උත්කෘෂ්ටවූ ධර්මදානයෙනි භික්ෂූන්වහන්සේ සාවරහෙයකින් අපට පින්පෙත් නොදෙනසේක්ද මෙහැන්පටින් සංඥාවහන්සේට වඳුරා අපව පින්දෙවා පිදුලමැනවැයි කියා යාඥාකෙළේය,

බුදුහු ඔහුගේ බස්අසා සංඝයන්හිනිපාතකරවා මහසොනි අදපටන් මහත් බණඇසීමෙකිද ප්‍රියවි බණඇසීමෙකිද ධර්මධාරණයෙකිද යටත් පිරිසයගින් අනුමෙවෙනි බනෙකිද සිඟළු සඟිගන්ට පින්පෙත් දෙයි වදුලසේක, එබඳා සත්පුරුෂයෙනි ධර්මදානය නම් බුබොරුන්පාද යෙහිමුත් අන්කලෙඤ සඬනොවන්නාවූ හෙයින් දුර්භාග්‍යන්ගේ අවිඥන් කොට මහත්භවභොග සම්පත් සිඛකරන්නාවූ උත්කෘෂ්ටවූ දානමයක විවර පිණ්ඩපාතාදි ප්‍රත්‍යයදානය වනාහි අධර්මයෙන් උපදවාගෙන් දෙයාවෙක් වීනම් විපාක මහත් නොවන්නේය, මේ ධර්මදානය වනාහි ලොවුතුරා බුදුන්ගේ ශ්‍රීමුඛයෙන් පහළවූ උත්කෘෂ්ටවූ පිවිතුරු ධර්මයන්ගේම දේශනාවක් හෙයින් චඤ්චුද්‍රඛීන ඇදුනැඳුයි පරීක්ෂා කළයුතු නොවන්නේය නැවත ආමිසදානය ගිල්වතුන්ට දුන්නාම මහත් විපාක වන්නේය. මේ ධර්මදානය වනාහි ගිල්වතුන්ට දුන් නත් දුසැසිලයන්ට දුන්නත් මහත් විපාකවන්නේය, ආමිසදානය දෙන අයවනාහි චඤ්චුවෙහිලොහයහැර නිරාලයවදෙන්ට නොහැකිවූනාම් මහත්විපාක ඵලදනොහෙනනාහුය මේ ධර්මදානයවනාහි එබඳු ලොහකටයුතු වඤ්චුවක් නොවනහෙයින් විපාක මහත්වන්නේමය. ආමිසදානය දුන්නාවූ ජනයෝ යම්කලෙක දිලිඳුවුන්නම් අපට දන්දුන්නිසායෙහි පඤ්චාත්තාප උපදවන්නාවූ දානයෙක්නොවෙති. මේ ධර්මදානයවනාහි එබඳු ලොහකටයුතු වස්තුවක් නොවනකලි එසේ දිලිඳුවන්නාවූ පශ්චාත්තාප උපදවන්නාවූ දානයෙක්නොවෙති. තවද ආමිසදානය නම්දුන්නාවූ දානවස්තුව තමාකෙරෙහිනැතිහෙයින් නැවතාගැනීම වස්තුසපයා දියයුතුවන්නේය. මේ ධර්මදානයවූකලි එකනාඑව ලඤ්ඡකටිකීවත් යඤ්ඤ නොවනහෙයින් අඤ්ඤදානනම් වන්නේය. තවද ප්‍රත්‍යයදානනම් සියළු සම්දරනවූ ලොව සියලුලවුන් දෙන්නාවූ දානයක මේ සඬම්යවූකලි සාරාසංඛ්‍ය කල්පලඤ්ඡයක් ඉස් ඇස් මස් දන්දී දසපාරමිතාවන්ප්‍රා සියළුකෙලෙසුන්නසා බුදුන්විසිනම් සිඬකොට ගත්තාවූ දානඝත්තෙයින් අසාධාරණවූ දානයෙක තවද ප්‍රත්‍යයදානයනම් දුන්අයම පින්පිරෙණ පමනක්මුත් ලත්අයට පින්පිරෙන්නාවූ දානයෙක් නොවෙයි මේ ධර්මදානයවනාහි දුන් අයට දෙශනාමය කුශලයත්ලත් අයට ශ්‍රවනමය කුසලයත් සිඬ කරණගෙයින් උත්කෘෂ්ට දානයක තවද ප්‍රත්‍යයදානයනම් නිවන් නොපැතුකෙනෙකුන්ට භවභොග සම්පත් පමනක්මුත් නිවන්

සිඹනොකරන්නේය. මේ ධම්දුනයවනාහි පැතුවත් නොපැතුවත් නිවන් උදෙසා කරණ දෙසනාවක් , හෙයින් නිවන් සිඹකරන්නේය. තවද ප්‍රත්‍යදුනය නම් පින්පල අ හා නොදෙනනාහට සුනවිප්‍රයුක්තවනහෙයින් උත්ක්‍රිෂ්ට කුසලයයි සිඹ කරනෙනාය ධම්දුනයවූනලි සුනවිප්‍රයුක්තවූවහොත් බණකිමක් නැතිහෙයින් ත්‍රිහෙතුකවූ උත්කෘෂ්ට කුශලය සිඹකරන්නේය, තවද ආමිසදුනයනම් එකාවර්ජිත චිත්‍රියකින් සිඹවන්නාවූ කායික ක්‍රියාවකින් හා දෙම්දිම්මියනාදි වචනයෙන් සිඹකරන්නාවූ සවල්ප චිත්තවාරයකින් සිඹිවහන්නාවූ කුශලයෙක, ධම්දුනයවූකලි බණකියා නිමවනතෙක් අප්‍රමානවූ චිත්තවාරයෙන් අප්‍රමානවූ වෙතනාවෙන් සිඹකටයුතු හෙයින් අප්‍රමාන කුශලයෙක, තවද ආමිසදුනයනම් දෙන අතවත් දන් ලබනඅයවත් එම ජාතියෙහිම නිවන් සිඹකරන්නාවූ කුශලයෙක් නොවෙයි, මේ ධම්දුනයවූකලි නාග සේන යථවිරයන්වහන්සේ එක් උපාසිකාකෙනෙකුන්ට කළ ධම් දෙසනාවෙන් තම්මුත්වහන්සේත් සෝවාන්ව උපාසිකාවනුත් සෝවාන්වූ හෙයින් එම ජාතියෙහිම නිවන් සිඹකරන්නාවූ කුශල යෙක, ප්‍රත්‍යදුනයනම් නොවේ දුනමයවූ එකම කුශලයෙක් වන් නේය, ධම්දුනයවූකලි බණකියා සමාරකරණතෙක් බණකියන අයගේද අසා යමාරකරණතෙක් අසන අයගේද සිතඑකඟ වස යෙන් කෙලෙසුන් දුරුකෙරෙව යවන්නා භාවනාමය කුශලයකුත් සිඹකරගනියි, මේ මෙසේ උත්කෘෂ්ටවූ මේ ධම්දුනයට එබඳු සත්පුරුෂයෙන් මා දන්නේ සඩිලපදෙයෙක, ඒ කෙසේ කියන්දයි ආලින්ඩංගොව් ආහාරාදින්ගේ අලාභයෙන් ශරීරයදුබ්ලිය කෙසේ කියනදයි කුසීතනොවී මේ ධම්යකියා යමක් ලැබනනිමිසි සිත ලොභනුපදවා මින් ප්‍රසංසාවක් අසමින් ප්‍රසංසාවක් අසමිසිසිතෙම් මානයක් නුපදවා මේ කියමන් අභිභවනය කෙරෙම් සිතෙම් වෙයයකුත් නුපදවා මේ නැඹුරු බණ මුන්ට කියන්නේඇතිදයි සිතෙයි මාසවය්‍යිනුපදවා එසේ මේ කියමන් උත්ක්‍රිෂ්ට කුශලය නොනසා නමාත් අනුන්විසියා අනුන්ලවාත් කියවා බණ කියන අයට ඇ උපයෝගවසිට නමානියා ජීවත්වන අඹුදරුවෝ දැයි දැක්කමිකරුවෝද යන අයවත් තමාගේ සකහිපමිනින් බණ කියවා ඔවුන් සම්පතෙන යොදු සසරදුකින් මිදී නිවන්දක්නා ලෙස උත්සාහ කටියුත්තේය,

ධම්දුනය නම් මෙසේ මහත්විපාක ඇත්තේයයි

ඇසුවාවූ දුටුගැමුනු මහරජාතනා,

ධම්මදානං මහග්ඝතීති සුත්වා ආමිස දානතො
ලොහපාසාදකෙ ගෙහෙ සංඝමජ්ඣම්හි ආහරෙ,

යනාදින් මහාවංශයෙහි කීපරිදෙන් බණකියන්ටයහි සංඝයා වහන්සේද නුවරවැසසන්ද රැස්කරවා තමන්කරවූ ලොවාමහා ප්‍රාසාදයාගේ යටිමාලෙහි ධර්මාසනාරූඪව දෙලොස්දහසක් පමණ රහතුන් ඇතුළුවූ මහාසංඝයාපිහන්සේ මැද හසින් බණකිය නොහී ධර්මාසනයෙන් බැස සවාමිනි බණකියන්ට නොහැක්කෙමි ධර්මදානයෙහි පින් කෙසේලබම්දැයි විචාරා මහරජ නොපෙ නමින් වැටුප්විසදදී බනකියවයි වදලෙන් එතැන්පටන් ධර්මාසනයන්ට මහත්සත්කාරකොට ශ්‍රීලඞ්කාවාසය මුළුල්ලෙහි හැම විහාරවල තමනාතමන් බණපවත්වා මාස්පතා එකිඑකි ධර්මකථිකයන්හට ගිවතල් උක්පැනි සක්කරා තැලියතැලියද සතරගුල් වැල්මිණඩක්ද පිලිසඟලක්ද දී එකිඑකි ධර්මශාලාවකට මහැඟි එකවියනක්ද ධර්මාසනයක් ඇතිරිලියක් විජිනිපත්‍රයක්ද දී බණකියවිය, එසේම බුජස්රජ්ජුරුවෝද සිසළලඞ්කාවාසයෙහි ගම්දසයකට එකිඑකි ධර්මකථිකයන්නෙතුන් සලසවා ඔවුන්ට වැටුප්දී බණකියෙවුවා හුය, මෙසේ පෙර මහොතතමයෝ ලොවට ධර්මදානය දෙවා පින්රැස්කලහෙයින් දැනුත් මෙබඳු ධර්මදානයට ආලිසංනොවී සඞ්ඛාවනත මහොතතමයන් විසින් ලොවට බණකියවා පින්රැස්කම් සුත්තේය, පූජාකුත්‍රනබුඞ්ගෙන් තමාසතතක වස්තුවක් අනුන්ට ප්‍රතිධානය කිරීමෙන් ආමිසදානනම් වන්නේය, ආමිසදානයත් සාංඝිකදානය පුද්ගලිකදානයයි දෙවැදෑරුම් වන්නේය, ඒ විප්‍රකාරවූ දානයන් අතුරෙන් සාංඝිකදානය සත්වැදෑරුම් වන්නේය, හේකෙළෙස්දහන් ?

බුදුන් ජීවමානකාලයෙහි එක් පාර්ශවයෙක භික්ෂුසංඝයා වහන්සේද එක් පාර්ශවයෙක භික්ෂුනිසංඝයාවහන්සේද මැදලොවු තුරාබුදුන්ද වඩාහිඳුවා චීවර පිණ්ඩපාතාදියෙන් දෙනනාවූදානය පලමුවෙනි සාංඝිකදානයනම් වන්නේය, මේ දානයට සම්වූ විපාක ඇති අන් ප්‍රත්‍යනදානයෙක් නම් නැත්තේය, බුදුන්පිරිනිවන් පෑකල්හි භික්ෂුණික්ෂුනි සංඝයාවඩා හිඳුවා ඒ මැද ආසනයක ධාතු පිහිටුවා කළ ප්‍රතිමාවක් වඩා ඒ පිලිමය ඉදිරියෙහි පාත්‍රාවල ලලක පාත්‍රයක්නබා දක්ෂිනොදකාදිවූ සියලලම පලමුවෙන් ප්‍රතිමා වට පවත්වා ඊට ඉක්බිති උභතොසංඝයාට දෙනු මේදෙවෙනි සාංඝිකදානය නම්වෙයි. එසේම භික්ෂුසංඝයා පමනක් වඩාහිඳුවා මැදසඩාතුක පිලිමයක් වඩා දෙනනාවූදානය තුන්වෙනි සාංඝික දානයකම් වන්නේය, එසේම භික්ෂුනි සංඝයා වඩාහිඳුවා සධා

තුන පිලිමයක් වඩා නිදුවා දෙන්නාවූදානය සතරවෙනි සාංඝික දානයනම් වෙයි, මෙතෙක් භික්ෂූන්වහන්සේද සමතෙක් භික්ෂුනින්වහන්සේද සඟින්දෙවයි. ඉල්වාගෙන දෙන්නාවූදානය පස්වෙනි සාංඝිකදානයනම් වෙයි උපසම්පදා සතර නමකින් අඩුනොවූ සංඝයා වසනවිහාරයකට ගොස් මම්සාංඝිකදානයක්දෙනෙමි මට සංඝයා දානමැනවයි ගරුත්පිරිසෙයින් එක නමක්වත් ඉල්වාගෙන දෙන්නාවු දානය සවෙනි සාංඝික දානය නම්වෙයි. එසේම භික්ෂුණී සංඝයාගෙන් එක නමක්වත් ඉල්වාගෙන දෙන්නාවූ දානය සත්වෙනි සාංඝික දානය නම් වෙයි. මේ සියලු සාංඝික දානයෙහි විපාක පොළොව පස්මෙන් අප්‍රමේය්‍ය වන්නේය, එහි බුදුන්ම පිදූදෙය කුමක් කවයුතුදැයි යතහොත් බුදුන්ම වත්පිළිවෙත් කොට පිළිපදනා යම් මහතෙක් ඇත්නම් ඔහට දියයුතුය. නොහොත් වළඳන්ම උන් මහසංඝයාට හෝ බෙදා දියයුත්තේය. ඝිතෙල් තල තෙල් ආදිය ගෙන බුදුන්ට පහන්ඇවිලිය යුත්තේය. පිදූ පිළිගෙන බුදුන්ට ධජපතාකා කොට බැන්ද යුත්තේය. මේ ශාසනය තැසී ගොස් එන දවස කස්සාභඬක් අනෙකි හෝ බෙලෙලුකි හෝ බැඳ අඹු දරුවන් ගෙන කෘෂිවණිජ් කර්මාන්තකොට අපි මහනුමිහයි කියා ඇවිදිනා අයෙකුත්වෙයි එබඳු දුසීලයන්වත්. සාංඝික දෙමිහයි අෂ්ටාර්‍යපුද්ගලසංඝයාසිතින්වෙන්නොකොට යම්කෙනෙක්සාංඝික කොට දානය දුන්නාහුවිනම් ඒ සාංඝිකයේ විපාකත් බුදුහු අසංඛ්‍ය අප්‍රමේය්‍ය වෙතියි වදාළසේක. සාංඝිකදානය සංඝයාට ආදර සත්කාර කරන්ට පුලුවන් අයටම සිඹවෙතියි වදාළ හෙයින් සංඝයාට දන්දෙමිහයි දානවස්තු සපයා වෙහෙරවගොස් සංඝයාට පසඟ පිණිවුවා වැඳ නමාගේ දානවස්තු පමනට වහන්ස මේ නමින් නමක් හෝ දෙනමක් හෝ දානමැනවයි යාඥා කවයුත්තේය, එසේ යාඥාකළ කල්හී සංඝයා විසින් සාමණේර නමක් දුන්නත් නමා දන්නා දුසීලනමක් දුන්නත් මම දුසීල කෙනෙකුන් ලදිමි මම සාමණේර කෙනෙකුන් ලදිමියි දෙමනස් නොකොට යුත්තේය. ඛුතාඝධර කෙනෙකුන් මහතෙර කෙනෙකුන් ලදන් මම ඛුතාඝ ධර කෙනෙකුන් ලදිමි මහතෙර කෙනෙකුන් ලදිමියි සොමනස් නොකොට යුත්තේය. ඉදින් නමා සඟින්ලත් මහනුන් අඬුනරම වැඩිනරම් සිතුවහොත් සාංඝිකදානය සිඹනොවන්නේය. එබැවින් ලත් ලත් යම්කෙනෙකුන් වහන්සේටම සැරියුත් මුගලන් දෙදෙනාවහන්සේට මෙන් පුඤ්ඤ සුඛාදියෙන් නමා ශක්තිපමණින් පූජාකොට ආදරකොට දන්දිය යුත්තේය. ඉදින් එසේ සිත නානා ගත දන්දෙන්ට පුලුවන්වීනම් සාංඝික නොකොට එක් රහතන් කෙනෙකුන්වහන්සේට දුන් දානයටත්වඩා සඟින්ලත් දුසීල කෙනෙකුන්ට දුන් දන්ම වැඩිනරම් වන්නේය.

මේ සේ යාංකිත දූතය වැඩිතරම්බව මේ මිතු කියන කථා වෙන් දනයුත්තේය. ඒ කෙසේදැයි ?

දඹදිව නාලකගමිගම රෙවත නම් මහතෙරුන් වහන්සේට උපස්ථානකරණාවූ එක්තරා කෙළෙඹි පුත්‍රයෙක්ඇත. ඔහුගේ භද්‍රාය සුභද්‍රාය යන දූන් දෙදෙනෙක් ඇත. ඔහු ත් අතුරෙන් භද්‍රා තොම ශ්‍රද්ධා සම්පන්නය කුවණැත්තිය. ඕතොමෝ තමා වදහෙයින් වලලහඤාව කියන්නී සඛාමිනි මාගේ සුභද්‍රා නම් නැගනියෙක් ඇත. නුඹවහන්සේ ඇකැඳවාගෙණ අවමැතවැයි ඇව පුතෙක් උපතෙනාත් ඒමාගේ පුත්‍රයා නුඹවහන්සේගේ කුලපරම්පරාවත් නොනස්නේයයි කීවාය. ඒ කෙළෙඹි පුත්‍රතෙම සඟපතැයි ගිවිස එපරිද්දෙන්ම කෙළේය. භද්‍රාතොම සුභද්‍රාවම එබඳා සුභද්‍රාවෙනි දන්දෙව ධර්මයත් පුරුදු කරව සංඝයා වහන්සේට උපස්ථාන කිරීමෙහි පවීත්‍රතාව මෙයින් තොපට මෙලොව පරලොව වැඩ අන් පත් වන්නේයයි අවවාදකළාය. සුභද්‍රාද අවවාදයෙහි පවත්නී එක්දවසක් රෙවත මහතෙරුන්වහන්සේ ඇහුලුවූ අමතමකට දන්දෙමියි පැවරුවාය. තෙරුන්වහන්සේ සුභද්‍රාවට පිණ්ඩෝකාරනු කැමතිවහන්සේක් සඟින් යන්නමක් ඉල්වාගෙන ඇන්ගෙට වැඩි සේක් සුභද්‍රාතොම ඒ තෙරුන්වහන්සේ භාගිඤ්ඤුන්වහන්සේ ප්‍රණීතවූ බාදාඛාද්‍යාදියෙන් සියඅතින් වැළඳවූවාය. තෙරුන්වහන්සේද අනුමෙවැනි බණ වදාරා වැඩිසේය. ඒ සුභද්‍රාතොම මෑත භාගයෙහි මිය නිම්මානරතී දිව්‍යලොකයෙහි උපන්නීය. භද්‍රාව එතැනි පුද්ගලික දන්දුන්බැවින්ශක්‍රදෙවෙන්ද්‍රයාට පාදපරිචාරිකාව උපන්නීය. නිම්මාණරතී දිව්‍යලොකයෙහි උපන්නාවූ සුභද්‍රාව එතැනි තමාලත් දිව්‍යසැප දූත කෙවර පින්කමකින් මේ ලැබීමදැයි සලකන්නී. භද්‍රාවගේ අවවාදයෙහි පිහිටියා සාංඝිකයකොට දුන්දන යෙන් ලත්බවදූක භද්‍රාවක්කායි උපන්නිදැයි ශක්‍රයාගේ පිරිවර සඟින් කෙරෙහි උපන්නීයයි දූන නැවත දෙව්ලොවින් අවුත් ඒ භද්‍රාවගේ විමානයට බැස ඒ භද්‍රාව ගේ නමකියා කැඳවූවාය. එසේ තමාගේ නමකියා කැඳවා සිටියාවූ සුභද්‍රාවගේ රූපශ්‍රීයදූක භද්‍රාතොම මේ ගාථාවෙන් මෙසේකීවාය.

දදදල්ලා මාතා වතෙඅහොසි යාසඋව යසයසිනී
සබෙබ දෙවෙනෙවතීං සෙ වලොණෙන අතිරොචසි.
දිසාසබා නාභිජානාමි ඉදංපඨම දායතා
කසමා නවිත්තු ආනම්ම නාදෙවතා හාසසෙ සමං.

- ශරීර වර්ණයෙන් ඉතා දීප්තිමත්වූවාවූ මහත් පරිවාර සම්පත්තිය කින් යුක්තවූ එබඳා දිව්‍යස්ත්‍රීය අයෙන් මේතාවුහිසාවැයි සිතලු

දෙවියන්මැද ශරීරවර්ණයෙන් දිලිහෙමින් අප මැඩපවත්නිය. මීට පළමු තොපගේ දර්ශනයක් නොදක්නෙමි මේ වනාහි පළමු වරනි දර්ශනයවන්නේය, තොපි කවරකාරණයක්නිසා කවර දිශාවකින් අවුත් මා කැදවන්නිදැයි විචාළාහ.

එසේ විචාලාවූ භද්‍රාවට කියන්නාවූ සුභද්‍රා තොමෝ:—

අහං භදෙද සුභද්දාසිං පුබ්බෙ මානුසකෙ භවෙ
සහ භරියාවසෙ ආසිං භගිනීව කනිට්ඨිකා.

යනාදීන් එම්බා භද්‍රාවෙනි මම මනුෂ්‍යලොකයෙහිදී සුභද්‍රානම් විෂ්ණොපහාසමග එකපුරුෂයෙකුට භාර්‍යාවන්විමි තොපම බාලනම් විමි යනාදීන් මනුෂ්‍ය ලොකයෙහි තමාගේ නාම ශෝත්‍රාදි සියල්ල තෝරාකීවාහ. එකල්හි භද්‍රාතොම:—

පහූත කතකල්‍යාණෙ තෙවෙසන්නි පාණිනො
සෙසන්වං කිත්ති ඉංභදෙද සුභදෙදජාති මත්තනො.

භද්‍රාවූ එම්බා සුභද්‍රාවෙනි ඔබ්දෙවිකෙනෙකුන්අතුරෙහි තොපගේ ඉපදීම කියවුද? බොහෝපින් කළාවූ මනුෂ්‍යයෝ එම නිම්මාණරති දෙවියන් කෙරෙහි උපදනානුවෙනි තොප කවර පින් කමක් කොට ඒ දෙවියන් කෙරෙහි උපන්නිදැයි විචාරා ඇවසිත්:—

අසෙව පිණ්ඩපාතාති යංදානං අදදිංපුරෙ
දකඛිණෙය්‍යස්ස සංඝස්ස පසන්නා කෙහි පාණිභි.

යනාදී ගාථාවෙන් එම්බා භද්‍රාවෙනි රෙවත තෙරුන්වහන්සේ අතුලවූ අවඳෙනෙකුන් වහන්සේව පිණ්ඩපාත අවක් සපයා දක්ෂිණාර්හවූ සංඝයාට පැහැදිසින් ඇතිව මාසියඅතින් පෙරයම් දානක් දිනිමිද ඒ දානයනිසා නිම්මාණරතීනම් දිව්‍යලොකයෙහි ඉපදෙමිබදු සෙශ්වයෂ් ලද්දෙමියි කීවාහ. එඛයට භද්‍රාතොම කියන්නී:—

අහංතඤා බහුතරෙ සඤඤතෙ බ්‍රහ්මචාරයා
තපෙසිං අන්නපානෙන පසන්නාසකෙ පාණිභි.

තඤා බහුතරංදත්වා ඛීනකාසුපගා අහං
කථින්වං අපතරං දත්වා විසෙසං විපුල මජ්ඣගා.

යනාදීන් එම්බා භද්‍රාවෙනි පන්සුන් කාසඛාක් සමාචාර ඇති බොහෝ සංඝයාවහන්සේ මධුරවූ ආහාර පානවර්ගයෙන් සිය අතින් සන්තර්පනය කෙළෙමි, එසේ තොපවඩා බොහෝ දන් දුන්නාවූ

මිය ගිනවු දිව්‍යලෝකයෙහි උපන්නෙමි. සවල්පදුනයක් දුන්නාවූ තෝ මෙසේ උත්තරාවට නිමිණෙරහි දිව්‍යලෝකයෙහි උපන්නී දැයි විචාළාය, එසේ විචාළාවූ භද්‍රාවට සියල්ල පෙරා කියන්නාවූ සුභද්‍රාතොමි:—

මිතාභාවනියෝ භික්ඛු සන්ථවෙනා මම පුරෙ අහු
අහං තෙහෙත නිමන්තෙසිං රෙවතං අත්තනාමකං.

සොමෙ අප්ප පුරෙක්ඛාරෝ අනුකම්පාය රෙවතෝ
සංඝෙ දෙති ඉදං වොච තස්සාහං වචනංකරී.

සාදකිණා සංඝනෙතා අප්පමෙය්‍යපතිට්ඨිතා
පුග්ගලෙසු තාදිසෙසු නත්තංතව මහප්පලං.

එම්බා සුභද්‍රාවෙනි ඒ පූර්වජාතියෙහි මවසංදෘෂ්ටවූමිත්‍රවූ මතවඩත්නාවූ රෙවත නම් තෙරණුවන්ගෙන් එහෙත්සේ කල උන්වහන්සේ ඇතුළත්සෑට සඟ අවතාරයක් මම පිණ්ඩපාතයෙන් පැවරීමි, උන්වහන්සේ මාගේදානය මහත්ඵලවේවයි මට වැඩ අපරදිගිරීම් ඇතිසේක් මෙසේ දෙන්නාවූ දානය සාංඝිකවශයෙන් දෙවයි වදාළසේක. මේ උන්වහන්සේගේ බස් අසා සාංඝිකවශයෙන් දන්දුන්නෙමි ඒ මාගේ සාංඝිකදානය හෙතම් අප්‍රමේය්‍යඵලය ඇති මහාසංඝයා කෙරෙහි පිළිවිසේය හොප විසින් වනාහි පුද්ගලික කොට දෙනලද බැවින් බොහෝ දෙනාට බොහෝ දන් දුන්නාත් මාගේ දානයේ මහත්ඵල වශනාවෙයි කීවාය. ඒ සුභද්‍රාවගේ බස් අසා භද්‍රාතොමෝ කියන්නී:—

ඉදානුවාහං ජානාමි සංඝතෙදනානං මහප්පලං
ඉතා ගන්ත්වා මනුස්සත්තං වදඤ්ඤූ විතමච්ඡරා
සංඝදානං දස්සාමි අප්පමත්තා පුනප්පුනං.

එම්බා සුභද්‍රාවෙනි සාංඝිකවශයෙන් දුන් දානය මහත්ඵල ඇතැයි යනු දන් හොප අතින් අසා දැනගත්තෙමි. එබැවින් මෙයින් මිය මනුෂ්‍යලෝකයෙහි උපදිමින්, යාචකයන්ගේ අදහස්දැන දන් දෙන්නෙමි මසුරුයින් තැතිතෙමි මතු පමානොවී නැවත නැවත සාංඝිකවශයෙන් දන් දෙන්නෙමියි කීවාය.

මෙසේ දිව්‍යලෝකයෙහි උපන් අයත් සාංඝිකවශයෙන් දන්දීම මහත්ඵල ඇත්තේයයි යනු අසා මතු මනුෂ්‍යලෝකයෙහි ඉපද සාංඝිකදන් දෙමිහයි පතන්නාහුවෙතිඑබැවින්,මනත් ශ්‍රෙෂ්ඨවිපාක දෙන්නාවූ මෙබඳු සාංඝිකදානයට මදකුත් පමානොව් තමාගේ

ශක්තිපමණින් භික්ෂූන්වහන්සේ ඉල්වාගෙන උන්වහන්සේලාට ආදරයත්කාරසකාව දන්දීමෙහි කුසලසම්භාරය සිඹසොබා ගත යුත්තේය.

තවද ප්‍රද්ගලික දානයත් තුදුස්වැදෑරුම් වන්නේය.

එහි කෙසේද යත් ?

සම්‍යක්සම්බුදු කෙණෙකුන්වහන්සේට දන්දීමය, පසේබුදු කෙණෙකුන්වහන්සේට දන්දීමය, රහත්කෙණෙකුන් වහන්සේට දන්දීමය, අනාගාමිව රහත්වන්ට පිළිවෙත් පුරණ කෙණෙකුන් වහන්සේට දන්දීමය, අනාගාමී කෙනෙකුන් වහන්සේට දන්දීමය, අනාගාමි ඵලයට පිළිවෙත් පුරණ කෙණෙකුන් වහන්සේට දන්දීමය, සකෘදාගාමී කෙණෙකුන් වහන්සේට දන්දීමය, සකෘදාගමි ඵලයට පිළිවෙත්පුරණ කෙණෙකුන්වහන්සේට දන්දීමය, ශ්‍රොතාපන්න කෙණෙකුන්වහන්සේට දන්දීමය, සරණශීලය ගත් තැන්පටන් ඵලචිත්තයදක්වා ශ්‍රොතාපත්ති ඵලයට පිළිවෙත්පුරණ කෙණෙකුන්වහන්සේට දන්දීමය, සත්තෙන් පිටත් බාහිරයෙන් රාගාදි අකුසල් සන්සිඳුවා වසන කෙණෙකුන් වහන්සේට දන්දීමය, පංචශීල අෂ්ටාඟශීලාදියෙන් ශීල්වත්වූ පෘථග්ජන කෙණෙකුන්ට දන්දීමය, වැදි කෙවුල් ආදිවූ දුසීල මනුෂ්‍යයෙකුවදන්දීමය, බලු කුකුළු ආදිවූ තිරශ්චීනයෙකුට දන් දීමය, කියා තුදුස්වැදෑරුම් වන්නේය.

මෙයින් තිරශ්චීනයා රූපාදී විශිෂ්ටගුණ ඇතැයි යන සිතින්ද මොහු පොෂ්‍යයෙකැ'ට වඩමියි යන සිතින්ද දෙනහාවූ දානඟැර පිඬක් දෙපිඬක් දීමයයි කියනලද අසම්පූර්ණවූ දානඟැර කුක්කුර සූකර කුක්කුටාදීන් අතුරෙන් යම්කිහිව මේ දානයෙන් මට පින්ඇතැයි සිතා ඔහුගේ බඩපුරා ආහාරයක් දුන්නොත් ඒ දානය දන් දුන්නාහට සියඇක්ජාතියෙහි ආයු ඇතිකරන්නේවෙයි. සැපවිඳුවන්නේවෙයි, මෙසේ සියඇක්ජාතියෙහි වර්ණඇතිකරන්නේවෙයි, බලඇතිකරන්නේවෙයි, නුවණ ඇතිකරන්නේවෙයි, මෙවැනි අනුසස් පසක්දෙන්නේවෙයි.

මෙසේම දුසීල මනුෂ්‍යයෙකුට දන් දුන්නොත් ඒ දානය දහසක් ජාතියෙහි ආයුසයද වර්ණයද සැපයද බලයද ප්‍රඥාවද සිඹිකරන්නේවෙයි.

මෙසේම ශාසනයෙන් පිටත් සිල්වත් මනුෂ්‍යයන්හට දානක් දුන්නොත් ඒ දානය ලක්ෂඇක්ජාතියෙහි ආයුෂය වර්ණය සැපය බලය ප්‍රතිභාණය යන මේ සැප සිඹිකරන්නේවෙයි. මෙසේම ශාස

නෑයන් සිවත් ඛ්‍යානලාභී කෙණෙකුන්ට දන් දුනහොත් ඒ දානය අසංඛ්‍යෙය්‍ය අප්‍රමේය්‍යජාතියෙහි මෙහි විපාක දෙන්නේය. සරණ ගතව පන්සිල් රක්නා එකක්නට දුන් දානය ඊටත් වඩා අප්‍රමේය්‍ය ජාතියෙහි විපාකවන්නේය. සරණගතව දසසිල් රක්නාහට දුන්නාවූ දානය ඉතා අප්‍රමේය්‍යවූ විපාකවන්නේය. එද වස් මහණවූද භෙරණක්හට දුන්දානයඊටත්වඩා අප්‍රමේය්‍ය විපාක වන්නේය. උපසම්පන්න කෙනෙකුන්හට දුන් දානය ඊටත් වඩා අප්‍රමේය්‍ය විපාකවන්නේය. එසිනුත් වත්පිළිවෙත්මනාව පිහිටියක්හට දුන් දානය ඊටත් වඩා අප්‍රමේය්‍ය විපාක වන්නේය. මේසේ විදර්ශනා ආරම්භ විදර්ශක සෝතාපන්න සකෘදාගාම්ඵලයට පිළිවෙත් පුරන්නෙය, සකෘදාගාම්ය අනාගාමී ඵලයට පිළිවෙත් පුරන්නේය අනාගාම්ය අර්හත් ඵලයට පිළිවෙත් පුරන්නේය, රහත්කෙනෙකුන් වහන්සේය. පසේ බුදුන්වහන්සේය, ලොවිතුරා බුදුහුය යන මෙතෙක්දෙනා වහන්සෙට දුන් දානය එක් කෙනෙකුන් වහන්සේට වඩවඩා අප්‍රමේය්‍ය විපාක වන්නේය. සම්සේ මේ දෙලක්ෂ සතලිස් දහසක් යොදුන් ඝනඋතැති පොළව කල්පවක්පමණ තැන් පසුත් අප්‍රමේය්‍යවේද හව්වක් පමණ පසුත් අප්‍රමේය්‍යවේද ඊටත් වඩා යොත්නක් පමණ තැනැ පසුත් අප්‍රමේය්‍යවේද චක්‍රවාල පර්වත අවසන්කොට ඇති මහපොළොව පස් ඉතාම අප්‍රමේය්‍යවේද එමෙන්ම සරණගතයා පටන් ලොවුතුරාබුදුන් දක්වා දුන් දානය ක්‍රමයෙන් ඉන් ඊටත්වඩා අප්‍රමේය්‍ය විපාක ඇතිබව දතයුත්තේය. මේ දානය තෙම ප්‍රතිග්‍රාහකයන්නිසා මහත්ඵලවීමක් නැතිවම දායකයන් නිසා මහත්ඵල වන්නාවූ එක්දානයක, දායකයාගෙන් මහත් ඵල වීමක්නැතිව ප්‍රතිග්‍රාහකයන් නිසා මහත්ඵල වන්නාවූ එක් දානයක, ප්‍රතිග්‍රාහකයන් නිසාත් දායකයන් නිසාත් මහත්ඵලවීමක් නැතනාවූ එක්දානයක, දායකයන් නිසාත් ප්‍රතිග්‍රාහකයන් නිසාත් මහත්ඵල වන්නාවූ එක් දානයක, කේ කවරේද? සුචිවූ චිත්තසන්තාන ඇත්තෝ ප්‍රතිග්‍රාහකයෝය, දුසීලයෝද පව්කරනා අයෙක්ද දානවස්තුවත් දැහැමෙන් සෙමෙන් ලත් වස්තුවේද දායකයාගේ සිතත් ඉතා ප්‍රසන්නද මින් විපාකඇතැයි දැනඵලයත් අදහා සිටියේද ඒ දායකයානිසා මහත්ඵලවන්නාවූ දානය නම් වන්නේය. ජූජකබ්‍රාහ්මණයා දුසීලව ලාමකව සිටියදී ඔහුට වෙස්සන්තර රජුරුවන් වහන්සේ දන් දුන්තැන පොළොව කම්පාවිය. එසේ හොළොව කම්පාවන්ම කාරණාවූයේ ජූජකබ්‍රාහ්මණයාගේ ශක්තියෙන් නොවසි වෙස්සන්තර රජුරුවන්වහන්සේගේ සිල්වත්කමය. යම් දානක දායකයෝ දුසීලයෝද පව්කුවූ චිත්තසන්තාන නැතෙන්ද ප්‍රතිග්‍රාහකයෝ සිල්වත්වෙද්ද ලාමකයෝද දානවස්තුවත් අධර්

යෙන් ලබනලද වස්තුවෙක්වේද දායකයාගේ චිත්තයත් අප්‍රසන්නද දානඵලයත් අදහා නොදෙන්නේද දානය ප්‍රතිග්‍රාහකයා නිසා මහත්ඵලවන්නාවූ දානයක.

කැලණියං මෝදර වසන්නාවූ එක්කෙවුලෙන් දිසසුමන නම් මහ තෙරුන්වහන්සේට තුන්වළඟක ආහර දන්දී මරණ සෙයාවෙන් හොන්තෝය සවඟෝත්පත්තියම කාරණාවූ ගතිනිමිති දැක දිසසුමන නම් තෙරුන්වහන්සේට දුන් පිණ්ඩපාත දානය මා සතර අපායෙන් නොඩනගන්නේයයි කීය.

යම් දානයෙක් ප්‍රතිග්‍රාහකයෝ දුසසීලයෝද දායකයොත් දුසසීලයෝද දානවස්තුවත් අධර්මයෙන් ලබණලද වස්තුවක්විද චිත්තයත් අප්‍රසන්නද දානඵලයත් අදහාගෙන නොදේද ඒ දායක ප්‍රතිග්‍රාහක දෙදෙනානිසා මහත්ඵල නොවන්නාවූ දානයෙක් කවී වන්නේය.

වඩුන්නාවේ වසන වැදෑදක් මල නෑ කෙනෙකුන්නිසා පිත් පෙත්කොට දන්දෙන්නේ එක් දුසසීල මහණකුහට තුන්වරක දන්දුන්නේය. ඒතුන්වරෙකිම ප්‍රේතයාට පින්නොපැමිණියේය, තුන්වෙනිවර ප්‍රේතතෙම දුසසීලයෙක් මාගේ දන්නොරාගන්නේ යයි මොරගැයය ඒ අසා වැදිතෙම සිල්වත් කෙනෙකුන් වහන්සේට දන්දී පින්පෙත්දින එතොළුතෙම ප්‍රේතයෝනියෙන් මිදී දිව සිරි ලද්දේය.

යම්දානයෙක දායකයොත් සිල්වත්වෙද්ද ප්‍රතිග්‍රාහකයොත් සිල්වත්වෙද්ද දානවස්තුවත් දැහැමෙන් ලබනලද්දේවේද චිත්තයත් ප්‍රසන්නද කර්මඵලයත් අදහාදේද ඒ දානය දායකයන්නිසාත් ප්‍රතිග්‍රාහකයන්නිසාත් මහත්ඵල වන්නේය.

බුදුන්ව අසදෘශ මහදන්දෙනකල්හි උපාසකවරුන් සිල්වත්ව සිව් දන්දෙනඅයුරින් දායක ප්‍රතිග්‍රාහක දෙපක්ෂය නිසාම දානය මහත්ඵලවිය.

එබඳු සත්පුරුෂයනි මෙසේ අසංඛ්‍යගණන් ජාතියෙහි විපාකදීමට සමර්ථවූ මෙබඳුදානයෙන් බුඩසුනාවූ අසංඛ්‍ය ගණන් කල්පයන් අතුරෙන් යම්කිසිතැනකවත් බුඩශාසනයෙන් පිටත් තැනකවත් මේ මගුල් සක්වලිහිපිටත් අන්සක්පිලකවත් බුදුන්ගේ ඛණ නොඇසූ අන්සත්වයක්හට්වත් සිඹ නොවේයි. එබැවින් ඉදිරි සසරබොහෝකලක් මනුෂ්‍යලොක දිව්‍යලොක

දෙක්හි මිහත් සැපවිඳුවන්නාවූ උත්කෘෂ්ට දූතයට තොප විසින් නිරන්තරයෙන් උත්සාහකටයුතු වන්නේය.

අබුද්ධොත්පාද කාලයෙහි මේ උත්කෘෂ්ට දූතය සිඹින්නා වන නියාව දම්බිතු කියන කථා වස්තුව අසා දතයුත්තේය.

දඹදිව අසිතඤ්ජනනම් පුරයෙහි මහා කංස නම්රජහුගේ දෙවි ශ්‍රීයා නම් අගබිසවුන්ගේ කුසින් උපන්නාවූ වාසුදෙවය බලදෙවය සුභද්‍රදෙවිය අගහිදෙවිය චරුණිය අනුජාය ඵජුජාය සනාය පණ්ඩිතාය අංකුරයයි යන දසබෑ රජපුරුවෝද අසිඤ්ජන දේවිය යන රාජකුමාරිකාවන්හා එකොළොස් දෙනෙක්වුන, දයුබෑ රජදරුවෝ අසිතඤ්ජන නුවර ආදිකොට වාරවතී නුවර අවසන්කොට ඇති තෙසැට දනයක් නුවරවල රජදරුවන්මරා රාජ්‍යශ්‍රීයා මාරවතී නුවරෙහි දෙරට දස භාගයක් කොට බෙදාගෙන පසුව අජන දෙවියයි යන තමන්ගේ කැනයියන් සිඟිකොට එකොළොස් කොටසක් කරවිහයි කීතැන අංකුර රජතෙම මා ලත්කොටසය කැනයියන්ට දෙව මම වෙළඳාමින් ජීවත්වෙමියි නොප තොපගේ රටවැ පැමිණිකල්හි සුන්ගම් නොගනුවයි හිඟිසවාගෙන වෙළඳාම් කරමින් යන කලෙක බඹුපිරූ ගැල් පන්සියයක් ගෙන මරුකානනාරණයක් යනුයේ නුගගසක වසන දෙවනාවකු දුක.

පාණිනෙ සබ්බසෝ වණ්ණා පඤ්චධාරෝ මධුස්සවෝ
නානාරසා පගන්ධරුක්ඛි මඤ්ඤුහනනං පුරිසදං.

යන මේ ගාථාවෙන් එළඹාදිව්‍ය ප්‍රත්‍යක්ෂතොපගේ දක්ෂිණහස්තය සවිප්‍රකාරයෙන්සවණීවණිවන්නේය. පඤ්චාඟුලියෙන්කැමතිකැමතිසේ යන ධාරාවැහෙන හෙයින් පඤ්චධාරාවක් ඇත්තේය. නොයෙක් මිහිරි රසත් වහනය කරන්නේය. එබැවින් තොප ශක්‍රදේවේන්ද්‍රයයි සිතමිඳිකිය.

එසේ කීවාවූ අංකුර රජහට දිව්‍යපුත්‍රතෙම:—

නමත්ථිදෙවා නගතිබ්බා නහි සක්කෝ පුරිසදෙ
තෙමං අංකුරජානාහි තරාරුවමහා ඉධාගතං.

එබඳු අංකුර රජපුරුවනි මම වෛශ්‍රවණාදින්මෙන් ප්‍රසිඬ දෙවතාවකුත් නොවේමි ගාඛබ්බනීඨයකින් ආවාවු ඝාඛබ්බී දෙවතාවකුත්නොවෙමි. පුරිසදය යනු ලොකප්‍රසිඬවූ ශක්‍රයෙකුත් නොවේමී තරාරුව නමී නුවරින් චුතව මෙතැන්හි උපන්නාවූ මම විමාන ප්‍රතයෙකැයි දූතගත මැනවැයි කීය.

ඒ අසා අංකුර රජතෙමේ:—

කිංසීලා කිං සමාචාරෝ රොරුවස්මිං පුරුත්තමේ
කෙන තෙ බ්‍රහ්මචරියෙන ප්‍රාසාදං ආණිහි ඉජ්ඣති,

එම්බා දිව්‍ය පුත්‍රය පෙරජාතියෙහි රොරුව නම් පුරයෙහි වසන්නාවූ තොපවැනි පිණිස කෙබඳු සීලයකින් යුක්ත වූද කෙබඳු සුවරිතයකින් යුක්තවූද කෙබඳු ශ්‍රේෂ්ඨාචාරයක් නිසා මෙබඳු කුසලඵලයක් තොපගේ හස්තගතවීම සිදු වන්නේදැයි විමසා ඇත්තේය.

එසේ විචාළාවූ අංකුර රජහට ඒ සියලුලම තෝරා කියන්නාවූ දිව්‍යපුත්‍රතෙම මෙසේකීය.

තුන්නාවායෙ ප්‍රරෙ ආසිං රොරුවස්මිං තදා අහං
සුකිච්ඡ වුත්ති කපණා නමෙවිජ්ජති දුනවේ.

නිවෙසනඤ්ච මෙආසිං අසඡිහස්‍ය උපන්තිකෙ
සබ්බස්ස දුන පතිතො ඝාතප්‍රයුද්ධස්ස ලජ්ජිතෙනා.

තපයාවනකාඝනති නානා ගොත්තවනිබ්බකා
තෙවඹං තප ප්‍රරිච්ඡන්ති අසඡිහස්ස නිවෙසනං
කපණවච්ඡාම භදෘංවො කපදූනං පදියති.

තෙනාහං ප්‍රත්‍රථා වකඛාම් අසඡිහස්ස නිවෙසනා
පගඝයහදකබිණං බාහුං එපණවච්ඡථ භදෘවො
එපදූනං ප්‍රදියති

තෙනපාණිකාම් දදෙ තෙනපාණි ඔබුසත්‍රවා
තෙනමෙ බ්‍රහ්මචරියෙන ප්‍රාසාදුපාණිමහි ඉජ්ඣති.

එම්බා අංකුර රජ්ජරුවෙනි මම මීට පූර්ව භාගයෙහි රොරුව නම් පුරයෙහි සන්නාලි ජාතියෙහි උපන්නෙමි. ඒ ජාතියෙහි ඉතා දුඃඛ ජීවිතා ඇතෙනමී දන්දීමට සුදුසු කිසිවකුත් මම නැත්තේය. කම්පල ඇදහීමෙන් ශ්‍රද්ධාවන්තවූ නිරන්තරයෙන් පැවැත්තාවූ පරිත්‍යාග චේතනාවෙන් මසුරුකමින් මිදුණාවූ පෙර ජාතියෙහි කරණලද කුසල් ඇත්තාවූ පව්කිරීමෙහි ලජ්ජා ඇත්තාවූ අසඡිහ සිටාන්කෙනෙක් ඇත. මාවසන ගෙය ඒ සිටාන්ගේ ගෙවසවිමිප වන්නේය. ඒ සිටාන්ගේ ගෙට තොපයක් ජාතිඇති දුන්ඵලාදිය වණිහාරකාට ඇවිදිනාවූ තොපට කැඩීක් කෑයි යන්නාහුවෙති ඒ යාචකයෝ පින්වත තොපට කැඩීක්

වේවයි අපි සිහමනව කොතනව ඇමෝද කවර තැනක ගියාවූ අපව සිහමන් ලැබේද, අසසිහ සිවාහන්ගේ ගේ කොතනදැයි මා අතින් විචාරන්නාහුනමිවෙති. එසේවිචාලාවූ ඔවුන්වදකුකතඔසවා මෙසේ යවමෙතැන්හි ගියාවූතොපට දන් ලැබෙන්නේයයි ඒ අසසිහ සිවාහන්ගේ ගෙය දක්වා කියන්නෙමි ඒ කුසල කම්යෙන් මේමාගේ අත කැමති වසතුදිමව සම්පත්විය. ඒ කුසල කම්යෙන් මධුරවූ ආහාර පානවර්ගාදිය වහනය කරන්නේවිය. එම ශ්‍රේෂ්ඨ වස්ත්‍රාවෙන් පුණ්‍යඵලය මාගේ හස්තතලයෙහි සිඹවන්නේයයිකීය,

ඒ අසා අංකුර රජතෙම:—

අලමේව කාතුං කල්‍යාණං දානං දාතුං යථාරහං
පාණිං කාම දදං දිස්වා කොපුඤ්ඤං නාකරිස්සති.

යනමේ ගාථාවෙන් මේ අසා පින්කරන්නටම සුදුසුය නම් යකෙහි. පමණින් දන්දෙන්ට සුදුසුය දන්දෙන ගෙය අතදිගුකොට දක්වූ පමණින් කැමතිකැමති ධන ධාන්‍යය කරනනාවූ තොපගේ හස්තය දැක කවරෙක්නම් පින් නොකරන්නේදැයි හතාදීන් දන්දීමට ප්‍රතිඥා කොට ගොස් රට සතක් උඩබද හතුල් ඇතිකරවා සතලිස් අවගවූ වස් තැන් දන්හල්කොට බදලිප් බදවා තමාගේ දානොපකරණ අනුභවකොට සවියත් සැපසේ ජීවත්වනලෙසට ගොදු මගොස යක් මහවතුරන් පරිදෙදන් මහදන් පැවැත්වීමය. ඒ අංකුර රජ හුගේ දානයෙහි බහා පළඳනාලද මාණික්‍ය කුණ්ඩලාදිවූ ආභරණ ඇති සැවදහසක් ජනයෝ දවස්පතා දරපලා රැස්කරන්නාහුවෙති, මණිකකුණ්ඩලාභරණා දිසෙන් අලංකෘත වූ නව යෞවන රූපශ්‍රීසාර ඇති හොලොස් දහසක් සත්හු දුරු මිරිත් ආදිය අඹරා පිඬුකොට දෙන්නාහුවෙති එසේම සොළොස් දහසක් සත්හු සැදිගත ඒ ගොදු සිටිනාහුය, එසේම බහා පළඳනා ලද මණිකාණීපුරා භාරාඩ්ඨද කටක කඨකාදිවූ ආභරණ ඇතිව දහස් ගණනකට සූදානව සිටි තිස් දහසක් අරක්කැමියෝ හොජන සපයන්නාහුවෙති සුවඳ ඇල්සාල් ආදියෙන් අසූ සත්දහස් දෙසිය දෙසැතැනෑ යාල තුදුස් අමුතු දෙපැල් දෙලාසක් දවස් පතා නිරන්තරයෙන් දන්වය දමවි යන්නේය. ඒ මතු නොවෙහිමධුර ආහාර කැමැතන්ට උන් කැමති පරිදෙදන් ඝෘත මධුර සකීරාදියෙන් යකස් කරන ලද ඉවුම් හොජනයෙන් දෙන්නේය. ෂඩ්‌රසපාන කැමැතන්ට අඹ ජම්බා දිවූ ෂඩ්‌රපානයන් දෙන්නේය. වස්ත්‍ර කැමැතන්ට යුගපත් වස්ත්‍රත් දෙන්නේය, නිරුදක කාන්තාර මාගීවල්හි පන්සල් කොට පින් පැන් තබා ලිංපොකුණු කපවා දුන්නේය, දුගීසථානවල්හි ඒ දැඩි අඹලම් කරවා දුන්නේය, ඔහුගේ නුවර ඇම කල්හිම උදුසන

දවස දවස එබඳා සත්ත්වයෙනි කවරෙක් සාදුක් ඇත්තේද, කවරෙක් පිපාස ඇත්තේද කවරක් වහනු කැමැත්තේද කවරෙක්හුගේ රථ යානාදියෙහි අශ්වයන් හා වෘසභයෝ දුම්ලවුද කවරන්හට ජනුය කින් ප්‍රයෝජන ඇද්ද කවරෙක් ඇඟඟානා සුවඳ කැමැත්තේද කවරෙක් මල් පලඳනා කැමැත්තේද කවරෙක් වඟන් සඟලක් කැමත්තේද ඒ සියලෙල්ලම තමනමන් කැමති දෙය ගනිත්වායි උද්ඝොෂණය කොට ඇවිදිති මෙසේ ඒ අංකුර රජ්ජුරුවන් දන්දෙන කල්හි නීති ශාස්ත්‍රයෙහි දක්ෂවූ සොනක නම් එක් පුරුෂයෙක් අංකුර රජ්ජුරුවන් අධික දුනශෙන් නවත් වන කැමැත්තේ,

අදුනමතිදුනඤ්ච නපපසංසන්ති පණ්ඩිතා
තසමාහි දුනා ධනමෙව සෙය්‍යා
සඤ්ඤත චත්තෙනය්‍ය සධිර ධම්මා.

එබඳා අංකුර රජ්ජුරුවෙනි ඔබත් පිරිසෙසින් ඔත් සැන්දක්ද සාල්මිටක්ද නෝදිමයැයි කියන ලද අදුනයද ප්‍රමාණාතික්‍රාන්තවූ වස්තු පරිත්‍යාගයයි කියන ලද අතිදුනයද යන දෙකම පරලොව වැඩ පිරිහෙන හෙයින්ද මෙලොව වැඩ පිරිහෙන හෙයින්ද නුවණැත්තාවූ මෙඛාවිතමයෝ යහපතැයි නොකියති. ඒ හෙයින් දන්දීමට වඩා ධනය රක්ෂාකිරීම උතුම එබැවින් ධනය රක්ෂාකොට අදුනය අතිදුනය දෙකින් දුරුවූ විඤ්ඤූන් විසින් අගරහිත මඛ්‍යම ප්‍රවෘත්තිශීලයන් එසේ පැවැත්මම නීතිශාස්ත්‍රයෙහි ථිරව පිහිටියාවුන් ගිය මාර්ගයෙකැයි කියේය, ඒ අසා අංකුර රජතෙම තමාට මහත්වූ දුනාඛ්‍යාස ඇතිහෙයින් මතු කියන ගාථා සතරින් මෙසේ කීසේය,

අහොවතාරෙ අහමේව දජ්ජං
සත්තානාවමං සප්පුරිසා භාජයන්තු,
මෙඛොව නිත්‍යා නිප්පූර යන්තනා
සත්තානපපයෙ සබ්බ වණ්ණඛ කාතා.

එබඳා සත්පුරුෂයන් දන් දීමට වඩා ධනරක්ෂාකිරීම උතුම්යැයි කියා නීතිශාස්ත්‍රයෙහි දක්ෂ අය කියත්මය, උන් එසේ කියනත් ඒ බුබාදි මහොන්නතමයන්ගේ වචනයන් නොවනා හෙයින් මම දන් දෙන්නමිය එසේ දන් දෙන්නාවූ මා නුවණැත්තාවූ සත්පුරුෂයෝ භජනය කරන්නාහු වෙති ධන්ය රක්ෂාකරන්නාවූ පුරුෂයන් එසේ භජනය කරන්නාහු නොවෙති එබැවින් වලනැන් වැසි දියෙහි ප්‍රාවසිත්තාවූ මඩ වැස්සන්මෙන් සියඵ යාවකයන්ගේ අදහස් පූරා ඔහු සාහසිණය කරවූහ කම්:— තවද,

යස්ස යාවතකෙ දිසවා මුඛවණ්ණා පසීදන්ති
දත්වා අත්තමනෝ හොති එසා යඤ්ඤස්ස සම්පදා.

යවත්ව සිඟාඇවිදිනා යාචකයන් දැක යමෙක්හුගේ මුඛවර්ණය ප්‍රසන්න වන්නේද තමාගේ ශක්තිපරිද්දෙන් දන්දී ප්‍රීතිසොම්නසින් යුක්තවූ සිත් ඇතිවේද මෙසේ යාචකයන් දැකීමද ඔවුන් දැක සිත පහදවා ගැණීමද තමාගේ ශක්තිපමණින් දන්දීමද පසුව නැවත සිත සතුටුකොට ගැන්මද යන මේ ගිහිගෙයි වසන්නාවූ සත්වයාට සැපයෙක් නම් වන්නේය.

පුබ්බෙව දානා සුමනෝ දදං චිත්තං පසාදයං
දත්වා චත්තමනෝ හොති එසා යඤ්ඤස්ස සම්පදා.

දන්දීමනම් සියළු සම්පත්හීන්ට මුල්කාරණයෙක ජාතියක් ජාතියක් පාසා තමා කැටුව යන්නාවූ නිධානයෙක යනාදීන් දන්දීමට පූර්වභාගයෙහි දානොපකරණ සපයන්නාවූ කාලයෙහිත් අනුසස් කල්පනාකොට චිත්තය පහදවන්නේ වේද දානවස්තුව ප්‍රතිග්‍රාහකයාගේ අත තබන්නේත් රාජචොරාදීන්ට සාධාරණවූ මේ වස්තුවෙන් සියලලවුන්ට සාධාරණ නොවන්නාවූ. උත්තෘෂ්ට සාර දානයක් කරන්නෙමියි චිත්තය සන්තොෂ කරන්නේ වේද දන්දීමට ඉක්බිතිව බුඩ ප්‍රත්‍යෙක බුඩ ඛොධි සත්වාදීන් විසින් ඉස් ඇස් මස්දී පූරුදුකළාවූ දාන පාරමිතාව මෙන් මා විසිනුත් දන්දී පින් රැස් කොට ගත් බැවින් නුවණැත්තන්ට මම ඇතුලත් වීම් මෙලෝ පරලෝ දෙක්හී මව වැඩෙක් වේවයි කියා චිත්තය සන්තොෂ කරන්නේ වේද මෙසේ පූර්වචෙතනාය පරිත්‍යාග චෙතනාඝ අපර චෙතනාඝයයි කියා තුන්කල පැවැත්නාවූ ප්‍රීති සොම්නස් සහගතවූ චෙතනා තොම දානයාගේ සම්පූර්ණතාවෙක අන් පරිද්දෙන් දානය සමුඩි නොවන්නේයයි මෙසේ කල්පනා කොට ඒ අංකුර රජතෙම දසදහසක් අවුරුදු නිරන්තරයෙන් දන්දී එහින් මිය තව්තිසා දිව්‍යලොකයෙහි උපන්නේය.

බුදුන්ලොව පහලවූ කල්හි ඉන්දකනම් දුගීයෙක් වීථියෙහි සිඟාඇවිදිනේ තමාව දෙන්වයයි ගෙනා බත් සැන්දක් තමාසිටිගෙදොරට සිඟාවැඩියාවූ අනුරුඬ මහතෙරුන් වහන්සේට දෙවා ඒ පින්කමෙන්ගොස් තවුතිසා දිව්‍යලොකයෙහි උපන්නේය, එසේ උපන්නාවූ ඉන්දකනම් දිව්‍යපුත්‍රතෙම කාරණාදසයකින් අංකුරයාමැඩපවත්නේය. තමාගේ රූපශ්‍රීයෙනුත් අංකුරයාමැඩපවන්නේය. තමාලබනලද ගීතවාද්‍යාදිවූ ශබ්දයෙනුත් අංකුරයාට

අධිකතරවිය, තමාලදදුවු දිව්‍යමයවූ ක්‍ෂුධාහෝජනයෙනුත් අංකු
රයාට විසිෂ්වතරවිය, තමාලදදුවු දිව්‍යචන්දන කර්පූර සුගන්ධාදි
යෙනුත් ඉතාවිශෙෂවන්විය ඉතාමනොඥවූ ශෙය්‍යාසනාරණ වස්ත්‍රා
භරණාදියෙන් අංකුරයාට වැඩිතරවිය, දෙවියන්ටත් ප්‍රියයාවීප
ත්තියෙන් අන්තරා මරණපැමිණෙනහෙයින් තුන්කෙලසැටලක්
ශයක් අව්රුදු ජීවත්වීමයයි කියනලද ආයුෂයෙන්ද අංකුරයාට
වැඩිතරම්විය, එසේමපරිවාර සම්පත්තියෙන්ද ශරීරශෝභාදයෙන්
දිව්‍යසුඛානුභාවයෙන්ද ආධිප්‍රත්‍යයෙන්ද අංකුරයාමැඛපවත්
නේයයි මෙසේ අංකුරයාත් ඉන්දකයාත් තව්තිසා දිව්‍යලොකයෙහි
ඉපද මෙසේ දිව්‍යසම්පත් අනුභවකොට වාසයකරණකල්හි අපගේ
භාග්‍යවත්වූ සව්ඥයන් වහන්සේ බුදුවූ සත්වැනි අවුරුදෙදහි
ඇසලමස මැදිපොහෝදිනයෙහි සැවැත්නුවර දොර ගණ්ඩඉබ්බවෘ
ක්ෂමූලයෙහිදී යමාමහ පෙළහරදක්වා තුන්පියවරින් තව්තිසා දිව්‍ය
ලොකයටවැඩ පාරිචජ්ජතනක වෘක්ෂමූලයෙහිදී පාණ්ඩුකම්බලශෙ
ලාසනයෙහි අභිධම්දෙශනාවට වැඩලන්කල්හි දසදහසක් සක්
වල වාසඝකරන්නාවූ සියලු දිව්‍යබ්‍රහ්මයෝ රැස්වලන්නාහුද, එසේ
ලන්නාවූ දිව්‍ය සමාගමයෙහි තමන් වහන්සේට ආසන්නව ලන්
නාවු ඉන්දකයාද අවසාලිස් ගවුවකින් ඇතලන් අංකුරයාද දැක
බුදුහු මෙසේ වදුළ සේක.

මහාදුනං තයාදිත්‍යානං අංකුරං දීඝමන්තරෙ
සුවිදූරෙ නිසින්නොසි ආගච්ඡ මම සන්තිකෙ,

එම්බා අංකුරය තොප දසදහසක් අවුරුදු මුළුලොහි මහත්
දන් දුන්නාහිවේද එක බත් සැන්දක් පමණ දුන්නාවු ඉන්දකයා
මා සවමීපයෙහි ඉන්දදී තා ඉතාදුර උග්නේ කවර කාරණයකින්ද
මා සවමීපයට එවසි කියා වදුළසේක. ඒ අසා අංකුර දිව්‍ය
පුත්‍රතෙම,

වෙදිතො භාවිතත්තෙන අංකුරෝ ඉදමබ්‍රවි
කිංමයහං කෙනදුනෙන දක්ඛිණෙය්‍ය නසුඤ්ඤකං.

පාරමිතා පරභාවිතවූ ආර්‍ය්‍ය මාර්ග භාවනායෙන් වඛතලද සිත්
ඇති භාග්‍යවතුන් වහන්සේ විසින් විචාරණලදදුවු ඒ අංකුර නම්
දිව්‍ය පුත්‍රතෙම මෙම වචනයෙන් මෙසේ කිය, සවාමීනි භාග්‍යවතුන්

වහන්ස මාගේ ඒ දසඳහසක් අවුරුදු දුනහාවූ දුහාය සිල්වත් මනුෂ්‍ය කුල නැතිවෙයින් දක්ෂිණාර්හයන් සූනාවිය එබඳුනිගේ මට කවර ප්‍රයෝජනයද,

අයංසෝ ඉන්දකෝ යක්ඛා දිබ්බාදූනං පරිත්තකං
අතිරොචති අම්හේහි චන්දං තාරගණේ යථා,

මේ ඉන්දක නම් දිව්‍ය පුත්‍රතෙම ඔත් සැන්දෑ පමණ සවල්ප දානයක් සිල්වතුන්ට දී තාරකා සමූහයා මැඩ දිලිහෙන්නාවූ සම් පූර්ණ චන්ද්‍ර මණ්ඩලයක් මෙන් අපගේ තේජස් මැඩ දිලිහෙන්නේය.

උජ්ජංගලේ යථාඛෙත්තෙ බීජංඛහුකම්පි රොපිතං
නඵලං විපුලංහොති නපිතොසෙති කස්සකං,

ඉතා දුඩිවූ හෝ තොයෙක් කරමැටි නැගෙන්නාවූ භූමියෙහි වපුරන ලද්දවූ බීජවලද බොහෝ ඵල දෙන්නේ නොවෙයි. එහෙයින් ගොවියාගේ සිත සතුටු කරන්නේ නොවෙයි,

තථෙවදානං විපුලං දුස්සීලෙසු පතිට්ඨිතං
නඵලං විපුලංහොති නපිතොසෙති දායකං.

එපරිදෙන්ම දුසිලවූ ජනයන් කෙරෙහි දෙනලද්දවූ දානය බහුත් ඉෂ්ටවිපාක දෙන්නේ නොවෙයි දායකයාගේ සිත සතුටු කරන්නේ නොවෙයි,

යථාපිභද්දකෙ ඛෙත්තෙ බීජං අප්පම්පිරොපිතං
සම්මාධාරං පවත්තෙතෙන ඵලං තොසෙති කස්සකං,

යම්සේ සාරවූ ක්ෂෙත්‍රයෙහි වපුරණලද්දවූ සුළුපටු බීජවලත් අඩමසින් අඩමසහෝ දසදවසින්දසදවසහෝ පස්දවසින් පස්දව සහෝ නොහැර වැසිවස්සාකල්හි බොහෝ සශ්‍යඵල ප්‍රදානය කර න්නේවේද.

එවමපි සීලවන්තස්ස ගුණවන්තස්ස තාදිස්ස
අපපකම්පි කතංකාරං ප්‍රසූසංහොති මහප්පලං.

එපරිදෙදන්ම ධ්‍යානාදිවූ ගුණ ධර්මයෙන් යුක්තවූ සැපදුක් දෙක්හි වෙනසක් නැතතාවූ සිල්වතුන් කෙරෙහි දෙනලද්දුවූ දානාදිවූ උපකාරය මහත්වූ ඉෂ්ටවිපාක ඇතතාවූකුසුලය සිඹකරන් නේයයි කීයේය.

මෙසේ අඛ්‍රබොන්පාදයෙහි දසදහසක් අවුරුදු අංකුර රජුරුවන් දුන්නාවුදානයත් අනුරුඹ තෙරුන්වහන්සේට ඉන්දකයා දුන්බත් සැන්දත් පරිභෝගකාලයෙහි ඉන්දකයා දුන්නාවූ දානය ඉතා සළුපය අංකුරයාගේ දානයෙහි දවසකට දනට දෙන්නාවූ සාල් පස්විසිකෙල තෙයාතුලක්ෂ පන්සාලිස්දුස් සහිතයක් කොමස් කළකල්හි ඉන්එකදෙකොටසක් පමණ ඇතැයි කියන්වත් සැකව තිබෙන්නේය. අංකුරයාගේ දානය සූපබ්‍යඤ්ජන සර්කරාදී මධුර රසයෙන් යුක්තය මේ ඉඳුකයාගේ දානය එසේවූ දානයෙක් නොවෙයි අංකුරයාගේ දානය බොහෝසේම සවහස්තයෙන් දුන්නාය. මේ ඉඳුකයාගේ සවහිස්තයෙන් දුන් දානයෙක් නොවෙයි. අංකුරයාගේ දානය අනුභවකරන අයට උන්උන්ගේ රුචිවූ පරිද්දෙන් සම්පූර්ණකොට දුන් දානයකි. මෙසේ ඉඳුකයාගේ දානය එකබත් සැන්දක් පමණහෙයින් සම්පූර්ණ දානයෙක් නොවෙයි. අංකුරයාගේ දානය වෙළඳමඬ පවත්ගත්තැන් පවත් දන් දෙන්වයයි උපකරණ රැස්කොට දුන් දානක් හෙයින් බොහෝ ව්‍යායම්කොට බොහෝ පුළු වෙතනා රාශියක් ඇතිව දුන්නාවූ දානයකි. මේ ඉඳුකයාගේ දානය පලමුවෙන් දන් දෙන්වයයි දැනොපකරණ රැස්කොට දුන් දානක් නොවන හෙයින් බොහෝ ව්‍යායම්කොට බොහෝ පුළු වෙතනා රාශියක් ඇතිව දුන්නාවූ දානයක් නොවේ. මේ අංකුරයාගේ දානය විසිදහසක් අවුරුද්දට ආයුෂය ඇති අවදියෙහි මනුෂ්‍ය ලොකයෙහි ඉපද දසදහසක් අවුරුදු නිරන්තරයෙන් දුන් දානයකි. මේ ඉඳුකයාගේ දානය ක්ෂණයකින් සිඹවූ දානය වන්නේය. එබදු ඉතා සවල්පවූ දානයෙන්ද දසදහසක් අවුරුදු මුලුල්ලෙහි දුන්නාවූ දානයෙන්ද අකුසල විපාක නැතිවඒකාන්තයෙන් උපදනාවූ දිව්‍යලොකයෙහි උපන්නාවූ ඔවුන්දෙදෙනා අතුරෙන් ඉතාසවල්ප දන්දුන්නාවූ ඒඉඳුකතෙම් දිව්‍යමයවූ රූපයෙන්ද දිව්‍යමයවූ ශබ්දයෙන්ද ගන්ධයෙන්ද ප්‍රෂ්ටව්‍යයෙන්ද ආයුෂයෙන්ද පරිවාරයෙන්ද ශරීරසෞන්දර්‍යයෙන්ද උසස්ගතියෙන්ද ආධිපත්‍යයෙන්ද දිවසැපවිඳිමෙන්ද ඒ අංකුරයාට වැඩිතරවූවේය. එබැවින් එබඳු සත්පුරුෂයෙනි, කුප් අසංඛයකිනුත් දුර්ලභවූ අනික් සක්වලකවත්

ලබාගත නොහැක්කාවූ දිව්‍යලෝක බ්‍රහ්මලෝකයෙහි සිටත් සිඹ නොකොටහැක්කාවූ මෙබඳු උත්කෘෂ්ට දානයට මදකුත් ආලිස්සං නොවී අප්‍රමාදව තමාගේ ශක්ති පමණට බුබාදී මහොත්තමයන්ට දන්දී මෙලොව පරලොව වැඩ සිඹ කටයුත්තේය.

මෙසේ උත්කෘෂ්ටවූ ප්‍රණීතශ්‍රේෂ්ඨයක් පැමිණි කල්හි තමාට දන්දීමනිසා ජීවිත විනාශයක් පැමිණෙතත් නුවණැත්තාහු පසු නොබැස දන්දෙන්නාහුවෙති. ඒ මෙපරිද්දෙන් අසා දත යුත්තේය.

එක්කලෙක අප තිලොගුරු සම්‍යක් සම්බුදුරජානන් වහන්සේ මහණ ගහනා පිරිවරා දනවී සැරිසරා වඩිනාසේක් කොසොල් රට ථූනනාම බමුණුගම සවත්පයට වැඩිසේක. ඒ බමුණුගම වසන්නාවූ බ්‍රාහ්මණයන් හා ගෘහපතීන් තමන් මිථ්‍යා දෘෂ්ටි හෙයින් මෙබඳු කල්පනාවක් කළෝය. ශ්‍රමණ භවත් ගෞතමයෝ ඉදින් කීපදවසක් මෙගම වාසය කළාහු විනම් මෙගම වැසියන් තමන්ගේ බසෙහි පවතිනා පරිද්දෙන් කෙරෙති එසේ කළෝවිනම් අපගේ බ්‍රාහ්මණ ධර්මයට පිහිටෙක් නැතැයි බුදුන් එගම් නොවසන පරිද්දෙන් උත්සාහ කරන්නෝ ගන්තොට තිබූ නැව් සඟවා ඒ දඹදිව් ඇදදමා මනුෂ්‍යයන්ගේ ගමන් නැවැත්තුවාහුය, එසේම පොකුණු සහ මරුබඩපාදියෙහි මනුෂ්‍යයන් අනුපරිභොග නොකරන පරිද්දෙන් කළෝය, එගම් එක ලිඳක් තබා සෙසු ලිං තණ පිදුරු පොල්ල ආදියෙන් පුරා වැසුවාහුය, භාග්‍යවත්වූ සම්බුදුන් වහන්සේ ඔවුන්කෙරෙහි පතලකරුනාවෙන් සංඝයා හා සමග අහසින් එනම් දෙරට පැමිණ මහින් ඉවත්ව එක් රුක් මූලක සංඝයා සමග වැඩඋන්සේක, බොහෝ දියට යන සත්‍රිහු බුදුන් වැඩඋන්නැන සවම්පයෙන් යෙති, එගම් වැස්සන් විසින් ඉඳින් ශ්‍රමණ භවත් ගෞතමයෝ මෙගමට ආවාහු විනම් ඔවුන්ට වන්දනමානනාදි සත්කාරයක්වත් හෙදෙරට ආවාවූ ඔවුන්ගේ ශ්‍රාවකයන්ට භික්ෂාවෙක් වත් නොදිය යුත්තේයයි කතිකාවක් කළාහුය, එගම බමුණෙක් හුගේ එක් දැසියක් කලඇකින් දියගෙන යන්නී භික්ෂූ සංඝයා පිරිවරා උන්කාවූ ලොවුතුරා බුදුන්ද මාර්ගඵලයෙන් මිරිකී දිය ලබනු කැමතිව වැඩඋන්නාවූ සංඝයාවහන්සේද දැක පැහැදි සිත් ඇතිව දියදෙනු කැමත්තී ඉදින් ගම්වැස්සෝ ශ්‍රමණ භවත් ගෞතමයන්ට කිසිවක් නොදිය යුත්තේය, ආදර විතරකුත් නොකටයුත්තේගයි, කතිකාවක් කොට උන්නේය, උන් එසේ කළත් මෙබඳු කෙනක් දැක බොන පැන් පමණක් දිවත් පිනක් නොකළෙමි, මෙබඳු දුඃඛ ජීවිකාවෙන් මම් කවර කලෙක මිදෙම්දැ

ඒකාන්තයෙන් මාගේ සවාමිපුත්‍රයාවත් මෙගම්වැස්සන්වත් මා මරතත් බඳිනතත් මේපින්කෙතට දියදී මිසක් නොනවතිමිසිජීවිතයෙහි ආලයක් නැතිව ඉසතිබු පැන්කලය දුනින් ගෙන එක්පසෙක තබාසිත්හි ජාතවූ ප්‍රීතිසොම්නස්ඇතිව බුදුන්ට පසඟපිහිටුවාවැඳ බොහොපැනින් පැවරුවාය, භාග්‍යවතුන් වහන්සේද ඇගේ චිත්තප්‍රසන්නතාවය බලා හස්තපාද ධොවනයකිරීමට උදක පානයන්කොට වදාළසේක, දිය මදකුත් අඩුනොව තිබුයේය. ඕ නොමෝ ආශ්චර්‍යයි දුකනම් දෙනමක යහාදින් හැම සංඝයා වහන්සේටම දිය දුන්නාය. එසේ කොටත් අඩුනොවිතිබු දියකලේගෙන ගෙට අභිමුඛව හියාය. ඇගේ සවාමි පුත්‍රතෙම එසේ එන්නාවූ ඈ දුක දිය දුන්බව අසා මැවිසින් ගම්වැස්සන්ගේ කතිකාවක් බිඳිනාලදහ මමත් නින්දුවට පැමිණියෙමියි ක්‍රොධයෙන් දිලියෙමින් තවතම යන අනුකරණ පවත්වන්නේ ඈ බිමහෙලා අතින් පයින් ඇන මැරිය. ඕ නොමෝ මිය තවුතිසා දිව්‍ය ලොකයෙහි උපන්නිය. ඇගේ ඒ කුශලානුභාවයෙන් කල්පවෘක්ෂයෙන් උපසොහිතවූ මහත් දිව්‍ය විමානයෙක් උපන්හේය, ඒ වටස්පවිත මණිවණී නිම්ල ජලවහනය කරන්නාවූ මුඛතාජාල රජත පට්ට භාසුර සිකතාකීණී පුලින තලාභිරාමවූ සෝන්ඵුල්ල සාලනිලක වඹපකොද්දල පාවල්‍යාදී වෘක්ෂයෙන් සැදුන් ලද්දවූ පඤ්චවර්ණ පද්ම සණ්ඩ මණ්ඩිත ප්‍රශස්තජලහරිත පුස්කරණියෙන් උපසොහිතවූ තීරානතඇති ගංගාවෙක් පහලවිය, එකල්හි භාග්‍යවත්වූසම්බුදුරජාණන්වහන්සේ ආනන්ද පාත්‍රය ගෙන ලිඳකින් දිය ගෙනෙවයි වදාළසේක. ආනන්ද සථිරයන් වහන්සේ සවාමිනි ගම්වැස්සන් විසින් ලින් වසනලදහ දිය ඉගනොන්ව නොපිළිවනැයි සැලකළසේක. බුදුහු දෙවනුවත් වදාළසේක. තෙරුන්වහන්සේ දෙවනුවත් නොපිළිවනැයි සැලකළසේක බුදුහු තෙවනුවත් වදාළසේක. තෙරුන්වහන්සේ තුන්වෙනිවර බුදුන්ගේ පාත්‍රය ගෙන ලිඳට අභිමුඛව වඩාගෙන්හි ලිදෙකි දිය පිරී ඉතිරී යන්නට වත ලිඳ වසාලූ තණ පිදුරු බොල් රොඩු ආදිය තෙමේම ඉගිල පහවිය එසේ ඉසිර යන්නාවූ ජලය සියලූ ලින් පොකුනුආදිය පුරාගෙන ගම් මැදින් ඉතිර දුවන්නට පටන්ගත. ඒ බුඛ මහිම දුටු ගම්වැස්සෝ ආශ්චර්‍යවිමන්වූ බුදුන් සවම්පයට අවුත් ක්ෂමා කළාහුය. එකෙනෙහිම චතුර අන්තඩ්ඩාහ්‍යය. නැවත අභිඝගින් ප්‍රශස්තවූ ගම්වැස්සෝ බුදුන්ට හා සංඝයාවහන්සේට වසතැන් නියම කොට දී දෙවෙනි දවස් මහා දන් සරසවා සිය අතින් වළඳවා අනන්තයෙහි බුදුන් පිරිවරා වටකොට උන්නාහුය. එකෙනෙහි බුදුන්ට දිය දී දිව්‍යලොකයෙහි උපන්නාවූ සත්තොම එකෙනෙහිම තමාගේ දිව්‍ය සම්පත්තිය දුක මේ කවර පිනකින් ලදිම්දැයි බලන්නී බුදුන්ට

දුන් දිය පමණකින් ලත් බව දන සන්ජානවූ ප්‍රීතිසොම්නස් ඇත්තී මනා පිළිවෙතෙහි පිහිටියාවූ මහෝත්තමයන්ට කරනලද සවල්පවූ සත්කාරයත් මෙබඳු මහත් විපාක දෙන්නේයයි ඒ මනුෂ්‍යයෝ නොදනිති. එහෙයින් දැන් ප්‍රකාශ කෙරෙමියි උත්‍යාන ඇතිව දිව්‍ය ස්ත්‍රීන් දහයක් පිරිවරා තමාගේ උද්‍යාන විමාන කල්පවෘක්ෂ නදී ප්‍රස්කරණී ආදිය නොතබාම ගෙන බුදුන් සවිමපයට අවුත් ඒ සියල්ල අහස රදවා තොමෝ විමානයෙන් බැස භාග්‍යවතුන් වහන්සේට තමිස්කාර කොට සිටියාය එසේ සිටියාවූ දිව්‍ය ස්ත්‍රිය දැක කුසල ඵලය ලොවට ප්‍රකාශ කරනු කැමැත්තාවූ භාග්‍යවතුන් වහන්සේගාථාපසකින් විචාරා වදළසේක, එසේ විචාළාවූ භාග්‍යවතුන් වහන්සේට ඒ සත්‍රිතොම තමාකල පින් තෝරා කීවාය, එසේ කීවාවූ සත්‍රියට හා එතැන්හි රැස්වූ පිරිසට බුදුහු ධර්මදෙශනා කොට වදළසේක, ඒ ධර්මදෙශනාව අසා දිව්‍ය සත්‍රිතොම සොවාන් වූවාය, සෙසුත් එතැන්හී පැමිණියාවූ මහජනයාට දෙශනාව සාර්ථකවූසේය.

මේසේ සවල්ප දානයෙනුත් මහත් විපාක සිඹවන්නේශයි දන්නා කවර නම් සත්වයෙක් දන් දීමට ප්‍රමාද වන්නේද.

තවද අකුශල්කොට එදා මිය නරකයෙහි උපදිනා අයත් මේ බුඬාදි මහෝත්තමයන්ට සවල්පවූ ඉතා ලාමකවූ දන්දී දිව්‍ය ලෝකයෙහි උපදනාහු වෙති. ඒ මතු කියන කථාවෙන් අසා දතයුත්තේය.

රජගහ නුවර එක් කුල ගෙයක් එක් රෝගයකින් මහත් උපද්‍රවයට පැමිණියේය. ඒ ගෙයි සියලු මනුෂ්‍යයෝම මළහ. එක ස්ත්‍රියක් පමණක් ජීවත්වූවාය. ඒ ස්ත්‍රිතොම මරණ භයින් තැති ගත්තීය. ගෙයත් ගෙයි තිබූ සියලු ධන ධාන්‍ය සම්පත්තියත් දමා තික්ෂී සිදුරකින්ම ගොස් අනාථව අනුන්ගේ ගෙයක් පිටිපස වසන්නීය. ඒ ගෙහි වසන්නාවූ මනුෂ්‍යයෝ ඈ කෙරෙහි කරුණාවෙන් සැලි කල තාලි ආදියෙහි ඉතිරිව තිබූ කැඳ බත්ද බතින් පෙරාගත් කැඳ දියද දෙති. ඒ සත්‍රිතොම එයින් ජීවත්වන්නීය. එකල්හි ආයුෂ්මත්වූ මහා කාශ්‍යප තෙරුන්වහන්සේ සතියක් නිරොධ සමාපත්තියෙන් වැඩහිඳ ඉන් නැගිසේක් මම අද කවරක්හුගේ ආහරයක් පිළිගෙන ඕහට සංග්‍රහ කෙරෙම්දැයි දිවසින් බලා ඒගෙය පිටිපස ඔත් ස්ත්‍රිය දැක ඈ මරණාසන්න බව දැන නරකයෙහි උපදවන්නාවූ අකුසලකර්ම අවසරලත්බව දැන් තෝතාමෝ මා ගිය කල්හී අහරක් දෙයි. එසින් ඕ නරකයෙහි නොගිපද දිව්‍ය ලොක

යෙහි උපදින්නීය. එහෙයින් ඇම සඟී ලෝකෝත්පත්තීය සිඹ කෙරෙමිසි ගැටවටු ගන්වාගෙන පාත්‍රය අතින්ගෙන ඇ වහන තැනට අභිමුඛව වඩින්ට පටන්ගත්සේක.

"එකල්හි ශක්‍රදේවේන්‍ද්‍රතෙම අප්‍රසිඛ වෙශයකින් නොඉක්මක් සුප ව්‍යංජනයෙන් සම්පූර්ණවූ දිව්‍යාහාරයක් ගෙනැවුත් සිටියේය. තෙරුන්වහන්සේ ශක්‍රත්‍වයයි දැන එම්බා ශක්‍රදේවෙන්ද්‍රය තෝ කෘතපුණ්‍ය ඇත්තෙහිය. කවරහෙයකින් මේ දුගින්ගේ සැපත් උදුරන්නෙහිදැයි ඔහුගේ දන් ප්‍රතික්ෂේපකොට් ඒ සත්‍රියගේ ඉදිරිපිට වැඩසිටියේක. ඒ සත්‍රිතොම එසේ සිටියාවූ තෙරුන්වහන්සේ දැක මුන්වහන්සේ මහත් මඟිම ඇති තෙරකෙනෙකුත් වහන්සේයයි මුන්වහන්සේට දියයුතු ආහාරයෙක් මව නැත. ඉතාම මිලිත භාජනයක තිබෙන්නාවූ ත්‍රිණවූණීාදියෙන් මුසුවූ ධූලියෙන් කිලිටුවූ ලුණු නැත්තාවූ සිඟිල්වූ රසනැත්තාවූ ඇඹිල්වූ බතින් පෙරාගත් කැඳදිය පමනෙක් ඇත, ඒ මුන්වහන්සේට දෙන්ට නොහැකෙක මියි සිතා සවාමීනි අනික් නැනකින් ලබනසේ වැඩිය මැනවැයි කීවාය. තෙරුන්වහන්සේ මදක් පසුබැස වැඩසිටියසේක් එහෙයි මනුෂ්‍යයෝ පිළිගැන්වීමට ආහාර ගෙනාවාහුය; තෙරුන්වහන්සේ ඒ නොපිළිගත්සේක; ඒ සත්‍රි දුක මුන්වහන්සේ මාගෙරෙහි කරුනාවෙන්ම වැඩසේක; මාහනන දෙයක්ම ලබනසේක්වකැයි සිතා පැහැදි සිනින් ඒ කැඳදියහන තෙරුන්වහන්සේගේ පාත්‍රයට පිළිගැන්වුවාය; තෙරුන්වහන්සේ ඇගේ සිත සැපවඩනා පිණිස වළඳන ආකාර දැක්වූසේක; ඒදැන මනුෂ්‍යයෝ අස්නක් පනවා දුන්නාහුය; තෙරුන්වහන්සේ එහි වැඩහිඳ ඒ කාඳියත්න වළඳ අතත් පාත්‍රයත් සෝදා අනුමෙවෙනි ඛණවදුරා සත්‍රියට තෝ මිට තුන්වන ජාතියෙහි මිට මව්වූවායයි වදුරා වැඩසේක, එයින් ඕ තෙරුන්වහන්සේ කෙරෙහි හක්තිප්‍රේම උපදවා එමදු රාත්‍රියේ ප්‍රථම යාමයෙහිදීම මිය; නිමිණරහී දිව්‍යලෝකයෙහි උපන්නීය; ශක්‍රදේවේන්‍ද්‍රතෙම ඇම ලබවදුන කොතනකඋපන්නිදැයි ආවර්ජනා කරනුයේ තව්තිසා දිව්‍යලෝකයෙහිත් පානදිව්‍යලෝකයෙහිත් ඇ නොදැක මධ්‍යම රාත්‍රියෙහි අවුත් කාශ්‍යප තෙරුන්වහන්සේ කරා පැමිණි ඒ සත්‍රිය උපන්නැන විචාරන්නේ:—

පිණ්ඩාය තෙ චරන්තස්ස තුණ්හීභූතස්ස තිට්ඨතෝ
දළිද්දා කපනා නාරී පාරාගාරං අපස්සිතා.

යනාදීන් ඒ සත්‍රිය උපන්නැන් විචාළේය.

එසේ විචාලාවූ ඔහුට තෙරුන්වහන්සේ ඒ සත්‍රිය නිම්මාණරජ්ජ දිව්‍යලොකයෙහි උපන්බව වදුළසේක. එසේ වදුළාවූ කාශ්‍යප සථවිරයන්වහන්සේගේ වචනය අසා ඒදුනය ප්‍රශංසාකොට කියන්නාවූ ශක්‍රදේවෙන්‍රතෙම,

මේ දුනය ඉතා ආශ්චර්‍යවන්සේය. ඒ එසේමය. මේ දුගිවූ සත්‍රියවිසින් අනුන්ගේ හෙදෙර සිහාගෙනාවාවූ බහින් පෙරූ ඇඹුල්කැඳදියතනකැයි කියනලද මේ දුනය කාශ්‍යප සථවිරයන් වහන්සේ කෙරෙහි පිහිටුවූයේය. මහත් අනුසස් ඉහත් විපාක සිඹ කෙළේය.

අති දිඹි අහිනුඹු අතිකෘෂ අතිස්ථූලාදි දෙෂවිරහිතවූ මනුෂ්‍ය සත්‍රීන්ගේ රූපය ඉක්ම සිවියාවූ දිව්‍යස්ත්‍රියගේ රූපයට නොපැමිණියාවූ වලලහයාට අලාමක දර්‍ශනවූ යම් සත්‍රියක් සතරමහදිවසිනට ආධිපත්‍යය පවත්වා රාජශ්‍රී අනුභවකරන්නාවූ චක්‍රවර්ති මහා රජ්ජාට අනෙකශතසහස්‍රවූවාද ඒරාජමහෙසිකාද ඇගේ ආශ්චර්‍යවූද මේ සත්‍රිය දුන් ඇඹුල්කැඳ දියත්තෙහි කුසලඵලය සොළොස්වන භාගයක්තෙකාට ඉන් එක්භාගයක් හෙණ ඒ භාගයත් සොළොස් කොටියාගයක්තෙකාට ඉන් එක්කොටසාසයකුත් අගනේ නොවෙයි.

උතුම් සඛණියෙන් පසළොස්ලක්ෂයක් හෝ කෙලක්ද රන් පොරොවුලා සරහනලද ශිෂ්‍යජවසම්පන්නවූ උතුම අශ්වයා ලක්ෂයක්ද එසේම අශ්වාලංකාරයෙන් සරහා යොදනලද අශ්වයන් ඇති රථලක්ෂයක්ද බහා පලඳනාලද සඛණීපුරුතුපුරාදි ආභරණ ඇති ආවහාවලිලාවිලාස සම්පන්නා තව යෞවන සත්‍රිහු ලක්ෂයක්ද යන මේ සියල්ලෝ සත්‍රිය දුන් ඇඹුල් කැඳදියත්තෙහි විපාකයාගේ සොළොස්වන කලාවකුදු අගනානු නොවෙති.

සත්දහසක් යොදුන් පූර්වවිදෙහය එසේම අපරගොයානය අවදහසක් යොදුන් උතුරු කුරුෂීපයද දසදහසක් යොදුන් ජම්බු ද්වීපයද යන සතරමහාදිවසිනවද දෙදහසක් ක්ෂුද්‍රද්වීපයන්වද එකාත පත්‍රව රාජ්‍යයකරන්නාවූ හස්තිරත්නාදය අශ්වරත්නාදය යනාදීවූ සප්තවිධරත්නයක් ඇති සතිස්යොදනෙක පැතිර සිටින මහා සෙනඟක්ඇති චක්‍රවර්ති රජ්ජුගේ යම් ඓශ්වර්‍යයෙක් ඇද්ද? ඒත් මේ දුනයාගේ සොළොස්වෙනි කලාවටත් අගනේ නොවෙයි කියාශක්‍රදේවෙන්‍රයා ප්‍රශංසාකොටකීය, මෙසේ ඇඹුල්කැඳ දියතත පමණයාදුන් සත්‍රිය පින්කෙත මහත්හෙයින් පැමිණියාවූ නර කෝන්පත්‍යයෙන් මිදී නිම්මාණරතී දිව්‍යලොකයෙහි දෙවියන් කෙරෙහි උපන්නාය.

මේ සත්‍ර මතුතෝවෙයි මෙසේම පෙර කාශ්‍යපබුදුන්ගේ ශාසන යෙහි එක්සඟනමකට කඩක්දුන් එක්සත්‍රියක්ද දැසමන් මල්දමක් දුන් එක්සත්‍රියක්ද සුවඳ පිඹක්දුන් එක්සත්‍රියක්ද මිහිරිපලයක් දුන්.එක්සත්‍රියක්ද උක්රසයක්දුන් එක්සත්‍රියක්ද බුදුන්ගේ දෙඉැටියි සුවඳ පසඟුලක්දුන් එක්සත්‍රියක්ද පිඬුසිඟා යන හිඳුම්ණෙනෙකුන් වහන්සේට කිරිබත්දුන් එක්සත්‍රියක්ද උක්පැණිදුන් එක්සත්‍රියක්ද උක්දණඩක්දුන් එක්සත්‍රියක්ද හිඹිරිගෙඩියක් දුන් එක්සත්‍රියක්ද කැඹිරිගෙඩියක් දුන් එක්සත්‍රියක්ද තියඹරාවක්දුන් එක්සත්‍රියක්ද පලාම්පක්දුන් එක්සත්‍රියක්ද මූලඵලයක්දුන් එක්සත්‍රියක්ද කොසඹ කොලම්පක්දුන් එක්සත්‍රියක්ද තලමුරුවට පමණක්දුන් එක්සත්‍රියක්ද කායබන්ධනයක්දුන් එක්සත්‍රියක්ද යොගිපට්ටයක්දුන් එක්සත්‍රියක්ද දුම්මාලාවක්දුන් එක්සත්‍රියක්ද තල්වැටක්දුන් එක්සත්‍රියක්ද මොනරපිල් කලඹක්දුන් එක්සත්‍රියක්ද කුඩයක්දුන් එක්සත්‍රියක්ද වහන්සඟලක්දුන් එක්සත්‍රියක්ද ත්‍රුපමණක්දුන් එක්සත්‍රියක්ද යන මේ සියල්ලෝම එතැන්පටන් අවුරුදු දහසක් ගියකල අභ ලක් වැඩෙන පොළොව සත්ගවු සමාරක් වැඩෙනතුරු සුගතියෙහි සිට දැනුත් හැමදෙනම දහස්ගනන් දිවසුරන් පිරිවරා ශක්‍රදේවෙන්ද්‍රයන්ට පාරිචාරිකාව සිටිනාහුය.

මේසේ බුඩාදිවූ ප්‍රණ්‍යක්ෂේත්‍රයෙහි පවත්වනලද සළුල්ප දානයත් මහත් විපාකදෙන්නේය.

තවද මේබඳු ප්‍රණ්‍යක්ෂේත්‍රයෙහි පවත්වනලද දානය හෙමේ සුළුපවිනමුත් කල්පලක්ෂගණනකුත් සතරඅපායෙහි ඉපදීම නවත සදිව්‍යලොකයෙහි සැපවිඳුවා අකලවර නිවනුත් සිඹකරන්නේය.

මේ කථාව අසා දතයුත්තේය. මේ භද්‍රකල්පයෙන් සව කල් ලක්‍ෂයකින්ඇත පියුමතුරානම් බුදුන් ලොවපහළවූකල්හි උන් වහන්සේගේ ශාසනයෙහි මහාවූ සුජාතනම් එතදාංසුකුල තෙර කෙනෙකුන්වහන්සේ පාංසුකූලයව සුදුසු තැරදී හොයා ඇවිදිනාවා දැක හංසවතී නුවර අනුන්ට බැලමෙහෙවර කොට ජීවත්වන්නාවූ එක්දුගී පුරුෂයෙක් තමා ඇඳිකඹින් කැබැල්ලක් කඩාදී කමස් කාරතොට ගියේය ඒ කුශලකම්යෙන් හෙතෙම සිස්තුන්වරෙක දෙව්ලොව දිව්‍යරාජ්‍යය කෙළේය. සත්සියක්වර මිනිස්ලොව චතු වර්ති රාජ්‍යයකෙළේය. කාසිකොසලදේශ මහඩකුරුපක්‍ෂාල අග වූ කාලිකාදිවූ සදශවලම රජවූ ජාතිපමණක්නැත. කාශ්‍යප බුදුන්සමයෙහි මහනදම්ප්‍රරා එතැන්පටන් බුඩානන්තරයක් දිව්‍ය මනුෂ්‍ය ලෝකයන්හි සැරිසරා අවිදින් අප බුදුන් කල්හි බුදුපි

කොසඹෑනුවර ඛම්බුකුලයෙක ඉපද බ්‍රාහ්මණධම්මිකයෙකි නීඝපතියව පැමිණ බුදුගුන අසා පැහැදිසින් ඇත්තේ සස්නෙහි මහතව උපසම්පදා ලැබ වරිතානුකූලවූ කම්මට්ඨානභාවනා කොටමින් එකල්හි කලඟකාරිව දෙපසෘයකව මඬුනාවූ කොසඹෑනුවර භික්ෂූන්ව එක්තොව බුදුන් දුන් අවවාදයෙහි පිහිටා රහත්වූ සේක.

මෙසේ සවල්ඹදුනයකුත් උතුම් පුණ්‍යක්ෂෙත්‍රයව පමුණුවන ලද්දේ මහත්විපාක දෙන්නේය. බොහෝකලක්ඉඤවිපාක දෙන්නේයයි සිතා සත්පුරුෂයන්විසින් අප්‍රමාදව දන්දිදිය යුත්තේය.

තවද දන්දෙනා පුරුෂයාගේ ශ්‍රද්ධාවත් ඉතා බලවත්විනම් ඵලත් අදහාදෙන්නේවිනම් දානවස්තුවත් ඉතා දැහැමෙන් ලබන ලද්දේවිනම් ආදිමධ්‍යඝන චෙතනාවෝත් ඉතා පිරිසිදුවිනම් පුණ්‍යක්ෂෙත්‍රයත් ඉතා උතුම්විනම් එසේ පැවැත්වූ දානය එම ජාතියෙහි විපාකදී භවානන්තරයෙහිත් විපාකදී ප්‍රාප්තිනාවූ පරිද්දෙන් නිවන්සිඹකරන්නේයයි ඒ මේ හේතුකියන කථාව අසා දන යුත්තේය.

මේ කප තුන්වෙනිවූ භාග්‍යවතුන්වහන්සේ විසින් විසිදහසක් ක්ෂීණාශ්‍රවයන් පිරිවරා බරණැස් නුවරට වැඩි සේක, මනුෂ්‍යයෝ තමතමන් ශක්තිපමණින් අටදෙනෙකුන් දස දෙනෙකුන් එක්ව ආගන්තුක දන් දුන්නාහුය. එක් දවසක් වළඳා අන්තයෙහි බුදුහු අනුමෙවෙනි බන වදාළසේක. එම්බ උපාසක වරුනි යමෙක් තමා සන්තක දෙයක්ම දන්දිය යුත්තේය, අනුන් සමාදන්කරවීමෙන් ප්‍රයෝජන කිමිදැයි සිතා තමාගෙන් දන් දෙන්නේය, අනුන්ගෙන් සමාදන් කොකර වන්නේය, ඒ පුද්ගලතෙම උපනුපන්තැන භොගසම්පත්තියම ලබන්නේය, පිරිවර සම්පත් නොලබන්නේය, යමෙක් අනුන්ගෙන් සමාදන් කරවා දන්දෙන්නේය, තමාගෙන් දන්නොදෙන්නේය; ඒ පුද්ගලතෙම උපනුපන් තැන පිරිවර සම්පත් ලබන්නේය වස්තු නොලබන්නේය. යමෙක් තෙමේ නමනුත් දන්කොදේද අනුනුත් සමාදන් නොකරවාද හෙතම උපනුපන් තැන භොග සම්පත්තියත් නොලබන්නේය, පරිවාර සම්පත්තියත් නොලබන්නේය. යාවකයෙක්ව ජීවත්වන්නේය. යමෙක් තෙමේත් දන්දේද අනුනුත් සමාදන් කරවාද ඒ තෙම උපනුපන් තැන්හි භොගසම්පත්තියත් ලබන්නේය පරිවාර සම්පත්තියත් ලබන්නේයයි වදාළසේක. එක් පණ්ඩිත පුරුෂයෙක්ද ඒ අසා මම භොගසම්පත්තියත් පිරිවර සම්පත්තියත් ලබනලෙස උත්සාහ කෙරෙම්යි සිතා බුදුන්වැ වැඳගිය මාගෙන් දන් පිළිගන

මැනවැයි ආරාධනා කෙළේය. කෙනෙක් භික්ෂූන්ට දන්දෙතු කැමැතෙනසිදැයි වදුලසේක, සවාමිනි භාග්‍යවතුන් වහන්ස තුමූ වහන්සේගේ පිරිවර භික්ෂූන්වහන්සේ කොපමණදැයි විචාළේය. විසිදහසකැයි වදුලසේක. ඒ හැම්දෙනා වහන්සේටම දන්දෙමියි කියා ආරාධනා කෙළේය, බුදුහු ඉවසා වදුලසේක. ඒ පුරුෂතෙම නුවරට ගොස් එම්බා මෑනිගෙනි පියාතෙනි; මම බුදුන් ප්‍රධාන කොට ඇති මහා සංඝයා වහන්සේට හෙට දවස් දන්දෙමියි පැවරිම් තොපි සම් කෙණෙකුන් වහන්සේට දන්දෙන්ට හැකිවුවාහුද එපමණ භික්ෂූන්වහන්සේට දන්දෙවයි කියා ඇවිද්දේය. නුවර වැස්සෝ ඔහුගේ බස් අසා තමතමන්ගේ සක්ති පමණින් අපි දස නමකට දෙමහ. අපි විසිනමකට දෙමහ අපි තිස්නමකට දෙමහ අපි සතලිස් නමකට දෙමහ පනස්නමකට දෙමහ සියස් නමකට දෙමහ සාරසියයක් නමකට දෙමහ පන්සියයක් නමකට දෙමහයි කිවාහුය. පණ්ඩිත පුරුෂතෙම සියල්ලවුන්ගේ බස් අසා පන්තිසයන්ම පතක ලියාගනිමින් ගියේය එනුවර එකල්හි ඉතා දුගිතෙයින් මහලු දුගියයි යන එක් යාචකයෙක් ඒ උපාසකයා ඉදිරියට පැමිණියේය තෙතෙම ඔහු දැක එම්බල දුගිය සෙවදවස දන්දීමට බුදුපාමොක් මහා සංඝයාට ආරාධනාකෙළෙමි සෙට නුවර වැස්සෝ දන්දෙති තොවත් දන්දෙන්ට හැකිවන්නෙහිදැයි විචාළේය. දුගිතෙම කියනුයේ ස්වාමිනි දන්දෙනෙහෝ වස්තු ඇති අයම්ය මට කැඳබීමට සාල් නැලියක් නැත මම කෙසේ දන්දෙමි දැයි කියා. එසේ කිවත් ඒ පුරුෂතෙම තමා නුවන ඇතිතෙයින් හැරනොගොස් එම්බා මහදුගිය මෙනුවර රසමසවුලෙන් යුක්තවූ එතුම් ආහර අනුභවකොට සිතින් පිලිහැඳ නොයෙක් ආභරණ පැළඳ ශ්‍රීඝන්වල සැතපෙන්නාවූ බොහෝ ජනයෝ මහා සැපත් අනුභවකෙරෙත් තෝ දිවාභාගය ඉක්මවුල්ලෙහි බැලමෙහෙකොටත් බඩපුරා ආහාරයක් නොලබන්නෙහිය එසේමුත් පෙර තා පින් නොකළහෙයින් දුක්විඳින්නෙමියි දැනගත නොහෙන්නෙහිගයි කීයේය, ඒ දුගිතෙම එබසට මම දන්දෙමියි කීයේය, එසේ දන්නා කල මෙබඳු පුණ්‍යක්ෂෙත්‍රයකුන් ඇතිව තමාගේ කායබලත් ඇතිව තිබියදී බැලමෙහෙකොටවත් දන්දියයුත්තේයයි කීය, ඒ උපාසකයා එසේ කාරණා කීකල්හි ඒ දුගිතෙම එසේවිනම් එක් කෙනෙකුන් වහන්සේ පතෙහි ලියාගත මැනව බැලමෙහෙකොටවී දන්දෙමියි කීය ඒ උපාසකතෙම එක්කෙනෙකුන් වහන්සේ පතෙහි ලියන්නේ කිම්දැයි කියා ගියේය, මහදුගිතෙම ගෙටගොස් භාර්‍යාව කියනුයේ සොඳුර සෙට්දවස් නුවරවැස්සෝ මහසඟනට දන් දෙති සම්දන්කර්න පුරුෂයා විසින මවත් එක් භික්ෂු කෙනෙකුන්

ඔහන්සේට දන්දෙවයිකීය, මම ඔහුගේ බස් අසා ඒ යහපතැයි පිළිගතිමියි කීය, ඒ අසා ඔහුන්ගේ භාග්‍යවතොමෝ අපි දිලිඳු අපයක කවර හෙයකින් අපෝ ගිවිස්සෙහිදැයි නොකියා යහපතක් කරන ලදහ පලමු අපි තුදුන්නකයින්ට දැන් දුගිවූවිහ එබැවින් අපි දෙදෙනාම බැලමෙහෙකාරයා දන්දෙමියනි සදෙදනාම නෙසියන් නිත්‍ය බැලමෙහෙකරුයා නැනකව ගියෝය, එතුවර සිටුතෙමේ දුගියා දැක කිමෙක්ද බැලමෙහෙ කරන්නෙහිදැයි විචාළේය, ඔහුද එසේ යයි කීය. කවර මෙහෙයක් කරන්නෙහිදැයි විචාළේය. තුඹවහන්සේ කරවනසේ කරවන දෙයකැයි කීයේය, එසේවීනම් අපි සෙව සඟ තුන්සියනමකට දන්දෙමිහ ඊට දරුපලා දෙවයි කියා වැපොරෝ ගෙන්වාදින මහදුගිතෙම කුසපට දුඹකොට බැඳගෙන පොරවදමා වැයගනිමින් වැසදමා පොරව නගිමින් මහත් උන්සාහයෙන් දරපලන්නේය. මහ සිටුතෙම ඒ දුක නෝ සසු දවස්වලට වඩා අද මහා වියරුවෙන් මෙහෙකරන්නෙහිය ඊට හාරතා කිමිදැයි විචාළේය. ඩෑම්න්වහන්ස සෙව මිමත් එක් භික්ෂුකෙනකුන් වහන්සේ වළඳවනු කැමැත්තෙමි ඒනිසායයි කීයේය.

ඒ අසා සිටුපුත්‍රතෙම ඉතා ආශ්චර්‍යයක් මේ දුගියා මට බැලමෙහෙකොට ජීවත්වන එකකැයි නියම් කොයිද බැලමෙහෙකොට දන්දෙන්නෙමියයි සතෙනාඹව දරපැලූ ශීලයයි හාල්සතර නැලියක්ද දන්දෙනවාට සතුටුව දෙතෙදෙයයයි නැවතත් හාල්සතරනැලියක්ද දුන්නේය. සිටුභාර්‍යාවද ඔහුගේ භාග්‍යවත දුක නෝ කවර මෙහෙයක් කරන්නීදැයි විචාරා තුඹවහන්ස වදුල දෙයක් කෙරෙමියි කීකල්හි ඈ වීකොටන ගෙට ගමන්කරවා තුටු මොහොල් ආදිය දෙවූවාය ඔද නවන්නියකමෙන් තුටු පහටු සිත් ඇතිව විපහරන්නීය සාල්ද පුකරනතීය, සිටුදුතොම විචාරන්නී නොපි ඉතා තුටුපහටුව කම්මානතකරන්නෙහිය ඒ කුමක්නිසාදැයි විචාළාය. වහන්ස, මම එක් භික්ෂුකෙනෙකුන්වහන්සේ වළඳවමි. ඒනිසායයි කීවාය, එබසම සතුටුව සිටු භාර්‍යාවද එක් ගිතෙල් නැලියක්ද දිහාජනයක්ද දුරු ඵිරිස් ආදී කුලුබඩු පැසි සාල්නැලියක්ද දුන්නීය. මෙසේ ඔවුන්දෙනා සාල් පස්නැලියක් ලදුරුගසි සතෙන්නාඹව උදුසන නැගිසිට භාර්‍යාවොම දුගියාට පලාගෙණවිසි කීවාය. ඒ තෙමේ තෙරුන් වහන්සේ නිසියගියා සතුටු සිතින් පලාකඩන්නේය මින් පූර්ව්වමා ගිටියාවූ කෙවිලූතෙම ඒ මිනිදුගියා කැඳවා ගෙන්වාගෙණ ඉතා සතුටුව නිතියකියා තුම්බක්කරන් නෙහිදැයි විචාළේය. "පලාකඩාවා" යි කීය, එසිත් තුම්බ් කෙරේදැයි විචාළකල්හි එක් භික්ෂුකෙනෙහු වහන්සේ වළඳවනු

නිසාගසයි කීවේය, දෙවෝ මහණගිය පලාගකාල වළඳන භික්ෂූන්වහන්සේ ඉතා සුවපත් කොගනාගුන්වනන්සේයයි කීවේය. එබසට දුගිගතෙම මා ලුදුදෙගයි. ගනාවළඳවා කුමක් කෙරෙමිදැයි කීය. එබසට කෙවුලුගතෙම කියනුයේ එසේවීනම් මේ මත්සගයන්ගෙන් කඟවනු දෙකක් වවනා අයද, සමාරක් වවනා අයද, පණමක් වවනා අයද, වෙනවෙනම අමුණුවසිකීය, ඇමුණු ඇමුණු මසුන් භික්ෂූන්වහන්සේට දන්දෙන හුගර වැඩසෝ ලිලදී ගෙණගියෝය, එසේ මස අධිනාත්තාවූ හිඟට වෙලාවූ ආගගනාවිය, එකල්හි යහළුව භික්ෂූන් වඩින්න වෙලාවගයි කීය, එකුලුගතෙම් මස් පැලක් ඇද්දයි විවාළේය, ඔබතැයි කියල්ලම් අරගෙණ ගියෝගයි කීය, එසේවීනම් මිනිසා විලිසාරා නබනලද "පරාධින" මත්සගයෝ සගරදුන ඇතා වෝ භික්ෂූන්වහන්සේ කෙනෙකුගේ වළඳවන් ගනහිඟම් ඔවුන් අරගෙණ යවයි කියා දුන්නෝය. සම්ඹුදන්වහන්සේ අඵගම් ලොවබලා වදුරණයේගේ මනදුගියා දැක ඔහුව කවර භික්ෂුවක් ලැබෙන්නිදැයි බලා කිසි භික්ෂුවක් නොලැබෙන නියාව දැක උදැසනම ශරීරකෘත්‍යගනොට මහදුගියාට සංග්‍රහකරෙමියි ගදකිලියව වැද වැඩහුන්සේක, ඒ මහදුගියාද රේමස්ගෙණ නෙවිවදනා කැඟී ශක්‍රයාගේ පාණ්ඩුකම්බල ශෛලාසනය හුණු විය, කාරණා කවරේදැයි බලන්නාවූ ශක්‍රදේවේන්ද්‍රයෙම බුදුහු මහදුගියාට සංග්‍රහකරෙමියි ගදකිලියෙහිම වැඩහුන්සේක. ඒ දුගිතෙම තමන් අනුභවකරණපරිද්දෙන් කැඳ බත් පලා මාලු ආදිය සපයා බුදුන්ට දෙන්නේය මම ඔහුගේ ගෙදරට ගොස් අරක් කැවිව හෝජන සම්පාදනයගකාට දුන්නොමියි සගහෙකැයි අප්‍රසිඩි වේශයකින් දුගියාගේ ගෙය සමීපයට ගොස් කිසිවක්හට බැල මේගෙයක් ඇද්දැයි විවාළේය, ඒ මහදුගිතෙම් කුමන කම්මාන් සගයන් කරන්නෙහිදැයි විවාළේය, එබසට ශක්‍රතෙම කියනුයේ මම සියලු සිල්පය දන්නෙමි, මා නොදන්නා සිල්පයෙක් නැත, කැඳ බත ආදියත් පියසාට දන්නොමියි කීය, යහළුව අපි තොපගේ කම්මානගෙයක් ප්‍රයෝජන ඇත්නම්හ, තොපම කුලී දෙන්ට නොහැකොකම්හයි කීය, එබසට ශක්‍රතෙම කියනුයේ තොපට කටයුතු කුමක් ඇද්දැයි විවාළේය, මම එක් භික්ෂූකෙනෙකුන් වහන්සේට දන්දෙන්නෙමි. උන්වහන්සේට කැඳබත්සපයාදීම කැමැත්තොමියි කීයඑබසට ශක්‍රතෙම ඉඳින් භික්ෂුවයහට භික්ෂාවක් දෙනුකැමැත්තේනම් මට කුලියෙන් ප්‍රයෝජනනැත, මටත්පින්පිරෙන්නේ වේ දැයිකීය. එබසට දුගිතෙම යහපත යහළුව ගෙට එවයි කැඳවීය. ඒ ශක්‍රදේවේන්ද්‍රතෙම දුගියාගේ ගෙවැද තොපි ගොස් තොපට කැමති භික්ෂූකෙනුන්කුත් වහන්සේ කැඳවා නෙණ එවයි කියා දුගියා

ගමින්කරවිය දනව විඛානකළාවූ පුරුෂතෙමේද තමා පතෙහි
ලියාගත් පමණ භික්ෂූන් ඒ ඒ ගෙවල්වලට බෙදාදිනා මහදුගියාද
ඔහුගේ සමීපයට ගොස් තොපට කැමතිලෙසට පැමිණි භික්ෂූන්වහ
න්සේ දෙවයි කීය. ඒවිඛාත පුරුෂතම එකෙනෙහි සිහිලැබූ මම
තොපගේ නමට භික්ෂුකෙනෙකුන් පතෙහි නොලිවි සෙයින් සිහි
නැතිවීමියි කීය. එකල්හි තියුණු තෙබකින් ලැයෙහි පහරණලද්
දක්මෙන් යහලුව මා නොනසව ඊයේ දවස් තොප විසින් සම්මාදන්
කරණලද්දාවූ මම භාග්‍යවන්හා සමග ඊයේ දවල් බැලමෙහෙ
කොට පලාපිණිස ගංතෙරවගොස් දැන් ආයෙමි. ඕට භික්ෂුකෙනෙ
කුන් වහන්සේ දෙවයි කියා දෙහොත් මුදුන් බැඳ හැඬිය. මිනු
ෂ්‍යයෝ රැස්ව මේකිමෙක්දැයි දුගියාගෙන් විචාළෝය, හෙතෙම්
එපවත්කීය, ඔව්හුද සමාදන් කරවූ පුරුෂයා අතින් යහළුව,
නොප බැලමෙහෙකොට එක් භික්ෂු කෙනෙකුත් වහන්සේට දන්
ෂදවයිකියා මෝහටකීවේ සැබෑදැයි විචාළෝය, එසේය, සැබ
වයිකීය, නැවත මනුෂ්‍යයෝ මොහුට එක් කෙනෙකුත් වහන්සේ
නුදුන්නේ ඇයිදැයි අවවාද කිවුය. උපාසකතෙම් නිස්තේජස්ව
එමඟා යහළු මහදුගිය, තෝ මා නොනසව තෝනිසා මම මහත්
දුකට පැමිණියෙමි. මනුෂ්‍යයෝ තමතමන් පත්වල ලියවූ ගණන්
භික්ෂූන් තමතමාගේ ගෙවලට කැඳවාගෙණ ගියේය. වැළඳීමට
තමතමන්ගේගෙයිවැඩහුන්භික්ෂුකෙනෙකුන් දෙනකෙනෙක්නැත.
භාග්‍යවතුන් වහන්සේ වහාහි මුවසෝදා ගඳකිළියෙහි වැඩහුන්
සේක, රජ යුවරජ සෙනෙවිරන් ආදිහු බුදුන් ගඳකිලියෙන් නික්
මෙන වේලාවබලා පාත්‍රය ගණුම්හඬ සිටියාහුය, බුදුවරයෝනම්
දුගියන්ව අනුග්‍රහකරන්නාහුය, තොපි විහාරයට ගොස් සවාමිනි
මම දුගියෙකි, මට අනුග්‍රහකළ මැනවයි කියා බුදුන්ට නමස්කාර
කරව ඉඳින් තෝ පිනැත්තෙහි නම් බුදුන් ලබන්නෙයයිකීය. ඒ
අසා දුගිතෙම විහාරයට ගියේය, රජ, යුවරජ, සෙනෙවිරන් ආදිහුද
මේ ඔත් වේලානොවේයයි කීවෝය, වහන්ස, ඔත් වේලානොවන
නියාම දනිමි, බුදුන්වඳින්ට ආයෙමියි කියා ගඳකිලිය සමීපයට
ගොස් එලිපත්තෙහි හිස තබා පසඟපිහිටුවා වැඳ සවාමිනි භාග්‍ය
වතුන් වහන්ස, මේ නුඹර මටවඩා දුගියෙක් නැත, මට පිහිටවී
සංග්‍රහයක් කොට වදුළමැනවයි යාඤ්ඤාකළේය, බුදුහු ගඳකිලි
දොරහැර පාත්‍රයගෙණ ඔහු අතට දුන්සේක, හෙතෙම සක්විති
රුවනක් ලදඤ්ඤුමෙන් සතුටුවිය. රජ; යුවරජ ආදීන් අතුරෙන්
ඔහු අතැතිබු පාත්‍රය ඇරගන්ට සමර්ථකෙනෙක් නුවූවාහුය,
එතකුදුවුවත් එම්බා දුගියා තව පාත්‍රයෙන් ප්‍රයෝජන කවරේද?.

තව දහස්ගණන්ත් වස්තු දෙමිහ. පාත්‍රය අපව දෙවසී යාඤ්ඤ කළෝය. දුගිතෙම කියනුයේ මට ධනයෙන් ප්‍රයෝජන කවරේද? බුදුන් වළඳවම්සි කියා පාත්‍රය නුදුන. සෙසු ශ්‍රව රජ, සෙනෙවිරත් ආදීහු යාඤ්ඤාකොට පාත්‍රය නොලදිත් ගියාහුය. එනුවර රජතෙම මේ දුගියා වස්තු ගෙණ පාත්‍රය නොදෙන්නේය, බුදුන් ශ්‍රී හස්ත යෙන් දුන් පාත්‍රය ඇරගන්මත් බැරිය. මේ දුගියාගේ දන් අල්ප වේයි. මොහු දන් පිළිගැන්වුකල්හි බුදුන් කැඳවාගෙණ රජ ගෙට ගොස් දන්දෙම්සි රජ බුදුන් හා කැටුව ගියේය.

ශැක්‍රතෙම කැඳ බත් මාලු සපයා බුදුන්ට වැඩ ඉන්ම සුදුසු අස්නකුත් පනවා උන්හෙන්ය, මහ දුගි තෙම බුදුන් කැඳවාගෙණ ගෙට වඩිනවයයි කියේය, ඔහුගේ ගෙය මිටිය බුදුවරයෝ නැමී ගෙට නොවදනාහුය, බුදුවරයන් ගගට වඩින විට මහපොලව හෝ පාත්වන්නේය, ගේ හෝ උස් වන්නේය, එයදුන පාරමිතාවේ මහිමයකි එබැවින් බුදුහු නොනැමී ගෙට වැඩ ශක්‍රයාවිසින් පනවන ආසනයෙහි වැඩහුන්නේය, එවිට රජතෙම එමහා දුගිය තෝ අප යාඤ්ඤාකළදිත් පාත්‍රය නුදුන්නෙහිය කෝපයෙන් දන් බලමිනයි කියා, එකල්හී ශක්‍රතෙම කැඳබත් මාලු ආදිවූදේ බුදුන්ට දැක්විය එහි සුවඳ සියලු නුවර පැතිරසිවිදේය; රජතෙම බුදුන්ට කිහුයේ ස්වාමිනි මේ දුගියාගේ දන් අල්පයදන් පිළිගැන්වුකල්හී ඔබ වහන්සේ කැඳවාගත රජගව යෙම්සි සිතා ආමිස මෙබඳු අහර යක් මා කිසිකලෙක නුදුටුයෙමි, මෙතන සිටි කල්හි මේ දුගිතෙම මිරිකෙන්නේය, මම යෙම්සි වැඳ අවසරගෙණගියේය. ශක්‍රදේවේන්ද්‍රයාද කැඳබත් ආදිය බුදුන්ට පිළිගන්වා වැළඳවිය, බුදුහු වළඳ අනතයෙහි අනුමෙවැනි බණ වදාරා හුනස්නෙන් නැගි වැඩියේක. ශක්‍රයාගේ බසින් මහ දුගිතෙම බුදුන්ගේ පාත්‍රය ගෙණ පසුපසසාගියේය. ශක්‍රතෙම දුගියාගේ ගෙදර සිට අහසබැලීය. සත්රුවන් වැසිවැස ඒ දුගියාගේ ගෙය පිරී ගියේය අවකාශනැතිවිය එබැවින් ඔහුගේ අඹුදරුවෝ දෙර සිටියෝය. දුගියා අවුත් දෙර සිටියවුන් දැක කිමෙක්දයි විමා ලෝය, ස්වාමිනි සියලුගෙය සත්රුවනින් පිරුණේය, ගෙවටදනම අවකාශනැතැයි කීවාය, මෙතෙම බුදුන්ට දුන් දානයෙහි විපාක අදම ලදිම්සි රජහුගේ සමීපයට ගොස් වැදසිටියේය, කුමක්නිසා ආයෙහිදැයි විචාලකල්හී මාගේ ගෙය සත්රුවනින් පිරුණේය ඒ හෙන්වාගත මැනවැයිකීය, ඉතා ආශ්චර්යයක අදම බුදුන්ට දන්දුන් විපාක දුනැයි සතුටුව එම්බල පුරුෂය ඊට කුමක් කටයුතු දැයි විචාළේය වස්තුව හෙනතට හැල්දහක් ඵවමානයි කීය රජ තෙම හැල්දහසක් ගමන්කරවා වස්තුවගෙන්වා රජගෙයි මිදුලෙහි

ගොඩගැස්වීය ධනරාශිය තල්ගයක් උසමවීය, රජතුවර වැසෙන් රැස්කරවා මෙතෙක් වස්තුව ඉඹුනුවර කවරක්හට ඇදගැසි වීවා ලේය දෙවඟන්වහන්ස කඹරෙක්හවත් නැතැයි කීවානුය, මෙබඳු වස්තුව ඇතතාහට කුමක්ද සංග්‍රහය ත් කරන්ට සුදුසුදැයි විචාළේය දෙවයන්වහන්ස සිටුතනතුරු දෙන්ට සුදුසුයයිකීහ, රජ ඔහට මහත් සත්කාරකොට සිටුතනතුරුදුන්හ පළමු සිටුවරයෙකු සිවිය යෙපලක් දකවා මේ බිම නෙවල්තනා වසවයිකීහ, බිම සුඛ කරවා කල්හි එහි මුවවිටින් මූවවිටට පැහැර යිවිනා නිධාන් ගතරක්ද පහළවිය එය රජහට කීහ, රජහු තාගේ පිතෙන්ඇපන් නිධාන් තා ගනුවයි කීහ එතෙම ගෙයකරවා සතියක් බුදුපාමොක් මහ සංඝයාට දන්දීනා ජීවිතාන්තයදක්වා පිත්කරමින් යිට කම්වුපරිද් දෙන් දෙව්ලොව ඉපද අප බුදුන් දවස එහින්චුතව අවුත් සැවැත්නුවර සැරියුත් භාග්‍යදුරුවන්ට උපයථානකරණ එක් සිටුකුලයක සිටුකුමාරියක කුසපිළි සිදගත්හ ඒ සිටුකුමරියව මෙසේ දෙලත් උපන සැරියුත් තෙරුන් ප්‍රධාන පන්සියයක් සංඝ යාට දන්දී කසාපිළිහැඳ ඒ අසුන් කෙළවර ගිඳගණ සංඝයා වලඳපු ඉදුල් බත් කනසේ මෙසේ දෙලක් උපත්හ ඒ බැව්දත් මව්පියෝ එසේකරවාලූහ, ඉක්බිති ඒ සිටු දූ පුත්‍රයෙකු වැදූහ ඒ පුත්‍රයාට නම්තබන දිනයෙහි සැරියුත් තෙරුන් ප්‍රධාන පන්සියය කට දන්දී අවසානයෙහි මෑනියෝ සඟවිනි නුබවහන්සේගේ දුස යාට ගිල්දුන මැනවයිකීහ. තෙරුන්වහන්සේ කුමාරයාගේ නම කුමක්දැයි විචාලසේක එබසට සිටුදූ කියන්නේ කුමරු ගැබ පිලිසුන්තැන්සිට මේ ගෙයි වැසිගොලුවෝ බිහිරා කොලූ බිහිරි හැරි ශ්‍රවපත්වූය එබැවින් කුමාරයාට පණ්ඩිත කුමාරයෝයනි නම් වන්නේයයිකීහ තෙරුන්වහන්සේ සිල්දී වැඩසේක, මෑනියෝද පුත්‍රයාගේ අදහස නොබිඳිමියි සිත්යේය කුමාරයා සත්ඇවිරිදිවූ කල්හි මහත්වහනව යෙමියිකීහ. පුත යහපත අදහස් නොබිඳිමියි කියා නැයන් රැස්කරවා සැරියුත්තෙරුන් වැඩමවා මාගේ පුත්‍රයාට හිඳිනේ පිළිබඳ සියලල අදම කරමියි කියා මහත් සත්කාරකොට ඉක්බිති විහාරයට පෙළහරින් ගෙනගොස් භාරකලේය තෙරුන් වහන්සේ පැවිදිකමේ දුස්කරතාවය කිකල්හී එසේ පැවිදිව වසන්ට සතුටුබැව් කීකල්හි එසේ වීනාම් එවසිඟියා තවපංචක කම්යථානය කියා පැවිදිකරවූසේය, මව්පියෝ විහාරයෙහි වසන බුදුන් ප්‍රධාන මහසංඝයාට දේමස්යතින සතියක් මහදන් පවත්වා සතවෙනිදා ගෙමගියෝය, තෙරුන්වහන්සේ ඔහු මහනවූ දින අසන් අටවනි දින භික්ෂුඅංඝයාවහන්සේ ගමට ඩිභාවැඩියකල්හි සියලු විනාශයේ ඇවිද බලා නැමද පුතුන් ඇමදඛොනපැන් සහ දුරිතොනයට ගන්නා පැනුත් රැස්කර ඇදපුටු සකස්කරතබ

පසුව ගමට වඩිනාණේක්ක මක්නිසාදයත් නීඝීකයෝ වෙහෙරවිහාරය ශ්‍රමනයන්ගේ කෘත්‍යබලවයි කියති ඒ නිසා එදවස් ඒ සියලු කොට පණ්ඩිත සාමණේරයන්වහන්සේ ලවා පාඝිවිරුගෙන්වා ගඟ ඉතා දුවල්කොට ගම්මතින්මුතුසේක. සාමණේරයන්වහන්සේද වඩනාසේක් අතරමග ඇල්දුණ වහන්ස මේකිමක්ද මෙයින් කුමක් සිඹකෙරේදැයි ඇසිය, මෙයින් ඒ ඒ තැනට දියඝනාඝාස් නොයම්කරතියි කීහ සඟාමිනි දිසට සිත්පිරි ඇදද ඇවනැතැයි වදුලසේක මේ යිත්පින් නැතනාවූ දියත් ඒ ඒ තැනට ගෙනයම් වේදැයි විචාලසේක එසේයයි වදුලසේක එවිට මෙසේ සියපින් නැතනාවූ ජලයත් තමුන් සිතූතැනට ගෙනඝාය කම්මනය සිඹකෙරෙති එසේ කල තැම්තෙරෙහි පැවැත්තාවූ සිත් පිසඟ කොටඝණ මේ ජනයන්ට කවරහෙයකින් මහනදම් පුරන්ට නොහැකිදැයි සිතූසේක, එසේසිනා ඇතයනවිට ශිත්තනත් තවා ඇස්කෙළවරින් බලා ඊ දඹු හදනනාවුන් දැක මොනු කවරහුදැයි විචාලසේක, මොනු ඊවඩුවොයයි වදුලසේක මොහු කුමක්කරම් දැනි විචාලකල්හී මොහු ශිත්තනත්තවා ඊදඹු ඇඳඅරිහියි වදුල සේක මේ දඹුවලට සිත්ඇදදැයි විචාලකල්හි සිත්නැතැයි වදුල සේක ඉඳින් සියනැතත වූ මේ දඹුශිත්තනත් තවා ඵලලකරණ කල කවර හෙයකින් සින් ඇත්තාවූ ජනයෝ විත්තය තමා වයඝයෙහි පවත්වාගත මහඤකම්කරන්ට නොහැකිවූවාදැයි සිතූසේක, නැවත ඇතයනකල්හී රථවක්‍රයට අරනිමි නැබඇදිය සස්නාඛුන් දැත මොහු කවරහුදැයි විචාරා වඩුවනැයි කීකල්හි මොහු සුමක් කෙරෙමිදැයි විචාරා දඹුගෙන නැහැරථයක් කරතියි අසා මිට සිත්ඇදදැයි විචාරා සිත්නැතැයි වදුලකල්හී ඉදින්සිත් නැත්තාවූ දඹුකැබලි ගෙණ රථාදිය කෙරෙද සවිත්තකවූ ජනයෝ කවරහෙයකින් සින තමා වසඝයෙහි පවත්වාගත මහනදම් නොකෙරෙදැයි මෙසේ ඒ සාමණේරයන් වහන්සේ සිතා සඟාමීනි නැවතුන මැනව සඟාමීන්වහන්සේගේ පාඝිවිරුඅරනත මැනව මම පන්සලට යෙමියිකීයේය, එකල්හී තෙරුන්වහන්සේ මේ සාමණේර තෙම මටබාලව සිවියෙමි මට පාඝිවිරුගන්ට කියන්නේයයි සිතා එසේ ගෙනෙවයි කියා පාඝිවිරු අහට ගන්සේක සාමණේරයන් වහන්සේද නමස්කාර කොට නවතිමින් වහන්ස මට අඟරක් ගෙනෙතොත් රේරමස්රය ඇතිව ගෙනෙවයිකීහ. සැරිපුත්හාමුදුරුවෝ ඇවත ඒ නොසින් ලබන්සක මිදුයි විචාළසේක. සඟාමිනි භුඛවහන්සේගේ පිණින් නොලබනත් මාගේ පිණින් ලබන සේකැයි කීහ. විහාරයට ගොස් ඇතියන් පිටත උන් මෙතෙට උපදුවයක් වේදැයි යනාසිතින් කෙස්සදීමා

වසනගෙයි දොරකැර හිදුවයි වදළසේක. උන්වහන්සේ ගොස් එසේ ඉඳන්දෙතිස්කුනපකොළාසය අරමුණුකොට භාවනාවට පවත්ගත් සේක. උන්වහන්සේගේ පුන්‍යතේජසින් ශක්‍රයාගේ පාණ්ඩුකම්බල සෛලාසනය හුනුවිය. කවරක්නිසාදයි බලනුයේ පන්සීය සංඝන් රසන්වහන්සේ උපාධ්‍යායන්වහන්සේට පාසිවිරුදි මඟනදම් පුර මිසි නැවතිසේක, මොන් එහි යායුතුයයි වරම්රජදරුවන් කැඳවාවිභා රය කාන්පස වනගෙයි පක්ෂීන් 'දුරුකොට රැකවල් ගණුවයි කියා චන්‍ද සූය්‍ය දෙදෙනාගේ ගමන් නවතා තෙමේ ගොස් දොරකඩ රැක වල්ගෙණ සිටියේය. වෙහෙරෙ පරඬැල් පතකුත් නුහුණියය. සාමණේ රයන් වහන්සේගේ සිතඑකඟවූයේය. උන්වහන්සේ පෙරවරුම ආන් මහාවය සම්මර්ෂනය කොට මාඝීපල තුනකට පැමිණිසේක. සැරියුත් තෙරුන්වහන්සේ සාමණේරතෙම වෙහෙරඋන්නේ උන්ට සුදුසු අඟ රක් අසවල් කුලයෙන් ලද්දඇක්කැයි තමන්ගේ කුලූපහකුලයකට වැඩිසේක. එගම මනුෂ්‍යයෝ ප්‍රේරමස් ලැබ තෙරුන්වහන්සේගේ ඊමබලා උන්නාහුය. වඩනා තෙරුන්වහන්සේ දැක සතුටුවී ගෙට කැඳවාඇත ගොස් කැඳඅවුලූ ආදිය දී ප්‍රේමස් රසයෙන් අහර පිලිගැන් නුහුණියය. තෙරුන්වහන්සේ ගෙන යන ආකාර දැක්කුසේක. වහන්ස වැලඳුව මැනව, ගෙනයාමුවත් ඇතැයි කීවාහුය. උන්වහන්සේද වලඳ පාත්‍රය පුරවාදුන් බොජුන්ගෙන සාමණේරයන්ට සාදුක් ඇතැයි වහ වහා වැඩියහසේක. බුදුහු එදවස් වේලාසනින් වලඳ විහාර යට වැඩ පණ්ඩිත සාමණේරයන් උපාධ්‍යායාට පාසිවිරුදි මඟනකම් කරයි උන්ගේ ශ්‍රමණ කෘත්‍යය උපදින්නේදැයි බලා ඕඟි පල තුනකට පැමිණියාදැක රහත්වන්හේතු ඇද්දැයි බලා පෙරවරු මහරහත්වහන්නේය. සාරිපුත්‍රයන් සාමණේරයන්ට ආහාරගෙණ සිඹුව වහා එන්නේ එසේ ඒ මෙන් රහත් ඵලයට අන්තරාවන්නේ යයි තමන්වහන්සේ වැඩ දොරටුවේ වැඩසිටිසේක. තෙරුන්වහන් සේද අවුත් එහි වැඩසිටිසේක. තෙරුන්වහන්සේ අතින් බුදුහු ප්‍රස්නයතරක් විචාලසේක.

භේෂකඡස්දයත්; ශාරිපුත්‍රයාවිසින් කුමක් ලබනලද්දේදැයි විචාරා වදළසේක. එබසට සැරියුත්ගාමුදුරුවෝ අහරක් ලබනලද්දේයයි වදළසේක. ඒ අහර කුමක්හෙයින් අහරවේදැයි විචාළසේක. යම් හෙයකින් සාපිපාස ඇත්තාවුන් විසින් අනුභව කරණලද ආහාරය එයින් දුකහාසා සුඛවේදනාව පමුණුවාද එයින් වේදනාගණෙණිසි කියා තෙරුන්වහන්සේ වදළසේක. බුදුහු නැවතද වේදනාව කුම ක්හෙනදේදැයි විචාළසේක. යම්හෙයකින් ආහර වැලඳීමෙන් සුව පත්වූ සත්‍යා ඒ සැපවිඳිනියා සරිරයෙහි වණ්ණසම්පත්තියවේද, ඒනිසා තෙරුන්වහන්සේ රූපගඟෙනෙයිවදළසේක. බුදුහු

නැවත ඒ රූපය සුමක් ගෙණෙදැයි විචාළසේක. යම්සඟයකින් ඒආහාර රූපයෙන් උපන් සැපසොම්නස් ඇති පුද්ගලතෙම දුන් මම අස්වැස්ලදිමියි සැතපෙන්නේනම් සුවපහස් ලබන්නේද එබැ වින් ස්වකීය ගෙණදෙනියි වදුළසේක ප්‍රස්ණසතර විසඳනකල්හී සාමණේරයන්වහන්සේ සිව්පිළිසිඹියාපත් රහන්බවට පැමිණිසේක සළුඹුයන්වහන්සේද ශාරිපුත්‍රය නොවැ සාමණේරයන්ම බත්දෙවයි වදුළසේක. තෙරුන්වහන්සේ නිහපිටින් දෙරවගැසුසේක. සාම ණේරයන්වහන්සේ දෙරහැර සැලූසේය. ඉක්බිති තෙරුන්වහ න්සේ සාමණේරයෙනි වලඳවයි කීහ. සාමිණි තුබවහන්සේ නොවලඳමැයි විචාළේය. අපි වැලඳුයෙමියිකීහ. ඒ සත්හැවිරිදි කුමාරතෙම පැවිදිවූ අවස්වෙනි දවස්හී සිව්පිළිසිඹියාපත් රහත්වී සුපිපි පියුමක්වැනි ප්‍රසන්නමුහුනින්ග්‍රස්තව පස්විකා ආහාරවලඳ පාත්‍රය සෝදා නමාරකලවිට චන්ද්‍රසූර්‍යයින් වහා බැසයාමෙන් හෙවනැල්ල දික්ව ගියේය ශක්‍රයා ආදි වූ බ්‍රහ්මරජදරුවන් නික්ම ගියේය. භික්ෂූනු වැඩුනාවූ ශාසාවදුන සාමණේරයාදන්වැලඳුසේය. මේ විකාලයයි ක්ෂයමින් භික්ෂූන් තුනුනකීවාහුය. බුදුහු දම්සභාම න්ඩපයට වැඩ මහතෙනි කුමක්කියමිදැයි විචාළකල්හි තමන් කීකථාව දුන්නුවාහුය. බුදුහු ඒඅසා එම්බා මහතෙනි පින්වත්නු මහාදම් කරණකල්හි චන්ද්‍රදිව්‍යපුත්‍රතෙමද සුර්‍යදිව්‍යපුත්‍රතෙ මේද ගමන්වලකා නැවතී සිටියේය. වරම්රජදරුවෝ වෙහෙර රකවල් ගන්හ සක්දෙව්රජතෙම දෙරටුව රක්සේය මමත් බුදුවිම යසිනිරුත්සාහයෙන් නොසිඳ මාගේ පුත්‍රයාට දෙරටුවේ රකවල් ගත සිටියෙමියයි වදුළසේක.

එතුන් පින්කෙන්හී පැවැත්නු දුනය නම් මෙසේ මහත් විපාක ඳන්නේයයි දුන අප්‍රමාදව දන් දියහුන්සේය. තවද පෙර බරනැස් නුවර බ්‍රහ්මදත්තනම් රජෙක් රාජ්‍යය කරණ කල්හී අපමහබෝස තාහන් වහන්සේ එනුවර අසුකෙලක් ධනඇති විසසිහසම් සිටුව පන්සිල් රක්නාසේක. මහත් දුනාධ්‍යාසඇති ඒ සිටුහෙමි නුවර මැද වාසල්දොරද තමන්ගේ ගෙදරද දන්ගල් කරවා දවස ලක්ෂය බැගින් ධනවිසදමින් මහදන්දෙන්වවිය. මේ මහත් දුනයෙන් සක් දෙව්විමන හුනුවිය. ශක්‍රතෙම තවරෙක් මගේ අස්න ගත්ව පින් කරන්නේදැයි බලා මහත් දන්දෙන විසසිහ සිටුතෙම දුක මොනු මෙසේ දන් දුනහොත් මට වන්නේ මහත් විපතකැයි සිතමින්ඔනු දිලිඳුකොට දන්දීම වලකවමියි සිතා සහල් තෙල් මී සකුරුආදී දුනවස්තූන්ද කම්කරුවන්ද අතුරුදම් කරවිය. දුනසාලාවෙහි නියු ක්ත පුරුෂයෝ ඇවිදින් සවාමීනි දන්දීම නැතිවිය තිබුතිබූ තැන්හි කිසි උපකරණයක් නුදුටුමිහයි කීවාහුය ඒ අසා සිටාහෝතැවත

මෙයින් උපතරණ නොණහොස් දෙව දත් වැර්නොතසවයි කියා හාසකාව කැඳවා සොඳුර දන්දැවි පවත්වති වදුලසේක ඕ තොමෝ සියලු ලොය පරිභොගකාව මුලුලඟයි අඩමසුක් පමන කුදු නොදැක ආයුසියන්වහන්ම අප දෙවදකා අදින වයතුපමනක් මුත් වෙනකිවිත් නැතැකිහිග. සත්රුවත් ගබඩාවලුත් එයේ ඇතුරුදන්වීය සියලුම කම්කරුවනුත් නොපෙනී ගියහ හම බෝසතානෝ සොඳුර දත් කඩක්රීම අනුතුය නෙයි මොනවාවත් ඇද්දැසිපරික්ෂාකරවති කිහ එසේ පරීක්ෂාකරණ සිටු හාසකාවන්ම තණ කපන කැත්තක් සහ තණ බඳින රැහැනක්ද කත්දන්ඩක්ද දෙරම්මුවාවෙහි තිබේනුදැක සිබෙන්නේ මෙපමනාසකි කිහ. එබසට බෝසතානෝ කිනනසේක් පියාවහ මිට පලමු මා තණකැපූදු නැත අදවනාකි තණ කපා ගෙනවුත් භික්ෂූව දන් දෙමිසිකියා දුකැන්නද කත්දන්ඩද ගෙන නුවරින් නික්ම තණ කෙතට ගොස් තන මිටි දෙකක් කපා එනන් අප පිණිසය අවිත දත් පිණිසයසි සිතා කඳින් ගෙණවුත් නුවරෙහිදී භික්ෂූවට රත් ගෙනවුත් එන් හාසයක් සාවිකයන්ට දින සාවතසන් ඛොහෝ බැවින් අපවත් දෙව අප වත් දෙවයි ඉල්ලන්වීය එවිට අනිත් හාසයන්දී හාසකාවන්හා නිරාහාරව සැතපී ඉඳ මේසේ දෙවවනි දවස්හි තන කපා ගෙණවුත් භික්ෂූව දෙහාසයම් දුන්නාහ. මේලෙස සත්දිනක්ම දුන්නේය. මෙසේ සත්වෙනි දවස තන ගෙණන්නාවූ සකියන්ම නිරාහාරවූ සවහාසවය්ම සිටිදැලිවූ උන්වහන්සේගේ මුහුනට ඉරුරුවැදගැන්මෙන් ඇස් බැබිසිසේය. එවිට උන්වහන්සේ ගිහිදුලුවාසන නොනී තණ කද කරනබානයම් වැටුනාසේක. ගැහැසාද උන්වහන්සේගේ ක්‍රියාව පරීක්ෂාකරනාස මෙසේකීහ. එවිබා විසඟිහ සිටානනි තොප නොපෙන් වස්තුව බොහෝ ඇතිකල්හි මුලු දඹදිව උඩ බබඳනා තනුල් ඇතිකොට මහදන්දුන්නේය, දුන් වනාහිදී දන් දීමනිසා වස්තුව ක්ෂයවහිසියේය, ඉදින් ඕන්මතු නොපිදන්නොදෙන්නේ වීනම් නොපෙන් වස්තුව ප්‍රකෘතිවත්තේය පළමුවෙන් වස්තුව දත්වෘත්තාමයි කිහ, මහාබෝසතානන්වහන්සේ ඒ අසා නොප කථෙර්දැයි විචාරා වදුලසේක් එබසට මම සකුදේවේන්ද්‍ර යෙමියිකිහ, එවිට බෝසතානන් වහන්සේ වදුරණසේක් තෝ සකුදේවේන්ද්‍රවීනම් ඕට පළමු දන්දී සිල්රැක හුනධම්යෙන් පුරා ශ්‍රද්ධාවුයෙමිහ, එබැවින් තට මේ සකුසම්පත්තිය සිඩිනොට දුන් නාවුද දුඃඛිත බහාසලුත්තෙනනාකිය දැන් නෝ නුවකැකි හිනජාති යන් කරණ කාරියක් කරන්නාහිසයි වදුලසේක,

එම්බා සකුදේවේන්ද්‍රය යටි මහකින් පළමු එක රථයක් ගියේ වීනම් පසුවසන අනික් රථයකුත් එමමනම් යන්නේය, එමේන්

පළමුවන්පුරුෂයෝ යම් දානාදි කුසලචිත්තයක ශිෂ්‍යද ඒ මාගේ යෙහි මම්ත් යනෙහෙමි මිට අන්‍ත මාතියක් ඇත්තේනොවෙයි එසමයේම පුරාතැන මහාවිත්තඝියන් විසිනුත් මේදැවැට යෙදූ සේක මිට පළමු මාවිසිනුත් පිහිටුවූසේය, එමදන්වැට නැවත නැවතත් දිවිහුළුවයිසියා වදුලසේක, එබඳු සකුදේවිඳුගේ ඝම්භීරඥානසම්භාණ්ඩාදිවූ යම් වස්තුවක් අපට ඇතිනම් එවස්තුවම අපි දන්දෙමිහ, එබඳු වස්තුවක් අපට නැතිනම් කෙසේ දෙමිද එබඳු වස්තුවක් නැතත් මේසේ තෘෂ්ණා අවියාවට පැමිණියත් ඒ සාන්තවිසුවත් දන්දෙමියි බුබ්බාදි උතුමන්විසින්වණ්ණා කරණලද දානය නොනසිවිසි වදුලසේක, සකුදේවිඳුගේ ඔම ශක්‍රසම්පත්බ්‍රහ්මසම්පත් පහාදෙන්නේනොවේයයි වදුලසේක සකුදේවිඳුනෙම ඒ අසාධාරණවූ අහිත් පිට පිරිමැද්දේය එකතින් අමෘතාහාරයක් අනුභව කලාක්මෙන් සියලු සරීරය පිරිනිවේය සියලුම වස්තුවත් පහළවිය, ශක්‍රදේවිඳුනෙම කියනුයේ සිමා නති මෙතැනසිට දිනකට ලක්ෂයබැගින් වස්තුවියදන්කොට දන් දෙවයි කියා වස්තුව අප්‍රමාණකර බෝසතානන් නෙව ගමන්කරවා සක්දෙවි රජහු දෙව්ලොවටගියේය, මෙසේ දවසකට නිලකම්පන ලක්ෂයක් දීමනාම් ලබිකාලේ පහමෙන් එකෙකාවි අසූලක්ෂයක මෙසේ වස්තුවිසදම්තරම්න් ඒ විසතින මහාවිතෝ මෙබඳු මනත් ආශාවයිඇතිව දවස්තෑවා නුවර රාජදණ්ඩාදිවූ නිග්‍රහයක් නැතිව දැකැත්තන් රැහැනකුත් කත්දණ්ඩකුන්ගෙන තමා නොදන්නා පොළලදේකැයි නොසිතා මේබඳු ඝිනක්‍රියාවක් නුවරුන් මැද නෙසේ කරවිදැයි ලජ්ජානොවී දන්නොදෙනොත් වස්තුවදෙමියි අහසේසිට කියන්නාවූ සක්දෙවිරජහුගේ වචනයවද ලෝභනොවී දෙවියන්ගේ බස්නාසුවිට අනාදීයක් වේදෙයන හෘදයත් නැතුව සතියක් නිරාහාරවිමින් ශරීරයට පැමිණි දුක් වේදනාවත් නොතකා තනතෙනවුත් විකුට දන්දීමට සතුටු වූසේය මෙසේ විසඝිඝසිටුතෙමේ බොහෝ පින්කොටකම්වූ පරිදෙදන් දෙවිලොව හිඳිසේය, දන්දීමෙහි අනුසස් දන්නාවූ එතනමසෝ මෙසේ දන්දෙනාහුවෙන්, ඉමලක්දිව අනුරාධපුර යෙහි රජසිරිවින්දුවූ මහසිලුනිසස්ස මහරජහු දැහැමින් සෙවුවසතු වෙන් දන්දීම මහන්ඵලවන්නේයයි අසා තමා රාජ්‍යයට පැමිණි අවුරුදෙදහිම අනුන්නේ නොතකවලහනට ගොඇමිකපා එසින් ලද කුලියගෙණ මහා සුමණසාමුදුරුවන්ට දන්දිනා එසේම සබඹ ගිරිනම් පවතය සමීපයේ තුන්අවුරුදුත් මුලුල්ලේ එක්වතතක මෙදහසකාට කුලියට ලැබූ එක්සක්කරුළුගණ මිහසාඹයාට දන්දුන් නේය, මේසේ මහාදානය නැතහුන්ද සියඅයින් කණ්ණතෙසාට දන්දුන්නාහුමය, එසඵලසේම්ය තුන්දෙනෙකුගේ එක්වීම ඇයි

කල්හී අවශ්‍යයෙන්ම දුනමය කුසල සිඳුවත්නේය, එකවර තුන් දෙනෙක්දෙන් සඬාව ලැබීමය දුනවස්තුව ලැබීමය ප්‍රතිග්‍රාහක යන් ලැබීමය එසින් මේ ලංකාවෙහි උපන්නාවූ සත්ත්වයන්ට දුගොප් මහබෝධාතුපෙනී පිළිම සංඝයාද ඇතිහෙයින් ප්‍රතිග්‍රාහකයෝ දුලීහතෝවෙති එකවේලක අනුනවකටයුතු ආහරණවත් පලජාතීන් දුනවස්තුව සෙයින් ඒ ජාතින් දුලීහතොවෙද ප්‍රථග්ජනයාගේ සඬාවවනාඹ පියවරක් පාසා නැසෙනසුභයින් සඬාව විවරත් දුලීහවන්නේය, එබඳා සත්පුරුෂයනි අපක්‍රීවාවූ මේ ධර්මකථාවෙන් සඬාවලපදවාගත දන්දී නොපවසින් සවනිඳොඤ්ඤ යම් පතනිය සිඹකරන්නාවූ කුශල් රැස්කටයුත්තේය,

තවද මෙබඳු නිවන් අවසන්කොටම ඇවිදින දෙන්නාවූ දුනය වකාහි තුන්සිත පිරිසිදුකරගන්ට සමර්ථවූ එකෙක්හටම එසේ විපාක දෙන්නේය, දන්දී පශ්චාත්තාපවී එසේවිපාකනොදෙන්නේය. මේඅසා දතයුත්තේය. එක්දිනක කොසොල්මහරජානෝ ආගන්තුකනම් මහසිටානකෙනෙකුන් නැසුනවිට ඔහුගේ වස්තුව සත්රැඟත්දවාලක් රාජභානයට අද්දවා උදැසන බුදුන් වඳින්ට ගොස් වැඳ එකන්පසක හුන්නේය. එසේ උන්නාවූ රජහට බුදුහු ප්‍රමාදවූයේ කවර කාරණයකින්දැයි විචාළසේක එබසට කියන්නේ සවාමිනි භාග්‍යවතුන්වහන්ස සැවැත්නුවර ආනන්තුකනම් එක් සිටු පුත්‍රයෙක් සිටියේය. ඔහුම නොයෙක් රහමෙවුලෙන් අහර ඵලවූ විටඅනුභව නොකොට නිඛුබුබාළේ මත්සකිත කාඩිදිය අනුභව කරන්නේය. සුවඳකවා තිලෙන අකඟි කසිසලු ගෙනාකල්හී ඒනොහැඳ දලරදිනඹක් හැඳගන්නේය. එතුන්රථවාහනාදිය තිබියදී පත් කුඹයක් ඉසට කොට දිරාගිය වාහනයක නැගියන්නේය. ඔහුගේ වස්තූ හිමිවන්ට දරුකෙනෙකුන්ද නොසිටියේය ඔහු මළ්ය ඔහුගේ වස්තුව රාජාභානයටඇද්දවීමෙන් පමාවියයි දුන් විය. බුදුහු වදරණසක් මහරජ අමනුෂ්‍යයන් අධිග්‍රහිත ආරණ්‍යයෙක්හි සිඹිල්වූ මිහිරිදිය ඇති තීරාන්තය සුදුවැල්ලෙන් හා රලකාඹිදීමෙන් සොභාමත්වූ පොකුණක්වේද ඒ පොකුනෙන් මනුෂ්‍යයෝ දිය නොඉගතයාද පාණයකරණ කෙණෙකුත් නැද්ද ඒපොකුණේ දිය වියලියන තම්හුත් ජනයාගේ පරිභොගය නොපැමිණෙද එමෙන්ම අසන් පුරුෂයා හට වස්තුව ලැබුනවිට තමාට වත් මව්පිය අඹුදරුආදීන්වවත් දුස කම්මකාරාදින්වවත් දිවාලෝකයේ ඉපද සැප විඳින්ට සුදුසුයේ ශ්‍රමණ බ්‍රාහ්මනාදින්ට දන්දීම කුත් නොකර මේ සිටුපුත්‍රතෙදෙ එසේ කිසිත් නොකර දැස රෞරව නරකයෙහි උපන්නේයයි වදුලසේක.

ඒ පුරුෂතෙම කවර පිනක්කොට මෙබඳු වස්තුවක් ලද්දේද කවර හෙයකින් ඒ වස්තුව අනුභවකිරීමට සිතහොත්මෙන්නේ දැයි විචාලේය. බුදුහු එම්බා මහරජ මෙබඳු වස්තුලබනනට කාරණාත් අනුභව නොකරන්ට කාරණාත් ඔහුවිසින්ම කරණලදැයි වදරා අතීත කථාව හෙනහැර දැක්වීය. මොහු පෙර බරණැස්නුවර සිටු කෙනෙක්වීය, එතෙම සඬානැත්තේය මසුරුසිත් අත්තේය කිසිවක් නොදෙන්නේය ඒ සිටුතෙම එක්දවසක් උදැසන බත් අනුභවකොට රජගෙටයන්ට නික්මින එදවස් පදුමාවතීබිසවගේ තුන්වෙනි පුතුවූ තගරසිඛිතම් පසේ බුදුරදුන් පුරදෙරට බැස හැවතුන්හන්වා පාත්‍රයෙහෙන ගෙපිළිවෙලින් සිටුනුගේ නෙදෙරට වැඩියසේක. එසේ වැඩසිටින්නාවූ පසේබුදුන් දැක නමස්කාරකොට කිමෙක්ද වහන්ස ආහරලත්සේක්දැයි විචාලේය, එම්බා සිටානෙනි ආහාර සිඟන්නමෝවේදැයි වදාලසේක සිටුපුත්‍රතෙම ඒ අසා පුරුෂයෙකුට ආමන්ත්‍රනයකොට මුත්වහන්සේ කැඳවාගණ අපගේ ගෙටගොස් අපනිසා සැපපූ ආහාරපාත්‍රය පුරා දෙවයිකීයේය. එලෙස වැඩමවා හනනොස් ඒ බැව් සිටුභාර්‍යාවට කීය, සිටුභාර්‍යාතොම එසේ සිතිය එමගෙක්දවස් සිටාකන්ගෙන් දන්දෙන්ටය යන බයක් නැසිමිද අද දන්දෙන්ට කෙලෙස් නැසුපසේ දුබුකෙනෙකුත් වහන්සේට දෙන්ට කියේය, එබැවින් යම්නම් දෙයක්හොඳි ප්‍රණීත ආහරක්දෙමියි සිතා පසේබුදුරජානන්වහන්සේ වඩාහිඳුවා ඉතා පිරිසිදුවූ ආහරසපයා ඊට සුදුසු ඛාද්‍යභොද්‍යද සූපවිව්‍යඤ්ජනදසපයා පාත්‍රය පුරවා පාත්‍රය පිට සුවඳගල්වා පිළිගැන්වීය පසේබුදුන්වහන්සේද ඒ ආහර හොව ලදුම් පින්දි වැඩසේක. සිටානොද රජගෙසිට එන්නේ පසේබුදුන් දැක වැඳ ආහරලබනලද්දෙයැයි විචාලේය. එසේයසි වදාලකල්හී ස්වාමිනි පාත්‍රයබලා මේ ආහරය දැසිදැස්කම්කරුවන්ට දීපියානම් දුස්කරවූ කම්හනයන් ශිඛාකරදෙති උන්ටනොදී මුත්වහන්සේට දුන්නෙනම්සි සිත දුශ්‍යනරගන්හ අපරවෙතනාව සූඛකරන්ටහොඳැකි වීමු. දැනයනම් තුන්සිත පිරිසිදු කරන්ට හැකි කෙනෙකුන්ටම මහත් ඵල වන්නේය. මහ රජානි මේ ආහන්තුක සිටුතෙම ඒ බරණැස් සිටු කල්හි පසේ බුදුන්ට දැන් දුන් හෙයින් මෙසේ වස්තු ලද්දේය, අපර චෙතනාව පිරිසිදු කරගන්ට හොහැකිවූ හෙයින් අනුභව කරන්ට නිත් හොනැමුනේයයි වදාල සේක.

මෙසේ තුන් සිත පිරිසිදුකොට දන් නුදුන්නාහින් ලත් වස්තු වත් මෙලෝ පරලෝ දෙකට වැඩ නැතිවා බැවින් නුවණැත්තාවූ එම්බා සත්පුරුෂ වරුනි තුන්සිත පිරිසිදු කරගණම් දන්දිය යුත්තේය, තුන්සිත පහදා දන් දිමෙන් ලත් විපාක මෙම කථාවෙන් අසා දැනගත යුතුයි. ඉහ් සොඒදු යන්:—

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජෙක් රාජ්‍ය කරණ කල්හි අප මහ බෝසතාණන් බමුනු කුලයක උපන්සේක, උන් වහන්සේට සේනක කුමාරයෝයයි නම්කලාහුය උන්වහන්සේ ශිල්ප ඉගෙන රජහට අප්‍රමාදයෙන් අනුශාසනා කරමින් වැඩ සුයාඃයන් මෙන් ප්‍රකට වුවාහුය. පුරෝහිත බ්‍රාහ්මනයාගේ පුත්‍රතෙම රාජසේවයට ගියකල්හී රජ හුගේ අභිමෙහයුන් බිසව් දූක බිසව් පිළිබඳ සිත්ඇතිව නෙවගොස් නිරාහාරයෙන් හොත්තාහුය යහලු වන් විසින් විචාරණ ලදුව එපවත් කීය, රජතෙම පුරෝහිත පුත්‍රයා නොදූක ඔහුගේ අදහස් දූන රජහු පුරෝහිත පුත්‍රයා ගෙන්නා ඔම තව මේ බිසව යන්දවසකට දෙම්සි සත් දවසක් තොපගේ ගෙයි නවතා ඉඳ අටවෙනිදා කැඳවාගෙන එවයි කීය, එතෙම යහපතැයි පිළිගෙණ බිසව ගෙට කැඳවාගණ ගොස් එක තැන වසිමෙන් ඔවුනොවුන් කෙරෙහි පිළිබඳ සිත් ඇතිව කිසිවක් හවත් නොදන්වා උදයහල දෙරින් පිටව ගොස් අන් රජක්හුගේ රටකට වන්නාහුය, ඔවුන් හිය මගක් කිසිවෙක් නොදන්නාහු වෙති රජහු මුලු නුවර පරිසා කොටත් ආශ්‍රයමන් නොදූන බිසව නිසා රජහට බලවත් සෝක උපන හෘදය උනුවී ලේ යන්ට පටන් ගත්තේය. වෙදවරුන් ඇවිත් පිළියම් කොටත් නොහැකිවුවාහුය, බෝසතානන් වහන්සේ ඒදූක රජනට වාසිත්ආදී ඥෂයකින් උපන් රොගයක්නොව භාෂ්‍යාව නොදක්නාසෙයින් මනොදුඃඛයෙන් උපන් රොගයෙක උපායකින් ඔහට පිළියම්කරම්හි සිතා ආශ්‍රුරනම්වූද පුක්කුශනම්වූද ඇමතියන් කැඳවාගණ කියන්නේරජහට ඇතිලඩය බිසවනොදූකීමය රජ අපට බොහෝ උපකාරිවූ එකෙක උපායකින් ඔහට පිළියම්කරම්හයි කීයා රජගේමුලුවේ නැටුම්යොදූ කඩුවක් ගිලින්ටදහන එකෙකුලවා කඩුවක්ගිලින්ට සලස්වා රජසිවිමැදුරු කවුලුව සමීපයේ ඉන්ට සලස්වා නැටුම්දක්වම්හ එවිට රජ මිවවඩා දුස්කරයෙක් ඇදැයි විචාරන්නේය. යහලු ආශ්‍රුරපන්ඩිතයෙනි තොපි එබසට අසවල්දෙයක් දෙම්හයිකියා, ප්‍රතිඥාකොට කිම ඊටත්වඩා දුස්කරයයි කියව එඹඩා පුක්කුශපණ්ඩිතයොවි තොපි සමක්දෙම්සි කියා ප්‍රසිඛකාට ඔහුගේ ආශාවවඩා නැවතනොදෙම්සි කියා ආශාව නිවඳදයකිරීම ඊටත්වඩා දුස්කරයයි කියාලව ඉන්පසු කියයුත් තක් මම්දන්නිමියි වදලසේක.

එසේකියා නැටුම් යොදූ රජගෙට ගොස් මහරජ්ජුරුවන්වහන්ස නැටුම් බලා වදලමැනව. ශරීර දුඃඛයන් සාන්නවෙයි කියා රජහු කැඳවාගණ සිව්මැදුරු කවුලුව සමීපයෙහි නැටුම් බලාඉන්ට සැලැස්වීය නැටුන් පෑවාවු එක් පුරුෂයෙක් තොසිස්අතුලන් දිග ඇති හියුනු මුවහත් කඩුවක් ගිල්ලේය. ඒ දූක මේ පුරුෂතෙම

නීයුතු ධාරා ඇති වස් සතුරන්ගේ ඇඟ රුධිර පානය කරන්නා වූද සානක දෙශයෙහි උපන්නාවූ මේ කඩුව ගිලීම සමාන දුස්කර යෙක් ලොව ඇද්දැයි ආසුරපණ්ඩිතයන් හෙන් විචාළේය එබසට ආසුරපණ්ඩිතතෙම දේවයන්වහන්ස මේ පුරුෂතම තමා අහ්‍යාෂ කළ හෙයින් මේ කඩුව ගන්නේය. ඒ ඉතා දුස්කරයෙක් නොවෙයි තමාට අවනතවූ ඔනයක් අනිකක්හට දෙමිකියාද ඒ කීම දුස්කර වන්නේය. ඉන් පිටත් දුස්කරදෙයක් නැතැ කිහ. ඒ අසා කඩු ගැලීමට වඩාදෙමි කියන බස් දුස්කරවෙලා මමද පොරොහිත පුත්‍රයාට බිසව දෙමි කීම් මාවිසින් දුස්කරයක් කරණලදැයි සලකන්නනට ඕදක් සෝක තුනිවිය. නැවත දෙමිසි කීමට වඩා අනික් දුකෙක් ඇද්දැයි විචාලකළ ආසුරපණ්ඩිතයන් තමා සත්‍යානක දෙයක් දෙමිසි කීම දුස්කරයයි කියති පුක්කුෂ තොප අතින් විවරම්. දෙමිකීමටවඩා දුස්කරයෙක් වෙන ඇද්දැයි විචාළේය. එකල්හි පුක්කුෂ පණ්ඩිත තෙම දේවයන්වහන්ස යමෙක් කාරිය සිඩිය නොපමුණුවන්නාවූ නිෂ්ඵලවන්නාවූ අතපුල් කියන්නේවිනම් ජනයෝ ඔහු ඇසිරුව ජීවත් වම්හයි නොදනිති. එබැවින් යමෙක් දෙමිකියා ලබන් අයගේ ආශාව වඩා නැවත නොදෙමිසි කීමට වඩා දුස්කරයෙක් ලොව නැත කඩුගිලීමට වඩාත් දෙමිකීමට වඩාත් මේ දුස්කරයයි කීය. රජ එබස් අසා මම පොරෝහිත පුත්‍රයාට බිසව දෙමිසි කීම්. පළමුකොට කියාදුනිම් නැවත ඇරඹන්නා සිනින් පරීක්ෂාකරවීම් මාකළේ ඉතා දුස්කරයකැයි සිතන්නාවූ රජහුගේ සිතේ සෝක මදක් තුනිවිය. ඉක්බිත්තෙත් මේ සේනක පණ්ඩිතයන්ට වැඩි පණ්ඩිතකෙණෙක් ලොව නැත එබැවින් මේ ප්‍රශ්නය ඔවුන් අතින් විචාරමිසි සිතා එම්බා සේනක පණ්ඩිත යෙනි මේ පුක්කුෂ පණ්ඩිතය යමෙක් දෙමිකියා නොදෙමි කීම දුස්කරයෙකැයි කියයි එයට වඩා අනික් දුස්කරයෙක් ඇත්නම් ඒතොපි කියවයිකීය. එකල්හි මහබෝසතාණන්වහන්සේ වදුරණ සේක් මාගධ ගෝත්‍රයෙහි උපන්නාවූ එම්බාරජ්ජුරුවන්වහන්ස දෙමි යන සිතපහලවූ ක්ෂණයෙහිමුවනින්සලකා සවල්පවුහෝ බොහෝවූ ඇම්කිහි දෙයක් අනුන්ට දෙන්නේවෙයි. ඒ දීම දුෂ්කරනොවෙයි. ප්‍රියජනකවූ වස්තුවක් දී තමා සිත උපන් ලෝභයකින් හෝ අනික් කෙනෙකුන්ගේ බස් අසාහෝ මේ වස්තුව කුමට දුනිම්දැයි පස්වාත් තාපයට නොපැමිනෙන්නම් එසේ දන්දී පශ්චාත්තාපනොවීම කඩු ගිලීමටත් දෙමිකීමටත් දෙමිකියා නොදෙමි කීමටත් වඩා දුෂ්කර යෙකැ. මෙයින් පිටත් සියලු කාරණා දුෂ්කරනොවෙයි. කියා වදාල සේක. රජතෙම බෝසතාණන්වහන්සේගේ බස්අසා මෙසේ සැලකීය. මම මාගේ සිතින්ම පොරෝහිත පුත්‍රයාට බිසවදී මාගේ සිත දරාගතනොහී සෝක කොට දුකට පැමිණියෙමි:

මේ මට සුදුස්සක් නොවෙයි. ඒ කියව් නොම් මා කෙරෙහි ඉෂ්ණහ යඇත්තීනම් මේ අසිශ්වයෂිහැර කුමටයේද මා කෙරෙහි ඉෂ්ණහය හැරගියාවූ ඈ කෙරෙහි ප්‍රේමය කුමටද ඇතෙන් කවර ප්‍රයෝජන දැයි සිතන්නාවූ රජහුගේ සෝක පියුන්පතකවත් කල දිසමෙන් නොරඳගියේය. රජ නිරෝගිවිය. මෙසේ පශ්චාත්තාපයතම් මෙලොවින් දුක් උපදවාසේ පරලොවත් දාන ඵලය නිස්ඵල කෙරෙයි. මේ පශ්චාත්තාපයවූනලි සාරාසංඛ්‍යකප්ලක්ෂයක් දානපාරමිතාව පුරුදු කළාවූ බෝධිසත්වයන්වත් උපදනේය එය එසේමය.

පැමිණිකල්හි පොක්ඛරසාතියනම් බමුණන්ගේසවිපයෙන් සිලපට ගන්නාපිණිස උක්කට්ඨානම් නුවරට ගමන්කරවිය. ඒතෙම තමා නුවනැතිබැවින්ද අලසනොවනබැවින්ද චතුවේදඝහාසියලුවිදහවන් නිමවාඉගෙණ බ්‍රාහමණසිලපයෙහි නිෂ්ඨාතතියට පැමිණියේය. ආචාරීන්වැද මමනුබවහන්සේකෙරෙන් සිලපනිමිත්ත උගත්තෙමි. ගුරුදක්ෂිණාවට කුමන්දියයුතුදයිවිචාළේය. ඒආචාරිතෙමෙකියතුයේ ගුරුවරයන්ට දියයුතු දීමනම් සිසයාගේ ශක්ති පමනය. එතකුදු උවත් කහවනු දහසක්. ගෙණවසි කීය. ඒ තෙම ඒ අසා ආචාරිහව වැඳ සේතව්‍යනුවරගොස් දෙමවිපියන්දැක සතුවුවූ දෙමවිපියන් දෙදෙනා විසින් දුක්ශප විචාලකල්හි තමා සිලප නිමවා උගත්බවකියා ගුරු දක්ෂිණාවට කහවනු දහසක් දීයයුතුය. ඒ දැන්මදෙව අදමගොස්දී එම්සිකීය. මව්පියදෙදෙනා අදකල්නොවන්නේය. සෙටයන්නෙහි මවිදසි කියා කහවනු නිකුත්ගෙකාට පොදීයන්බැඳ සිටුවානුය. සොරනු ඒ අසා ඡත්‍රමානවකගෝ යන මග සිට ඔහුමරා කහවනු ගනු මිහසී සැඟැවීසිටියාහුය. භාග්‍යවත්වූ සම්බුදහන් වහන්සේ එදු අලු යම මහාකරුණාසමාපත්තියෙන් නැගිම ලොවබලා වදුරණසේක් ඡත්‍රනම් බමුණු කුමාරයාට සොරුන්ගෙන් වන හිංසාවදුක ඔහු කෙරේ කරුණාවෙන් ඔහු ගෙයින් පිටත්වන්නාව පලමුගෙකොට තමන්වහන්සේවැඩ ඔහු යන මාර්ගයෙහි රුකක්මුලවැඩඋන්සේක. ඒබමුණුකුමාරයාද ආචාර්‍යයන්හට වස්තුඇරගෙණ උක්කට්ඨානං නුවරබලා යනුයේ අතර මග වැඩඋන්නාවූ බදුන්සමීපයට එලඹ සිටියෝය. කුමාරය තොප කොයියන්නෙහිදැයි බුදුන් විචාළකල්හි පොක්ඛරසාතිය නම් ආචාර්න් වහන්සේට ගුරුදක්ෂිණාව දෙනපිණිස උක්කට්ඨානම් නුවරට යෙමිසිකීය. එකල්හි භාග්‍යවතුන්වහන්සේ එබල කුමාරය! කිසරණයත් පංචසීලයත් දන්නෙහිවදැයි විචාලසේක. මම් ඒ නොදනිමි ඒ තෙබඳුද ඉන් ලබන අනුසස් කුමක්දැයි විචාලකල්හි ඒ මෙබඳුයයි ප්‍රකාසකොට උගන්නෙහිදැයි විචාලසේක. සාමිනි උගනිමි වදුලමැනවයි කීකල්හි ඔහුට රුවිවූ ගාථාපඤ්ඤායකින් කිසරණය මෙසේ වදුලසේක.

යොවදතං පවරෝ මනුජෙසු සක්‍යමුනී භගවා කතකිච්චෝ
පාරගතෝ බල විරිය සමඟි තං සුගතං සරණත්ත මුපෙමි.

රාග විරාග මනෙජ මසොකං ධම්ම මසංකත මපපටිකූලං
මධුර මිමං පගුණං සුවිභත්තං ධම්මමිමං සරණත්තා මුපෙමි.

යත්ථචදින්න මහප්ඵලමාහු චතූසු සුවීසු පුරිස යුගෙසු
අට්ඨිච පුගඝල ධම්මදඝාතෙ සංඝ මිමං සරණත්ත මුපෙමි.

මේසේ බුදුන් වදාලකල්හි ඒ ගාථා තුන තෙමේත් කියා සරණ ගත්තේය. ඒ සරණගතව සිටියාවූ ඔහට බුදුහු පන්සිල් දුන්සේක. ඒතෙම ඒද සමාදන්ව බුදුන්ගෙන් අවසරගෙණ පිටත්විය. බුදුහු සොරුන්ගෙන්වන අන්තරායද එපමනකින් වැඩියක් ආපදා නැතිවවද දැන වදාළසේක. ඔහුද තුන්සරුවන්ගේ ගුණ සිහිකරන්නේ මගට පැමිණියේය. බුදුරජානන්වහන්සේද මෙපමණක් මෝහට දිව්‍යලෝකයෙහි ඉපදීමට ප්‍රමාණයයි පේතවන විහාරයට වැඩිසේක.

බුබාදීවූ රත්නත්‍රයෙහි ගුණඅසා සරණ්‍යයෙහි පිහිටා එම සිහි කොට යන්නාහු පංචසිලය සිතින් ඉටාගන්නාවූ ඒ බමුණු කුමා රයාට සොරහු ලංවූවාහුය. ඒ කුමාරතෙම ඔවුන්ද තනාබලා රත්නත්‍රයෙහිම ගුණ සිහිකොට යන්නේය. එසේ යන්නාවූ ඔහට එක්සොරෙක් විෂපෙවූ ශරයක් විද මරා කහවනුගෙණ ගියේය. ඒ බමුණු කුමාරතෙම තව්තිසා දිව්‍යලෝකයෙහි තිස්යොදුන්උස දිව්‍ය විමාන්යක උපන්නේය. ඒ විමානයෙහි ආලෝකය එපින් පස්විසි යොදුන්තැන් පැතිර සිටියේය. ඒ මග මළාවූ බමුණු කුමාරයාදක සේතව්‍යනුවරට ගියාවූඅය ඔහුගේ දෙමව්පියන්ටද උක්කට්ඨාවට ගියඅය පොක්ඛරසාතිය බ්‍රහ්මණයාටද කීවාහුය. දෙමව්පියෝ තම්න්ගේ නැගණ්නා මිත්‍රයන්ද කැඳවාගණ පුත්‍රයාගේ මළකඳ තිබෙනතැනට ගියාහුය. පොක්ඛරසාතිය බමුණාද පිරිවර හාසමග මළකඳ තිබෙනතැනට ආයේය. සේතව්‍යනුවර වාසි බොහෝදෙනද උක්කට්ඨානම් නුවරවාසිහුද 'ඉච්ඡානංකලානං' බමුණුගම වසනඅයද රැස්වූවාහු මහත්වූ සේනා සමූහයක් විය. ඉක්බිති බමුණු කුමාරයාගේ මව්පියෝ මාගීය සමීපයෙහි සොහොන්පලක් සාදු ආදාහන කිරීමට ආරම්භකළෝය. එකල්හි බුදුහු මෙසේ සිතා වදාළසේක. ඡත්‍රනම් මානවකයා ආදාහනකරණතැන්ට මා ගියකල්හි දිව්‍යලෝකයෙහි උපන්නාවූ ඒ ඡත්‍ර මානවකතෙම මා දකින්ට එන්නේය. එසේ ආවාවූ ඔහු ඇතුලුවූ මහාජනයාහට මම ධර්මදේශනා කරන්නෙමි ඒ ධර්මය අසා බොහෝදෙනා නිවන් දකින්නේයයි දැන මහත් භික්ෂුසංඝයාහා සමග එතැන්හි වැඩ වනලැහැබ බුදුරජින් එකාලොකකාට ගිනියගත් කඳක්මෙන් නොයෙක් පැහැගන්වා එක් රැකක්මුල වැඩලන්සේක. එකල්හි ඡත්‍රමානවකද දිව්‍යලෝකයෙහි තමා ලත් ඓශ්වර්‍යය බලා මේ කුමක්නිසා ලබනලද්දේදැයි සලකනුයේ පැහැගනනක් රශ්මිකළාවූ සරණසිල පංචසිල දෙකින් ලදබව දැන ආස්වයත්තිම්වූ සිත්ඇතිව බුදුන් කෙරෙහි පැහැදුනේ දැන්මහොණ බුදුන්ද

මහාසංඝසාවහන්සේද වැඳ රත්නත්‍රයෙහි ගුණ ලෝකයාට ප්‍රකාශ කරමිසි දිව්‍යවිමානයහා සමගම් අවුත් ඒ වනාන්තරය ඒකාලොක කෙරෙමින් දිව්‍යවිමානය අහසරඳවා ඉන්බැස තමාගේ පිරිවරහා සමග අවුත් සියල්ලවුන්ගේ ඇසම පෙනෙන පරිද්දෙන්ම බුදුන්ගේ ශ්‍රී පාද වැඳවැටී දෙගොන් මුදුන්බැඳ එකත් පසෙක සිටියේය. ඒ දැක එතැන්හි රැස්වූ මහජනතෙම මේතෙම ශක්‍රාදීන් අතුරෙන් දෙවියෙක්ද නොහොත් බ්‍රහ්මයෙක්දයි ආස්චය්‍යමත්වූ සිත් ඇත්තාහු බුදුන් පිරිවරා සිටගත්හ, ඒ රැස්වූ මහජනයා මඬ්‍යයෙහි ඒ දෙවතාව කල පින් විචාරන්නාවූ බුදුරජානන් වහන්සේ මෙගාථාවෙන් මෙසේ වදාලසේක.

තථා තපති නභයම්හි සුරියෝ වජ්ජෙ න භාසති
න චුස්සා යථා අතුල මිදං ඔභපපභාසං
කොතුවිං තිදිවා ඔභිච්ච උපභා.

අසමානවූ තොපගේ මේ දිව්‍යප්‍රාසාදය යම්සේ දසදිසාව එලිකොට බබලන්නේද එපරිද්දෙන් ද්‍රුෂ්‍යතාරකාවන්ගේ බැබලීම කුත් නැත්තේය. තාරකාවන් තබා සොඬසකලා සම්පූර්ණව දස දිග බබුළුවන්නාවූ චන්ද්‍රමඩලයකුත් නැත්තේය. චන්ද්‍රමඩලයතබා නහෝ මඬ්‍යගහ මේ දිව්‍යප්‍රාසාදයමෙන් අන්ධකාරයනසා බබලන්නාවූ සූය්‍යමණ්ඩලයන් නැත්තේය. එබඳුවූ දිව්‍යප්‍රාසාදයකින් මේ පොලොවට පැමිණියාවූ තොපි කිනම් ඇත්තෙහිද.

ජිණුනාති චන්දරංසි පභංකරස්ස සාධිකං විසති යොජනානි
ආභාරත්‍යම්පිච යථා දිවංකරොති පරිසුඛං ච්මලං සුභං විමානං.

තාගේ මේ මාලිගාව හාත්පසින් පස්විසියොත්නක් තැන්හි තමාගේ ශෝභාවයෙන් සූය්‍යයාගේ ශෝභාව මැඩපහකරන්නේය. රාත්‍රියෙහි පැමිණියේවි නමුත් ලොව දවාලක්මෙන් එලිකරන්නේය. ඇතුලත් පිටත් ඉතා පිරිසිදුවන්නේය. කිලිටක් නැතිවම නිම්ලව තිබෙන්නේය. ඉතා යහපත්වන්නේය.

බහු පදුම විචිත්‍ර පුණ්ඩරීකං වොකිණනං කුසුමෙහි නෙකවිචිත්තං
අරජං විරජහෙම ජලච්ඡනනං ආකාසෙ තපති යථාපි සුරියෝ.

බොහෝ රත්පියුමෙන්හා හෙලපියුමෙන් සැදුනේය. එයින් අන්‍යවූ චම්පක, වකුලි, පාටලි, මඤ්ජර, නාග, ප්‍රහනාගාදීවූ පුෂ්ප දැමෙනුත් ආකීර්ණව තිබෙයි. හස්‍යාසඛමෘගසූකරාදී රූපයෙන්හා මාලාකම් ලතාකම්යෙන් ඉතා විචිත්‍රය. නෙමේ කිසි කැලලක් නැත්තේය. එසේ නිස්කලන්කවූ රන්දැලකින් වසනලද්දේය.

රත්නාඔරං පිතනිවාසඝාති අහඤ්ච පියඤ්ච චඤ්ඤුඝඤ්ඤදුඝි
කමන තතු සන්නිහත්තාවාඝි පරිපූරං ගගනංව තාරකාඝිං

රන්කඩක් අනන්තරියකොට රන්වන් සළුවක් උත්තරියකොට රදුදුපිනාවූ අඟිල් පුවඟමල් සදුන් සුවඳින් ඉතා උත්සන්නවූ රතුන් මෙන් ඉතා ප්‍රභාමත්වූ තුනිවූ ශරීර ඡවිඇති දිව්‍යස්ත්‍රීන්ගේ තාරකාවෙන් පිරුනාවූ අහසමෙන් තාගේ මේප්‍රාසාදය පිරුනේය.....

කිඤ්ඤ සම්මද මඤ්ඤඤං විපාකො කෙනාසි කම්මඛලෙනි ධුපපනෙනා
ඨඤාච නෙ අඩිගඤ්ඤ මිදං විමානං තදනුරූප අවචාඝි ඉඛ්ඛ පුවිඤ්ඤොතිං

එඹා දිව්‍යපුත්‍රය! මොඳු ඵෙඤ්ඤයී ලැබීම්ට පූර්ජාතියෙහි රක්ෂා කරණලද තාගේ කවරනම් සිලඤ්ඤුගේ කවර ඉන්ද්‍රිය දමනඤ්ඤුගේ ආනුභාව වන්නේද, හෙවත් කවර කුසලඤ්ඤකොට මෙබඳු ආනුභාව ඇතිව දිව්‍යලෝකයෙහි උපන්නෙහිද තවද යම් කුසලඤ්ඤකින් තොප මේ දිව්‍යප්‍රාසාදය ලද්දෙහිද ඒ ප්‍රාසාදය ලැබීමට පූර්ජාතියෙහි කල කුසඤ්ඤ මා විසින් විචාරණලද. මේ කථාව මේ සිටිනාවූ ජනයාගේ සිතෙහි සැකහැර කියවයි වදුලසේක:—එසේ බුදුන් විචාළකල්හි ඒ ඡත්‍රමානවකනම් දිව්‍යපුත්‍රතෙම මේ ගාථාවලින් මෙසේ කීයේය.....

ඡම්පිධ පථෙ සමෙවඩමාන වෙන සඤ්ඤාතුසාසි අනුකම්පමාඤනා
තවරතනවරස්ස ධම්මං සුත්වා කරිසසාමි මබ්‍රවිතු ඡතෙනා.....

මේ මාගීයෙහි යන තරුණ කුමරෙකුහා එක්ව ලොවට අනුසාසනා කරන්නාවූ භාග්‍යවතුන්වහන්ස! නුඹවහන්සේ කරුණාසිත් ඇතිසේක් යම් ධර්මයකින් අනුසාසනාකොට වදුලසේක්ද? උත්තම රත්නවූ නුඹවහන්සේගේ ඒ උතුම් ධර්මය අසා ඡත්‍රතෙම බමුණු කුමාරතෙම ඒධර්මය රක්ෂාකෙරෙමියි කීයේය.

ජිනරතන වරං උපෙමි සරණං, ධම්මං චාපි තථෙව භික්ඛුසංඝං
නොති පඨිං වචා හං භණෙනා, පඨමා තෙ වචනං තථෙව කාසිං

ඇඹාමිනි භාග්‍යවතුන්වහන්ස! දිව්‍යලෝකයෙහි උපන්නාවූ ඒඡත්‍රමානවක නම් මම නුඹවහන්සේ විසින් දැක සරණසිලඤ්ඤදන්නෙහි දැයි විචාළසේක. පළමුවෙන් මම ඒ නොදනිමියි කීයෙමි. නැවත නුඹවහන්සේ විසින් එහි අනුසස් වදුලකල්හි බුඩං සරණං ගච්ඡාමි, ධම්මං සරණං ගච්ඡාමි, සංඝං සරණං ගවඡාමි, යන වචනත්‍රයෙන් සරණගතව එසේම ප්‍රාණඝාත නොකරව යනාදීන් ප්‍රාණඝාතයෙහි ආදීනවය දක්වා දෙවඳු එහි අනුසස්ං මට ප්‍රකාශකොට

ට වඳුලකල්හී ඒ පංචසීලයත් මම සමාදන්වීමි. එසේ සරණ සීලයත් පංචසීලයත් සමාදන්ව උභතාවිභානම් භුවරට යන්නේ මා ගෙණයන ගුරුපඛුරුනිසා සොරහු මා මැරුවාහුය. භුබවහන්සේ දී වදුළාවූ සරණසීලයෙන් හා පංචසීලයෙන් දිව්‍යලෝකයෙහි උපන්නේ මේසාමහත් දිව්‍යසම්පත්තියක් ලදැමි.

එත්තාකම්දං අනුස්සරම් කුසලං තතෝ පරං පතමෙ නව්ජජ්ජති
අඤ්ඤංතෙනසුචරිතෙනකම්මුනාහං උපපන්නොනාතිදිවෙසුකාමකාමී.

සඛාමිනි භාග්‍යවතුන්වහන්ස! පෙරජාතියෙහි ගත්තාවූ සරණසීලයත් පංචසීලයත් නිරිතුරුව සිහිකරන්නෙමි. ඉන් පිටත අන් එකකුත් මට නැත්තේය: එම කුසලයෙන්ම මා කැමති කැමති සෙට සම්පත්තියක් ඇතිව මේ දිව්‍යලෝකයෙහි උපන්නෙමි.

පසඛන මුහුත්ත සඤ්ඤමස්ස අනුධම්මචාරී විපාකං
ජලම්ව යසසා පෙකඛමානා බහුකාමා පිහයන්ති හිනකාමා.

ක්ෂණයක මුහුතියක සිඛවූ භුබවහන්සේගේ ලෝකෝත්තර ධර්මයලැබි මට පිළිවෙත්ව සිටියාවූ මේ සරණසීල පංචසීල දෙදනාගේ අනුසස් බලාවදුළමැනව. මෙබඳු දිව්‍යඉර්ධියකින්හා පරිවාර සම්පත්තියකින් දිලිහෙන්නාවූ මාදුටුවාවූ මේ බොහෝ සතියෝවනාහි පෙරජාතියෙහි පින් ඉතාකලහෙයින් හිනවූවාහුය. දැන් මාගේ ඓසඛ්‍යය දැක මෙසේ ඓසඛරය්‍ය කෙසේ ලබමෝ දැයි ප්‍රාර්ථනා කරන්නාහු වෙත්.

පසස කතිපයාය දෙසනාය, සුගතිං ගතො සුඛං ච පත්තෙනා
ඉෙව සතතං සුනනති ධම්මං, මයෙකුදු තෙ අමතං ලුසනති ඛෙමං.

පින්වත් භාග්‍යවතුන්වහන්ස! භුබවහන්සේ විසින් වචන කීපයකින් දේසනාකලාවූ ධර්මයෙහි අනුසස් බලා වදුළ මැනව. භුබවහන්සේගේ ශ්‍රී වචනකීපය ඇසුවාවූ මම ඒ පිනින් දිව්‍යලෝකයෙහි උපන්නෙමි. දිව්‍යලෝකයෙහි උපන් පමණක්ම නොවෙයි. මෙබඳු දිව්‍ය ඓසඛ්‍යයත් දැක සැපයටත් පත්වීමි. යම්කෙණෙක් භුබවහන්සේගේ ධර්මය නිරන්තරයෙන් ඇසුවාහු විනම් ඔවුන් ලබන භවභොග සම්පත් කවරෙක් කියා නිමවන්නේද? ඔවුන්වනාහි සසරදුකින් එතරව භයන් නැත්තාවූ අමෘතමහානිර්වාණසම්පත්තියට පැමිණෙන්නාහුයයි කීයේය. එසේ කීවාවූ ඒ භුතනම් දේවතාවාවද එතැන්හී රැස්වූ පිරිසටද බුදුරජනත් වහන්සේවිසින් මධුරවූ ධර්මයක් දේශනාකොට වදුළසේක. ඒධර්මදේසනාවසාන භුතනම් දිව්‍යපුත්‍රයාද ඔහුගේ මව් පිය දෙදෙනාද එතැන්හී රැස්වූ බොහෝදේනාද අමාමහ නිවන් දුටුවාහුය.

මෙසේ සරණසිලයෙනුත් පංචසීලයෙනුත් මෙබඳු අනුසස් ඇත් තේයසි දැන ඒ දෙකම (නොහොත්) සරණසිලයත් පංචසීල යත් අප්‍රමාදව රක්‍ෂාකොට මතු සර්‍වඥත්‍වය සම්පත්ති ප්‍රතිලාභයට උත්සාහ කටයුත්තේය.....තවද පංචසීලය රක්‍ෂාකලාවූ සත්වයෝ අසංඛ්‍ය කප්ගණනක් සතර අපායෙහි නූපදවා සුගතියෙහිම උප දවා කෙළවර නිර්‍වාණයට යන්නාවූ උත්කෘෂ්ට කුසලයෙකි. එබැ වින් අප්‍රමාදව පංචසීලය රක්‍ෂාකටයුත්තාහුය.....ඉක් කෙසේයත්?

මේ මහාභද්‍රකල්පයෙන් යට ඒකාසංඛ්‍ය කල්පලක්‍ෂයකින් ඈත අනොමදස්සිනම් බුදුරජුනන් වහන්සේගේ කාලයෙහි හංසාව තිනම් පුරයෙහි බැලමෙහෙවරකොට ජීවත්වන්නාවූ එක් දුගිපු රුෂයෙක්වූයේය. ඒ පුරුෂතෙම එක්දවසක් බුදුන්ගෙන් බන අසා මෙසේ සිතිය. මේ සියළු ලෝකවාසිවූ සත්වයෝ මෝහනැමැති අන්‍ධකාරයෙන් වැසුනාහුය. රාග වෙස මෝහයයි කියනලද බීජ තුනකින් ඇවිල්ල පවත්නාවූ චිත්තසන්තාන ඇත්තාහුය. මෙසේ සසරින් ගොඩයාමට උපාය කවරේදැයි සිතතුයේ මටදන්දෙන් ට සුදුසු වසතුවකුත් නොමැත්තේය. මම හිස්වූ පින්නැත්තාවූ පු රුෂයෙක්මි. එබැවින් පංචසීලය රක්‍ෂාකෙරෙමියිසිතා අඥානම් ද ස්සිනම් සර්‍වඥයන් වහන්සේගේ නිසඹනම් අගසව් මහතෙරු න් වහන්සේගේ සමීපයෙහිදී. පංචසීලය ගත්තේය. ඒකාලයෙහි මනුස්‍යයින්ට අව්‍රෑදුලක්‍ෂයකට ආයුඇත්තේය. එපමනක් ජීවත් වන්නේත් කඩඉනාකට (හෙවත් සිල්බිඳනොගෙණ) පංචසීලය රක්‍ෂාකෙළේය. ඔහු මරණසන්නවූ කල්හි දහසක් අශ්වයන්යෙදූ දිව්‍යරථයක් ගෙණවූත් දෙවියෝ (හෙවත් දිව්‍යරූපයෝ) රථයට කැඳවිවාහුය. පංචසීලානුභාවයෙන් එම රථයෙහි ඉපිද තව්ති සා දිව්‍යලෝකයට ගියේය.....තිස්වාරයක් දිව්‍යලෝකයෙහිම ඉපි ද දෙවඟණන් පිරිවරා දිව්‍යරූපසම්පත්තිය විඳ්දේය. පන්සැත්තැව රෙක සප්තවිධ රත්නයන් ඇතිව සතරදිවසිනට (පූර්‍වවිදේහය, අපරගෝයානය, උතුරකුරු දිවයින, ජම්බුද්වීපය) එකාතපත්‍ර චක්‍ර වර්ත්තිරාජ්‍යද කෙළේය. කාසි කෝසලාදී වෙන් වෙන් රාජ්‍යවල ප්‍රදේසරජව උපන් ආත්මනම් පමණක් නොමැත්තේය. අප ගෞතම සර්‍වඥ රාජාත්තමඥානන්වහන්සේ ලෝ පහළ්වූකල්හි දිව්‍යලෝකයෙන් චුතව විසාලාමහනුවර මහත් වස්තුඇති කුලය ක උපන්නේය. උපන් පස්ඇවුරුද්දෙහිම මව්පිය දෙදෙනා පන් සිල් ගන්වා තමා ඒකාසංඛ්‍ය කල්පලක්‍ෂයකින් ඈත ගත්තාවූ පං චසීලය සිහිකොට නුනස්ඉනිම (හෙවත් තමාඋන් තැනදීම)

රහත් වූයේය. ඒ පස්ඇවිරිද්දෙන්ම බුදුරජානන්වහන්සේ ඔහු ම හනකරවා උපසම්පදා කරවූසේක. නැවත බුදුරජානන්වහන්සේ ඉදිරියෙහි ඒ තැනැත්තා විසින් පෙර රක්ෂාකරණලද පංචසීලය වර්ණනා කරණසේක් මෙසේ වදාළසේක් එම මේ මහාභද්‍රකල්පය ම ඒකාසංඛ්‍ය කල්පලක්ෂයකින් ඇත යම් පංචසීලයක් රක්ෂා කෙළේද එතැන්පටන් කිසිකලෙකත් සතර අපායෙහි නුපන් නෙමි. මේ කාලයවනතාක් මම උපන් ආත්මයක්ඇද්ද? ඒ ඒ තැන දිඹුවූ ආයුෂයක් ඇතිවූයෙමි. බොහෝවූ උපභෝග පරිභෝග වසතු ඇතිවිමි. සියල්ලවුන්ටම මනෝඥව උපන්නෙමි. මහත්වීර්‍ය්‍ය ඇතිවිමි. දුන්වුකලී සියලු කෙලෙසුන්නසා සිව්පිලිසිඹියාවෙන් යුක්තව (හෙවත් අට ධර්‍ම නිරුත්ති පරිභාන) උතුම්වූ රහත්භූමියට පැමිණියෙමි. අවිඝ්‍යසමාපත්ති ලාභිවිමි. මාසේ භවභෝගසම්පත් විඳිනු කැමතිවූවන්ද නිවන්සැප ලබාගනුකැමැතිවූවන්විසින්ද අප්‍රමාදව (ප්‍රමාදනොව්) පංචසීලය රක්ෂා කටයුත්තානුයයි වදාළසේක.

තවද පොහෝදිනයන්හි අට්ඨාඞ්ගසීලය රක්ෂා කටයුත්තේය. ඒ අට්ඨාඞ්ගසීලය සමාදන්වනකළ මෙසේ සිතින් සලකා සමාදන්විය යුත්තේය. ඒ කෙසේදයත්? ලොව රහතුන්වහන්සේලා දිවි ඇතිතෙක් ප්‍රාණඝාත කිරීමයයි කියනලද දුස්සීල චේතනාවෙන් දුරුව වැලකී ප්‍රාණයක් නසම්සි යන දුස්සීලය සිත ට පහලනොකොට පරහිංසා කිරීම පිණිස දණ්ඩක්හෝ ආයුධය ක්හෝ අතටනොගෙණ පව් පිළිකුල් කරණ ලජ්ජාවක් සිතෙහි ඇතිව සියලු සත්වයන් කෙරෙහි මෛත්‍රී කරුණාවක් ඇතිව සියළු ප්‍රාණීන්කෙරෙහි හිතැතිව වාසය කෙළේය. මම මේ යැ තිස්පැය ත් මේ දහවල් තිස්පැයත් ප්‍රාණඝාතයක් කෙරෙමියි යන දුස්සීලසිත දුරුකොට මේ සැටපැය මුලුල්ලෙහි එබඳු දුස්සීලයක් නුපදවා සත්ව හිංසාවක් කෙරෙමියි දණ්ඩකුත් අතින් නොගෙණ සතෙකුත් අතින් නොඇල්වා පවට පිළිකුල් සිත්ඇතිව සියලු සත්වයන් කෙරෙහි මෛත්‍රී සිත්ඇතිව සියලු ප්‍රාණීන්කෙරෙහි මෛත්‍රියත් ඇතිව සියලු සත්වයන්කෙරෙහි ඒකාකාර සිතැතිව වාසයකෙරෙමියි මෙසේ විසීමෙන් රහතන්වහන්සේලා විසින් පලමුවෙන් රක්ෂාකල ගුණය දැන් රක්ෂාකරන්නාවූ මම උන්වහන්සේලාව අනුව වාසයකරමි. එසේ කෙළේනම්:—බුදුරජානන්වහන්සේ විසින් වදාළ පෙහෙවස් රක්ෂාකලානම් වන්නේයයි යන කාරණා සිතින් සලකාගෙණ පාණාතිපාතා වෙරමණි සික්ඛාපදං සමාදියාමි, යන ඔම් පළමුවැනි සීලය සමාදන්විය යුත්තේය.

රහතන්වහන්සේලාගේ ජීවිතය ඇතිතෙක්ම අනුන්සන්තක දෙයක් ඇරගනිමියි යන දුස්සීලයෙන් දුරුව ඒ දුස්සීලය සිතෙහි හටගැනීමට හිමියන් විසින් දුන්දෙයක්ම පිළිගණිමින් සිතිනුත් දුන්දෙයක්ම කැමැත්තෙමින් සොරනොවන්නාවූ පිරිසිදු සිත්ඇතිව වාසයකෙරෙති. මමද අද මේ රාත්‍රී තිස්පැයත් දහවල් තිස්පැයත් අනුන්සන්තක දෙයක් හැරගැනීමයයි කියනලද දුස්සීලයෙන්දුරුව සිල් ගත්තැන්පටත් අනුන්සන්තකදෙය ඇරගණිමියි යන චේතනාවකුත්. සිතෙහි පහළනොකරව. දුන්දෙයක්ම සිතිනුත් කැමතිවන්නෙම් සොර නොවන්නාවූ ඉතාපවිත්‍රවූ සිත් ඇතිව වාසයකෙරෙම්. මෙසේ වාසයකිරීමෙන් රහතන්වහන්සේලාගේ ගුණයන්ට අනුකූලවෙම්. එසේකලහොත් පෙහෙවස්විසූවානම් වන්සේයයි සිතින් සලකාගෙණ අදිනනාදූනා වෙරමණී සිකඛාපදං සමාදියාමි. යන දෙවෙනි සීලය සමාදන්විය යුක්තේය.

නැවත රහතන්වහන්සේලා ජීවිතාන්තයදක්වා අබ්‍රහ්මචරියාවසයි කියනලද ස්ත්‍රීසංසර්ගයෙන් දුරුව බ්‍රහ්මචාරීව සිතෙහිඋපන් රාගචේතනාවනිසා කටයුතු අනාචාරයෙන් දුරින්ම දුරුව වාසයකළසේක. මමද අද මේ රාත්‍රී තිස්පැයත් දවසල් තිස්පැයක් ස්ත්‍රීසංසර්ගයෙන් දුරුව බ්‍රහ්මචාරීව වාසය කෙරෙමියි සිතෙහි උපන් රාගචිත්තයනිසා කටයුතු අනාචාරයයි කියනලද දුස්සීලචේතනාව සිතෙහි පහළවන්ට ඉඩනොදී රහතන් වහන්සේලාගේ මේ ගුණයට අනුවම්. මේ සැටපැය වෙසෙම්. එසේ කෙළේනම්:— මාවිසි පෙහෙවස් වසන ලද්දේයයි සිතින් සලකා අබ්‍රහ්මචරියා වෙරමණී සිකඛාපදං සමාදියාමි කියා තුන්වැනි සීලය සමාදන් විසූයුක්තේය.

ජීවිතාන්තය දක්වා රහතන්වහන්සේලා විසින් බොරුකීමෙන්ද කිස්බස් කීමෙන්ද දුරුව සංවරයට පැමිණිතැන්පටන් බොරුබස් කියමියි යන කල්පනාවකුත් සිතට පහළනොකොට සැබෑබස් කියමින් තමන් මහණවූදු කී සැබෑබසුත් පිරිනිවන්පානදු කී සැබෑ බසුත් දෙක එකට ගැලපෙනසේ අතර බොරු බසක්වත් කිස්බසක්වත් නොකියා රිදු කසාපැහැයක්මෙන්ද දූවගොඩකසිටු කතුවක්මෙන්ද අසුපිටතුබු කොඩුවක්මෙන්ද අස්ථිරබස් නොකියා ශිලාලේඛනයක්මෙන්ද ඉන්ද්‍රඛීලයක්මෙන්ද ස්ථිරබස් ඇතිව හිස ගසාදමනතේ. දෙබසක් නොකියන්නාහ. ලොවඇත්තන්මිසින් අදහන්ට සුදුසු බස්ඇත්තාහ. ලෝ වැසියෝ වංචාකරණපිණිස එකබසකුත් නොකියන්නාහ. මමද? අද දහවල් මේ භික්ෂ

පැහැත් මේ රෑ තිස්පැහැත් ඒ රහතුන්වහන්සේලා මෙන් බොරු කියමියි යන කල්පනාවකුත් සිතෙහි නුපදවා සැබෑබස්ම කියම යි සිතාගණ සිල්සමාදන්වන වේලාවෙහි සැබෑබසත් දෙවිනිදා ඵ දූසන කී සැබෑබසත් එක්ව ඇදෙනසේ අතර බොරු නොකියා සතුරන්විසිනුත් අදහන්ට සුදුසු සිරිබස් ඇතිව ලෝවැසියෝ වං චාකරණු පිණිස එකබසකුත් නොකියා දවස්කැරීමේ ගුණයෙනු ත් රහතුන්ට අනුකූලවෙම්යි එසේ දවස හලේනම් පෙහෙවස් විසු වානම් වන්නේයයි මෙසේ සලකාගන මුසාවාදා වෙරමණි සිකඛා පදං සමාදියාමි කියා සූතරවැනි සිලයත් සමාදන් වියයුත්තේය.

ජීවිතාන්තය දක්වා රහතුන්වහන්සේලා රහමෙර පානය කිරී මෙන් වෙන්ව රහමෙර පානය කෙරෙම්යි යන කල්පනාවක් සිතට පහලනොකට වාසයකලසේක. මමද අද මේ එක්රැයත් මේ දහවලත් රහමෙර පානය කිරීමෙන් දුරුව රහමෙර පානයකෙරෙ මියි යන කල්පනාවකුත් සිතට පහලනොකොට වාසයකෙරෙම්ය මේ ගුණයෙනුත් රහතන් වහන්සේලාට අනුලත්වෙම් එසේ දවස හැරියහොත් පෙහෙවස් විසුවානම් වන්නේයයි සලකාගෙණ සුරාමෙරය මජ්ජපමාදට්ඨානා වෙරමණි සිකඛාපදං සමාදියාමි කියා පස්වැනි සිලය සමාදන් වියයුත්තේය.

ජීවිතාන්තය දක්වා රහතුන් වහන්සේලා විකාලභෝජනයෙන් දුරුව වාසයකළසේක. පස්වරු අනුභව කිරීමක්වත් ඵ අනුභවකි රීමක්වත් විකාලයෙහි අනුභවකරම් යන සිතක් පහලකරන් නේනැතිව වාසය කළසේක. මමද අද මේ එක්රැයත් මේ දහව ලත් විකාලභෝජනයෙන් දුරුව පස්වරු ඔත්ආදි සිලයම නුසුදු සුදෙය අනුභව කරම්යි යන සිතක් පහලනොකොට වාසය කෙ රෙම්යි මේ ගුණයෙනුත් රහතන්වහන්සේලාට අනුකූලව වසම්. එසේ වියිම පෙහෙවස්විසුවානම් වන්නේයයි සිතින් සලකාගෙණ විකාලභොජනා වෙරමණි සිකඛාපදං සමාදියාමි කියා සවැනි සි ලයත් සමාදන්විය යුත්තේය.

ජීවිතාන්තයදක්වා රහතුන්වහන්සේලා තමන්වහන්සේලාගෙ සිත්හි කුසල් ඇතඟසා සියලු අකුසල් දුරුකළහෙයින් හපිපුඛය, අසවපුඛය, එළුවන් කුකුලන් ආදීන්ගේ පොරය, පොරකෙටව් මය, පොර ඇල්ලවීමය, යනාදී නා නා ප්‍රකාර විසුලු දැකීමෙන්ද නුමුත් නැටුමිද විසුලුආදීනද නොකරණසේක. අන්‍යයින්ගේ නැටීම් ආදියද නොබලනසේක. ගීකීම ගායනාකිරීම නොකළසේක. අ න්‍යයන් විසින් ගායනලද සඛ්ඛ ගීතකාවක්හෝ සඛ්ශ්‍රවණ චිත්ත

යෙන්මුත් ශබ්දතුරඟයෙන් නොඅසති. බෙරආදි වාද්‍ය ගාණ්ඩ යන් නොගසති. අනුන්විසින් ගසනලද්දේද? ඒගීතය නොඅසන සේක. යම්කිසි පුෂ්පජාතියක්වත් යම්කිසි සුවඳජාතියක්වත් ඇඟ පැහැවඩන්ට ගල්වන්නාවූ විලේපනයක්වත් ගනාදි මේ සියල් ලෙන් එකකුත් පැලඳිම්වසයෙන් නොදරති. උත්තරාසංග පූරණ වශයෙන් මණ්ඩණයද නොකෙරෙති. සිව්පහස් වනසේද සැරසි ම්වශයෙන්ද නොකලසේක. මම්ද අද මේ එක් රැයත් මේ දහවලත් විසුලුදස්නෙන් දුරුවෙමි. නැවුම්ද ගී කීමෙන්ද දුරුවෙමි. මාලා ගඬ විලේපනයන්ගේ ධාරණමණ්ඩන විභූසනයෙන්ද දුරුවෙමි. මේ ගුණයෙනුත් රහතන්වහන්සේලාට අනුකූලවෙමියි මෙසේ විසුයේනම් පෙරෙවස් විසුවානම් වන්නෙමියි සිතින් සලකා ගණ නවය ගීත වාදිත විසූකදස්සන මාලා ගන්ධ විලෙපන ධාරණ මණ්ඩණ විභූසනවිධානා වෙරමණී සික්ඛාපදං සමාදියාමි කියා මේ සත්වැනි සීලය සමාදන්විය යුත්තේය.

ජීවිතාන්තයදක්වා රහතන්වහන්සේලා චඞ්ගරියනින් උස්වූ ඇඳ පුටු ආදියද තිලිමාලා පරමදූනාදීවූ අකප්පිය (හෙවත් කැපනොවූ) ඇතිරිලි අතුරනලද ඇඳපුටුද මිටිවූ පාඇති ඇඳපුටුද කලාල් පැදුරු තෙලින්සන්කඩ තිඛිරිපිලි ආදිවූ කැපනොවූ ඇතිරිලි අතුරණලද ඇඳපුටුආදියෙහි හෝ බිමහෝ සයනය කිරීමද වැඩසිඳි මද නොකළසේක. කැපවූ ඇතිරිලි අතුරණලද ආසනයන්ම පරිභෝග කළසේක. මමද අද මේ එක් රාත්‍රියත් මේ දහවලත් එබඳු අකපවූ උසසුන් මහඇසුන් හැර මිටිආසනයන්හිහෝ බිමහෝ සැනපෙමි. මේ ගුණයෙනුත් රහතන්වහන්සේලාට අනුකූලවෙමි. එසේ නොලේවිනම් පෙරෙවස් විසුවානම් වෙසි සිතින් සලකා ගෙණ උවවසඟන මහාසයනා වෙරමණී සික්ඛාපදං සමාදියාමිකියා අටවැනි සීලය සමාදන්විය යුක්තේය.

මේ අඞ්ගොපසීලය සමාදන්වන උපාසක උපාසිකාදී ජනයන්විසින් පෙරෙවස් සමාදන්වන දිනයට පළමු දවසෙහි මේ මේදෙය කරවසි පොහෝදිනයෙහි කටයුතු කාරියයන් විදිවිධාන කටයුත්තේය. පොහෝදවස් උදාසන්හිම නැගිට (හෙවත් අරුණෝත්ගමණයට පළමු) අත්පා ආදිය පිරිසිදුසේ සෝදාගෙණ භික්ෂුකෙණේකුන්ගේ සමීපයෙන්වත් සාමණේර කෙණේකුන්ගේ සමීපයෙන්වත් සීලයෙහි සහාවදන්නා සිල්වත් උපාසකයකුගේ සමීපයෙන්වත් එබඳුවූ උපාසිකා කෙණේකුන්ගේ සමීපයෙන්වත් වාක්‌හෙදකොට සිල් සමාදන්විය යුක්තේය. පාලිභාෂාවෙන් වූ සික්ඛාපද වනපොත්නැතහොත් (හෙවත් පාඨම්නැත්නේනම්

"බුද්ධසාසනස්ස උපොසථසීලං අධිට්ඨාමි" කියා ඉටාගත යුක්තේ යම්තාක් තමාම ඉටාගන්නාකල පානාතිපාතා වෙරමණී සික්ඛාපදං සමාදියාමි, යනාදීන් වාක්හෙද කොට ඉටාගත යුක්තේය. සිල් ඉටාගත්තැන් පටන් අන්සතළොස්පත්ම හිංසා භීඩාවන කර්මාන්ත යකට විධානනොකොට යුක්තේය. ගෙයි අය වියදන් හරිනොහරිනා කවයුක්තේය. ගෙට අවුත් නිතිබත් වලඳන මහණක්හුමෙන් ආහාර අනුභව කටයුක්තේය විහාරයකටහෝ ගොස් බණ ඇසිය යුක්තේය. නොහොත් විවේකසථානයක හිඳ බුදුන්ගේ ගුණ සිහි කිරීමය තමාගේ සිල් සිහිකිරීමය යනාදිවූ අටතිස් අරමුණෙන්එක් අරමුණක් නිරන්තරයෙන් සිහිකොට සිත පිරිසිදු කරගත යුක්තේය. තවද මේ අෂ්ටාඟසීලය ලාභයක් ලබන අදහසින්වත් කීකී ප්‍රසංසාවක් ලබන අදහසින්වත් රක්ෂාකරතහොත් සිල් කිළිටුවෙන්ය. සප්තවිධ මෛථුනයද නොඉවසිය යුක්තේය. ඒ කවරේදයත්? පෙහෙවස් වසන අතුරෙහි (හෙවත් සිල්සමාදන්ව හිඳිනාදවසෙහි) ස්ත්‍රීන්හා සමඟ මෛථුනයයි කියනලද අනාචාරයෙහිනොපැවැතිමයස්ත්‍රීන්විසින් ඇඟඉලීමක්හෝ පැන් නැහැවීමක්හෝ අත්පා හිරිකීමක්හෝ ඉවසිනම් ඒ කැමැතිවේනම් ඊට සන්තෝසවේනම් මේත් එක මෛථුනයෙක. මෙසින්ද සිලය කඩවන්නේය. සිදුරුවන්නේය. කිළිටුවන්නේය. තවද ස්ත්‍රීන්විසින් කරණලද ඇඟඉලීම්ආදිය නොඉවසතත් ස්ත්‍රීන්හා එක්ව කථාකෙරේද, ස්ත්‍රීන්හා එක්ව සිනාසේද, ස්ත්‍රීන්හා එක්ව ක්‍රීඩාකෙරේද, ආස්වාදකෙරේද, කැමැතිවේද, ඊට ප්‍රසන්නවේද, මේත් එකමෛථුනයෙක. මෙසිතුත් සිලය කඩවන්නේය සිදුරුවන්නේය. කිළිටුවන්නේය. නැවත මෙකීදෙය නොකරතත් තමාගේ දිට්ඨියෙන් ස්ත්‍රියගේ දිට්ඨියට පැහැරබලාද, ඇගේ බැලීමෙන් ආස්වාද කෙරේද, කැමැතිවේද, ඊට ප්‍රසන්නවේද, මේත් එක මෛථුනයෙක ඉතුත් සිලය කඩවන්නේය සිදුරුවන්නේය කිළිටුවන්නේය. නැවත දිට්ඨියෙන් දිට්ඨිය පැහැර නොබලතත් කථාකරන්නාවූහෝ ගීකියන්නාවූහෝ ස්ත්‍රියගේ ශබ්දය පිටබිතකහෝ පව්රෙන් (ප්‍රාකාරයෙන්) පිටතසිටහෝ අසාද ඒ ඇසූ ශබ්දය ආස්වාදකෙරේද, කැමැතිවේද, එයට සතුටුවේද, මේත් එක මෛථුනයෙක. එසිතුත් සිලය කඩවන්නේය සිදුරුවන්නේය කිළිටුවන්නේය. නැවත ඒ ස්ත්‍රියගේ ශබ්දය අසා ආස්වාද නොකරතත් පෙර ස්ත්‍රීහාසමඟ කරණලද සිනාසීම්ද, කරණලද ක්‍රීඩාගැන ආස්වාද කෙරේද, කැමැතිවේද, මේත් එක මෛථුනයෙක. ඉතුත් සිලය කඩවන්නේය සිදුරුවන්නේය කිළිටුවන්නේය. නැවත එසේවූ පූර්වානුභූත ස්ත්‍රී

යා සිහිකොට ආස්වාද නොකරතත් රූප, ශබ්ද, ගන්ධ, රස, ස්ප්ශී, යන පංචකාම කොට්ඨාසයෙන් සනාතර්ජිතවූ ඉන්ද්‍රියයන් පවත්වා වසන්නාවූ ගෘහපති පුත්‍රයෙකු දැක ආස්වාදකෙරේද, ඊට සන්තුෂ්ට වේද, මේත් එකු මෛථුනයෙක. එසීනුත් ශීලය කඩවන්නේය සිදුරුවන්නේය නිලුටුවන්නේය. නැවත එසේ පංචකාමඤ අනුභව කරන්නාවූ ඉසුරුමතුන් දැක ඔවුන්ගේ ශාපවිදිමට ආස්වාදනො කරතත් මේ සිලයෙන් මේ වෘතයෙන් මේ බ්‍රහ්මචර්‍යාවෙන් ශක්‍රාදි ප්‍රසිඛ දෙවියන්ගේ තනතුරටහෝ අන් දෙවිකෙණෙකුන්ගේ තනතුරටහෝ පැමිනෙම්සි පතාද (ප්‍රාර්ථනාකෙරේද) ඒ දිව්‍යසම්පත්තියට ආස්වාදකෙරේද කැමැතිවේද මේත් එක මෛථුනයෙක ඉනුත් සීලය කඩවන්නේය. සිදුරුවන්නේය නිලුටුවන්නේය. මෙසේ මේ සප්තවිධ මෛථුනය නැමැති නපුරුවූ විෂය දුරුකොට යහපත්සේ පිරිසිදුව රක්ෂාකරණලද අෂ්ටාංගසීලයෙන් ලබන ලද අනුසස් (ආනිසංස) කවරේදැයි යතහොත්,

යම් පුරුෂයෙක් අඟුරවය, මඟධරවය, වැදූරවය, මල්ලරවය, චේතියරවය, වංගරවය, කුරුරවය, පංචාලරවය, මච්ඡරවය, සුරසේනරවය, අස්සකරවය, අවන්තිරවය, ගන්ධාරරවය, කාම්බෝජරවයයි යන දසයක් මහාරාජවලින් සැදුන්ලද්දාවූ සියලුදඹදිව බෙරතලයක්සේ සමකොට ඒ හැමතැනම ඉනපමණ උස සත්රුවනින් පුරා ඒ හැමතැනටම ඒකාතපත්‍ර චක්‍රවර්තිරාජ්‍යය කරන්නේද ඔහු එසේ ලද්දාවූ රාජ්‍යසම්පත්තිය එක්රැයක් එක්දවාලක් (පෙහෙවස්) අෂ්ටාංගසීලය රක්ෂාකිරීමෙන් ලබනලද ආනිසංසයෙන් (කුසලයෙන්) සොළොස්භාගයක් කොට පසළොස්භාගයක් හැර එක් භාගයක් ගත්කල ඒ භාගයටත් සමනොවන්නේය. එසේ සමනොවන්ට කාරණ කවරේදැයි යතහොත් එක්රැයක් එක් අභවලක් අෂ්ටාංගසීලය රක්ෂාකලාවූ ඒ පුරුෂතෙම ඒ කුසලයෙන් මනුෂ්‍ය දේහයාගේ නැසීමෙන් මත්තෙහි චාතුම්මහාරාජික දිව්‍යලෝකයෙහි දෙවියන්කෙරෙහි උපදනේය. මේ මනුෂ්‍යයන්ට පනස් අවුරුද්දක් ගතවූයේනම් එහි වැසි දෙවියන්ට එකදවසෙක එදවස් තිසක් ගතවූකල එක්මසෙක එසේ දොළොස්මසක් ගතවූකල එක් අවුරුද්දෙක ඒ අවුරුදුගණනින් පන්සියයක් අවුරුදු චාතුම්මහාරාජික දෙවියන්ට ආයුෂවන්නේය. ඒ පන්සියයක් අවුරුදු මනුෂ්‍ය ගණනින් බැලුවාම අනූලක්ෂයක් වන්නාහුය. එහි උපන්නාවූ දෙවියන්ට ඇසට අමනෝඥ අරමුණෙක් නොපැනෙයි. කනට අමනෝඥ ශබ්දයක් නොඇසෙන් නාසිකාවට අමනෝඥ දුර්ගන්ධයක් ස්ප්ශීනොවෙත් දිවට නපුරු රසයෙක් විඳීමෙක්නැත. කයට අනි

ස්ථ (නපුරුවූ) ස්ථිරියක් නොවැදගන්නීත් සිතට දුකුදුයකවූ අර මුණෙක් නොමැත්තේය. මෙසේ සදෙරින්ම ශැපවිදිනාවූ ඒ දෙවියන්ගේ ඓසුවයින් දුටුකෙණකුන්ට සියලු දඹදිවටද අනිත් චිපතුනවද ඉසුරුමත්ව රජ්ජයකරන්නාවූ පළමුකී සක්විතිර ජ්ජුරුවන්ගේ රජ්ජසුවයින් ඉතා සුළුපායෙක යාචකයෙකුගේ ජීවිකාවෘත්තියක්වැන්න. නැවත මේ එක් රැයක් එක් දහවලක් අෂ්ටාඟසිලය රක්ෂාකලාවූ පුරුෂතෙම එමකුසලයෙන් තව්තිසා දිව්‍යලෝකයෙහි උපදනේය. ඒ දෙව්ලොව වැසි දෙවියන්ට මනුෂ්‍ය ගනනාවෙන් සියක් අවුරුදුන් එකදවසෙක. එදවසින් තිස්දවසක් එක්මසෙක, එමසින් දෙලොස් මසක් එක්අවුරුදෙක, ඒ අවුරුදුන් අවුරුදු දහසක් එහිවැසි දෙවියන්ට ආයුවන්නාහුය. ඒ දහසක් අවුරුදු මනුස්‍යගනනින් බලනකල තුන්කෝටි ශැටලක්ෂයක් අවුරුදුය. ඒ එකදවසක් රක්ෂාකලාවූ මේ සිලයෙන් යාමදිව්‍යලෝකයෙහි උපදනේය. ඒ දිව්‍යලෝකයෙහි දෙවියන්ට මිනිසුන්ගේ අවුරුදු ගනනින් දෙසියයක්අවුරුදු එකදවසෙක, එදවසින් තිස්දවසක් මසෙක. ඒ මසින් දෙලොස්මසක් අවුරුද්දෙක. ඒ ගනනාවෙන් දෙවියන්ට දෙදහසක් අවුරුදු ආයුසවන්නේය. ඒ දෙදහසක් අවුරුදු මනුෂ්‍ය ගණනින් බලනකල තුදුස්කෙළ සතලිස් ලක්ෂයක් අවුරුදුය. ඒ එක දවසක් රක්ෂාකලාවූ අෂ්ටාඟසිලයෙන් තුසිත දිව්‍යලෝකයෙහි උපදනේය. මිනිස්ලොව අවුරුදු සාරසියයක් අවුරුදු ඒ දෙවියන්ට එකදවසෙක. ඒ දවසින් තිස්දවසක් එක් මසෙක. ඒ මසින් දෙලෙස් මසක් එක් අවුරුද්දෙක. ඒ අවුරද්දෙන් සාරදහසක් අවුරුදු එහි වැසි දෙවියන්ට ආයුස ය. එය මනුෂ්‍ය ගණනාවෙන් බලනකල සත්පනස් කෙළසැට ලක්ෂයක් අවුරුදුය. එක දවසක් රක්ෂාකලාවූ අෂ්ටාඟසිලයෙන් නිම්මානරති දිව්‍යලෝකයෙහි උපදනේ මනුෂ්‍ය ගනනාවෙන් අමිසියයක් අවුරුදු ඒ දිව්‍යලෝකයෙහි දෙවියන්ට එක දවසෙක. ඒ දවසින් තිස්දවසෙක් එක් මසෙක. ඒ මසින් දෙලොස්මසෙක් එක් අවුරුද්දෙක. ඒ අවුරුද්දෙන් අටදහසක් අවුරුදු එහි වැසි දෙවියන්ට ආයු ඇත්තේය. එය මනුෂ්‍ය ගණනාවෙන් බලනකල දෙසිය තිස්කෝටි සතළිස්ලක්ෂයක් අවුරුදුය. තවද එක දවසක් අෂ්ටාඟසිලය රක්ෂාකලාවූ සත්‍රී පුරුෂාදී කෙණෙක් එම කුසලයෙන් පරනිම්මිත වසවර්තිනම් දිව්‍යකයෙහි උපදනේය. මනුෂ්‍යගණනාවෙන් එක්දුස් සසියයක් අවුරුදු ඒ දිව්‍යලෝකයෙහි දෙවියන්ට එක දවසෙක. ඒ දවසින් තිස්දවසක් එක් මසෙක. එමසින් දෙලොස් මසෙක්, එක් අවුරුද්දෙක. ඒ අවුරද්දෙන් සොළොස්

දහසක් අවිරුදු එහි වැසි දෙවියන්ට ආයුෂවන්නේය. ඒ මනුෂ්‍ය ගණනාවෙන් බලනකල නවසිය විසිඑක්කෝටි ඇටලක්ෂයක් අවිරුදුවන්නේය. මෙසේ අෂ්ටාඟසීලයෙන් සදිව්‍යලෝකයෙහි උපන් නාවූ දෙවියන්ගේ ඇසඟයෂ්‍යයන් කිමෙන් ඵලයක් නැතිනිසා බුදුහු ආයුපමණක් වදාළසේක. මෙබඳු ආයුෂ ඇත්තාවූ මහත් ඇසඟයෂ්‍යඇත්තාවූ ඒ දෙවියන් දුටු අයට ඉතාපමණ උස සත්රුවන්පිරුදඹදිවවද අනිකුදු විප තුනටද චක්‍රවර්තිරාජ්‍ය කරන්නාවූ ඒ රජ්ජුරුවන්ගේ ඇසඟයෂ්‍යයන් කෙසේ මහතැයි සිතේද? දිලිඳුවූ යටහත් පැවතුම්ඇති යාචකයෙක්මෙන් සිතෙන්නේමය.

තවද චන්ද්‍ර සූර්‍ය්‍ය දෙදෙනා මහමෙරවට ඇවිද යම්පමණ ආලෝකයකොට ඇවිදිද්ද? ඒ ඇතුලත සතරමහා දිවයින දෙදහසක්කොදෙව්ද සමුද්‍රයෙහිද ගොඩද යන සියළුතැන්හිම වසන්‍නාහරණාදිවූ යම් ධනයෙක්ඇද්ද යම් මුතුජාතියෙක් ඇද්ද යම් රත්නජාතියෙක් ඇද්ද මැනික් නිල්මැණික් ජාතීන් ඇද්ද වෛඩූර්‍ය්‍ය මැණික්ජාතියෙක්ඇද්ද ගෝමයසේ ඇතිවන සෙයින් සිංගිඤ්ඣවර්නයයි කියනලද යම් රත්නජාතියෙක් ඇද්ද පවිතයන්හි උපදනා යම්රත්නජාතියෙක් ඇද්ද නැවත බුදුන්ගේ ශරීරයෙහි පැහැවැනි පැහැඇතිසෙයින් ජාතරූපයයි කියනලද යම් රත්නජාතිහු ඇද්ද පතුවන්විසින් සාරා ගොඩදමනලද භටකනම්වූ රත්නජාතියෙක් ඇද්ද ඒ සියල්ලම සොළොස්භාගයක් කොට එයින් එක් භාගයක්ගෙණ බැලූකල එක් දවසක් රක්‍ෂාකරණලද අෂ්ටාඟ සීලයාගේ එක් භාගයකුත් අගනේ නොවෙයි මෙසේ මහත් විපාක ඇත්තාවූ මේ අෂ්ටාඟසීලය එබා සත්පුරුෂයෙනි රක්‍ෂාකරන්ට නොපට කවර බැරිදෙයක් ඇද්ද ප්‍රාණඝාතනම් අනුන්ගේ දිවිනැසීමය. ආයුදෑ නොයෙක් උපකරණගෙණ මහත් වෑයමෙන් කටයුතු දෙයක. ඒ ප්‍රාණඝාතය මම නොකරම්යි සිතාගන්නා සිතිවිල්ල එසේමත් උත්සාහයකින් කටයුතුදෙයක් නොවෙයි. නිදුකින් සිඹවන්නේය. අදත්තාදානයත් අනුන් සන්තකදෙයත් ඇරගැන්මක්හෙයින් සොරා ඇරගණිතත් බලාත්කාරයෙන් ඇරගණිතත් මහත් උත්සාහයෙන් ගතයුතු දෙයෙක. ඒ නොගනිම්යි සිතාගැන්ම නිදුකින්ම සිඹවනදෙයක. අබ්‍රහ්මචර්‍ය්‍යාවත් ඉන්වන උපද්‍රවයන්ද ස්ත්‍රීන්ගේ නුගුණ සිතාගන්නා කෙණෙකුන්ට ඉන් වැලකෙම්යි සිතාගැන්මත් නිදුකින් සිඹවන දෙයක. බොරුකීවනම්:—අනුන්ගේ වැඩත් නසත් බොහෝදෙනා අප්‍රියකරත් බොරු කියන්නාවුන් නොකරණ පවිනම් නොමැත්තේයයි යනුහෙයින් බොහෝ අකුසලයට මුල්වසිවිනේයයි යනාදීන් සිතාගන්නා කෙණෙකුන්ට ඉ

න් වැලකීම දුක් නොවන්නේය. රහමෙර පානය කිරීමනම්:—සියළු කටයුතු පමාකරන්නේය. භය ලජ්ජාදෙක නැතිකරන්නේය සියනාදින් සිත්ගන්නා කෙනෙකුන්මතම ඉන් වැලකීමත් දුක් නොවන්නේය. විකාල භොජනයනම්:—පෙරවරු අනුභවකිරීමත් එක්ව දෙවේලක අනුභවකිරීමය. ඒදෙවේලක අනුභවකිරීමත් වැඩි උපදවන්නේය භෝජනය පිණිස දෙවේලක ව්‍යවෘතවීමෙන් කටයුතු කාරියයන් නැසෙන්නේයයි සිතා සිල් රක්ෂාකරණනිසා පෙරවරු බත් අනුභවකිරීමෙන් සඛීසම්පත්තිය සිඩකරන්නේයයි සිතාගන්නා කෙනෙකුන්ට විකාලභොජනයෙන් වැලකීමත් දුක් නොවන්නේය. නෘත්‍යනම් විසරුවක්වැන්න ගීතම් හැඩිමක්වැන්න ඒ නෘත්‍ය ගීත වාදිනයෙන් කවර ප්‍රයෝජනයෙක්ද මාලාඟ ඛි විලේපනාදිය පූජාකලහොත් නොයෙක් කෙලගහනන් කප්මුලුල්ලෙහි දිව්‍ය මනුෂ්‍ය සම්පත්තිය සිඹවන්නේය. ඒ තමා පරිභෝගකිරීමෙන් කුවර වැඩක් සිඹකෙරේදැයි සිතාගන්නාහට එසින් වැලකීමත් දුක්නොවන්නේය. උච්චාසයන මහාසයනයෙන් වැලැක්මවනාහී මේ සියල්ලටම වඩා නිදුක්වන්නාහුය. එබා සත්පුරුෂයෙනි! නොපවිසින් මේ බුඩොත්පාද කාලයෙහි මනුෂ්‍යත්ම භාවය ලබාගත්තැනදීම පොහොයෙන් පොහොයඅෂ්ඨාඟසිලය රක්ෂාකොට සසර බොහෝකලක් දිව්‍ය මනුෂ්‍ය සම්පත් විඳිමටත්නිවිණ සම්පත් ලැබීමටත් සුදුසුවූ කුසල් කටයුත්තේය.

බුඩොත්පාදයට පැමිණ බුදුන්වදුල ඛනඅසා අෂ්ඨාඟසිලයෙන් ලබන අනුසස් විභාගකොට ගතහැකි ප්‍රථුලවූ නුවනැතිව මනුෂ්‍ය වසිවිනා නොපතබා පෙර අබුඩොත්පාදකාලයෙහි හෙයක් දෙරක් ආහාරපානවගියක් නැතිව නිරන්තරයෙන් ගොදුරු සොයා ඇවිද සාපිපාස සන්සිඳුවාගත නොහෙන්නාවූ ඔවුනොවුන් කෙරෙහි හසින් සෑහවි ඇවිදින්නාවූ තිරස්චීනයෝපවා චන්ද්‍රයාගේ සම්පූණීතාවයෙන් පසලොස්වක් පොහෝදිනයයි දැන අෂ්ඨාඟසිලය රක්ෂාකලොය. මෙබඳු ජාතියෙක මෙබඳු නුවනැත්තෙක්ව මෙබඳු රක්ෂාවෙක සිටිනාවූ නොපමබැරි කවරක්ද කවර ආලිස්සන් කමෙක්ද (හෙවත් කවර අලස කමෙක්ද) දුස්සිලව සිටියාසින් පැමිණෙන්නාවූ නපුරන් සිල්වත්වීමෙන් වන්නාවූ අනුසසුන් දැන නොපවිසින් අප්‍රමාදව අෂ්ඨාඟසිලය රක්ෂා කටයුත්තේය. පෙර අබුඩොත්පාදයෙහි තිරස්චීනයන්පවා අෂ්ඨාඟසිලය රක්ෂාකළපරිදි මෙසේ දතයුත්තේය.

පෙර දඹදිව මිඟඩරට ආදීවූ රටතුනකට අතුරෙහි එක් වනාන්තරයෙක් වූයේය. බුදුවීමට බෝධිසම්භාරපුරා ඇවිදිනාවූ අපම

භාග්‍යවතාණන්වහන්සේ මගධරට බමුණුකුලයක ඉපිද වැඩිවිය පැමිණි‍ණේක් ගිහිගෙයි සැප අනුභවකිරීමෙහි දෝස් දැක ගිහිගෙයින් නික්ම පැවිදිව ඒ වනාන්තරයෙහි පන්සලක් කොට විසූසේක. උන්වහන්සේ වසන ඒ පන්සලට නුදුරුනැන්හි එක් හුණවණයෙක. තමාගේ භාර්‍යාවහාසමග එක් කොබෝපක්ෂියෙක් වසන්නේය. එක් තුඛසෙක සකුණෙක්ද වසන්නේය. එක් වනලැහැබක කැනගිලෙක්ද වසන්නේය. එක් වනලැහැබක බිලසෙක්ද වසන්නේය. ඔවුන් සතරදෙනම කලින්කල් අවුත් ඒ තාපසයන්වහන්සේගෙන් බණ අසන්නාහුය. එක්කලෙක එක්දවසක් කොබෝපක්ෂිතෙම තමාගේ භාර්‍යාවහා සමග කැදැල්ලෙන් නික්ම ගොදුරුපිණිස යනුයේය. ඔහුපස්සේ යන්නාවූ පක්ෂිධේනුව එක් උකුසෙසක් ඇරගෙණගියේය. ආ ඇඹු අඩ අසා කොබෝපක්ෂිතෙම ඇගෙන් තමා වෙන්වූනිසා රාගාග්නියෙන් දවනුලබන්නාවූ ශරීර ඇතිව මෙසේ සිතුයේය. මේ රාගය මට ඉතා දුක්කෙරෙයි මේ රාගයට නිග්‍රහනොකොට ගොදුරට නොයම්සිසිතා තාපසයන්වහන්සේගේ සමීපයට ගොස් බණ අසා රාගයට නිග්‍රහකොට උපෝසථ සමාදන්ව එකත්පසෙක හුන්නේය. සකීතෙමේද ගොදුරු සොයමින් තමාවසන තුඛසින් නික්ම අසල්ගම ගෙරින් ගොදුරු කන තැන්හි ඇවිදිනේය. එකල්හි ගම්දෙටුවාගේ සඬ්ගධවලවූ මඬගල්‍යවෘසභතෙම ගොදුරුකා ඉක්බිති අංම්පිගෙණ කෙලින්නේ ගොදුරුසොයා තුඛසින් නික්ම ගොස් එතැන්හි සිටිනාවූ සකීතෙම ගොණුගේ කුරහඬින් හයගෙණ තුඛසට වදිනුපිණිස දුවනුයේ ගොණුගේ පයට අසුව කිපි නාගයා ගොණා දෂ්ටකෙළේය. ගොන්තෙම එතැන්හිවැටී මළේය. ගම්වැසෙස්සා ඔහු මළේයයි යනු අසා සියලෙල්ලම අවුත් අඬා වැලප පුෂ්පාදීන් පුදා වලලා ගියෝය. සකීතෙම ඔවුන් ගියකල්හි නික්ම බලනුයේ මාගේ ක්‍රොධය නිසා වෘසභයාමරා මෙතෙක්දෙනා සෝකයට පැමිනෙව්වෙමි. මේ ක්‍රොධයට නිග්‍රාහනොකට මම ගොදුරට නොයම්සි. අසප්‍රවටගොස් ක්‍රොධයට නිග්‍රාහපිණිස පෙනෙවස් සමාදන්ව එක් ප්‍රදේසයෙක හොත්තේය. කැනගිල්ද ගොදුරුසොයා ඇවිදිනේ එක් මල ඇතකු දැක මහත් ගොදුරක් ලදිමියි සතුටුව ගොස් සොඬ ඩැහැබැලීය. එයද ටැඹැක්සේ දැඩිව තිබුයේය. එහි ආස්වාදයක් නොලැබ දළ ඩැහැබැලීය. ඒත් ගලක්මෙන් දැඩිව තිබුයේය බඩ ඩැහැබැලීය. එයද අවුපතක්සේ කිසි මොලොක්ගුණයක් නැතිවූයේය නකුටද ඩැහැබැලීය. එයද මොලොක්ගුණයක් නොමැතිව ඉතා දැඩිවූයේය. නැවත මලමාගීය ඩැහැබැලූයේ ගිතෙල් මුලක්සේ මොලො

ක්ව තිබුනේය. ඒ සිවල්තෙම මසෙහි ඉතා ගිජුවූයේ ඒමස් කඳ යේ බඩඇතුලට වැද පිපාසිතකල්හි ලේඛොමින් ක්‍ෂුධාකල්හි ම ස්කමින් වැතිරෙණකල්හි අතුනුහෝ බඩවැල්හෝ අනුට වැතිරෙ න්නේය. එතැන්පටන් ඒතෙම ආහාරයත් පානයත් සයනයත් මෙසේම ඇත. අන්තැනකට ගොස් කුමක් කෙරෙම්දැයි එහිමයිත් අලවා විසීය. දවස්ගණනක්න් ඇත්කුන විසලෙනකල්හි මලමා ගියත් වැසුනේය. කැනගිල්තෙම බඩඇතුලෙහිම වසනුයේ එහි උපන් තද උෂ්ණයෙන් ශරීරමස් සිඳී පඬුවන්ව නික්මයන්නට ම ගක්නොලැබඋන්නේය.එක්දවසක් නොකල් මහාවැස්සක් වටුයේ මලමාගිය තෙම් මොලොක්ව සිදුර දැක්කේය. කැනගිල්තෙම් බොහෝකාලක් දුක්විඳ උන්බැවින් ඒ සිදුරට ඉසින්පැහැර නික් මුනේය. සිදුර හැකිලිනිබුසෙයින් සියලු රෝමයෝම මලමාගියෙහි ලග්නවිය. ඒ සිවල්තෙම් තල් අලයක්සේ ලොම්නැතිව සිතනු යේ මාසිතෙහි ලපන් තද ලෝභයනිසා මාවිසින් බොහෝ දුක්විඳි නාලදබැවින් ඉලෝභයබැහිගුාහනොකොට ගොදුරු අනුභවනොකෙ රෙමිසි ලෝභයට නිග්‍රාහපිණිස පෙහෙවස් සමාදන්ව එක් ප්‍රදේශ යක හොත්තේය. වලස්තෙමේද වනාන්තරයෙන් නික්ම මෙතෙ ක්කල් ගොදුරුගත්නා තැනින් ගොදුර නොගෙණ අත්‍රිජාවෙ න් (බොහෝ ආසාවෙන්) මඩනාලද සිත්ඇත්තේ මලයරට පසල් ගමකට ගියේය. වලසෙක් ආයේයයි අසා ගම්වැස්සෝ දුනු දඩු ආදියඉගෙණ ඔහුඋන් වනය වටකළාහුය. ඔවුන් වටකළබව දැන ඒ කැලයෙන් නික්ම යන්නාවූ ඔහු දැක දුනු මුගුරුගෙණ තැළී යේය. එතෙම බිඳුනු ඖස්ඇතිව තමා ලඟිනාතැනට ගොස් සිතනු යේ මේසා මහත් දුකට පත්වූයේ මාගේ අත්‍රිජාව නිසාමය එබැ වින් රෑට නිග්‍රහනොකොට ගොදුරට නොයෙමිසි අසපුවටගොස් අත්‍රිජතාවයට නිග්‍රහපිණිස පෙහෙවස් සමාදන්ව එක්ප්‍රදේශය කහොත්තේය. තාපසයන් වහන්සේටද ජාතියනිසා උපන්නාවූ මානයෙන් ධ්‍යානයක් උපදවාගත නොහැකිබව පසේබුදු කෙණ් කුන්වහන්සේ දිවැසින් දැක සිතනුයේ මේතෙම ලාමකවූ සත්වයෙ ක්නොවෙයි මේ කල්පයෙහිම බුදුවන්නාවූ බෝධිසත්වයෙක. එබැ වින් ඔහුගේමාන්නයට නිග්‍රාහකොට ධ්‍යානඋපදවාගන්නා ආකාර කෙරෙම්යි සිතා තාපසයන්වහන්සේ පන්සල උන්සල්හි හිමාල වනයෙන් තමන්වහන්සේ වැඩ ඒ තාපසයෝ හිඳිනා රුක්මුල තුබූ ගල්පුවරුවෙනි වැඩඋන්සේක. තාපසයෝද පන්සලින්නික්ම රුක්සමීපයටගියේ. එහි වැඩහිඳිනාවූ පසේබුදුරජානන්වහන්සේ දැක උන්වහන්සේකරා ඵලඹ කියනුයේ චණ්ඩාලවූ කාලකන්නි

හිසම්බුම්මහන මාණිඳිනා පුවරුවෙහි කුමට උන්නෙහිදැයි අසූසේක. එකල්හි පසේබුදුරජානන් වහන්සේ වදුරණුසේක් එම්බා සත් පුරුෂය නොපමට කුමට නින්දුකරන්නෙහිද මම ප්‍රතිවේද කරණ්ලද සත්‍ය ඥනඇති පසේබුදුකෙණෙක නොපවනාහි මේ කල්පයෙහි සම්‍යක්සම්බුඬවන්නාවූ පාරමිතාපුරා ආවාවූ බෝධිසත්වයෙක. තොප මෙතෙක්කල් ගියකල්හි බුදුවන්නේය. ඒ ජාතියෙහි සිඛාවී නම් කුමාරවන්නේය. ගෞතමනම් බුදුවන්නේය යනාදීන් සියල්ල ප්‍රකාශකොට එසේවූ නොපවනාහි මාන නිග්‍රහකොළ කුමට පරුෂ බස් කියන්නෙහිවේදැයි වදුලසේක. ඒ අඳා බෝසතානන් වහන්සේ කවරදවසෙක කවරකලෙක බුදුවන්නේදැයි යනාදීන් සාමීචි කථා පමණකුත් නොකළසේක. පසේබුදුරජානන්වහන්සේ වදුරණුසේක් තාගේ ජාතියෙනුත් මාගේ ගුණයෙනුත් කවරක් මහත් වන්නේදැයි නොපිම දැනගනුව ඉදින් තට හැකිවූනම් දැන් අහසට නැගි මාහාසමඟ උතුරු හිමවතටළුවයි තමන්වහන්සේ අහසටපැනනැගි උන්වහන්සේගේ පාදඛ්ඩවිලි ඒ බෝසතානන්වහන්සේගේ ජටාමතුයෙහි විසුරුවමින් අහසින් වැඩියේක තාපසයෝ ඒ පසේබුදුරජානන් වහන්සේ වැඩිකල්හි සිත කලකිරී සිටනුයේ මුන්වහන්සේ මහත් ශරීර ඇතිවූයේනමුත් සැඩපවන්කඳට පෑදූබූ පුළුන්පෙදක්මෙන් අහසට පැනනැගි වැඩියේක. මම වනාහී ජාතිමාන්නනිසා මෙබදු මහොත්තමඥානන් වහන්සේගේ ශ්‍රීපාදයන් නොවැන්දෙමි. ප්‍රිය කථාවකුත් නොකෙළෙමි. ජාතිමාන්නඥනම් මඟත් අකුසලයෙක.ඒවනාහි කවරෙකුඟට කුමන ප්‍රයෝජනයක් ඇද්ද කෙබදු වැඩක් සිඩවන්නේද සීලාචාරයම උතුම්වන්නේය. මාගේ මේ ජාතිමාන්නඥ වැඩිවූයේනම් මම නරකයට ගෙණයන්නේයයිදැන මේ ජාති මාන්නඥට නිග්‍රහ නොකොට ඵලාඵලඥට නොඇමිසි සිතා පන්ඥලටපැමිණ උපොසථවාසශෙන් යුක්තව ගහපත්සේ භාවනාකොට පංචාභිඥුවන්හා අෂ්ඨසමාපත්තීන් උපදවා සක්මන්කෙලවර ගල්පුවරුවෙහි වැඩඋන්සේක. කොඛෝපක්ෂියා ආදී සතරදෙනාද උන්වහන්සේගේ ශ්‍රීපාදයන්වැඳ එකත් පස්සව හුන්නාහුය.බෝසතානන්වහන්සේ කොඛෝපක්ෂියා අත්න් විචාරණසේක් තෝ මෙතෙක්වේලාවට ගොදුරු සොයා ඇවිදිනේය. අද උදැසන්හිම අවුත් මෙහි හුන්නෙහිය. කිමෙක්ද? පෙහෙවස් වෙසෙද්දැයි විචාළසේක. එසේය! සාමීනිසි කීය. නැවත ඒ කොඛෝපක්ෂියා ඇසින් පෙහෙවස් විසිමට කාරණ කාවරේදැයි විචාරන්නාවූ මහබෝසතානන්වහන්සේ මේ ගාථාවෙන් මෙසේ විචාළසේක.

අපෙපාස්සුකෝසාදුනි තිවං කපොට විහඟමාණෙ තව හොජනහෙට්ඨා
බ්‍රූදං පිපාසං අධිවාසඟනෙනා කසමා තිවං පොසථිකෝ කපොට...

අහස ඇවිදිනාහෙයින් විහඟමාන නම් එම්බා කොබෝ පක්ෂිණි!
තට හොජනයෙහි ඇලයෙක් නැත්තෙහිද කියමේන්ද? තව හොජන
යෙන් අසීයෙක් නැද්ද සාපිපාස දෙක ඉවසාගෙණ කවර කාර
ණයක්නිසා නොප පෙහෙවස් වසන්නෙහිදැයි විචාළසේක... ඒ
අසා කොබෝ පක්ෂිතෙම ගාථා දෙකකින් මෙසේ කීයේය.

අහං පුරෙ ගිඛිඟනෙහු කපොවිඟා අසිං පදෙසඛිහි උහොරමිම
අථඤඤගිසා කුනිකෝ කපොවිං අකාමඛා නාස විනා අහොසිං...

නානාභවා විපඅයොගෙන තසස මනොමයං වෙදනං වෙදියාමි
තසමා අහං පොසථං පාලඛාමි රාගො මමං මා පුන රාගමාසි...

සඛාමිනි තාපසයන් වහන්ස:—මම පළමු මේ වනාන්තරයෙහි
කොබෝ දේකුවක්හා සමගිව ගිදුව ප්‍රියවාසයෙන් සිත්අලවා වා
සයහෙළෙමි. එසේ වසන්නාවූ මාගේ භාය්‍යාව පක්ෂින්මරා මස්කා
ජීවත්වන පක්ෂියෙක්විසින් අල්වාගෙණ මරා මස්කෑයේය. මම්ව
නාහි ඇගෙන් වෙන්වීමෙන්ද ප්‍රිය විප්‍රයොගයෙන්ද දුක්විඳින්නෙ
මි එසේ දුක්විඳීමට කාරණාවූ රාගය කියනෙහි නුපදනා පරිද්දෙන්
රාග නිග්‍රාහ පිණිස පෙහෙවස් වසන්නෙමියි කියේය... කොබෝ
පක්ෂිතෙම තමා පෙහෙවස් විසීමට කාරණා කීකල්හි සත්‍යඥානයින්
පිවාරන්නාවූ මහබෝසතානන් වහන්සේ මේ ගාථාවෙන් මෙසේ
විචාළසේක.

අනුපුබ්බගාමී උරගච්ඡිවිහ, දුඛාබුධා ඝොර විසොසි සප්ප
බ්‍රූදං පිපාසං අධිවාසඟනෙනා, කසමා තිවං පොසථිකොසි දිඝ...

කෙළින්යන ගමණක් නැත්තාවූ බඩගාමන හෙයින් උරගනවී
වූ දිවි දෙනක් ඇත්තාවූ දලම ආශ්‍රයකොට ඇත්තාවූ එම්බළ සර්ප
තෝ ඝෝරවිස ඇත්තෙහිය. එසේවු තා කවර කාරණයක්නිසා සා
පිපාසදෙක ඉවසා පෙහෙවස් වසන්නෙහිදැයි විචාළාවූ මහබෝස
තානන්වහන්සේට සර්පතෙම කාරණා දක්වන්නේ මේමතු කියන
ගාථාදෙකින් මෙසේ කීයේය.

උසඛො අහු බලවාගාමිකසස ඛවලොසිවඛෙණා බහුපසනෙනා
සොමෙ මමං අඤඤමිතංවදවිසො දුඛාබාහිහුතො මරණංඋපාගතං.

තනොජනා නිඛ්ඛම්මිවානගාමතො කන්දිඛරෙදිව අපඤඤමිංසු
තසමා අඛං පෙසසථංපාලයාමි කොධොමමං මාපුනරාගමාසි.

ස්වාමිනි තාපසයන්වහන්ස! අසවල් ගම්දෙටුවාගේ සඬ්ඝධවල යසි කියනලද වණ්ණයෙන්හා කායබලයෙන් යුක්තවූ මඟල්‍යවෘසභ තෙම මම ගොදුරු බිමදී මිරිකීය. මම කිපි ඔහු දෂ්ටකෙළෙම් හේ තෙම දුක්ඛවේදනාවෙන් පීඩිතවූයේ මරණයට පැමිණියේය. ඔහු මලපසු ගම්වැසියා ඇවිත් ඔහු දැක අඩා වැලප වලලාගියෝය. මෙතෙක්දෙනාටත් වෘසභයාවත් දුක්වූයේ මාගේ ක්‍රොධයනිසාය. ඒ ක්‍රොධයට නිග්‍රාහකරණුපිණිස මම පෙහෙවස් වසන්නෙමිසි කීයේය. නැවත සිඟාලයා අතින්විචාරන්නාවූ මහාබෝසතානන් වහන්සේ මේ මතුකියන ගාථාවෙන් මෙසේ විවාළසේක.

මතා නිම්සානි බහුසුසානෙ මනුසසඤ්ඤරූපං වියහොජනංතෙ
ඛුදංපිපාසං අධිවාසහනෙනා කසම්භවං පොසපිකොසිඟාල.

එබාසිඟාලය අම්මුසොහොනෙහි මළ සවියන්ගේ මස් බොසේ ඇත. ඒ තව මනොඥවූ හොජනයෙක. එසේ හොජනය සුලභව තිබියදී සාපිපාසදෙක ඉවසාගෙණ කවරකාරණයක්නිසා තොප පෙහෙවස් වසන්නෙහිදැයි විවාළසේක. එකල්හි සිඟාලතෙම තෝ රාකියහුයේ ගාථාතුනකින් මෙසේ කීයේය.

පවිසසකුචඡිං මහතොහජසස කුනපෙරතොනතථිමංසෙ පඨිඛෝ
උනෙහවාතොතිඛිනාචරනෙනා සංකුචිතොඅසිතසස කරිසමගගං.

කිසොචපණඩුව අහංභදනෙනා නමෙඅහු නිකඛමනාය මගෙහා
මහාවමෙඝො සහසාපවසස, සො තෙමයී තසස කරිසමගගං.

තතො අහං නිකඛම්සසං භද්නෙනා, චඡෙ යථා රාහුමුඛා පමුතෙතා
තඨා අහං පොසථං පාලයාම්, ලොහො මමං මා පුනරාගමාසි.

ස්වාමිනි තාපසයන්වහන්ස! මම ගොදුරු පිණිස යනුයේ මලඇ නෙකුදැක මලමාංශයෙන් ඇත්කුසයටවැද හසථිකුනපයෙහි ගිදුවූ සිත්ඇතිව එහි විසිමි. මම එහි ඉන්දදීම උෂ්ණවූ වාතයක් හැමීය. සුභෂමවූ සුයසිරිය්මින්හින අව් සුලන් දෙකින් ඔහුගේ මලමාංශය වියලි හැකිලිය මම කුසතුල හිදිමෙන් ක්‍රසවූ පඬුවන් ගාත්‍රා ඇතිවිමි මා නික්මයන්නට මාංශයෙක් නොමැතිව එහිම උන්කල්හි මහත් අකාලමේඝයෙක් වටුයේය. එසින් ඔහුගේ මලමාංශය තෙත්විය. මම රාහුමුඛයෙන් මිදුනු සඳමඬලක්මෙන් ඒ ඇත්කුනින් නික්මුණෙමි. ඒ දුක්ඛය විත්දේ මාසිත හටගත් ලෝභයනිසාමය. එම නිසා ඒ ලෝභයට නිග්‍රාහකරණු පිණිස පෙහෙවස් වසමිසි කීයේය. ඉක්බිති චූලසා අතින් විචාරන්නාවූ මහබෝසතානන් වහන්සේ මේ ගාථාව කීයේය.

වම්මිකථූපසම්මං කිපිල්ලකානි, නිපෙපාඨයතෙන්නා තිං පුරෙ වරසි
වුදං පිපාසං අධිවාසතෙන්නා, කසමා තිං පොසථිකොසි අවිඡ

යන මේ ගාථාවෙන් විචාරි වදුළසේක. එඹල වලස! නෝ
මීවපලමු තුඹස්බිඳ එහිඋපන් පතුවන් අනුභවකරන්නෙහිය එබදු
වූතව පුරුදු ගොදුරට නොගොස් අද කුමක්නිසා පෙහෙවස් විසු
යෙහිදැයි විචාළසේක. එසේ විචාළාවූ මහබෝසතානන්වහන්සේ
ට තමා පෙහෙවස් සමාදන්වූ කාරණා කියන්නාවූ වලස්තෙම මේ
මතුකියන ගාථා දෙකකින් මෙසේ කියේය.

සතං නිකෙතං අනිසිලඝානෙ, අත්‍රිච්ඡතාහං මිලයං අගඤ්ඡිං
තතොජතානිකඛමිත්වානගාමකා, දණ්ඩඛනසතෙනසුපාඨිසිංසුමං.

සොහං ඛිනනසිසො රුහිතඝමඝො, පවවාගමිසිං සකං නිවෙසනං
තස්මාහං පොසථං පාලඝාමි, අත්‍රිවඡකාම පුනරාගමා සිං

සඛාමිනි තාපසඝන් වහන්ස! මම මාගේ සිතෙහි උපන් අත්‍රිවඡ
තාව්ඝනිසා මාගේ ගොදුරුබිම ලාමකකොවසිතා මලයරටට ගියෙ
මි එහම්හි මනුෂ්‍යයෝමාවටකොටගෙණපොලුඟදිගෙන්තැළුවාහුය.
ඒමම බිදුනුනිස්ඇතිව ලෙහෙඉගෙන් රුහැතුගාත්‍රාඇතිව මාවසනතැ
නට නැවත ආමි. ඒ මට මගේ අත්‍රිවඡතාවඝනිසා උපන් දුකඛයෙ
ක. ඒ අත්‍රිවඡතාවඝ මතු නුපදවනනිසා පෙහෙවස් වෙසෙමියි කි
යේය මෙසේ ඔහුසතරදෙනා තමතමන් විචාළ පැනවිසඳ තමන්
උන්හැනින් නැගිසිට ඇවිත්වැඳ මේ මතුකියන ගාථාවෙන් බෝස
තානන්වහන්සේ අතින් මෙඝස් විමාළාහුය.

යතෙන අපුවඡීත්‍ථ භං හදතෙන්ත, සබෙබවඤ්ඤකාසුං යථාපි ජනතං
මයම්පි පුවඡාම භං භතෙන්ත, කසමා භවං පොසථිකොසි බ්‍රහ්මණ

සඛාමිනි තාපසඝන්වහන්ස! නුඛවහන්සේ අප සතරදෙනාඅතින්
යම් ප්‍රශ්ණකෙණෙකුන් විචාරි වදුළසේක්ද? අපි සිගල්ලෝම ඒ
අපදන්නා පරිද්දෙන් නොවලඤා කිම්හ. අපිත් නුඛවහන්සේ අති
න් විචාරම්හ එම්බා උත්තමයානන්සහන්ස! නුඛවහන්සේ එලා
ඵලයට නොගොස් කවරහෙයකින් පෙහෙවස් සමාදන් වූසේක්ද
යි විචාළාහුය. ඒසේ විචාළාවූ ඔවුන්ට නෝරා වදුරන්නාවූ බෝස
තානන්වහසේ මේ මතුකියන ගාථාදෙකින් මෙසේ වදුළසේක.

අනුපලිතෙත්තා මම අසසමමඤ්ඤි, පවෙවකඛුබෙබා මුනතතං නිසිදි
සො ම අවෙදි ඝතිමාඝතිංච, මානංච ගොතතංච සඛබංචමරණං.

එවං පහංනාඝග හෙතඝසපාදෙ, නචාපි තං මානඝතෙන පුඤ්
තස්මා අහං ඵොසථා පාලයාමි, මානො මමං මා පුන රාඝමාසි

එබා සත්වයෙනි! රාගාදි කිසිවක්හි නැලුණු සිත්ඇතිවූ පසේබුදු කෙණෙකුන් වහන්සේ මාගේ අසපුවට ඇවිත් මොහොතක්කල් වැඩඋන්නාවූ උන්වහන්සේ මා මියගොස් උපදිනාතැන්ද අනාගතයෙහි මාගේ ප්‍රවෘත්තියද එබඳුවූ ජාතියෙහි මාගේ නාමයද ගෝත්‍රයද මා රක්ෂාකරන්නාවූ ගුණධර්මයන්ද යන මේ සියල්ල මවදන්වා වදාළසේක. එසේකල්හිත් මම මානාධිකවූසිතින්ම උන්වහන්සේගේ ශ්‍රීපාදයන්ට නමස්කාර නොකෙළෙමි. උන්වහන්සේ වදාළාවූ ප්‍රවෘත්තියත් මා සිත සැකහැර නොවිචාළෙමි. එසේ නොවිසින්නොවිචාළේ මාගේ සිතෙහි උපන් ජාතිමාන්නය නිසාමය. එබැවින් මාන්නයට නිග්‍රාහ කරණුපිණිස එලාඑලයට නොගොස් උපොසථවාසයෙන් උන්නෙමිසි වදාළසේක. මෙසේ මහබෝසතානන්වහන්සේ තමන්වහන්සේගේ උපොසථවාසයට්ඨාන්ට කායාදී ඔවුන් උන්උන්ගේ වාසස්ථානයන්ට ගමන්කරවා තමන්වහන්සේත් පන්සලට වැඩිසේක. ඒ තිරස්චීනයෝ සතරදෙනාද බෝසතානන්වහන්සේගේ අවවාදඅසා ගුණධර්මයන් රක්ෂාකොට එයින්මිය සදිවලෝකයෙහි උපන්නාහුය. බෝසතානන් වහන්සේ ධ්‍යානලාභි හෙයින් බ්‍රහ්මලෝකයෙහි උපන්සේක. මෙසේ පෙර තිරස්චීන යෝපවා උපොසථය රක්ෂාකොට සඟසැප සහ නිවන්සැප සිඹකර ගත්තෝය. මිනිස්ජාතියෙහි උපන්නාවූ එබා සත්වයෙනි! තොපට නුවර බැරිදෙයෙක්ද එබැවින් අප්‍රමාදව අෂ්ටාඟසීලය රක්ෂාකොට සතර අපායෙහිනොසිපිද සදිව්‍යලෝකයෙහි ඓශ්වර්යයන්විඳ කෙළවර අමාමහ නිවන්දකින්ට උත්සාහ සිතින් යුක්තව මේ උපෝසථසීලය දිවාරාත්‍රිදෙක්හි රක්ෂාකළ අයට පැමිණෙන විපාකනියා දැන්වූහ අඩපෝයක් රක්ෂාකළාවූ බොහෝදෙනාත් ලබාගන් දිව්‍යඓශ්වර්ය බුදුරජතන්වහන්සේ විසින් දෙයනාකොට තිබෙත් එයන් මෙසේ දතයුත්තේය.

සවඝිය දවස බරණැස්නුවර සැදැහැඇති බ්‍රහ්මදත්තනම් රජෙක් වූයේය. ඒ රජතෙම දන්දීමය, නිතිපන්සිල්රක්ෂාකිරීමය. පොහොය අටසිල් රක්ෂාකිරීමය යන මේහි පමාහුයේය. ඒ රජතෙම අමාත්‍යාදීවූ සෙසු නුවර වැසෙසාද දූනසිලාදියෙහි සමාදන් කරවන්නේය. ඔහුගේ පොරෝහිත බ්‍රාහ්මණතෙම අත්ලස්ගන්නේය. හිමියන් අහිමියන්කොට අයුක්තිබනන්නේය. රජතෙම එක් පොහෝදිනයක් පැමිණිකල්හි රජ උදෑසනම අමාත්‍යයන් කැඳවා පෙහෙවස් වසවසි මෙහෙරකියේය. සෙසෙසා සිල්සමාදන්වූවාහුය. පොරෝහිත බ්‍රාහ්මණතෙම කියහුයේ මම වෙලානොවරදවාම බත්කෑම් දැන් ගෙටගොස් කවසෝදු දමා සිල් ඉවාගෙණ රෑ බත් අනුභව

නොකට සිල්රක්ෂාකෙරෙමියි එසේ කල්හි මට අඩපොහොයක් පිරෙන්නේයයිකිය. ඒ අමාත්‍යයාද සහපතැයි ගිවිසගියේය. පුරෝහිතද ඒපරිද්දෙන්ම අඩපොහොයක් සිල්සමාදන්ව උන්නේය. මෙසේ ඔහු රක්ෂාකළසිලය නැවතා එක්පොහෝදිනයක ඔහු යුක්තිකියන්ම සභාවෙහි උන්කල්හි යුක්තිකියන්ට (හෙවත් නඩුකියන්ට) ආවාවූ සිල්වත් සත්‍රියෙක් වෙලා ආසන්වූකල්හී කුටශෝදන්ට ආරම්භකලාය. ඒ වේලාවම බමුණට පැසුන අඹකැනක්ගෙණවාය. ඒ තෙම ඈ ඵපහෙවස් සමාදන්වූබවදැන මේ අනුභවකොට පෙහෙවත් රක්ෂාකරවයි අඹකැන දුන්නේය. ඈතොමෝ ඒ අනුභව කෙළේය. බමුනා දුන්දන් මෙපමණිය බ්‍රාහ්මණතෙම මෑත හාගයෙහි මිය කෝසකිනම් ගඟානිරයෙහි තුන්යොදුන් දිග පුලුලැති අඹඵයනෙක දිලිහෙන්නාවූ රන්විමනෙක සරහණලද ශ්‍රීසහනෙක නිදැ පිබිදියාක්මෙන් උපන්නේය. උතුම් රූපශ්‍රී ධරන්නාවූ ශක්‍රදේවරාජයක් දිව්‍යස්ත්‍රීහු ඔහු පිරිවරා සිටියෝය. හෙතෙම රාත්‍රියෙහි ඒ ඒ දිව්‍යසම්පත්තීය අනුභව කරන්නේය විමානප්‍රේතව උපන්හෙයින් පෙර ජාතියෙහි කළ අකුසලයට සුදුසු දුක්විඳින්නේය. එබැවින් අරුණනැගෙණකාලයෙහි ඒ අඹවනයට වදනේය. ඔහු අඹවනයට වන්කල්හිම දිව්‍යාත්මභාවය නැතිවන්නේය. කය අසුරියන් උසඇති ප්‍රේත ආත්මභාවය පහළවන්නේය. සියලුශරීරය ගිනිඇවිල දන්නේය හාත්පසින් මල්පිපුනු කැලගසක්මෙන් පෙණෙන්නේය. දැතෙහිම එක එක් ඇඟිල්ලෙක්වන්නේය ඒ ඇඟිලිදෙතෙහිම මහාඋදළුතැරි පමණවූ නියපොතුවන්නේය. ඒ නියපොතුදෙකින් තමාගේ පිටපලා මස්උදුරාකම්න් මහාහඬින් මොරගා දුක්විඳින්නේය. සූර්‍යාභාසනාන්හතවනකල්හිම ප්‍රේතආත්මභාවය අනුභවකරන්නේය. දිව්‍ය ආත්මභාවය පහළවන්නේය. දිව්‍යස්ත්‍රීහු ඇවිත් පිරිවරාගන්නාහුය. ඒතෙම මහත් ඓශ්වර්‍යයෙන් දිව්‍යප්‍රාසාදයට නැගෙන්නේය. මෙසේ පෙහෙවස් රක්ෂාකරණලද සත්‍රියට අඹකැන (හෙවත් අඹවල්ල) දුන්විපාකයෙන් දෙලොස්හවිවක්දිගපුලුලැති අඹඵයනක් පහළවිය. අන්ලස්කා විපාකයෙන් පිටමස්පලාඋපුවාකන්නේය. අඩපොහොඹයහි විපාකයෙන් රාත්‍රියෙහි දිව්‍යඓශ්වර්‍යය අනුභවකරන්නේය. ඒබරණැස් මහරජතෙම වසනුකාම කොලසකාවයන්හි දෙස්දක රාජසම්පත්හැර තාපසව එම කෝසකිනම් ගඟානිරයෙහි ප්‍රේතයාගේ අඹඵයනටපාත පන්සලක්කොට වනමුල් ඵලාහාර අනුභවකොට වාසයකලාය. ඉක්බිති එක්දවසක් ඒ අඹඵයනින් මහකලයක් පමන මහතඇති විලිකුන් හුනුඅඹගෙඩියෙක් ගඟදියෙහිවැටී ඒ තාපසයන් දියනාතා

භංතොව සමීපයට ආය ඒ දුක තාපසයො පිහිනාගොස් ඒ අඹ ඉඩිය අසපුවට ගෙනවුත් සැස්ත්‍රයකින් කපා යැපෙන පමනක් අනුභවකොට සෙසස කෙහෙල් පතින් වසාතිබන්නේය. මෙසේ අනුභවකොට ඒ අඹුඉඩිය නිමාගියකල්හි දිව්‍යරසය අනුභවකල බෝධිසත්වයන්වහන්සේට රස තෘෂ්ණාව නවතාගතනොහී අන්ඵලාඵලයක් අනුභවකරන්ටත් රුචිනැතිව ගඟාතීරයටගොස් අඹ ඉඩියක් නොලැබ නොනැසිවිමිසි ගඟදිසාව බලාගෙණ සත්ද වසක්ම නිරාහාරව උන්නේය. සත්වෙනි දවස් ඒ ගඟාවෙහි අර ග්ගත්තාවූ දිව්‍යස්ත්‍රීතොමෝ සිත්නිති මේ තාපසතෙම අඹඵලයක් නොලැබ මියන්නේය. ඔහු මලහොත් මට මහත් නිදුවෙක් වන්නේයයි සිතා අවුත් ඒ මහාබෝසතානන්වහන්සේ වැඩඋන්නැන අහසසිටගණ්.

කිං ජඤ්ඤා කිමධිප්පායො එකොසම්මසි ගම්මනි
කිං පත්ථයානො කිං එසා කෙන අත්ථෙන බ්‍රාහ්මණිති.

ඝනාදින් ඒ බෝසතානන් අතින් විචාරන්නේ මේබදු උතුවැල් ලෙන් කකියන්නාවූ ගඟාතීරයෙහි මෙසේ නිරාහාරයෙන් සැතපී ම්ම කාරණා කවරේදැයි විචාළිය. බෝධිසත්වයන් වහන්සේද, ඒ දේවතා දුවට තමාගේ සිතෙහි අටගත් කාරණය නොවලහා ප්‍රකාශ කරණසේක් මේසේ කියේය.

තමන්වහන්සේ ගඟදියෙහි යන අඹඵලය ගෙණ අනුභව කලතැන් පටන් ආහාරයකට රුචිනැතිබව දක්වා වදාළසේක. මෙසේ අඩිපොහොයෙනුත් මෙබදු විපාකඇත්පෝයයි දන්නෙ එඹා සත්පුරුෂයෙනි! තොපවිසින් අප්‍රමාදව උපොසථසීලය රක්ෂාකටයුත්තේය. උපොසථසීලයනම් එකදවසක් රක්ෂාකල අයටත් කල්පලක්ෂගනනකුත් සගසිර්විඳුවා කෙලවර අමාමහනිවන් සිඹකරන්නේය. ඒ මේකථාව අසා දතයුත්තේය.

මේ මහාභද්‍රකල්පයට එකාඅනුවන කල්පයෙන් මත්තෙහි ඛන්ධුමතීනම් නුවර බන්ධුමතීනම් රජතෙම පොහෝදිනයෙහි පෙහෙවස් සමාදන්විය. ඒ නුවර ඉතා දිලින්දියක් රජහුද සේනාවද යන ඒ සියල්ලෝම සිල්සමාදන්ව උන්නා දුක මෙසේ සිතුවාය. මේ මහාරජුරුවෝද මේ අමාත්‍යයෝද තමතමන්ගේ මහත් ඓසඛ්‍යශ්‍රියහැර චන්දන කුන්කුමපත්‍ර කස්තුරි ආදි සුගන්ධයන්හා වස්ත්‍රාභරණයන්දහැර නිහතමානීවඉඳ සිල්රක්ෂාකරත් මේ මහාත්තමයන් විසින් මෙසේ සිල්රක්ෂාකරන්නේ ඕන්මතු මහත් වැඩක් සිඹවන්නේයයි නුවනින් සලකා දුශීව දිලිඳුව සිටිය තමාඉන්සිත ප්‍රසන්න

කොටගෙණ තොමෝත් අෂ්ටාඞ්ගසීලය රක්‍ෂාකළාය. ඒ කුසලගෙන් මිනිස්ලොව තව්තිසා දිව්‍යලොකගෙහි උපන්නීය. එසේ උපන්නාවූ ඇය උතුන් කුටාගාරගෙහි සැදුන්ලද්දාවූ ගඟපත් සඟනාසනගෙන් යුක්තව ගොදුනක් උසඇත්තාවූ මහත් දිව්‍යප්‍රාසාදගෙක් පහලවිය. ලක්‍ෂයක් දිව්‍යස්ත්‍රිහු ඇ පිරිවරා සිටගත්තාහුය. තමාගේ ශරීර සොභාවෙන් සියළු දිව්‍යස්ත්‍රින්ගේ ශරීරසොභාව මැඩපවත්වන්නීය. දිව්‍ය රජවරු ශතසහස්‍රදෙනෙකුට අගමෙහෙසුන්වූවාය. එතැන්පටන් නිවුන්දක්නාතෙක් ඒකාන්තකපක් මුළුල්ලෙහි හැමතැන්හි රන්වන් වණ්ණව උපන්නීය. හැමතැන්හිම සියළු සත්‍රින්ට වැඩිහිටි න්ව උපන්නීය. සුවණ්ණමයවූද ස්ඵටිකමයවූද උතුම්වූ සඟනාසන ලබන්නීය. මිහිරිමයවූද කම්බලමයවූද කප්පාසිකවූද උතුන් වස්ත්‍ර ලබන්නීය. චන්දන කස්තුරි ආදී සුගන්ධද චම්පක චකුලි නාග පුන්නාගසුමනාදීවූපුස්ඵගෙන්ද සුගන්ධවූණ්ණයන්හා විලෙපනයන්ද කූටාගාරයන්දප්‍රාසාදයන්ද මඬපය ගම්‍ය ගුහාය සඟනාදිවාසස්ථානයන්ද යන උතුම්දෙයලබන්නීය. මෙසේ ඒකාන්තකපක් මුලුල්ලෙහි භව භෝගසම්පත්විඳ අප බුදුන් දවස මනුස්‍යලෝකගෙහි ඉපිද සත්ඇවිරිද්දෙන්ම මහනව අටඇවිරිදි පිරෙන්ට පළමුකොටම රහත්වූවාය. මෙසේ එකදවසක් ශිල්රක්‍ෂාකලපමනින් එකාන්තකපක් මුලුල්ලෙහි සතරඅපායගෙහි නුපදවා සදිව්‍යලෝකගෙහි ඓස්වර්‍යයන් විඳුවා කෙළවර මෙසේඅමාමහනිවන් දක්වන්නට සමර්ථවූ අෂ්ටාඞ්ගසීලය රක්‍ෂාකිරීමට ප්‍රමාදවන්නාවූ ජනයෝ කෙසේනම් සසරදුකින් මිදෙද්ද කෙසේනම් අපායදුකින් ගැලවෙද්ද මෙලොවත් පරලොවත් කවරවැඩෙක්නම් සිඹවෙද එබැවින් එඕඝත්තරුණයෙනි! මේ කියන සිල්රක්‍ෂාකිරීමට කුසිතප්‍රමාදනොවී අලසනොවී අප්‍රමාදව සිහිනුවනින්ගෙදී අෂ්ටාඞ්ගසීලය රක්‍ෂාකොට මනුස්‍යත්වයෙහි ක්‍ෂණසම්පත්තිය සිඹිකරණලෙස උත්සාහ කටයුත්තේයි.

ශීලපරිචෙජ්දය නිමි.



